ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)

www.dasatha.com
dasathainfo@gmail.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

Pages 52 September 2013 Issue : 46 මාසික සංග්‍රහය. 2013 සැප්තැම්බර් 46 කලාපය Price.50¢


දෙස බස 7
15 ප්‍රියමනාප නිවසක්


භයානකම පොත 38
35 රෝහණ බැද්දගේ



තවත් ගිම්හානයක නිමාව සනිටුහන් කරමින් සීතල ඉඟි බිඟි පෑමට පටන් අරන්. එළඹෙන්නෙ සරත් සෘතුවයි. මිනිසුන්ට, සතා සීපාවුන්ට පමණක් නෙමෙයි. ගහ කොළවලට පවා මේ වෙනස දැනෙන්න පටන් අරන්. සැප්තැම්බර් 22 වනදා නිල වශයෙන් ඇරඹෙන කැනඩාවේ සරත් සෘතුව සිතුවමකට නැගුණේ සම්පත් රණවීරයන් අතිනි.

# විදේශ කටයුතු සේවකයන්ගේ වැඩවැරුමෙන් පාඩු රැසක්

මේ වන විට මාස 4 ක් ඉක්මවා ඇති විදේශ කටයුතු සේවක වැඩ වර්ජනයෙන් කැනඩාවේ විදේශ කටයුතු සේවාවන්වලට විශාල බලපෑමක් එල්ල වී ඇත. පසුගිය අප්‍රේල් 06 වනදා ඇරඹි මෙම වැඩ වර්ජනය සඳහා රටවල් 15 ක පවත්වාගෙන යන කැනඩා වීසා කාර්යාලවල සේවයේ නියුක්ත වූවෝ 1,600 ක පමණ පිරිසක් එක් වී සිටිති. කැනඩා තානාපති කාර්යාල තුළ සේවය කරන්නන් සියල්ලන්ගේ වැටුප් සමාන තලයක පිහිටිය යුතු බවත් ඒ සඳහා විදේශ සේවා නිලධාරීන්ගේ වැටුප වාර්ෂිකව ඩොලර් 14,000 කින් වැඩි කළ යුතු බවත් ඔවුහු ඉල්ලති.

මෙම තත්ත්වය මත කැනඩාවේ පාසල්, උසස් අධ්‍යාපන හා විශ්වවිද්‍යාල වෙතින් අධ්‍යාපනය ලැබීම සඳහා පැමිණීමට සූදානමින් සිටින විදේශ ශිෂ්‍යයන් දැඩි වීසා අර්බුදයන්ට මුහුණ පා ඇතැයි වාර්තා වේ. විදේශ සිසුන් වෙනුවෙන් අධ්‍යයන කටයුතු සඳහා ලබාදෙන

5 වන පිටුවට

## CT SCANS, MAMMOGRAMS පරීක්ෂාවන්හි දෝෂ ඇත්දැයි සැකයක්....!

2012 අප්‍රේල් 01 වනදා සිට 2013 මාර්තු 31 දා දක්වා ටොරොන්ටෝ සහ මිසිසාගා ප්‍රදේශවල රෝහල්වලින් ලබාගත් 3,500 කට අධික CT scans, Mammograms පරීක්ෂාවන් පිළිබඳ නැවතත් නිරීක්ෂණය කිරීමට සිදුව ඇතැයි සෞඛ්‍ය ආරංචි මාර්ග සඳහන් කරයි.

මේ අනුව ට්‍රිලියුම්ස් මිසිසාගා රෝහල( Trillium's Mississauga Hospital) සහ ක්වීන්ස්වේ සෞඛ්‍ය මධ්‍යස්ථානය(Queensway Health Centre) මගින් ලබාගත් විකිරණ පරීක්ෂාවන්හි දෝෂ පැවතිය හැකි බවට ඇති වූ සැකයක් මත මේ කාල සීමාව තුළ පරීක්ෂාවන් සඳහා යොමු වූ රෝගීන් වෙත නැවත කැඳවීමක් සිදු කර ඇත.

පසුගිය කාලය පුරා මෙම රෝහල්වලින් ලබාගත්

5 වන පිටුවට

## සතුටින්ම සිටින්නන් අතර කැනඩාව 6

එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් වාර්ෂිකව සිදුකරන සමීක්ෂනයකට අනුව ලෝකයේ සතුටින්ම සිටින මිනිසුන් සිටින රටවල් අතරින් 6 වන ස්ථානය මෙවර හිමිව ඇත්තේ කැනඩාවටයි. 2005 වසරේ සිට වාර්ෂිකව සිදුකරමින් පවතින මෙම සමීක්ෂණය සඳහා ලෝකයේ රටවල් 156 ක් සහභාගි කරගනු ලබයි. මෙහිදී එම රටවල්හි ජනතාව අතර විවෘත ඡන්ද විමසීමක් සිදුකරන අතර එතුළින් අසන ප්‍රශ්න විමසීම්වලදී 0-10 දක්වා ලකුණු ලබාදීමක් සිදුකරනු ලැබෙයි. 2013 වසර සඳහා කැනඩාව ලබා ඇති ලකුණු ප්‍රතිශතය 7.48 කි.

මෙම සමීක්ෂණයෙන් මෙවර ප්‍රථම ස්ථානය හිමිකරගෙන ඇත්තේ ඩෙන්මාර්කයයි. එතැන් සිට පිළිවෙළින් නෝර්වේ, ස්විස්ටර්ලන්තය, නෙදර්ලන්තය සහ ස්වීඩනය කැනඩාවට ඉහළින් සතුටින්

5 වන පිටුවට

## සේතු සමුද්‍රම් පරිසරය විනාශ කරන බවට චෝදනා

ඉන්දියාව හා ශ්‍රී ලංකාව වෙන් කෙරෙන පටු සමුද්‍රතීරයේ(ෆෝක් සමුද්‍ර සන්ධිය හා මන්නාරම් බොක්ක) පිහිටා ඇති නොගැඹුරු මුහුදු තීරය ගැඹුරු කරමින් නැව් ගමනාගමනය පහසු කිරීම සඳහා වූ ඇළ මාර්ගයක් සෑදීමේ ව්‍යාපෘතිය සේතු සමුද්‍රම් ව්‍යාපෘතිය නම් වේ.

මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමය එරෙහිව විවිධ ආයතන හා පුද්ගලයින් පසුගිය කාලය පුරා හඬ නගමින් සිටින අතර එහි නවතම තත්ත්වය පිළිබඳ 'ද හින්දු' පුවත්පත වාර්තා කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවහොත් පරිසරයට විශාල බලපෑමක් සිදුවන බව ඉන්දීය පරිසර

5 වන පිටුවට

## කච්චතිවු අර්බුදයට විසඳුම්

1976 වසරේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඇතිකර ගන්නා ලද එකඟත්වයට අනුව කච්චතිවු දූපත අයත් වන්නේ ශ්‍රී ලංකාවට බව ඉන්දීය විදේශ කටයුතු අමාත්‍යාංශය අවධාරණය කරයි. එනිසා ගැටලුවක් නොමැති දෙයක් සම්බන්ධයෙන් වාද විවාද කිරීම අනවශ්‍ය බවද ඉන්දියාව පෙන්වා දෙයි.

කච්චතිවු පිළිබඳ අර්බුදයක් මතු වූයේ එම දූපත නැවත ඉන්දියාවට පවරා ගන්නා ලෙස ඉල්ලා තමිල්නාඩු මහ ඇමතිනී ජයලලිතා ජයරාම් මෙනෙවිය විසින් ඉදිරිපත් කළ පෙත්සමක් හේතුවෙනි. කච්චතිවු අයිතිය ශ්‍රී ලංකාවට දෙමින් 1974-1976

5 වන පිටුවට

Airport | Wedding
Private Charters
24 hour Limousine service

AIRFLAT LIMO
Free Coffee & Wake up
24/7 Corporate Accounts
For Reservations
Phone : 416-988-8242
Toll Free: 1-866-961-1858
Email : info@airflatlimo.com
Web: www.airflatlimo.com

Residential & Commercial
Nature's-Air
Duct Cleaning Services
"Start breathing fresh air again"
• Furnace cleaning
• Dryer Vent Cleaning
• Central vacuum cleaning
• Filter inspection and replacing
• Carpet cleaning and office cleaning

For a free estimate call us
647 893 4667 or 647 718 1358
Email: info@ naturesair.ca
Visit us: naturesair.ca

1st & 2nd Mortgage
CENTUM
Optima Mortgages Inc.
Brokerage License # 10894
*Expert Advice
*Fast Service
*Save Money

Gini Annarasa
416.830.3241
Mortgage Broker (License # M08008550)
gannarasa@gmail.com

Beyond Your Expectations
For all your REAL ESTATE Needs.
www.gaminiabeysinghe.com

Best Homes For You
Gamini Abeysinghe.ABR,CNE
Real Estate Sales Representative
Mobile - 416 822 2789
ABR
Accredited Buyer Representative®
CNE
Certified Negotiation Expert®
RE/MAX Diamond Realty Inc., Brokerage









# නව ලොවක අරුණළු සිහිනයට කැනඩාවෙන් අත හිත

උතුරු පළාතේ මන්නාරම පෙරිය කුංචිකුලම R.C.T.M.S මහා විද්‍යාලයේ සහ පෙරියමුරිප්පු ප්‍රාථමික විද්‍යාලයේ ඉගෙනුම ලබන සිසු දරු දැරියන් වෙත අවශ්‍ය පාසල් උපකරණ කට්ටල බෙදා දීමේ මහඟු සත්ක්‍රියාවක් පසුගියදා සිදුකරනු ලැබුණි. මෙම සියලුම ද්‍රව්‍ය ලබාදීමට දායක වී ඇත්තේ කැනඩාවේ මැක්මාස්ටර් විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා සංගමය මගිනි.





ළමුන් 196 දෙනෙකු වෙත පිරිනැමුණු මෙම ත්‍යාග කට්ටල සිය සුරතින්ම ලබාදීම සඳහා මැක්මාස්ටර් ශ්‍රී ලංකා සංගමයේ සභාපති ගජිත් ජිනදාස මහතා එම පාසල් වෙත ගිය අතර තම සංගමය මෙවැනි කර්තව්‍යයක් සඳහා දෙමළ පාසල් දෙකක් තෝරාගැනීම පිළිබඳව අදහස් දැක්වීමටද අමතක නොකළහ.

එහිදී ඔහු පවසා සිටියේ තමාගේ සභාපතිත්වය බල පැවැත්වෙන කාල සීමාව පුරා ක්‍රියාත්මක වන වැඩසටහන් බොහෝමයක සිංහල-දෙමළ ජාතික සහජීවනය මතු කිරීමට ක්‍රියා කරන බවත් තම සංගමයේ සාමාජිකයින් වැඩි පිරිසක් සිංහල වන බැවින් මෙවර තිළිණ ප්‍රදානය සඳහා ශ්‍රී ලංකාවේ දෙමළ පාසල් දෙකක් තෝරාගත් බවත්ය. සිංහල දෙමළ භේදයකින් තොරව සියලුදෙනාම එකම රටක වෙසෙන පුරවැසියන් ලෙස සහයෝගයෙන් ජීවත්ව ගමට, රටට වැඩදායක අනාගත පරපුරක් බිහිකිරීම මෙවැනි කටයුතුවල අරමුණ බවද ඒ මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් පවසා සිටියේය.





ඔබටත් ලොව අග්‍රගන්‍ය උපාධියක් ලබාගන්න වරම්



මැසේ සරසවිය

- නවසීලන්තයේ විශාලතම සරසවියකි
- ලොව ඉහළම මට්ටමේ ශ්‍රේණිගත කිරීම් ලබා ඇත.
- නවසීලන්තයේ ජාතික විශ්ව විද්‍යාලයකි.
- අධ්‍යාපන විශිෂ්ඨත්වය සඳහා තරුපහේ තත්ව සහතිකය හිමිය.
- ප්‍රථම වසර ඉගෙනීම් කටයුතු GISM හිදී නිමාකර මැසේ සරසවියේ උපාධිය නවසීලන්තයේ දී ලබා ගතහැක.

STARS

UGC Recognised

Study @ GISM CAMPUS and save NZD 25,000

STUDY 1st Year at GISM and Complete the MU Degree in New Zealand.

| | |
|---|---|
| ව්‍යාපාර අධ්‍යාපනය පිළිබඳ උපාධිය | ගණකාධිකරණය / ව්‍යාපාර තොරතුරු පද්ධතිය / සන්නිවේදනය / කුඩා ව්‍යාපාර හා ව්‍යවසායකත්වය / මූල්‍යකරණය / මානව සම්පත් කළමනාකරණය / ජාත්‍යන්තර කළමනාකරණය / අලෙවි කළමනාකරණය / තක්සේරුකරණය හා දේපළ කළමනාකරණය |
| තොරතුරු විද්‍යා උපාධිය | තොරතුරු විද්‍යාව / මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව / තොරතුරු තාක්ෂණය |




එඩින්බර්ග් නේපියර් විශ්ව විද්‍යාලය

- රැකියා නියුක්තිය සඳහා පිළිගත් ප්‍රමුඛ විශ්ව විද්‍යාල දහයෙන් එකකි.
- වාර්ෂික රාජකීය සම්මානයෙන් පිදුම් ලබා ඇත.
- රටවල් 115 නියෝජනය කරන උපාධිධරින් 72, 829 පිරිසක් බිහිකර ඇත.
- ඉංජිනේරු ගෞරව උපාධිය
  මෙකාට්‍රොනික් / ඉලෙක්ට්‍රොනික් / ඉලෙක්ට්‍රිකල් / ඉලෙක්ට්‍රිකල් හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු විශේෂ උපාධි ලබාගත හැකිවීම
- විද්‍යාවේදී ගෞරව උපාධිය
  මයික්‍රෝබයොලොජි / බයෝමෙඩිකල් සයන්සස් / බයොලොජිකල් සයන්සස් / ඇනිමල් බයොලොජි / එන්වයරන්මන්ටල් බයොලොජි / මැරයින් ෆ්‍රෙෂ් වෝටර් බයොලොජි

මෙම උපාධි වසර දෙකක GISM අධ්‍යාපනය නිමකිරීම තුළින් එක්සත් රාජධානියේ එඩින්බර්ග් නේපියර් විශ්ව විද්‍යාලයේදී සම්පූර්ණ කිරීමට අවස්ථාව සලසා ඇත.

Hot-Lines :
0112 820 810 / 0714 279 279

IET | Engineering Council accredited degree | UGC Recognised

GISM CAMPUS
GRADUATE INSTITUTE OF SCIENCE AND MANAGEMENT
203, හයිලෙවල් පාර, කිරුළපන, කොළඹ 05.

Web : www.gism.lk
FB : www.facebook.com/GISMSriLanka
E-mail : info.gismcmapus@gmail.com

# රාජ්‍ය සේවකයින්ට ආගමික සංකේත සහිත ඇඳුම් පැළඳුම් තහනම්

ආගමික සංකේතයන් හුවා දැක්වෙන අන්දමේ ඇඳුම් පැළඳුම්වලින් සැරසී රජයේ රැකියාවල නිරත වීම තහනම් කිරීමේ සාරධර්ම ප්‍රඥප්තියක් පසුගියදා ක්‍යුබෙක් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව හිජාබ්, බුර්කා, තලප්පා, කිපා(යුදෙව් ජාතිකයින් පළඳින හිස් වැසුම්) හා විශාල ප්‍රමාණයේ කුරුස වැනි ආගමික සංකේතයන් නිරූපණය කෙරෙන ඇඳුම් පැළඳුම් තහනම් වනු ඇත.

විනිශ්චයකරුවන්, පොලිස් සේවයේ යෙදෙන්නන්, රජයේ දිවා සුරැකුම්හල්වල සේවයේ යෙදෙන්නන්, ගුරුවරු සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයේ යෙදෙන්නන්, රෝහල් සේවකයන්, නාගරික කාර්යාලවල සේවකයන්, රජය මගින් ක්‍රියාත්මක කෙරෙන මත්පැන්හල් සේවකයන් සහ වාහන රක්ෂණ මණ්ඩල ආදි රාජ්‍ය දෙපාර්තමේන්තු සහ මණ්ඩලවල සියලුම සේවකයින් සඳහා මෙම නීතිය වලංගු වේ.

මෙම නව සාරධර්ම ප්‍රඥප්තිය පිළිබඳ අදහස් දක්වමින් ක්‍යුබෙක් ප්‍රාන්ත අමාත්‍ය බර්නාඩ් ඩ්‍රෑන්විල් පැවසුවේ සියලුම ආගම් සඳහා සමානාත්මකව සැලකීමේ ප්‍රතිපත්තිය පිළිබඳ සලකා බලා මෙම නීති කෙටුම්පත් කළ බවයි. ක්‍යුබෙක් ප්‍රාන්තය තුළ බහු වාර්ගික හා බහු ආගමික ජන කොටස්හි වර්ධනයක් පෙන්නුම් කෙරෙන බවත් එහිදී ගැටුම් අවම කිරීම සඳහා මේ ආකාරයේ පැහැදිලි න්‍යායන් පැවතීම අනිවාර්යය බවත් ඔහු පෙන්වා දුන්නේය.

ක්‍යුබෙක් ප්‍රාන්තය විසින් ගන්නා ලද මෙම තීරණය පිළිබඳ ආගමික සංවිධාන රැසක් විසින් සිය විරෝධය පළ කර ඇති අතර දේශපාලන වශයෙන්ද මෙය කතාබහට ලක් වී ඇත. මෙම තීරණය පිළිබඳ සිය දැඩි අප්‍රසාදය පළ කරන පෙඩරල් රජයෙහි බහුවාර්ගික කටයුතු පිළිබඳ අමාත්‍ය ජේසන් කෙනී සික් ජාතිකයින් පළඳින හිස් ආවරණයක් සහිත වූ ඔහුගේ ඡායාරූපයක්ද ට්විටර් වෙබ් අඩවියෙහි පළ කර ඇත. මෙම ඡායාරූපය පසුගියදා ඔහුගේ ඉන්දීය සංචාරය අතරතුරදී ගන්නා ලද්දක් බව පැවසේ.

# සරණාගත අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අඩුවේ

කැනඩාවෙහි සරණාගත භාවය ඉල්ලන්නන්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් පහත වැටෙමින් පවතින බව වාර්තා වේ. පසුගිය වසර හා සංසන්දනය කර බැලීමේදී 2013 වසරේ මුල් මාස 06 තුළදී ඉල්ලුම් කර ඇති සරණාගත අයදුම්පත් සංඛ්‍යාව 50% න් පමණ පහත වැටී ඇතැයි පැවසේ. මෙම වසර මැද වන විට 4,558 දෙනෙකු සරණාගතයන් ලෙස ලියාපදිංචි වී ඇති අතර මෙම සංඛ්‍යාව 2012 වසරේදී 10,375 ක් ලෙස සටහන් විය.

මේ වන විට කැනඩා ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් ලෝකයේ රටවල් 37 ක් නිරුපද්‍රිත රටවල් ලෙස නම් කර ඇති අතර මේ රටවල්වලින් පැමිණෙන පිරිස් ඉදිරිපත් කරන සරණාගත අයදුම්පත් වෙත විශේෂ සැලකිල්ලක් යොමු කරනු ලබයි. එහිදී දින 30-45 ත් අතර ඔවුනගේ අයදුම්පත් පිළිබඳ කැඳවීම් සිදුකර පිළිගත හැකි ඉතාමත් සත්‍ය තොරතුරු මත පමණක් ඔවුන් වෙත කැනඩාවෙහි ස්ථිර පදිංචි වීසා බලපත්‍ර ලබා දෙනු ලබයි.

මෙහිදී ප්‍රතික්ෂේප වන අයදුම්පත් පිළිබඳ නැවත සලකා බැලීමක් සිදුනොකරන අතර වහාම රටින් පිටවීම සඳහා වන නියෝගය ඔවුන් වෙත ලබාදෙනු ලබයි. මෙම රටවල් 37 අතරට මෙතෙක් ශ්‍රී ලංකාව අයත්ව නොමැති අතර මීට අලුතින්ම එක් වූ රටවල් දෙක චිලී රාජ්‍යය සහ දකුණු කොරියාව වේ.

මේ රටවල් 37 ට අමතරව ලෝකයේ සෙසු රටවල්වලින් පැමිණෙන්නන්ගේද සරණාගත අයදුම්පත් ප්‍රතික්ෂේප වීමේ ප්‍රවණතාවක් මේ වන විට පවතින අතර 2013 වසරේදී මේ වන තෙක් පිළිගෙන ඇත්තේ 16% පමණ අයදුම්පත් ප්‍රමාණයක් බවද වාර්තා වේ.

# කැනේඩියානු නිවාස වෙළඳ පොළ තුළ විදේශීය ආයෝජන වැඩි වේ

කැනේඩියානු නිවාස වෙළඳ පොළ වෙත විදේශීය ආයෝජකයින් පැමිණීම වැඩිවෙමින් පවතී. චීනය, රුසියාව, මැද පෙරදිග, ඉන්දියාව සහ ඇමරිකාව වැනි රටවල්වලින් පැමිනෙණ මෙම ගැනුම් කරුවන් මිල අධික සුඛෝපභෝගී පන්තියේ තට්ටු නිවාස(condominium) මිල දී ගැනීමට වැඩි නැඹුරුවක් දක්වන බව පැවසෙයි.

මේ ආකාරයෙන් නිවාස මිල දී ගැනීමට පෙළඹී ඇති ධනවතුන් බොහොමයකගේ දරුවන් කැනඩාවෙහි අධ්‍යාපනය ලබන අතර ඔවුන්ගේ නවාතැන් පහසුකම් සඳහා නිවාස මිල දී ගැනීම් සිදු කරමින් පවතී. නව පාසල් හා විශ්වවිද්‍යාල වාරය ඇරඹීමත් සමග මෙහි වර්ධනයක් පෙන්නුම් කෙරෙන අතර නාගරික පහසුකම්වලින් යුත් ප්‍රදේශවල පිහිටි ඩොලර් ලක්ෂ 5 ත් 7 ත් අතර පවතින සුඛෝපබෝගී පන්තියේ තට්ටු නිවාසවලට හොඳ ඉල්ලුමක් පවතින බව පැවසේ.

# 2014 වසර සඳහා සේවා රක්ෂණයෙහි උපරිම සීමා

සේවා රක්ෂණය එසේත් නැත්තම් Employment Insurance (EI) කියන්නෙ රැකියාවල නියුතු කවුරුත් දන්නා රක්ෂණ ආවරණ ක්‍රමයකි. කිසියම් මොහොතක රැකියාව අහිමි වුවහොත්, ආබාධිත තත්ත්වයට පත් වුවහොත්, ගර්භනී භාවය වැනි තත්ත්වයකට පත් වුවහොත්, හදිසි රෝගාබාධයක් ඇති වුවහොත් මෙම EI ක්‍රමය මගින් බොහෝ ප්‍රතිලාභ අත්කර ගත හැකි බව ඔබ කවුරුත් දන්නා කරුණකි.

පසුගියදා සේවා රක්ෂණ ක්‍රමය සම්බන්ධ විශේෂිත පුවතක් වාර්තා වූ අතර එයට අනුව සේවා රක්ෂණ ක්‍රමය සඳහා 2014 වර්ෂය සඳහා වන අයකිරීම් ප්‍රතිශත සහ යටත් වන උපරිම වැටුප් සීමාවන් කැනඩා සේවා රක්ෂණ කොමිෂන් සභාව මගින් ප්‍රකාශයට පත් කර ඇත.

2014 වර්ෂය සඳහා අදාළ අයකිරීම් ප්‍රතිශතය 1.88% ක් වන අතර මෙය 2015 හා 2016 වර්ෂ සඳහාද නොවෙනස්ව පවතිනු ඇත. තවද 2014 වර්ෂය සඳහා අදාළ උපරිම වැටුප් සීමාව ඩොලර් 47,400 සිට ඩොලර් 48,600 දක්වා වැඩිකර ඇත. ක්‍යුබෙක් ප්‍රාන්ත වැසියන් සඳහා වන Quebec Parental Insurance Plan (QPIP) රක්ෂණ ආවරණ යටතේ 0.35% ක ප්‍රතිශතයකින් සේවා රක්ෂණ දායකය අඩු වන අතර ඔවුන්ට අදාළ දායක ප්‍රතිශතය 1.53 ක් වේ. සේවා රක්ෂණ ප්‍රතිලාභය අඩුකර ගැනීමේ වැඩපිළිවෙළ Premium Reduction Program (PRP) යටතේ ලියාපදිංචි සේවා යෝජකයින් ගෙවනු ලබන සේවා රක්ෂණ ප්‍රතිශතයද 0.22% සිට 0.37% දක්වා ප්‍රමාණයකින් අඩුවීමට නියමිත වේ. මේ වන විට සේවා රක්ෂණ ක්‍රමය සඳහා දායක වීමට ස්වයං රැකියාවල නියුක්ත වන්නන්ටද හැකි අතර ඔවුන් වෙනුවෙන් 2014 වර්ෂය සඳහා වාර්ෂික ආදායම් සීමාව 6515 ක් ලෙස දක්වා ඇත.

# කැනඩාවේ වැඩියෙන්ම සල්ලි තියෙන්නෙ මධ්‍යම වයසේ සුද්දන්ට

## - කැනඩා සංඛ්‍යා ලේඛන වාර්තාවේ හෙළිකිරීමක්

ජාතික නිවාස හිමියන්ගේ සමීක්ෂණයෙහි නවතම වාර්තාව පසුගියදා කැනඩා සංඛ්‍යා ලේඛන අංශය විසින් එළිදක්වනු ලැබුණි. එයට අනුව විවාහක, මධ්‍යම වයසේ පසුවන, සුදු ජාතිකයින් කැනඩාවේ ධනවත්ම පුද්ගලයින් බව හෙළිදරව් වී ඇත. මෙම පුද්ගලයින්ගෙන් වැඩි පිරිසක් තම නිවාස ණය, වාහන ණය ආදිය පියවා ණය බරින් තොරව වෙසෙන්නන් බවද එම වාර්තාව දක්වයි. මෙම වාර්තාවට අනුව වාර්ෂික පවුලේ ආදායම ඩොලර් 76,000 ක් වන මධ්‍යම පාන්තිකයින්ගේ සංඛ්‍යාව කැනඩාවෙහි බටහිර ප්‍රදේශයට වඩා නැගෙනහිර ප්‍රදේශයෙහි වැඩිවීමක් දක්නට ලැබෙන බව පෙනී යයි. මෙහිදී මධ්‍යම පාන්තික තනි පුද්ගලයෙකුගේ ආදායම ඩොලර් 27,600 ක පවතියි.

ධනවත් පුද්ගලයින්ගෙන් 10% ක් වාර්ෂිකව ඩොලර් 80,400 ක් උපයන අතර 1% ක පමණ පිරිසක් ඩොලර් 191,100 ක් උපයයි. ඩොලර් 685,000 ක් වාර්ෂිකව උපයන්නන් 0.1% ක්ද ඩොලර් මිලියන 2.57ක් උපයන්නන් 0.01% ක්ද ලෙස අනුව සංඛ්‍යා ලේඛණ පෙන්වා දෙයි. මේ දත්තයන්ට අනුව කැනඩාවේ සුපිරි ධනවතුන්ගේ සංඛ්‍යාව ඉතාමත් සීමිත වන අතර ඉහළ ආදායම් තත්ත්වවල පසුවන මේ ධනවතුන්ගේ බහුතරයක් වයස 45-54 ත් අතර පසුවන්නන් බවද මෙම හෙළිදරව්වෙන් සොයාගෙන ඇත.

කැනඩාව පැමිණ සිටින සංක්‍රමණිකයන්ගේ ආදායම් තත්ත්වයද සැලකිය යුතු මට්ටමක පවතින බවත් විශේෂයෙන්ම සංක්‍රමණිකයන්ගේ දෙවන පරම්පරාව තුළ ආදායම ඉහළ මට්ටමේ පවතින පිරිස වැඩියෙන් සිටින බවත් සංඛ්‍යාලේඛන දත්ත විශ්ලේෂකයන් පෙන්වා දෙයි.

ඇල්බර්ටා ප්‍රාන්තයෙහි තෙල් ආශ්‍රිත කර්මාන්තයන්හි යෙදෙන්නන් වෙසෙන කැල්ගරිහි Fort McMurray පළාතෙහි වැසියන්ගේ වාර්ෂික පවුල් ආදායම ඩොලර් 186,782 ක් ලෙස දැක්වෙන අතර මෙම සංගණනයේදී දක්නට ලැබුණු ඉහළම වාර්ෂික පවුල් ආදායම් මට්ටම ලෙස එය පිළිගනු ලැබ ඇත. ඒ අනුව කැනඩාවෙහි ආදායම ඉහළ මට්ටමේ පවතින නගරය ලෙස කැල්ගරි පත්ව ඇත. මෙහි දෙවන ස්ථානය ටොරොන්ටෝවටත් තෙවන ස්ථානය එඩ්මන්ටන්වලටත් ලැබී ඇත.

# ඔන්ටාරියෝ ආණ්ඩුවෙන් ආබාධිතයින්ට විශේෂ සහන රැසක්

විශේෂ අවශ්‍යතා(Special Needs) ඇති දරුවන් සහ තරුණයන්ගේ පහසුව උදෙසා වැඩපිළිවෙළ රැසක් ක්‍රියාත්මක කිරීමට ඔන්ටේරියෝ රජය තීරණය කර ඇත. ඒ අනුව ආබාධිත වූවන් විසින් අවශ්‍ය සේවා ලබාගැනීමේදී මුහුණ පෑ දීර්ඝ පොරොත්තු ලේඛන ගැටලුව ඉදිරි කාලයේදී මගහැරෙනු ඇත.

මේ වෙනුවෙන් ඔන්ටේරියෝ රජය ඩොලර් මිලියන 5 ක් ආයෝජනය කර ඇති අතර පවුල් මධ්‍යස්ථානයන්හි ළමා පුනරුත්තාපන තොරතුරු පද්ධතීන් කාර්යක්ෂම කිරීමටත් නව ළමා ප්‍රතිකාර මධ්‍යස්ථාන 5 ක් ආරම්භ කිරීමටත් මෙම මුදල් යෙදවෙනු ඇත. භෞත චිකිත්සා, වෘත්තිය චිකිත්සා සහ කථන චිකිත්සා ආදි විශේෂ අවශ්‍යතා සහිත වූවන් සඳහා ලබාදිය යුතු ප්‍රතිකාරයන් මෙම මධ්‍යස්ථානයන්හදී ලබාගත හැකි වෙයි. මීට අමතරව ඔන්ටේරියෝවෙහි පාසල්වල පවතින විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වෙන් වූ ඒකකයන්හි පවතින අඩුලුහුඬුකම් පිළිබඳවද සොයා බැලෙනු ඇත. දැනට අර්ධකාලීන බාලාංශ(kindergarten) පංති පැවැත්වෙන පාසල්වල පූර්ණ කාලීන බාලාංශ පංති පැවැත්වීම කෙරෙහිද අවධානය යොමු වී ඇත.

විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සහ තරුණයන් වෙත ක්‍රමානුකූලව ප්‍රතිකාර සහ නිසි සැලකිල්ල දැක්වීම තුළින් ඔවුන්ගේ රෝගී තත්ත්වයන් මර්ධනය කරගත හැකි අතර ඒ වෙනුවෙන් ඔන්ටේරියෝ රජය විසින් මෙම පියවර ගෙන ඇත.

# ටොරොන්ටෝ - යෝර්ක් උමං මාර්ගය ඉක්මනින් ජනතා අයිතියට

ටොරොන්ටෝව සහ යෝර්ක් යාකරමින් දීර්ග වෙමින් පවතින ස්පැඩිනා උමං දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු මේ වන විට නිමාව දකිමින් පවතී. කිලෝමීටර 8.6 ක දුරක් දක්වා දීර්ඝ කර ඇති මෙම මාර්ගයේ කටයුතු 85% ක් පමණ මේ වන විට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත. ඒ අනුව ඩවුන්ස්වීව් දුම්රිය ස්ථානයේ සිට වෝන්ග් දක්වා මෙම මාර්ගය දිව යනු ඇත.

ෂෙපර්ඩ් ඇවනියු සහ වෙස්වුඩ් ඩ්‍රයිව්හි පිහිටි ඩවුන්ස්වීව් පාක් දුම්රිය ස්ථානයේ සිට සෙන්ට් රෙජිස් ක්‍රෙසන්ට් සහ කීල් වීදිය දක්වා දීර්ඝ වන දුම්රිය මාර්ගය අතරතුර නැවතුම් පොළවල් 6 ක් පිහිටුවා ඇත. ඒවා ෆින්ච් වෙස්ට්, ෆයනියර් විලේජ්, යෝර්ක් විශ්වවිද්‍යාලය, 407 අධිවේගී මාර්ගය සහ වෝන්ග් මෙට්‍රොපොලිටන් සෙන්ටර් යන ස්ථානයන්හි පිහිටා ඇත.

# යාල්දේවි කිලිනොච්චි යයි

උතුරු දුම්රිය මාර්ගයේ දුම්රිය ගමනාගමනය තවදුරටත් දීර්ඝ කරමින් කොළඹ කොටුවේ සිට කිලිනොච්චිය දක්වා දුම්රිය ගමනාගමනය මෙම මස 14 දා සිට විවෘත වීමට නියමිත වේ. මේ වන විට ඕමන්ත දක්වා දුම්රිය ගමන් අරඹා ඇති අතර ඕමන්තේ සිට කිලිනොච්චිය දක්වා කිලෝමීටර 63 ක දුරක් සහිත නව දුම්රිය මාර්ගය මේ අනුව විවෘත වනු ඇත.

වසර 23 කට පසු යාල්දේවී දුම්රිය කිලිනොච්චිය දක්වා ධාවනය කිරීමේ නිරීක්ෂණ චාරිකාවක් සැප්තැම්බර් 06 වන දින සිදු කළ අතර මෙයට සහභාගි වෙමින් ප්‍රවාහන අමාත්‍ය කුමාර වෙල්ගම මහතා ප්‍රකාශ කර සිටියේ ලබන සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වන විට යාල්දේවී දුම්රිය පැය 06 න් යාපනය බලා ගමන් කරවීමට අවශ්‍ය කටයුතු යොදන බවයි.

ඕමන්ත සිට කිලිනොච්චිය දක්වා දුම්රිය මාර්ගය විවෘත කිරීමෙන් පසු යාල්දේවී ඇතුළු දුම්රිය තුනක් දිනපතා ධාවනය කිරීමට නියමිත අතර ඒ වෙනුවෙන් නව දුම්රිය මැදිරි 100 ක් ගෙන්වීමටද නියමිත වේ.

ඕමන්තේ සිට කිලිනොච්චිය දක්වා දිවෙන දුම්රිය මාර්ගය සහ අදාළ දුම්රිය ස්ථානය ඉදිකිරීම සඳහා වැය වී ඇති මුදල ඇමරිකානු ඩොලර් මිලියන 185 ක් වෙයි.

# සුනිලා අබේසේකර අභාවප්‍රාප්ත වෙයි



ප්‍රකට මානව හිමිකම් ක්‍රියාකාරිනියක වූ සුනිලා අබේසේකර මහත්මිය පසුගියදා අභාවප්‍රාප්ත වූවාය. මිය යන විට 61 හැවිරිදි වියේ පසුවූ ඇය කලක් පිළිකා රෝගය නිසා රෝගාතුරව පසු විය. මානව හිමිකම් සහ ස්ත්‍රී අයිතිවාසිකම් වෙනුවෙන් දශක කිහිපයක් පුරා හඬ නැගූ ඇය ඒ වෙනුවෙන් 1999 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සම්මානයෙන්ද පුද ලැබුවාය. 88-89 භීෂණ සමයේදී අතුරුදන් වූවන් වෙනුවෙන් සහ ඔවුන්ගේ පවුල්වල අයගේ මානව හිමිකම් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් මහත් වූ කාර්යභාරයක් ඉටු කළ ඇය එවක පිහිට වූ 'මවුවරුන්ගේ පෙරමුණ' 'අතුරුදහන් වූවන්ගේ මාපිය දූදරු සංවිධානය' ඇතුළු සංවිධාන සමග සමීපව කටයුතු කළාය. එම සංවිධානයන්හි නියෝජිතවරියක් ලෙස කටයුතු කරමින් එකල විපක්ෂ මන්ත්‍රීවරුන් වූ මහින්ද රාජපක්ෂ හා වාසුදේව නානායක්කාර යන මහත්වරුන් ජිනීවාහි මානව හිමිකම් කොමිසම දක්වා ගෙන යෑම සඳහා වූ සම්බන්ධිකරණය ඇයගේ ප්‍රධානත්වයෙන් සිදුවූ මහගු සේවාවන් විය.

ජනතා විමුක්ති පෙරමුණ හරහා දේශපාලනයට පිවිසියත් පසුව ඉන් ඉවත්ව ප්‍රගතිශීලි වාමාංශික දේශපාලන බලවේග හා එක්ව ඇය කටයුතු කළාය. ලංකාවේ ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ සමාරම්භිකාව ලෙස සැලකෙන ඇය දෙමළ ජනතාවගේ අයිතීන් වෙනුවෙන්ද ප්‍රසිද්ධියේ ප්‍රබල හඬක් නැගූ චරිතයක් විය.

මේ සියලුම දේශපාලන භූමිකා අතර ඇය තුළ කෘතහස්ත කලාකාරියක්ද සැඟවී සිටි අතර ඇය චිත්‍රපට කීපයක චරිත නිරූපණයටද දායක වී ඇත. 'හඳුනාගත්තොත් ඔබ මා..' 'හිමින් සැරේ පියා විදා...' වැනි ගීත තුළින් ඇයගේ හඬද අප මතකයෙහි නොමැකෙන ලෙස සටහන් වී තිබෙනු ඇත.

# හෙළ සිරිතට කුඹුරු අක්කර ලක්ෂයක්

ඉදිරි වසරේදී ශ්‍රී ලංකාව තුළ සම්ප්‍රදායානුකූල හෙළ සිරිතට අනුව කුඹුරු අක්කර ලක්ෂයක් වගා කිරීමට කටයුතු සකස් කෙරෙමින් පවතින බව පැවසේ. මෙහි මූලික පියවරක් ලෙස මේ වන විට කුඹුරු අක්කර 3000 ක් වගා කර ඇති බවත් ඉන් ලබාගත් වී අස්වැන්න සහල් බවට පත් කර රජයේ වෛද්‍ය මධ්‍යස්ථාන වෙත ලබා දීමට කටයුතු කෙරෙන බවත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විජේරත්න සකලසූරිය මහතා පවසා සිටියි. කිසිදු රසායන ද්‍රව්‍යයක් භාවිත නොකර සිදුකරන මෙම වගා ක්‍රමය වෙනුවෙන් ගොවි ජනතාවට අවශ්‍ය සියලුම පහසුකම් ලබා දීමට කෘෂිකර්ම අමාත්‍යාංශය සූදානම් බවත් මේ සඳහා අවශ්‍ය උපදෙස් නොමිලේ ලබා දීමේ පහසුකම් මේ වන විට අරඹා ඇති බවත් ඔහු වැඩිදුරටත් පැවසීය.

# අලින්ව රකින්න 'නයිට් විෂන්' කැමරා

දුම්රිය මාර්ගයට ඒමෙන් අනතුරට පත්වන අලින්ගේ ජීවිත රැක ගැනීම සඳහා දුම්රියවලට 'නයිට් විෂන්' කැමරා සවිකිරීමේ වැඩපිළිවෙළක් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. ඒ අනුව ගල්ඔය, මඩකලපුව ඇතුළු මාර්ගවල ගමන් ගන්නා දුම්රිය 15 ක් සඳහා කැමරා 30 ක් මිල දී ගැනීමට කටයුතු සකස් කෙරෙමින් ඇත. රාත්‍රී කාලයට විශේෂිත කිලෝමීටරයක් දුර දර්ශනය වන මෙම නයිට් විෂන් කැමරාවක මිල රුපියල් මිලියන 2 ක් පමණ වෙතැයි පැවසේ. මෙම කැමරාවක් දුම්රියක සවිකර එය සාර්ථකදැයි පරීක්ෂා කිරීම පසුගියදා සිදුවූ අතර එම කැමරාව සාර්ථක මට්ටමේ ප්‍රතිඵල දුන් බව දුම්රිය සාමාන්‍යාධිකාරී බී.ඒ.පී. ආරියරත්න මහතා සඳහන් කරයි.

# ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය

මෙවර ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය සැප්තැම්බර් 14 සිට 21 දක්වා පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී 500 කට ආසන්න දෙස් විදෙස්හි ප්‍රකාශිත පොත් සහිත කුටිවලින් පොත් මිල දී ගැනීමට මෙවරත් ජනතාවට අවස්ථාව සැලසෙනු ඇත. පසුගිය වසර කීපය තුළම ලක්ෂ සංඛ්‍යාත ජනකායක් මේ සඳහා ඇදී ආ අතර මෙවරත් ලක්ෂ 10 ට වැඩි ජනකායක් පැමිණෙනු ඇතැයි ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය අපේක්ෂා කරයි.

ලක් පුවත්
Sri Lanka news

# බිලි පූජා තහනම්

## අභියාචනාධිකරණ නියෝගයක්

සියලුම ආගමික ස්ථානවල පැවැත්වෙන සත්ව බිලි පූජා වළක්වාලමින් අභියාචනාධිකරණ නියෝගයක් අගෝස්තු 29 දා නිකුත් කර තිබේ. එසේම හලාවත මුන්නේශ්වරම් දේවාලයේ සිදුකරනු ලබන සත්ව ඝාතන වළක්වමින් මැන්ඩාමුස් රිට් ආඥාවක්ද නිකුත් කර ඇත.

මින් ඉදිරියට ආගමික ස්ථානයන්හි සත්ව බිලි පූජා පවත්වන්නේ නම් ඒ සඳහා බලපත්‍රයක් ලබාගැනීම අනිවාර්ය බවද අභියාචනාධිකරණ නියෝගයේ සඳහන් වේ. කිසියම් ලෙසකින් මෙම පනත්වලට අනුකූලව කටයුතු නොකර ඒවා උල්ලංඝනය කළ හොත් සත්ව ඝාතන පනතෙහි සඳහන් අන්දමට දඬුවම් ලැබිය හැකි බවද එම නියෝගයෙහි දක්වා ඇත.

ජාතික සංඝ සම්මේලනය, ධර්ම විජය පදනම, බෝධිරාජ පදනම, සත්ව සුභ සාධන භාරය ඇතුළු සත්ව අවිහිංසා සංවිධාන කිහිපයක් මගින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක් සලකා බැලීමෙන් අනතුරුව මෙම රිට් ආඥාව නිකුත් කර ඇත. බෞද්ධ රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ මෙවැනි විශාල සත්ව ඝාතන සිදුවීම යෝග්‍ය නොවන්නක් බව ආගමික සංවිධාන විසින් පෙන්වා දී තිබුණි. ඒ අනුව කිසිදු ආගමික ස්ථානයක මින් ඉදිරියට සත්ව බිලි පූජා පැවැත්වීම තහනම් වනු ඇත.

# ජ්‍යෙෂ්ඨ ඇමති ධුර අනාගතයේදී අවලංගුයි ?

දැනට ක්‍රියාත්මක වන ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුර ක්‍රමය නුදුරු අනාගතයේදී අවලංගු කිරීමට ආණ්ඩුවෙහි සූදානමක් පවතින බව වාර්තා වේ. ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුර මගින් බලාපොරොත්තු වූ තරම් සාර්ථක ප්‍රතිඵල නොලැබීම නිසා දේශපාලන උපදේශකයින්ගේ උපදෙස් මත මෙවැනි පියවරක් ගැනීමට අදහස් කරන බව පැවසේ.

දැනට සිංගප්පූරුවේ සාර්ථක ලෙස ක්‍රියාත්මක වන මෙම ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුර ක්‍රමය ශ්‍රී ලංකාවේදී ක්‍රියාත්මක කිරීම ඇරඹෙනුයේ අත්හදා බැලීමක් ලෙස වන අතර ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ දෙවන පදවි ප්‍රාප්තියෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් දසදෙනෙක් පත් කරමින් මෙම ක්‍රමය ආරම්භ විය. එහෙත් මේ ධුරවලට පත්ව ඇති ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයින්ගේ උදාසීනත්වය මත මෙතෙක් මෙය එතරම් යහපත් ප්‍රතිඵල ගෙන දී නොමැති අතර තමා වෙත ලැබී ඇති අමාත්‍ය ධුර සහ ඒ හා පැවරී ඇති බලතල හා වරප්‍රසාද සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් අතර නොසතුටක් පැවතීම මෙයට ප්‍රබල හේතුවක් වෙයි.

මේ සියල්ල සැලකිල්ලට ගෙන ජ්‍යෙෂ්ඨ ඇමති ධුර අවලංගු කර එම තනතුරු සඳහා පත්ව සිටින පළපුරුදු දේශපාලනඥයින් වෙත වෙනත් තනතුරු ලබාදීමේ අදහස ක්‍රියාත්මක කිරීම සඳහා මේ දිනවල සාකච්ඡා කෙරෙමින් පවතින බව සඳහන් කරයි.

# කොළඹටත් කැසිනෝ

ඇමරිකානු ඩොලර් මිලියන දහසක ආයෝජනයෙන් කැසිනෝ පහසුකම් සහිත හෝටල් ව්‍යාපෘති දෙකක් ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබේ.

වෝටර් ෆ්‍රන්ට් ප්‍රොපටි සමාගම යටතේ ජෝන් කීල්ස් සමාගම විසින් කොළඹ 02 ග්ලේනි වීදියේ ඉදිකිරීමට යෝජිත ඒකාබද්ධ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ඩොලර් මිලියන 650 ක ආයෝජනයෙන් එක් ව්‍යාපෘතියකුත් සීමාසහිත ලේක් ලෙෂර් හෝල්ඩිංස් සමාගම ඩී.ආර්. විජේවර්ධන මාවතේ ඇ.ඩො. මිලියන 350 ක ආයෝජනයෙන් අනෙක් ව්‍යාපෘතියත් කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබේ.

මෙම ආයෝජනයන්හි සුඛෝපභෝගි හෝටල්, සම්මේලන මධ්‍යස්ථාන, විනෝදය සපයන ස්ථාන, කැසිනෝ ඔට්ටු ඇල්ලීමේ ස්ථාන, සාප්පු සංකීර්ණ, නිවාස හා කාර්යාලයීය පහසුකම් සැපයීම ඇතුළු අංගෝපාංගයන් රැසකින් සමන්විත වේ.

# නවනීදන් පිල්ලේ ඇවිත් යයි

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරිය වූ නවනීදන්පිල්ලේ මහත්මිය පසුගියදා සිය ශ්‍රී ලංකා සංචාරය නිම කළාය. ඇය මේ ආකාරයෙන් ශ්‍රී ලංකාවට ගොස් සිටියේ ශ්‍රී ලංකා රජයේ ආරාධනාවකට අනුවයි. ඒ අනුව පසුගිය කාලය තුළ මානව හිමිකම් ක්ෂේත්‍රය තුළ මෙන්ම ප්‍රතිසන්ධානය හා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හරහාද ශ්‍රී ලංකාව විසින් ක්‍රියාත්මක කොට ඇති වැඩකටයුතු සියැසින්ම දැක බලාගැනීම ඇගේ මෙම ගමනෙහි අරමුණ විය. ඒ අනුව දින 07 ක කාලයක් ශ්‍රී ලංකාවේ රැඳී සිටි මහකොමසාරිස්වරිය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු රජයේ නියෝජිතයින් සමගද, විපක්ෂ නියෝජිතයින් සමගද සාකච්ඡා පවත්වා ඇති අතර රාජ්‍ය නිලධාරීන් හා පොදු ජනතාව සමගද අදහස් හුවමාරු කරගෙන ඇත. සංචාරය අතරතුර උතුරු නැගෙනහිර පළාත්වලටද යෑමට ඇය අමතක නොකළාය.

මෙහිදී යාපනය සංචාරය අතරතුරදී අදහස් දක්වමින් නවනීදන් පිල්ලේ මහත්මිය පවසා සිටියේ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ ගැටලු රැසක් තමන්ට පවතින බවත් ඒ පිළිබඳ අවසන් තක්සේරුවක් කිරීමට කාලය අවශ්‍ය බවත්ය.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘති හා ක්‍රියාවලීන් පිළිබඳ සිවිල් වැසියන් දැනුවත්දැයි දැනගැනීමට ඇය කැමැත්තෙන් සිටින බවත් ප්‍රතිපත්ති හා තීරණ ගැනීමේ ක්‍රියාවලියට සාමාන්‍ය ජනතාවගේද අදහස් යොදාගන්නේ නම් වඩා වැදගත් බවත් මෙහිදී ඇය පැවසුවාය. මේ වන විට ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ ඔස්සේ ජනතාවට වඩාත් වැඩි ප්‍රතිලාභ ලැබෙනු ඇතැයි තමා අපේක්ෂා කරන බවද ඇය වැඩිදුරටත් පැවසුවාය.

# සිරියා අර්බුදය තරමක් විසඳෙයි

සිරියාවේ සිදුවූ බව පවසන රසායනික අවි ප්‍රහාරයත් සමග එරට පවතින අර්බුදය මහත් මතභේදාත්මක තත්ත්වයකට පත්ව ඇත. 2011 වසරේ මාර්තු මාසයේ ඇරඹි සිරියානු සිවිල් යුද්ධයෙන් මේ වන විට මියගොස් ඇති සංඛ්‍යාව ලක්ෂය ඉක්මවා ඇතැයි පැවසේ. ලෝකයේ විශාලතම සරණාගත අර්බුදයද මෙම තත්ත්වය මත නිර්මාණය වී ඇති අතර සිරියානුවන් මිලියන දෙකක් පමණ මේ වන විට රට හැර ගොස් ඇතැයි පැවසේ. ඊට අමතරව තවත් මිලියන හතරකට අධික පිරිසක් රට තුළම අනාථයන් බවට පත්ව ඇති බවද වාර්තා වේ.

සිරියානු අර්බුදය හමුවේ ඇමරිකාව හා රුසියාව අතරද සීතල යුද්ධයකට මුල පිරී ඇති අතර ඇමරිකාව විසින් සිරියාව වෙත රතු එළි දල්වමින් හමුදාමය ක්‍රියාදාමයකට සූදානම් වෙමින් සිටින බව පසුගියදා පළවූ වාර්තාවල සඳහන් විය. මේ පිළිබඳව අදහස් දැක්වූ ඇමරිකානු රාජ්‍ය ලේකම් ජෝන් කෙරී පවසා සිටියේ සිරියාවේ සිදුවූ රසායන අවි ප්‍රහාරයත් සමග ලෝක ප්‍රජාවගේ ඉවසීමේ සීමාව ඉක්ම ගොස් ඇති බවයි. මෙම අවස්ථාවේදී ලෝක ප්‍රජාව විසින් සිරියාවට එරෙහි පියවරක් නොගතහොත් එය වසර සියයක අන්තර්ජාතික ප්‍රමිති කඩකිරීමකදී නිහඬ වීමක් විය හැකි බවද ඔහු පවසා සිටියි. මෙහිදී යුදමය විසඳුමකට වඩා අන්තර්ජාතික ප්‍රමිතිවලට සිරියාව අනුගත කර ගැනීමකට යාම සුදුසු බව ඔහුගේ අදහස විය.

සිරියාව වෙත ඇමරිකාව කරන මෙම බලපෑම් හමුවේ නිහඬ වීමට රුසියාවද සූදානම් නැත. මේ පිළිබඳ අදහස් දැක්වූ රුසියානු ජනපතිවරයා පැවසූයේ ප්‍රහාරයක් එල්ල වුවහොත් සිරියාවට සහාය පළ කරන බවයි. ජනපතිවරයා මේ බව ප්‍රකාශ කර ඇත්තේ පසුගියදා පැවති ජී 20 සමුළුවේ මාධ්‍ය හමුවකදීයි. රුසියාව විසින් සිරියාවට අවිආයුධ ලබා දී ඇති බවත් එරට සමග ආර්ථික සහයෝගිතාව පවත්වාගෙන යන බවත් ජනපති ව්ලැදිමීර් පුටින් එහිදී වැඩිදුරටත් පවසා ඇත.

සිරියානු අර්බුදය පිළිබඳ අදහස් දක්වන ඇමරිකානු ජනාධිපති ඔබාමා පවසා ඇත්තේ සිරියාව සතු රසායනික අවි අන්තර්ජාතික පාලනයකට යටත් කරන්නේ නම් සිරියාව කෙරෙහි හමුදාමය පියවර ගැනීම අත්හිටුවන බවයි. කෙසේ වුවත් ඔවුන් එයට එකඟ වේදැයි යන්න සැක සහිත බවද ඇමරිකානු ජනාධිපතිවරයා පවසා ඇත.

මේ අතර වාර්තා වන අලුත්ම තත්ත්වයට අනුව තමා සතු රසායන අවි ජාත්‍යන්තර ප්‍රජාව වෙත භාරදීමේ විසඳුමට සිරියානු රජය එකඟ වූ බව පැවසේ. රුසියානු විදේශ ඇමතිවරයා සමග පැවති සාකච්ඡාවකින් අනතුරුව මෙම යෝජනාවට එකඟත්වය පළ කිරීමට සිරියානු රජය පියවර ගෙන ඇත. ඇමරිකානු ආක්‍රමණයකට පවතින ඉඩකඩ ඇහිරීම සඳහා මෙම තීරණයට එළඹි බව සිරියානු විදේශ අමාත්‍යවරයා පවසා ඇත.

කෙසේ වුවත් නුදුරු අනාගතයේදී මෙම එකඟත්වය ක්‍රියාත්මක වීම කෙතෙක් දුරට සාර්ථක වේදැයි ලෝකයම විමසිලිමත්ව බලා සිටිනු ඇත.




# ජාත්‍යන්තර ළමා සාම ත්‍යාගය මලාලාට

තලේබාන් සටන්කරුවන්ගේ වෙඩි ප්‍රහාරයකට ලක් වූ පාකිස්තානු ජාතික ශිෂ්‍ය ක්‍රියාකාරිනියක වූ මලාලා යුසුෆ් සායි වෙත මෙවර ජාත්‍යන්තර ළමා සාම ත්‍යාගය පිරිනැමීමට නියමිතව ඇත. දහසය හැවිරිදි මලාලා ගැහැනු ළමයින්ගේ අධ්‍යාපන අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැඟීම වෙනුවෙන් මෙවර සාම ත්‍යාගය සඳහා සුදුසුකම් ලබා ඇත.

නෙදර්ලන්තයේ ළමා අයිතිවාසිකම් පදනම විසින් පිරිනමනු ලබන මෙම සම්මානය සඳහා 2011 වසරේදීද මලාලාගේ නම නිර්දේශ වී ඇත. මෙවර කිසිදු නිර්දේශයකින් තොරවම එය මලාලාට ලබා දීමට නෙදර්ලන්ත ළමා අයිතිවාසිකම් පදනම ඒකමතිකව තීරණය කර ඇති අතර ලබන මස 06 වන දින නෙදර්ලන්තයේ පැවැත්වෙන උළෙලකදී 2011 වසරේ නොබෙල් සාම ත්‍යාගලාභිනී තවක්කුල් කාමල් අතින් මලාලා වෙත මෙම සම්මානය පිරිනැමීමට කටයුතු යොදා ඇත.

# 2020 ඔලිම්පික් ජපානයේ

2020 වසරේදී පැවැත්වීමට නියමිතව ඇති ඔලිම්පික් හා පැරාලිම්පික් තරඟ සඳහා සත්කාරක රට වශයෙන් ජපානයේ ටෝකියෝ නගරය තෝරාගෙන ඇත. සත්කාරක රට තෝරාගැනීම සඳහා ආර්ජන්ටිනාවේ බුවනෝස් අයර්ස් නගරයේදී පැවති ඡන්ද විමසීමේදී තුර්කියේ ඉස්තාන්බුල් නගරය පරදා එම ස්ථානය හිමිකර ගැනීමට ටෝකියෝව සමත් වී ඇත.

2020 ඔලිම්පික් සඳහා ටෝකියෝ වෙනුවෙන් ඡන්ද 60 ක් ලැබුණු අතර ඉස්තාන්බුල් සඳහා ලැබී තිබුණේ ඡන්ද 36 ක් පමණි. මේ සඳහා ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නගරයද ඉදිරිපත්ව සිටි අතර එය පළමු ඡන්ද විමසීමෙන්ම පරාජයට පත් විය.

2016 දී බ්‍රසීලයේ රියෝ ද ජෙනයිරෝ නුවර පවත්වනු ලබන මීළඟ ඔලිම්පික් උළෙලේදී නිල වශයෙන් 2020 ඔලිම්පික් උළෙලෙහි සත්කාරකත්වය ජපානය වෙත පිරිනැමීමට නියමිතය.

1964 වර්ෂයේදී ප්‍රථම වතාවට ඔලිම්පික් සත්කාරකත්වය හිමිකරගත් ජපානය ඉන් වසර 56 කට පසු මෙම අසිරිමත් අවස්ථාව හිමිකරගෙන ඇත. ඒ අනුව ඔලිම්පික් සත්කාරකත්වය දෙවරක් හිමිකරගත් පස්වන රට බවටද ජපානය පත් වෙනු ඇත.

1 වන පිටුවෙන්

## විදේශ කටයුතු ...

වීසා බලපත්‍ර පිළිබඳ කටයුතු මෙම නිලධාරීන් හරහා සිදුකෙරෙන අතර, 2013 නව පාසල් වාරය ඇරඹී ඇතත් මේ වන විටත් ඇතැම් ඉල්ලුම් පත්වලට කිසිදු ප්‍රතිචාරයක් නොලැබී ඇති අතර බොහෝ දෙනෙක් මේ හේතුවෙන් දැඩි කණස්සල්ලට පත්ව සිටිති. මේ සිසුන් අතර අලුතින්ම කැනඩාවේ අධ්‍යාපනය හැදෑරීමට පැමිණෙන්නන් මෙන්ම කැනඩාවේ අධ්‍යාපනය හදාරමින් සිට වීසා කාලය දීර්ඝ කරගැනීම සඳහා බලාපොරොත්තු වන්නන්ද රැසක්ම සිටින බව වාර්තා වේ. මේ පිළිබඳව අදහස් දක්වන විදේශ සේවා නිලධාරීන්ගේ වෘත්තිය සංගමයෙහි (Professional Association of Foreign Service Officers-PAFSO) ප්‍රකාශකයකු මෙසේ පැවසීය.

'වීසා නිකුත් කිරීම සාමාන්‍ය අන්දමට වඩා පමා වුවත් අධ්‍යයන කටයුතු සඳහා නිකුත් කරන වීසා බලපත්‍ර සඳහා අපි ප්‍රමුඛත්වය දීමට කටයුතු කර තියෙනවා'

ශිෂ්‍ය වීසා බලපත්‍රවලට අමතරව කැනඩාව වෙත ලබාදෙන සියලුම වීසා බලපත්‍රයන්හි ප්‍රමාදයක් පවතින බව වාර්තා වෙයි. කැනඩාවේ සංචාරක ව්‍යාපාරය ඇතුළු බොහෝ ක්ෂේත්‍රයන් සඳහා මෙම ගැටලුව සෘජුවම බලපා ඇති බවද පැහැදිලි කරුණකි.

මේ වන විට ප්‍රංශයේ පැරිස්, එක්සත් ජනපදයේ ලන්ඩන්, රුසියාවේ මොස්කව්, ඊජිප්තුවේ කයිරෝ, අබුඩාබි, සවුදි අරාබියේ රියාද්, තුර්කියේ අන්කරා, චීනයේ බීජින් සහ ෂැන්හයි, ඉන්දියාවේ නවදිල්ලි සහ චන්දිගාර්, හොන්කොං, පිලිපීනයේ මැනිලා, බ්‍රසීලයේ සාවෝපාලෝ, මැක්ෂිකෝ යන රටවල්වල ඉහත නගරවල පිහිටි වීසා කාර්යාලවල නිලධාරීන් මෙම වැඩ වර්ජනයට එක් වී ඇත.

## CT scans, ...

බොහෝ විකිරණ පරීක්ෂාවන්හි ප්‍රතිඵල පිළිබඳ සැලකිලිමත් වීමේදී ඒවායෙහි යම් වරදක් සිදුවී ඇති බවට සැකයක් ඇති වීම මත මෙම නැවත පරීක්ෂාව සිදුකිරීමට තීරණය කර ඇත. එහිදී රෝගීන් බොහෝ දෙනෙකුට ලැබී තිබූ ප්‍රතිඵලය වූයේ 'කිසිදු රෝගී ලක්ෂණයක් නොමැති' බවටය. මෙම රෝගීන් අතර සිටි මිසිසාගා ප්‍රදේශයේ පදිංචි පෙණහලු පිළිකාවෙන් පෙළෙන්නෙක් වෙතද ලැබී තිබූ විකිරණ ප්‍රතිඵලය වූයේ කිසිදු ආබාධයක් නොමැති බවටය.

මෙම වරද සිදුව ඇත්තේ එම පරීක්ෂාවන් සිදුකළ විකිරණවේදීන් අතින් බවට සැක පළ වී ඇති අතර එම විකිරණවේදීන්ගේ සේවය අත්හිටුවා ඒ පිළිබඳ පරීක්ෂණ කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතී.

මේ සම්බන්ධයෙන් රෝගීන් මුහුණ පා ඇති දුෂ්කරතා වෙනුවෙන් සමාව අයදින ට්‍රිලියුම්, රෝගීන්ට හා සියලු මහජනතාවට තම රෝහල් පද්ධතීන්හි සේවය උපරිම ලෙස ලබාදීම වෙනුවෙන් සෑම විටම ක්‍රියාත්මක වන බවද පවසා සිටියි.

## සතුටින්ම සිටින්නන් ...

සිටින ජනයා වෙසෙන රටවල් වෙයි. සතුටින් සිටින ජනයා අතර ඇමරිකා එක්සත් ජනපදයට හිමිව ඇත්තේ 17 වන ස්ථානය වන අතර එක්සත් රාජධානිය 22 වන ස්ථානයටත්, ජපානය 43 වන ස්ථානයටත්, චීනය 93 වන ස්ථානයටත්, ඉන්දියාව 111 වන ස්ථානයටත්, ශ්‍රී ලංකාව 137 වන ස්ථානයටත් පත්ව ඇත. ලෝකයේ ප්‍රීතියෙන්ම සිටින ජනතාව වෙසෙන රටවල් අතරින් අවසානයටම සිටින්නේ ටෝගෝ රාජ්‍යයයි.

## සේතු සමුද්‍රම් ...

සංරක්ෂණ සංවිධානයක් විසින් නැවතත් පෙන්වා දී ඇත. සේතු සමුද්‍රම් ඇළ මාර්ගය ඉදිකළහොත් සිදුවන ආර්ථික වටිනාකමට වඩා වැඩි විනාශයක් ඇති විට හැකි බව එම සංවිධානය අනතුරු හඟවා සිටී.

Coastal Action Network CAN ලෙසින් හැඳින්වෙන මෙම පරිසර සංවිධානය වැඩිදුරටත් පවසන්නේ ලෝක භූ විද්‍යාත්මක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති ආදම්ගේ පාලම(රාම් සේතු) මෙම ව්‍යාපෘතිය නිසා විශාල වශයෙන් හානි සිදුවිය හැකි බවයි. එපමණක් නොව මෙම මුහුදු කලාපයේ වෙසෙන විවිධ ජෛව විවිධත්වයන්ටද මෙය සෘජුවම බලපාන අතර එයින් මෙම කලාපයේ වෙසෙන සත්ව කොටස් වඳ වී යාමේ තර්ජනයද පවතියි. මන්නාරම බොක්කේ මුහුදු පතුලටද දැඩි හානි සිදුවිය හැකි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවහොත් සුනාමි වැනි ව්‍යසනයකදී ශ්‍රී ලංකාව දැඩි අපහසුතාවකට පත්විය හැකි බවද හෙළි වී ඇත.

මෙම මාර්ගය වෙනුවට වෙනත් විකල්ප මාර්ගයන් යොදා ගනිමින් සේතු සමුද්‍රම් ව්‍යාපෘතිය අතහැර දැමිය යුතු බවට තමිල්නාඩු රජය ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණයටද මේ වන විට දැනුම් දී ඇත. ඒ අනුව සේතු සමුද්‍රම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට එරෙහිව ඉන්දීය ජනතා පක්ෂයේ නායක සුබ්‍රමනියම් ස්වාමි මහතා විසින්ද එරට ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පෙත්සමක් ගොනු කර ඇත. මේ පිළිබඳ අදහස් දැක්වූ ඉන්දීය බලශක්ති සහ සම්පත් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් පචාවුරි මහතා පවසා ඇත්තේ සේතු සමුද්‍රම් ක්‍රියාත්මක කරනවාද නැද්ද යන්න තීරණය කළ යුත්තේ ඉන්දීය මධ්‍යම රජය බවයි. මේ අතර සේතු සමුද්‍රම් ව්‍යාපෘතියේ වැදගත්කම සහ එය වහාම ක්‍රියාත්මක කිරීමට ඇති අවශ්‍යතාව පිළිබඳ ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ දිවුරුම් ප්‍රකාශයක් කරන බව ඉන්දීය මධ්‍යම රජයේ නාවික අමාත්‍යවරයා විසින් පවසා ඇත.

ව්‍යාපෘතිය පිළිබඳ තමිල්නාඩුවේ මතු වී ඇති ගැටලු විසඳීම ඔහුගේ අරමුණ වන අතර මෙම ව්‍යාපෘතිය මගින් ඉන්දියානු ආර්ථිකයට මෙන්ම තමිල්නාඩු ප්‍රාන්තයේ ආර්ථිකයටද විශාල වාසි අත්වෙන බව ඔහු පවසයි.

## කච්චතිවු ...

වසරවලදී ඇති වූ ඉන්දු ලංකා ගිවිසුම් ව්‍යවස්ථානුකූල නොවන බව එම පෙත්සම පෙන්වා දී තිබුණි. මෙහිදී කිසිදු විටෙක ඉන්දියාවට අයත් භූමි ප්‍රදේශයක් ශ්‍රී ලංකාවට පවරා දීමක් සිදු වී නොමැති නිසා එම දූපත ශ්‍රී ලංකාවට අයත් වීම පිළිබඳ කිසිදු ගැටලුවක් නොමැති බව ඉන්දීය මධ්‍යම රජය පවසයි. 1976 වසරේදී ඓතිහාසික හා නීතිමය ප්‍රතිපාදන සියල්ල සලකා බලා කච්චතිව් දූපත පිළිබඳ ගැටලුව සම්බන්ධව එකඟතාවයකට පැමිණ ඇති බවත් එවන් තත්ත්වයක් යටතේ කච්චතිවු දූපත ශ්‍රී ලංකාවට පවරා දීමක් සිදුකළේ යැයි පවසා සිටීම වැරදි මෙන්ම නිල වාර්තාවලට පටහැනි බවත් ඉන්දීය මධ්‍යම රජය අධිකරණයට දන්වා ඇති අතර මේ කරුණු සැලකිල්ලට ගෙන අදාළ පෙත්සම නිෂ්ප්‍රභ කරන ලෙසද අධිකරණයෙන් ඉල්ලා ඇත.

දසත Dasatha
2013 සැප්තැම්බර් September 2013
Published by - Dasatha Publications
**Publisher** - Gamini Abeysinghe
**Consultant Editors** - Sirisena Vithanage
(Well known Writer, Ex Additional secretary,
Ministry of Education)
**Editor in Chief** - Chamari Abeysinghe
**Veteran Journalist** - Sujeewa Disanayake
(Ex Chief Editor Silumina News Paper)
**Associate Editors** - Nandana Prasadh
**Graphic Design & Layout** - Sampath Ranaweera
**Creative graphics** - Jagath Hewapanna
**Web Master** - Dhanushka Bandara
114 Chatfield Dr . Woodbridge
L4H 0Z7. Ontario. Canada
**Telephone :** 416 822 2789
**Fax :** 289 553 5668
**E-Mail :** dasathainfo@gmail.com
**Website :** www.dasatha.com

# සාහිත්‍ය මාසය අරුත් බර කරන්නට නම්....

මේ ජාත්‍යන්තර සාහිත්‍ය මාසයයි. මේ මාසය තුළ ලොව සෑම රටකම සාහිත්‍යය වෙනුවෙන් උත්සව පැවැත්වෙයි. සාහිත්‍ය සම්මන්ත්‍රණ, සාහිත්‍යධරයින්ට සම්මාන පිරිනැමීම්, නව සාහිත්‍ය කෘතීන් වැඩි වැඩියෙන් නිකුත් වීම් වැනි දෑ මේ මාසය තුළ නිමක් නැතිව සිදුවේ. එහෙත් සාහිත්‍යයෙහි අරුත කුමක්ද යන්න ලේඛක, පාඨක, විචාරක බොහෝ දෙනෙකුට අමතකව ඇති බව නම් නොරහසකි.

පෙරදිග විග්‍රහයට අනුව සකු පඬිවරුන් සාහිත්‍යය යනුවෙන් හැඳින්වූයේ 'සාහිත්‍යය යනු සහිත බවය' (සහිතශ්‍ය භාවෝ සාහිත්‍යම්) යනුවෙනි. ඔවුන් කී මේ සහිත බව කුමක්ද? එකී සහිත බව දෙයාකාර වෙයි. එකක් නම් සාහිත්‍යය ජීවිතය අර්ථවත් කරවන්නක් විය යුතුය යන්නයි. සාහිත්‍යය තුළින් මිනිස් ජීවිතයට උසස් ජීවිතාර්ථයන් ලබාදිය යුතුය යන්නයි. මිනිස් ජීවිතවලට සාහිත්‍යයෙන් තරම් උසස් අරුත් එක් කළ හැකි අන් කිසිවක් නොමැති බවද ඔවුහු පෙන්වා දුන්හ. දෙවැන්න නම් ජීවිතය වින්දනාත්මක කරවන්නක් විය යුතුය යන්නයි. තවත් ලෙසකින් කිවහොත් ජීවිතය රස භාවයන්ගෙන් පිරවිය යුතුය යන්නයි.

අපරදිග සාහිත්‍ය විග්‍රහයෙහි මෙහි කී පළමුවැන්න සුපැහැදිලිව සඳහන් නොවේ. ඔවුන් දැක්වූයේ සාහිත්‍ය වැනි කලා කෘතීන් සෞන්දර්යවාදී විය යුතු බව පමණකි. තවත් ලෙසකින් කිවහොත් සාහිත්‍ය වැනි කලාවන්ගෙන් මිනිසාට ලබාගත හැක්කේ සෞන්දර්යාත්මක(වින්දනාත්මක) අත්දැකීම්(Aesthetics experiences) බවය.

කෙසේ වෙතත් වර්තමාන ලෝකය ගැන සලකන කල සාහිත්‍යය මගින් මේ දෙකරුණම සමබරව ඉටු විය යුතුයි යන්න අවධාරණය කිරීමට සිදුව ඇත. වර්තමාන පාතාල ලෝකය, සිරමැදිරි, දාමරික ක්‍රියා ආදි මිනිස් ජීවිතය බේදයට හෙළන අවස්ථා ගෙන කළ පරීක්ෂණවලදී හෙළි වූ කරුණක් නම් එබඳු පුද්ගලයින් සාහිත්‍ය, කලා ආදියෙන් ඈත් වූවන් බවයි. තිරිසනුන් හික්මවීමට යම් යම් උපක්‍රම භාවිත කරන්නාක් මෙන් මිනිසුන් හික්මවීමට භාවිත කළ හැකි හොඳම උපක්‍රමය ලෙස ජී. බී. සේනානායකයන් හැඳින්වූයේ සාහිත්‍යයයි. එසේ නම් සාහිත්‍යය ගොඩනගන්නවුන් විසින් සාහිත්‍යය මගින් කුමක් හෝ කීම නොව මිනිස් ජීවිත අර්ථවත් කරන්නක්ම කිව යුතු බව තේරුම් ගත යුතු කාලය එළඹ ඇත. බොළඳ ප්‍රේමය, කාමයම සාහිත්‍යයේදී විෂය ක්ෂේත්‍රය කරගන්නා නිර්මාණ කරුවන් විසින් තමන් නොදැනුවත්වම පාතාලයට, හිරමැදිරියට, දාමරිකකමට අනුබල දෙන බව වටහා ගත යුතු කාලය එළඹ ඇත.

බටහිර සෞන්දර්යවාදය තුළින්ද අවධාරණය කරනුයේ මිනිස් ජීවිත වින්දනාත්මක කොට මිනිසුන්ගේ රළු පරළු ගති ඉවත් කොට මිනිසුන් සෞම්‍ය, සුන්දර මිනිසුන් කිරීම යැයි වරක් ජෝන් ඩුවි නමැති මනෝවිද්‍යාත්මක විචාරකයා පෙන්වා දුන්නේය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව තුළ සිංහලයෙන් බිහි වන, සම්මාන ලබන බහුතරයක් කෘති තුළ දහසකුත් එකක් මිනිස් අත්දැකීම් පසෙක තිබියදී ප්‍රේමයට හා කාමයට මුල් තැන දෙන බවක් පෙනී යයි. බොහෝ රුසියානු සාහිත්‍ය කෘතීන් සහ ඇතැම් බටහිර සාහිත්‍ය කෘතීනුත් අචෙබේ, හාමාටූමා වැනි අප්‍රිකානු සාහිත්‍යකරුවන්ගේ කෘතීනුත් පරිශීලනයෙන් තම පටු සීමාවන්ගෙන් ඈත් වීමට සිංහල නවකතා කරුවන් හා කෙටිකතා කරුවන් උත්සාහ ගන්නේ නම් එය සිංහල සාහිත්‍යයේ උන්නතියට විශාල මෙහෙයක් ඉටුකරනු ඇති බව සාහිත්‍ය මාසය අර්ථවත් කිරීමට එයම ප්‍රමාණවත් වන බව සඳහන් කරනු කැමැත්තෙමු.

# පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව හා අපේ ආර්ථිකය

යුද ජයග්‍රහණයෙන් පසු රට තුළ උදා වී පවතින නිදහස් හා සාමකාමී වාතාවරණය නිසා රටේ ඉදිරි ගමන සාර්ථක කර ගැනීමට ලැබී ඇති අවස්ථා බොහෝය. මේ අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් රටට, රටේ ආර්ථිකයට උපරිම ප්‍රතිලාභ උදාකර ගැනීමට අප වෙහෙස විය යුතු වේ. මෙවන් පසුබිමක් තුළ මේ වසරේ නොවැම්බර් මස ශ්‍රී ලංකාවේදී පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට හිමි වන්නේද වැදගත් ස්ථානයකි. මේ සමුළුවට දැන් රජය සූදානම් වෙමින් සිටී. මේ සඳහා අපගේ ඇති නිසි පෙර සූදානම මෙවර සමුළුව සාර්ථක කර ගැනීමටත්, සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම නිසා අප රටට ලබාගත හැකි වාසි උපරිම කර ගැනීමටත් ඉවහල් වේ. සමුළුවේ සංවිධාන කටයුතුවල පෙරමුණ ගෙන කටයුතු කරන ආර්ථික සංවර්ධන ඇමැති බැසිල් රාජපක්ෂ මහතා මේ ලියුම්කරුට ප්‍රකාශ කළේ සමුළුව සාර්ථක කර ගැනීම සඳහා කමිටු රාශියකින් අදාළ සංවිධාන කටයුතු කරමින් හොඳ පෙර සූදානමකින් යුතුව කටයුතු කරමින් සිටින බවයි. සමුළුව වෙනුවෙන් අප දරන වියදම නාස්තියක් නොවී රටේ හෙට දවස වෙනුවෙන් මහඟු ආයෝජනයක් වනු ඇත්තේද සමුළුව සාර්ථක කර ගැනීම සඳහා අප විසින් හොඳ පෙර සූදානමකින් කටයුතු කළහොත්ය. මේ පසුබිම තුළ පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට ඇති අපේ පෙර සූදානම පිළිබඳව අපි මේ ලිපියෙන් අවධානය යොමු කරමු.

මෙහි ප්‍රධානතම අංගය වන්නේ රාජ්‍ය නායකයන්ගේ සහ විදේශ ඇමැතිවරුන්ගේ සම්මේලනයයි. මේ සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල් 54 ක් නියෝජනය කරමින් රාජ්‍ය නායකයන් සහ විදේශ අමාත්‍යවරුන් සහභාගි වීමට නියමිතය. මෙය වෝටර්ස් එජ් හෝටලයේදී පැවැත්වෙන නිසා එම හෝටලය අවට බත්තරමුල්ල ප්‍රදේශයේ මේ වන විට බෙහෙවින් අලංකාරවත්ව විශාල වෙනසකට භාජනය වී ඇත. සමුළුව ළං වන විට එම ප්‍රදේශය තවත් සංවර්ධනයට ලක් කිරීමටද රජය කටයුතු කරමින් සිටී. රටේ තත්ත්වය පිළිබඳ වැරැදි ප්‍රතිරූප මවමින් බොරු ප්‍රචාරය කරමින් රටට එරෙහිව කටයුතු කරන ද්‍රෝහී බලවේගවල ක්‍රියාකාරීත්වය හමුවේ රටේ ප්‍රතිරූපය ඉහළ නංවා ගැනීමට මෙන්ම රට පිළිබඳ නිවැරැදි තත්ත්වය ලෝකයට ප්‍රකාශ කිරීමටද මේ සමුළුව අපට ලැබුණු මහඟු අවස්ථාවකි. ඒ නිසා එම අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට අප ක්‍රියා කළ යුතු වේ. මෙය රජය විසින් සංවිධානය කරමින් සිටියත් මෙය රජයේ වැඩක් පමණක් නොව රටේ වැඩකි. මේ සමුළුව සාර්ථක කර ගැනීම සඳහා සෑම පාර්ශ්වයකගේ ම සහාය වැදගත් වන අතර එය ලබා ගැනීම මෙන්ම සමුළුව රටේ පැවැත්වීමේ ප්‍රතිලාභ ගැන මහජනයා දැනුවත් කිරීමටද රජය ක්‍රියා කළ යුතු වේ.

සමුළුවෙන් පොදුවේ රටේ කීර්තිය හා ප්‍රතිරූපය ඉහළ නංවා ගැනීමට ලැබෙන අවස්ථාවට අමතරව රටට ලබා ගත හැකි ආර්ථික ප්‍රතිලාභද බොහෝමයකි. විශේෂයෙන් ව්‍යාපාරික සමුළුව හරහා අපගේ විදෙස් ආයෝජන ඉහළ නංවා ගැනීමට, සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට සහ ජාත්‍යන්තර වෙළෙඳ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට ලැබෙන ඉඩ ප්‍රස්තාවන් හරහා අපට ආර්ථික ප්‍රතිලාභ රැසක් උදාකරගත හැකිය. සමුළුව හරහා ආයෝජන වර්ධනය කර ගැනීමේ අපේක්ෂාවන් ගැන ඇමැති බැසිල් රාජපක්ෂ මෙසේ කියයි.

'පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුවට සමගාමීව මෙරටදී පැවැත්වෙන සමුළු අතර ව්‍යාපාරික සමුළුවට ඉතා වැදගත් තැනක් හිමි වෙනවා. මේ සමුළුව ගැන ව්‍යාපාරික සමුළුවේ සංවිධායක කමිටුව විසින්ම ඒ ඒ රටවල ව්‍යාපාරික ලෝකය, ප්‍රධාන පෙළේ ආයෝජකයන් දැනුවත් කරනවා. මෙයට පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් නැති රටවල ව්‍යාපාරිකයනුත් එනවා. රාජ්‍ය නායකයන්, විදේශ අමාත්‍යවරුන් සහ ආයෝජකයන් ඇතුළු නියෝජිතයන් දහසක් පමණ අපේ රටේ පැවැත්වෙන ව්‍යාපාරික සමුළුවට සහභාගි වෙයි කියලා අපේක්ෂා කරනවා. මේ ව්‍යාපාරික සමුළුවේ අපේ ප්‍රධාන ඉලක්කයක් තමයි රාජ්‍ය අංශය තුළ පවතින ප්‍රධාන ආයෝජන අවස්ථා සඳහා ආයෝජන 5 ක් පමණ ලබා ගැනීම. ඒ සඳහා අවශ්‍ය සියලු තොරතුරු අපි කලින්ම පොදු රාජ්‍ය මණ්ඩල ව්‍යාපාරික කමිටුව හරහා අදාළ පාර්ශ්වයන්ට දැනුම් දීමට කටයුතු කරනවා. එවිට ඔවුන් නොවැම්බර් මාසෙ අපේ රටේ තියන ව්‍යාපාරික සමුළුවට එන්නෙ අපේ එම ප්‍රධාන ආයෝජන අවස්ථා ගැන දැනුවත්වයි. ඒ නිසා ඔවුන් කැමති ආයෝජන සිදුකරන්න, අපේ රටට එන එම ආයෝජකයන්ට තවදුරටත් අවශ්‍ය තොරතුරු සහ ආයෝජන සිදුකිරීමට අදාළ පහසුකම් සැපයීමට සමුළු කාලය තුළ රජය විසින් සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. මේ ව්‍යාපාරික හමුව තියෙන්නේ නොවැම්බර් 12 සිට 14 දින දක්වා කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ. එය ඉදිරිපිට තියන සංචාරක මණ්ඩලයේ අපි ආයෝජකයන්ට අවශ්‍ය සියලු පහසුකම් එකම තැනකින් සලසන One Stop Shop එකක් දානවා. එතනට සමාගම් ලේකම්ගේ සිට අවශ්‍ය හැම රාජ්‍ය අංශයක්ම සහභාගි කරවනවා. ඒ නිසා අපේ ආයෝජන අවස්ථා ගැන ආයෝජකයන්ට අවශ්‍ය තොරතුරු ලබාදීමෙන් නොනැවතී අපි ඔවුන්ට අවශ්‍ය දේ ඉටුකර ගත හැකි මධ්‍යස්ථානයක් බවට එය පත් කරනවා'

එකවර විශාල ආයෝජකයන් සහ ව්‍යාපාර ලෝකයේ දැවැන්තයන් පිරිසක් අප රටේ පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩල ව්‍යාපාර සමුළුවට සහභාගි වන්නට පැමිණීම අපට විදෙස් ආයෝජන වර්ධනය කර ගැනීමට මෙන්ම ලෝකය සමග අපේ ව්‍යාපාරික හා වෙළෙඳ ප්‍රජාවට සම්බන්ධ වීමටද ලැබුණු හොඳ අවස්ථාවකි. මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට ක්‍රියා කිරීම රජයේ අදාළ අංශවල මෙන්ම අපේ ව්‍යාපාර හා වෙළෙඳ ප්‍රජාවගේද වගකීමකි. විදේශ කටයුතු අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශවලට මෙන්ම ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා සංචරණය වැනි ආයතනවලටද මෙහිදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකිරීමට තිබේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අපගේ ආයෝජන අවස්ථා පිළිබඳ විස්තර ඇතුළත් පොතක් දැනටමත් පිළියෙල කර ඇති අතර ශ්‍රී ලංකා සංචරණය විසින්ද අපේ සංචාරක ක්ෂේත්‍රය ගැන උනන්දු ආයෝජකයන් ඉලක්ක කර ගනිමින් සංචාරක ආයෝජන පිළිබඳ මාර්ගෙ ්පදේශයක් පිළියෙල කරමින් තිබේ. මේවා පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සමුළුවට සහභාගි වන නියෝජිතයන්ට බෙදා දීමට නියමිතය. මේ විස්තර අනුව ව්‍යාපාරික සමුළුව පැවැත්වෙන කාලය තුළ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය ඉදිරිපිට ඇති සංචාරක මණ්ඩලය තුළ පිහිටුවනු ලබන ආයෝජකයන්ට පහසුකම් සලසන මධ්‍යස්ථානය වෙත ගොස් මෙරට ආයෝජන සිදුකිරීමට අවශ්‍ය වෙනත් කටයුතුද ඉටුකර ගත හැකිය. ආයෝජන ආකර්ෂණය කර ගැනීමට මෙවැනි වැඩපිළිවෙළක් දියත් කිරීම ඉතාමත් අවශ්‍යය. පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය නායක සමුළුව වෙනත් රටවල පැවති අවස්ථාවලදී එම රටවලටද විශාල ආයෝජන ප්‍රමාණයක් ආකර්ෂණය කර ගත හැකිව තිබේ.

මීළඟට අපගේ අවධානය යොමු කළ යුතු වන්නේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනයට මෙම සමුළුව ඉවහල් කර ගන්නේ කෙසේද

19 වන පිටුව බලන්න

**ශ්‍යාම් නුවන් ගණේවත්ත**

# බස මියැදුණු කල දෙස කොයින්ද?

ඒ කුමක් වුවත් ඒ පිළිබඳ විනිශ්චයකට අපි ඉදිරිපත් නොවන්නෙමු.

සිංහල භාෂා භාවිතය පිළිබඳව බොහෝ විද්වතුන් තුළ තිබෙන දොම්නස පදනම් විරහිත එකක් නොවේ. එහෙත් සිංහල භාෂාව කෙලෙසමින්ද විකෘති කෙරෙමින්ද සිදුවන භාෂා සංහාරය පිළිබඳව ප්‍රාමාණික අවධානයක් යොමු වන බවක්ද කිව නොහැක. ජනාධිපතිවරයකු විසින් 'සාහිත්‍යය කන්ඩ'දැ යි ඇසූ රටක 'භාෂාව ගිනි තපින්ටදැ' යි ඇසීමටද බැරි නැත. එහෙත් සිංහල බහුතරයක් ජීවත් වන, සිංහලය රාජ්‍ය භාෂාවක් ලෙස සම්මත වූ රටක ඒ බසට නිසි ගෞරවයක් නොලැබේ නම් එය බලවත් අපරාධයකි.

මුනිදාස කුමාරතුංගයෝ 'දෙස, බස, රැස' යැයි තුන් රුවනක් දැක්වූහ. එතුමන් ජීවත් වූ යුගයේදී මෙන්ම ඉනික්බිතිවද භාෂාව සම්බන්ධයෙන් යොමු වූ අවධානය කෙබඳුදැයි එයින්ම ගම්‍ය වේ. බස නසන අයට එදා වියතුන්ගෙන් බැට වැදුණු අයුරුද ඒ අතීතය විමසන කවරකුට වුවද දැන මැන ගත හැකිය.

අද අප ජීවත්වන යුගය එක් අතකින් අමුතුම අගැයීම් හා ආකල්පවලින්ද පිරුණු එකකි. බස තබා දෙස හෙවත් තම මාතෘභූමිය පිළිබඳ පවා නොතකන අය කොපමණ සිටිත්ද? දේශ ප්‍රේමිත්වයට වඩා දේශ ද්‍රෝහීත්වය ලාභ ලබන මගක් කර ගත් නිවටයෝ කොතරම් සිටිත්ද? එහෙත් අපට නම් හැඟෙන්නේ දේශ ප්‍රේමිත්වය තරමටම භාෂා ප්‍රේමිත්වයද අත්‍යවශ්‍යම කරුණක් බවය. බස මියැදුණු කල දෙස කොයින්ද?

භාෂාව යනු මානව සංස්කෘතියේ විශිෂ්ටතම නිෂ්පාදනයකි. මානව සමාජය සම්බන්ධ කරන්නා වූද එහි පැවැත්ම තහවුරු කරන්නා වූද ප්‍රධානම උපකරණයක් හෙවත් මෙවලමක් ලෙස භාෂාව හැඳින්විය යුතු යැයි සන්නිවේදන විශේෂඥයෝ අවධාරණය කරති. මිනිසාගේ හැඟීම් ප්‍රකාශ කිරීමට භාෂාව වුවමනාය. සතුන් අතරද භාෂාවක් තිබේ. එහෙත් එය මිනිස් භාෂාවක් මෙන් නිර්මාණාත්මක එකක් නොවන බවද කියති. කිසියම් සතකු තුළ ඇතිවන බිය, කෝපය, ශෝකය යනාදී භාවයන් ප්‍රකාශ කිරීම සඳහා නඟන හඬ අපි හඳුනමු. මිනිස් භාෂාවන් තුළද ඒ ලක්ෂණය තිබේ. එහෙත් මිනිස් භාෂා ඊට වඩා වර්ධනීය ඒවා බව භාෂා පර්යේෂකයන්ගේ පිළිගැනීමය.

මේ අනුව හෙළ බස මෙන්ම එහි නිවැරැදි භාවිතය පිළිබඳවද කිසිවකුට නොසලකා සිටිය හැකිද? පැරැණි පඬිවරුන් විසින් මේ පිළිබඳව කරන ලද විශේෂ අවධානය තහවුරු කෙරෙන උධෘතයක් මෙසේය. සියබස්ලකර නම් සාර ග්‍රන්ථයෙහි මේ අවධාරණය කොතරම් රමණීයදැයි බලනු මැනවි.

**ගවඟන වේ පසස් - නදා බස් කර සකස්**
**පිය සුවහට අන්හට - ගව බැව්ම හුදු සාදා**

'භාෂාව නිසි ලෙස භාවිත කරන අයට එය සිතූ පැතූ සම්පත් සාදා දෙන සුරබි දෙනක් වැන්න. එහෙත් එය නිසි ලෙස නොයොදන අයගෙන් පළවන්නේ හුදෙක් මුග්ධභාවය (ගොන් බව) පමණි' යන්න එහි අරුතයි

අද බොහෝ විට ඇසෙන එක් විවේචනයක් නම් භාෂා සාහිත්‍ය කේන්ද්‍රයන් විය යුතු විශ්වවිද්‍යාල පිරිහෙමින් තිබෙන බවය. ශාස්ත්‍රඥයන්ගෙන් ඒවා හිස් වෙමින් තිබෙන බවය. 'අද ශ්‍රී ලංකාවේ කිසිදු විශ්වවිද්‍යාලයක සිංහල භාෂාව පිළිබඳව විශාරදයෝ නොවෙති' යි මහාචාර්ය සුචරිත ගම්ලත්හු විවෘත චෝදනාවක් නැගූහ. ජනමාධ්‍ය ඇතුළු සකල විධ සිංහල ලේඛනය බොහෝ විට සදොස් හා නීරස බවද තවත් විද්වත්හු කියති.

ජනමාධ්‍ය යන්නට අපද අයත් වන නිසා භාෂා භාවිතය සම්බන්ධයෙන් විශේෂයෙන් පුවත්පත් අරභයා කෙරෙන විවේචනවලදී අපටද මුවා විය නොහැකි බව කීමට ලජ්ජා නොවෙමු. එහෙත් අප ලියන තන්හි වියරණය රැකීමට අපි නිබඳව සැලකිලිමත් වන බවද කිව යුතුය. එය අප ගැන කෙරෙන පුරසාරමක් ලෙස නොසිතනු මැනවි. එහෙත් පුවත්පත්වල භාවිත වන බස පිළිබඳ වියතුන්ගේ විවේචන සාධාරණ බවද කිව යුතුය.

පුවත්පත්වල භාවිත වන භාෂාවට අමතරව රූපවාහිනී හා ගුවන් විදුලි නාලිකාවල භාවිත වන භාෂාව පිළිබඳවද බරපතල විවේචන තිබේ. ඇතැම් රූපවාහිනී නාලිකාවල භාෂාව සම්බන්ධයෙන් කිසිදු අවධානයක් යොමු නොවන බව අපට ද පෙනී ගිය අවස්ථා තිබේ. සිංහල හා ඉංග්‍රීසිය කලවම් වූ අච්චාරු බසක්ද අපට ඒවායින් ඇසෙයි. එෆ්. එම්. ගුවන් විදුලි නාලිකාවල තත්ත්වයද ඊටත් වඩා බිහිසුණුය.

සන්නිවේදනය හා තාක්ෂණය පුළුල්වීමත් සමඟම සන්නිවේදනය සතු අධිකාරය බිඳී යැම යහපත් දෙයක් වුවද එයින් සිදු වන්නේ අයහපතක් නම් ඒ පිළිබඳව නිහඬව සිටීම නොවටී. මේ රටේ මුල් යුගයේ තිබුණු පුවත්පත් මෙන්ම එකම විද්යුත් මාධ්‍ය වූ ගුවන් විදුලිය පිළිබඳව අදත් අපට ඇසෙන්නේ ප්‍රශංසාවන්ය. ඒවායේ සිටි විශිෂ්ට ගණයේ මාධ්‍යවේදීන් හා ගුවන් විදුලි ශිල්පීන් ගැන අපටද ඇත්තේ ඉමහත් ප්‍රසාදයකි.

විද්යුත් මාධ්‍ය ක්ෂේත්‍රය අද එකිනෙකා කපා ගන්නා යුද පිටියක්දැයි සිතෙන තරමටම තත්ත්වය භයානකය. එක් ආයතනයකින් කෙරෙන විචිත්‍රාංගයක් අවමානයට ලක් කරමින් නගන බාල වර්ගයේ සිනා අපටද ඇසෙයි. එහෙත් පොදුවේ බලද්දී මේ හැම තැනකම බස මරණ බව නම් කිව යුතුය. අද තිබෙන්නේ ගිරා පෝතක සන්නිවේදන ක්‍රමයකැයිද ඇතැම් විද්වත්හු කියති. නිවේදකයා යනු විකටයකු හෝ වාචාලයකු නොවන බව එබඳු තන්හි විරාජමානව සිටින බොහෝ විකට රූපවලට නොතේරේ. එහෙත් උන්ගේ ගොන් බවම අසනා, දකිනා අය කොපමණ සිටිත්ද?

දිනෙක රූපවාහිනී නාලිකාවක විකාශය වූ සෞඛ්‍ය ගැටලු පිළිබඳ විශේෂාංගයකට මෙබඳු ප්‍රශ්නයක් යොමු විය.

"ඩොක්ටර් ඔය ටැබ්ලට් යූස් කළොත් ප්‍රෙග්නන්ට් අයටත් සයිඩ් එෆෙක්ට් තියෙනවද?"

වෛද්‍යවරයාගේ පිළිතුර මෙය විය.

"විශේෂයෙන් ගර්භනී සමයේදී වෛද්‍ය උපදෙස් නොතකා මොනම ඖෂධයක්වත් භාවිත නොකළ යුතුයි"

වෛද්‍යවරයා සිංහල බසට දැක්වූ ගෞරවයත් ඉහත ප්‍රශ්නය යොමු කළ අයගේ හිස් බවත් මෙයින් තහවුරු නොවේද? එනිසා අද ප්‍රේක්ෂක හා ශ්‍රාවක සමාජයද උඩුයටිකුරු වී තිබෙන බවද අපට පැහැදිලිය. සිංහල අතරට ඉංග්‍රීසි දැමීමේ වසංගතය අද විද්‍යුත් මාධ්‍යවල පැතිර ගොස් තිබෙන අයුරුද කාටත් රහසක් විය නොහැක. භාෂා භාවිතය තරමටම විනාශ වී යන තවත් දෙයක් ඇත. ඒ රසඥතාවයි. මෙයට හොඳම නිදසුන ගීතයයි. නිසරු පදමාලා වාත්තු කර සංගීත භාණ්ඩවලින් නිකුත් වන ඝෝෂාවද එක් කර එයටම සරිලන සාරවිට ඇඳුම් කට්ටලවලින්ද අප අභියසට එන ගීතය කෙබඳු එකක්දැයි ඔබට සිතා ගත හැකිය. මේ වසංගතයට හසු නොවූ සංයමයෙන් යුතු නිරූපණ සහිතව එන හොඳ ගීතද ඉඳහිට හෝ අපට දැක ගත හැකිය. එහෙත් තොග පිටින් රූපවාහිනී නාලිකා මගින්ද එෆ්. එම්. නාලිකා මගින්ද තොරොම්බල් කෙරෙන්නේ කෙබඳු අවර ගණයේ ගීතද? මේ පිළිබඳව වෙනම කතා කළ යුතුය.

කෙසේ හෝ අද සිංහල භාෂාව මුහුණ දී සිටින අර්බුදයේ එක් පැතිකඩක් එසේ දැක්විය හැකිය.

මේ හැර අද නිකුත් වන බොහෝ සිංහල පොත් පත්, සඟරා යනාදිය පිළිබඳවද භාෂා භාවිතය මැනවැයි අපට කිව නොහැක. භාෂාව විච්චූරණ බඩුවක් නොවන්නා සේම එය සෙල්ලම් බඩුවක්ද නොවන බව අපගේ පිළිග ැනීමයි. භාෂාව සඳහා පොලිස්කාරයකු හෝ එබඳු මණ්ඩලයක් යොදා ගත යුතු යැයිද අපි කිසිසේත් යෝජනා නොකරමු. එහෙත් ඒ සඳහා විද්වත් සංගායනාවකට කාලය එළැඹ තිබෙන බව නම් පැහැදිලිවම පෙනේ.

**දිවයින ප්‍රධාන කර්තෘ**
**ගාමිණී සුමනසේකර**



# ගුරාගේ කොළම

පසුගිය දිනක ටොරොන්ටෝ මහා විහාරයේදී වටිනා දම් දෙසුමකට සවන්දීමට ලැබුණි. පෘථග්ජන අපට තරහ නොගෙන සිටීමට අපහසු වුවද ඉවසීම තුළින් තරහව පාලනය කරගත හැකි බවත්, අනුන්ගේ කතාවලට, වැඩවලට තරහ නොවී උපේක්ෂාවෙන් බැලිය යුතු ආකාරයක් උපහැරණ සහිතවම අසන්නට ලැබුණි. අනුන්ගේ කතා සහ ක්‍රියාකාරකම් නිසා තරහ ගන්නා අප විවිධ දේ කරයි. එකට එක කිරීම මේ අතරින් ප්‍රධානය. තරහවට ඉරිසියාවද එකතු වූ විට වැඩේ තවත් භයානකය. 'නහි වේරේන වේරානි- වෛරයෙන් වෛරය නොසන්සිඳේ' කියා කීවද එකට එක කිරීම සමහරුන්ගේ ජන්ම ගතියකි. අපේ මිතුරන්, නෑදෑයන්, අසල්වැසියන් ආදි එකී මෙකී නොකී සියලුදෙනාම මේ කියන එකට එක කිරීමට පෙළඹෙන අයුරු ඔබ කොතෙකුත් දැක ඇතැයි මට සිතේ. සමහරුන්ට එකට එක කිරීම නැතුවම බැරිය. ඔවුන් සතුටුවන්නේ එකට එක කිරීමෙනි. අනුන්ට රිදවීමෙනි. එසේ නොකර ජීවිතයක් ඔවුනට නැත. එකට එක නොකෙරුවොත් හරියට නොකෑවා වගේය. ඉතා සුළු අතපසු වීමක් පවා මහ ලොකු දෙයක් සේ සලකයි. කෙන්ද කන්ද කර ගනී.

එකට එක කිරීමත් මට හිතෙන හැටියට ආකාර දෙකකි. එක් විදියක් නම් තව කෙනෙකුට සෙකන්ඩ් නොවී සිටීමට කැපී පෙනීමට අනෙකා කරන හැමදේම කිරීමයි. අල්ලපු ගෙදර කෙනා හෝ මිත්‍රයා හෝ ඥාතියා අලුත් වාහනයක් ගතහොත් අලුතෙන් යමක් ගෙනාවොත් තමනුත් ඒ දේම කරයි. දානයක් දුන්නොත් තමන්ද දානයක් දෙයි. එයාට පුළුවන් නම් මට බැරි මොකද කියා සිතයි. මෙහි ඇත්තේ එකට එක කිරීමේ තරඟයයි. තමන්ට හැකියාව ඇත්නම් අනුන් දෙස බලා හෝ දියුණුවක් වේ නම් එහි වරදක්ද නැත. එහෙත් බොහෝ විට දක්නට ඇත්තේ තරහව සහ ඉරිසියාව නිසා එකට එක කිරීමට ගොස් නැත්තටම නැති වී පස්ස බිම ඇන ගන්නන්ය.

එකට එක කිරීමේ අනිත් ආකාරය එක අතකට අනියම් විදියට පළිගැනීමක් වැනිය. තමන්ට වූ යම් වැරැද්දකට අඩුපාඩුවකට එකට එක කරන තුරු සමහරුන්ට නින්ද නොයයි. 'එයාලගෙ දානෙ, පිරිත, පාටිය අපට කිව්වෙ නැහැ. ඒ හින්දා අපිත් අපේ කිසි දෙයක් කියන්නෙ නෑ. අපේ ගෙදර පාටියට එන්න කියලත් ආවෙ නෑ. අපි යන්නෙත් නෑ එයාලගෙ ඒවට. එයා අපට කළේ මෙහෙමයි. අපිත් එයාලට එහෙමයි සලකන්නෙ' මේ ආකාරයට එකට එක කිරීමෙන් සතුටු වෙයි. දැන හෝ නොදැන සිදුවූ දේවල්වල එල්ලි එල්ලී එකට එක කරයි. ඇනුම් පද කියයි. සිදුවූ දෙය දිගටම සිතේ තබාගෙන එකට එක කරයි. විවිධ ආකාරයට රිදවයි. මූනිච්චාවට කතා කර නැති තැන බනියි. පරණ මිතුරන් අමතක කර අලුත් මිතුරන් ඇති කර ගනියි. සමහරු එකට එක කිරීමේදී එසේ කරන බවත් නොඅඟවා යටින් ගේම දෙයි. මෙවැනි එකට එක කිරීමට පුරුදු වූ අයට එයින් ගැලවීමක් නැත. එකට එක කිරීම ඔවුනට රසවත් අමෘතය පානය කරනවා වැනිය. එයින් මහත් සතුටක් ලබයි.

ඔබේ හිතවතා, නෑදෑයා, අසල්වැසියා මෙවැන්නකු විය හැකියි. සමහරවිට දැනුවත්ව හෝ නොදැනුවත්ව ඔබත් මෙවැනි අයකු විය හැකියි. මේවාට පෝර දාන අයද අනන්තවත් ඇත. එකට එක කිරීමට පුරුදු වූවන්ගේ එම ගතිය වෙනස් කිරීමද ලෙහෙසි නැත. බලු වලිගේ උණ පුරුකේ දැම්මද ඇදය නොයන්නා සේමය. අප සැවොම සිතාගත යුතු දැනගත යුතු දෙය නම් මෙලෙස එකට එක කිරීමෙන් සිදුවන යහපතක් නැත යන්නය. සිදුවනුයේ තරහව සහ ඉරිසියාව නිසා තමන්වම පිරිහී යාමයි. හිතමිතුරන් අහිමි වීමයි. අප කළ යුත්තේ එකට එක කිරීම නොව. අඩුපාඩු ඉවසා තරහ අමතක කර සමාජයට බරක් නොවී ජීවත් වීමයි.

මේ මට හිතෙන හැටිය

මේ වගට

**ගුරා**

පාඨක ප්‍රතිචාර එවීමට : gura.kolama@gmail.com



# සදාකාලික යුදෙව් දැරිය ඈන් ෆ්‍රෑන්ක්



**1939 සැප්තැම්බර් 01 දා ආරම්භ වූ දෙවන ලෝක යුද්ධය සිදුවී වසර 74 ක් ගත වී ඇතත් එයින් නැගුණු ගිනිදැල්වල ප්‍රතිඵල අදද ලෝකයේ ජීවමානව දක්නට ලැබෙයි. වසර 06 ක් පුරා පැවති මේ යුද්ධය එතෙක් මෙතෙක් ලොව ඇතිවූ බිහිසුණුම සංග්‍රාමය ලෙස සැලකෙයි. මිනිස් ජීවිත මිලියන හැත්තෑවකට වඩා අමානුෂික අන්දමින් ඝාතනය වූ මෙම යුද්ධයේ මහ මෙහෙයුම්කරුවා ලෙස ක්‍රියා කරනු ලැබුවේ ඇඩොල්ෆ් හිට්ලර් නමැති නාසිවාදී ජර්මානු ආඥාදායකයායි. 1933 ජනවාරි මාසයේ ජර්මානු පාලකයා ලෙස පත් වූ හිට්ලර්ගේ යුදෙව් වියරුව නිසා මිනිස් ජීවිත රැසක් අකාලයේ මිලිනව ගියේය. මේ අන්දමින් විනාශ වූ ජීවිත අතර ලෝකයේ නමක් රඳවා මියගිය පිරිසද බොහෝ වන අතර ඒ අතරින් ඈන් ෆ්‍රෑන්ක් නම් දැරියට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. යුද සමයේදී නාසි සිර කඳවුරකදී අනන්ත වූ දුක් විඳ මිය ගිය මෙම යුදෙව් ජාතික දැරිය පිළිබඳ අසා නැති අයෙකු වෙතොත් ඒ කලාතුරකිනි. ඒ ඇය විසින් ලියන ලද 'ඈන් ෆ්‍රෑන්ක්ගේ දිනපොත' (The Diary of a Young Girl) නිසාය. මේ පොත අදද ලෝකයේ වෙළඳසල්වල මිලියන ගණනින් අලෙවි වෙයි.**

- තවමත් හරිහැටි මා ගැන නොදන්නා මා වටා සිටින පුද්ගලයින්ට සහායක් වන්නට, සැනසුමක් වන්නට මට අවශ්‍යය. මගේ මරණයෙන් පසු වුවද එසේ වන්නට මට අවශ්‍යය...
- මිනිසුන් තුළ තවමත්, ඉතාම යහපත් හදවත් ඇති බව මම විශ්වාස කරමි.
- ව්‍යාකූලත්වය, දුක්ඛිතභාවය හා මරණය සතර අතම පැතිර තිබියදී, මට මගේ විශ්වාසයන් ගොඩනගා ගැනීමට අපහසුය. ලෝකය ක්‍රමයෙන් ම්ලේච්ඡ වෙමින් පවතින ආකාරය මම දකිමි. මට ඇසෙමින් තිබෙන ගර්ජනාවන් යම් මොහොතක අපවද නසා දමනු නියතය. දශ ලක්ෂ ගණන් දෙනා විඳින දුක මටද දැනෙමින් තිබේ. දෙව් ලොව දෙසට හිස ඔසවා බලන්න මට සිතෙයි. මෙම කෲරත්වයේ අවසන් සමය ඉක්මනින්ම එළැඹෙනු ඇත කියා මට සිතෙයි. මම මගේ කල්පනාවන් තවදුරටත් පවත්වාගෙන යමි. සාමකාමී බව යළි එළැඹි විට, මට ඒවාද රැගෙන ලෝකය වෙත පිය නැගිය හැකි වනු ඇත.

## 'ඈන් ෆ්‍රෑන්ක්ගේ දිනපොත'

ජර්මනියේ, ෆ්‍රෑන්ක්ෆර්ට්හිදී 1929 ජුනි මස 12 වැනි දින උපත ලද ඈන් ෆ්‍රෑන්ක් (Annelies Marie Frank) 1941 දක්වාම ජර්මනියට අයත් දැරියක වූවාය.

එහෙත් 1933 මාර්තු 13 වැනි දින ජර්මනියේ නාසි (Nazi Party) පක්ෂය ජය ලබා ඇඩොල්ෆ් හිට්ලර් රාජ්‍ය පාලනයේ සියලු බලතල අත්පත් කරගනිද්දී බොහෝ ජර්මානුවාසීහු භීතියෙන් ඇලලී ගියහ. ඔහු තම විරුද්ධ පාක්ෂිකයන්, ආබාධිතයන් සහ ජර්මන් ආර්යයන් නොවූ සියලුම යුදෙව් ජාතිකයින්ද සමූල ඝාතනය කිරීමේ බිහිසුණු කර්තව්‍ය ආරම්භ කළේය. ඔහු මේ සඳහා යොදාගත්තේ ගෙස්ටාපෝ (Gestapo) නම් වූ රහස් පොලිස් සේවාවයි.

යුදෙව් ජාතික ජර්මානු පවුලක් වූ බැවින් බියපත් වූ ඈන්ගේ පියා, ඔටෝ ෆ්‍රෑන්ක් තම බිරිඳ දරුවන් සමග ඇයගේ මහගෙදරට පිටත් කොට හැරියේය. පසුව නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් කරා සංක්‍රමණය වූ ඔටෝ ෆ්‍රෑන්ක් එහි ව්‍යාපාරයකට සම්බන්ධ විය.

'Opekta Works' නම් වූ පළතුරු අලෙවි කිරීමේ ව්‍යාපාරයක කොටස්කරුවෙකු වූ ඔටෝ 1934 දී පවුලේ අය ඇම්ස්ටර්ඩෑමයට ගෙන්වා ගත්තේය. ඔහු දෙවැනි ව්‍යාපාරයක්ද ආරම්භ කළේය. තම බිරිඳ වූ එඩිත්ගේ මවද තම පවුලට එකතුකරගන්නට ඔහු කටයුතු කළේය. ආච්චිඅම්මාගේ පැමිණීම ඈන් හට මහත් සතුටක් විය.

එහෙත් කුරිරු නාසිවාදීහු 1940 මැයි මාසයේදී නෙදර්ලන්තයද යටත් කොටගත්හ. යුදෙව් දරුවන්ට යුදෙව් පාසල් පමණක් විවර විය. චිත්‍රපට ශාලා සාමාන්‍ය ප්‍රවාහන සේවා යුදෙව් ජාතිකයන්ට තහනම් කෙරිණි.

ඈන්ගේ සොයුරිය 'මාර්ගෝ' ඉගෙනුමට අති දක්ෂ දැරියකි. ඈන් කියවීමට හා ලිවීමට අතිශයින් ඇළුම් කරන, සෘජුව කතා කරන, ශක්තිමත් දැරියක වූවාය. රටෙහි පැවැති අයහපත් තත්ත්වය යටතේ ඔටෝ තම ව්‍යාපාර අන් අයට පවරා දුන්නේය. 1942 වසරේදී යුදෙව් විගමන මධ්‍යස්ථානය මගින් මාර්ගෝ වැඩ කඳවුරකට කැඳවා තිබිණි. වහා ක්‍රියාත්මක වූ ඔටෝ ෆ්‍රෑන්ක් තම දරු පවුල ද රැගෙන 'Opekta' කාර්යාල පරිශ්‍රයෙහි වූ කුඩා රහස් උපගෘහයක පදිංචියට ගියේය. කුඩා කාමර දෙකකින්, නාන කාමරයකින් සහ අටුවකින් යුක්ත වූ රහස් නිවහන ඈන් හට සිරගෙයක් නොවූයේ ඇය කියවන්නටත්, ලියන්නටත් කාලය වැය කළ බැවිනි.

එහෙත් නිවහන හැර එන්නට මසකට කලින් සිදුවූ ආච්චිඅම්මාගේ මරණයත්, තම සුරතල් පූසා 'මුවර්ටි' අතැර ආ ශෝකයත් ඈන්ගේ කුඩා සිත දැඩිව පෙළමින් තිබිණි.

සුනිලා විජේසිංහ

ගමන් මලු ගෙන ආ නොහැකි බැවින් ඇඳුම් කිහිපයක් එකවර හැඳ බොහෝ දුර පා ගමනින් පැමිණියද ඈන් සතු සුවිශේෂ යමක් තිබිණි. ඒ ඇය 13 වැනි උපන්දිනය සැමරූ දා පියා ඇය හට ලබා දුන් තිළිණය වූ සමරු පොතයි. රතු, සුදු කොටු රෙද්දකින් පිටකවරය නිමවා තිබූ එහි ඉදිරිපස අගුලක්ද විය. කලින් දිනයක ඈන් එම පොත සාප්පුවක තිබියදී තම පියාට පෙන්වා තිබුණේ එය තමා සතු කරගැනීමේ බලාපොරොත්තුවද ඇතිවය.

රහස් නිවහනේ ජීවිතය ආරම්භ කළ වහාම ඈන් තම සමරු පොත දිනපොතක් කරගත යුතු යැයි තීරණය කළාය. 1942 ජුනි 12 වැනි දින සිට 1944 අගෝස්තු 01 දා දක්වා ලියැවුණු ඈන්ගේ දින පොත ඇගේ ජීවිතයේ දුක්ඛ දෝමනස්සයන් පමණක් නොව ඇඩොල්ෆ් හිට්ලර්ගේ නපුරු නාසිවාදී පාලනය ගැනද බොහෝ දෑ ලොවට හෙළි කළේය. කුඩා කල නිළියක් වීමේ සිහිනය සිත දරා සිටි ඈන්ගේ පසුකාලීන සිහිනය වී තිබුණේ පුවත්පත් කලාවේදිනියක වීමයි. ඒ බව ඇය දිනපොතේ සටහන් කොට තිබුණේ මෙසේය.

'ඉස්කෝලෙ නොගියොත් මට මෝඩ ගෑනියෙක් වෙන්නට සිද්ධවේවි. මට වුවමනා පුවත්පත් කලාවේදිනියක් වෙන්නටයි. ඒ මට ලියන්නට පුළුවන් නිසා. පොත්පත් ලියන්නට, ලිපි ලියන්නට මට හපන්කමක් නැත්නම්, මම මං වෙනුවෙන්ම ලියන්නම්. ඒත් මට වුවමනා අම්මා වගේ වෙනත් ගැහැනු උදවිය වගේ හැම තිස්සේම වැඩ කර කර ඉන්නට නෙමෙයි. මිනිස්සුන්ට ප්‍රයෝජනවත් ඒ අය සතුටු කරන යමක් කරන්නට මට අවශ්‍යයි. මරණයෙන් පස්සෙත් ජීවත්වෙන්නට මට පුළුවන්නම්....'

'මගේ ආත්මය මගේ සිතුවිලි මේ විදියට මුදාහරින්නට මට ශක්තිය ලබාදුන් දෙවියන් වහන්සේට ස්තූතියි. ඒත් ලොකුම ප්‍රශ්නය මට පුළුවන්කමක් ලැබේවිද කවදා හෝ ලේඛිකාවක් වෙන්නට?''

- 1944 අප්‍රේල් 18 දා - ඈන් ෆ්‍රෑන්ක්

ආරක්ෂාව පතා පසුව තම රහස් නිවහනේම පදිංචියට පැමිණි පවුලක සිටි පීටර් නම් තරුණයකු සමග ඇතිවූ තාවකාලික ප්‍රේම සම්බන්ධයක් පිළිබඳවද ඈන් දිනපොතෙහි ලියා තිබිණි. නාසි පාලනය යටතේ සාමාන්‍ය ජන ජීවිතය උඩු යටිකුරු වී ගිය අයුරු ඇගේ දින සටහන් තුළින් මනාව හෙළි කැරිණි. වරෙක තම මව පිළිබඳව අමනාපයෙන් ලියූ ඇය තවත් වරෙක එසේ ලිවීම පිළිබඳ පසුතැවිල්ලට පත් වී සිටියාය. දිනපොතේ ලියන්නට ඈ බොහෝ කරුණු අසා දැනගත්තේ ඔවුනට නිතර උදව් උපකාර කළ ව්‍යාපාරයේ සේවකයන්ගෙනි. ඔවුන්ගෙන් කිසිවෙක් නිවසට පැමිණෙන තුරු ඇය මග බලාගෙන සිටියාය. ඈන් තම දිනපොතේ අවසාන සටහන තබා ඇත්තේ 1944 අගෝස්තු මස පළමුවැනිදාය. අගෝස්තු 4 වැනිදා කවුරුන් හෝ ලබාදුන් ඔත්තුවක් මත ෆ්‍රෑන්ක් පවුල ගෙස්ටාපෝ රහස් පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනිණි.

ලක්ෂයක් පමණ වූ යුදෙව්වන් අතර සිරගතව සිටි ෆ්‍රෑන්ක් පවුල 1944 සැප්තැම්බර් මාසයේදී දින 3 ක අප්‍රසන්න දුම්රිය ගමනකින් අවුෂ්විට්ස් (Auschwitz) වධ කඳවුර වෙත පිටත් කෙරිණි. දුම්රිය තුළ වූ 1,019 ක් වූ සිරකරුවන්ගෙන් වයස 15 ට අඩු දරුවන් 549 ක් වෙන් කැරුණු අතර ඔවුන් සියලු දෙනාම කෙලින්ම යවනු ලැබුවේ ගෑස් කුටි තුළටය. අවුරුදු 15 ඉක්මවා මාස 3 ක් ගෙවී තිබුණු බැවින් ඈන් අයත් වූයේ වැඩිහිටියන්ගේ කණ්ඩායමටය.

හිස මුඩු කොට සිරුර නිරුවත් කොට විෂබීජ නාශකයකින් නහවා සිරකරු අංකය හංවඩු ගසා බැරැක්කයකට යවනු ලැබූ ඈන් අනෙකුත් සිරකරුවන් මෙන්ම උදේ සිට රෑ වන තුරු වෙහෙසව වැඩ කළාය. ගල් අදින්නටත්, තණ පිඩැලි කපන්නටත් ඈන් හට සිදුවිය. කඳවුරට ගිය විගස ගැහැනුන් හා පිරිමින් වෙන් කැරුණු බැවින් ඈන් හට නැවත කිසිදාක ඇගේ පියා මුණගැසුණේ නැත.

පසුව සමේ රෝගයකින් පෙළුණු ඈන් සහ ඇගේ සොයුරිය මීයන්ගෙන් පිරුණු ගිලන් හලකට මාරුකොට යැවිණි. ඒ දිනවල ඔවුන්ගේ මව ගිලන් හලේ බිත්තියක තැනූ සිදුරක් තුළින් ඇගේ ආහාර කොටස දියණියන් හට ලබා දී නිරාහාරව සිටියාය.

ඔක්තෝබර් 28 වැනි දින ඈන් සහ මාර්ගෝ තවත් අටදහසක් කාන්තාවන් සමග 'Bergen Belsen' සිර කඳවුරට මාරුකොට යවනු ලැබූ අතර මව අවුෂ්විට්ස් කඳවුරේදී නිරාහාරවම මිය ගියාය. ඊකිබ සිර කඳවුරේදී ඈන් හට ඇගේ කිට්ටු පාසල් මිතුරියන් දෙදෙනකු වූ 'හනෙලි' සහ 'නැනේ'ද මුණ ගැසී තිබිණි.

1945 මාර්තු මාසයේදී කඳවුරේ සිටි 17,000 ක් සිරකාරියන් හට ටයිෆස්(typhus) නම් වූ උණ වසංගතයක් වැළඳුණි. මාර්ගෝ සහ

19 වන පිටුව බලන්න



# TRICO MARITIME

(Sole Authorized Agent of Trico Maritime (Pvt) Ltd. Sri Lanka)
The first Customs Bonded Warehouse for Personal Effects and gift items clearance in Sri Lanka

**Serving People Worldwide Reliably for 35 Years**

## Sri Lanka's best and largest clearing facilities in three Major cities - Since 1980

**Colombo - Galle - Kurunegala**

**DOOR TO DOOR SERVICE**

**Jaffna, Vavuniya, Kilinochchi, Batticaloa, Trincomalee and Mannar**

සැනසිල්ලේ ගමට යන්න
ට්‍රයිකෝ මෙරිටයිම් වෙත ඔබගේ භාණ්ඩ භාර දෙන්න

**TRICO OFFERS ANOTHER NEW SERVICE**
**"SPECIAL DOOR TO DOOR DELIVERY"**
EXCLUSIVELY TO - COLOMBO AND ALL OTHER GREATER COLOMBO AREAS COVERING UP TO PANADURA, HOMAGAMA, KADUWELA, PILIYANDALA, JA-ELA ETC.
SHORTLY THIS SERVICE WILL BE EXTENDED TO ALL OTHER MAJOR DISTRICTS IN SRI LANKA
FOR FURTHER DETAILS: CONTACT - DERRICK ANTON

**Contact Derrick Anton: 647-833-3020 / 416-335-8800**

අපගේ රේගු ගබඩා ශාඛා
කොළඹ, ගාල්ල, කුරුණෑගල නගරවල පිහිටා ඇත




## Trico Maritime Customer Service in Sri Lanka

**Head Office**
Trico Maritime (Pvt) Ltd
50 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580/2345581
Fax: 2432000

**Colombo Warehouse**
Trico Maritime (Pvt) Ltd
414/17 K.cyril Perera Mawatha
Colombo 13
Tel: 24444400/2444488
Fax: 2432000

**Kurunegala Warehouse**
Trico Maritime (Pvt) Ltd
Humbara Rd, Sandagala,
Uhumeeya
Tel: 037-2238924/037-2238925
F ax: 037-2238967

**Galle Warehouse**
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd,Kangoda
Galle
Tel: 091-2234842 Fax: 2234841

## Our Canadian Agents


Alberta: 587-708-5665 (Tony)
Calgary: 403-971-6721 (Saman)
Vancouver: 778-395-1234 Kumari /Sundar (Colombo Stores)
Montreal: 514-694-3508 (Kumari)
Ottawa : 613-513-6106 (Saman)
Winnipeg : 204-800-2364 (Hasaka)

**Trico Maritime Freight Forwarding Canada Inc.**
151 Nashdene Rd, Unit # 5, Scarborough, ON, M1V 4B9
Intersection: Markham Rd / Nashdene Rd
Tel: 416-335-8800 Fax: 416-335-8848
Email: info@tricomaritime.ca
www.tricomaritime.ca

# ඉන්නා තැන සොයා පස්සෙන් යන ගැරඬියෙක්

මිනිස් ජීවිතයක ආරම්භයේ පහළ වන මූලික ප්‍රකෘති සිත ඉතාම පිරිසුදුය. එයට අතීතය හා අනාගතය පවා දැකීමේ පුදුම ප්‍රබල ශක්තියක් ඇත. උපදින විටම හඬාගෙන එන දරුවාට කුසගින්න හා පිපාසය හේතු කොට ගත් වේදනාවෙන් සිත දුක්ඛ සහගතව ගැටීමට ලක්වේ. මවු කිරි හෝ වතුර ටිකක් ලැබීමෙන් සුඛ සහගතව ඇල්ම හට ගනී. ඉන් පසු සීතල හේතු කොට ගෙන උණුසුම ඉල්ලා හඬයි. සීතල නිසා දුකද දුක නිසා ගැටීමද හට ගනී. උණුසුම නිසා කැමැත්තද ඒ කැමැත්ත නිසා ඇලීමද හට ගනී.

මුළු ජීවිතය පුරාම තණ්හාව මුල් කොට ගත් ඇලීම හා ගැටීම නිසා පිවිතුරු ප්‍රකෘති සිත අපිරිසුදු වී ඒ කෙලෙස් දුහුවිල්ලෙන් සිතේ ශක්තිය දුර්වල වේ. ඇස, කණ, නාසය, දිව, ශරීරය හා මනස යන ඉන්ද්‍රිය සයේ ස්වභාවය අරමුණු ගැනීමය. ඇසේ පිහිටා ඇති දැනීමේ ශක්තිය සිතේ ඇති තණ්හාව හා සම්බන්ධ වීමෙන් දකින රූපයක් හේතු කොට ගෙන මනාප ඇලීමක් හෝ අමනාප ගැටීමක් ඇති කර ගනී. අනිකුත් ඉන්ද්‍රියයන්ගේ කාර්ය භාරයද එසේමය. මෙසේ ක්ෂණයක් පාසා රැස් කරන්නා වූ ඇලීම් හා ගැටීම්වලින් එකක් චුති චිත්තය වශයෙන් මරණයේදී සිතට අරමුණු වුවහොත් ඔහුගේ හෝ ඇගේ ඊළඟ ප්‍රතිසන්ධියද එසේම ඊට අනුකූලව සිදු වන බව බුදු දහමෙහි සඳහන් වේ. අපේ ගවේෂණයන්හිදී අනාවරණය වූ එවැනි සිද්ධියකි මේ.



## පුංචප්පුගේ වෛරය

පුංචප්පු බෙලිඅත්ත ප්‍රදේශයේ ජීවත් වූ ගැමියෙකි. ඔහු කිසිම කෙනෙකුට කිසිම උදව්වක් නොකරන අමුතුම ජාතියේ මිනිහෙකි. ගමේ කිසිම කෙනෙකුගේ ගෙදරකට, මරණයකට හෝ මගුල් තුලාවකට හෝ යන්නේද නැත. පන්සලකට හෝ දේවාලයකට පවා යන්නේද නැත. වයස් ගත වන විට සොබාවිකව ඇති වූ ලෙඩ රෝගයකදී ඔහුට සාත්තු සාප්පායම් කළ දියණියට පවා පොඩ්ඩ වැරදුණු හැටියේ

"අපොයි මට තෝව කන්න, තොගේ මාලු කන්න, ලේ බොන්න ඕනෑ" යි කෑ මොර ගසයි. මොහුගේ මේ නපුරු දුෂ්ට ගතිගුණ පිළිබඳව බිරිය හා දරුවෝ කර කියා ගත හැකි දෙයක් නැතිව ළතැවූහ. එසේම ඔහුගේ බිරියගේ හා දරුවන්ගේ ඇති ගුණ යහපත්කම් නිසා ගම්වාසීහු මේ ගෙදර සෑම වුවමනාවකටම ඔහු ගැන නොතකා හිතවත්ව සහභාගි වූහ.

පුංචප්පුගේ තිබුණු තවත් දුර්ගුණයක් වූයේ තරාතිරම නොබලා සෑම භික්ෂූන් වහන්සේ නමකටම අපහාස මුඛයෙන් කතා කිරීමය. එහෙත් පුංචප්පුගේ බිරියත් දරුවෝත් ගමේ පන්සලේ කුදු මහත් සෑම කටයුත්තකදීම පරිත්‍යාගයෙන් සහභාගි වූ දායකයෝය. පන්සලේ හාමුදුරුවන්ගේ ප්‍රසාදයට ලක් වූ ශ්‍රද්ධා භක්තිවන්තයෝය. මේ අතර පුංචප්පුගේ බිරිය මිය ගියාය. ගමේ කාගේත් සහභාගිත්වයෙන් ඒ අවමංගල්‍යයේ කටයුතු සිදු විය. බෞද්ධ චාරිත්‍රවලට අනුව ස්වාමීන් වහන්සේ වඩමවා පාංශුකූල කටයුතු සිදු කළහ.

උන් වහන්සේද අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම දේශනයන්හිදී මිය ගිය උපාසිකාවගේත් දරුවන්ගේත් ගුණ වැණූහ. අවසානයේ පාංශුකූල රෙදිකඩ පූජා කරන අවස්ථාවේ "මේක ගෑනුන්ට යට ගවුම් මහන්න දෙන්න නම් එපා" යැයි පුංචප්පු හඬ නගා කීවේය. ගමේ කාගේත් ගෞරව ප්‍රසාදයට ලක්ව සිටින ඒ සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේ ඉතාම ඉවසීමෙන් හා කරුණාවෙන් මිය ගිය තැනැත්තියට පින් අනුමෝදන් කොට නැගිට යන්නට ගියහ.

කාලය ඉක්ම යද්දී පුංචප්පුද වයස් ගතව රෝගාතුර වෙන්නට විය. කිසිම දවසක පන්සලකට ගොස් මලක් පහනක් පූජා නොකළ පිනක් දහමක් නොකළ පියා ගැන කනගාටු වූ දරුවෙකු තමන්ගේ නිවසේ පිරිතක් හා දානයක් සූදානම් කොට නියමිත දිනයේ සවස ත්‍රිරෝද රියකින් පියා කැඳවා ගෙන ගියේය. පිරිත නොරිස්සූ පුංචප්පු රාත්‍රි කෑම කා කිසිවෙකුට නොදන්වා පයින්ම ගෙදර ගියේය. ඒ ඔහුගේ ගතියයි. තවත් දියණියක් සමඟ වෛරයෙන් පසු වූ පුංචප්පු ගෙදර සිටින පුතා අමතා "මම මැරුණු දාට උඹ මගේ මිනී පෙට්ටිය ඇතුළේ හතර කොනේ බිත්තර හතරක් තියාපං. මං නයෙක් වෙලා ඇවිත් අරකිගෙන් පළිගන්නවා" යැයි නිතර කීවේය.

පුංචප්පු ඔත්පලව මාස ගණනක් දුක් වින්දේය. දරුවෝ උණු පැනින් නාවා ශුද්ධ පවිත්‍ර කොට සාත්තු සප්පායම් කළහ. එහෙත් පුංචප්පුගේ මුවින් පිට වූයේ තරහ වෛරය මිශ්‍ර වචනමය. පුංචප්පු මළේය. දරු මුණුපුරෝ ගම්වැසියන්ගේ සහයෝගයද ඇතිව අවසන් කටයුතු කළහ. පන්සලේ හාමුදුරුවෝ ආගමික වතාවත් ඉටු කළහ. දරුවන්ගේ ගුණ යහපත්කම් නිසා පුංචප්පුගේ අවසන් කටයුතු ලස්සනට සිදුවිය.

අවුරුද්දකට පමණ පසු මේ ගෙදරට නයෙක් ආවේය. එහෙත් පැමිණි දවසේම මුගටියෙකුගේ ගොදුරක් බවට පත් විය. වසරක් පාසා මේ නයාගේ පැමිණීමත් මුගටියෙකුගේ ගොදුරක් බවට පත්වීමත් නිරන්තරයෙන් සිදු විය. මේ නයා පුංචප්පුගේ පුනරාවතරණයදැයි අපි නිශ්චිතවම නොදනිමු. එහෙත් අනුමාන ලෙස සිතිය හැකි අතර ගම්මුන්ගේ අදහස නම් එයමය. තමන් අමනාප දේ අතහැර දමනු විනා ඒ සමඟ ගැටීම නිසා, ද්වේෂය නිසා නපුරක් සිදු වන්නේද තමන්ටම විනා අනුන්ට නොවේ.

අපි ඊළඟට ඇලීම පිළිබඳවද ප්‍රායෝගික සත්‍ය සිද්ධියක් විමසා බලමු.

## ඇලීම නිසා පසුපස ඒම

ෂෙල්මි බර්ගර් ජාතික තරුණියකි. පියාගේ මරණයෙන් පසු මෑණියන් සමඟ ඇය හෝමාගම ප්‍රදේශයේ ජීවත් වූවාය. බාලා ද්‍රවිඩ ජාතික තරුණයෙකි. මේ දෙදෙනා අතර ගොඩ නැගුණු සම්බන්ධයට මෑණියන්ගෙන් විරෝධතාවක් පැන නැගුණේද නැත. පෞද්ගලික ආයතනයක රියැදුරෙකු ලෙස රැකියාව කළ බාලා ෂෙල්මි සමඟ විවාහ වී ඉතාම ආදරයෙන් පවුල් ජීවිතයක් ආරම්භ කළේය.

ෂෙල්මි පල්ලි යන විට බාලාද ඇය සමඟ ගියේය. බාලා කෝවිලට යන විට ෂෙල්මිද ඔහු සමඟ ගියාය. ආදරය ඉහ වහා ගිය මේ තරුණ යුවළගේ සතුට සැනසුම ඔවුන් ජීවත් වූ නිවස පුරා ප්‍රීතියෙන් සිනහවෙන් දෝරේ ගැලුවා යැයි කීවොත් අතිශයෝක්තියක් නොවේ. එහෙත් කිසිවෙකු නොසිතූ නොපැතූ පරිදි බාලා බරපතල රිය අනතුරකට මුහුණ පෑවේය.

පොලීසිය පැමිණ ඔහු රෝහලකට ගෙන යද්දීත්, රෝහලේදී අවසන් හුස්ම හෙළන තුරුත් ඔහු මිමිණුවේ "ෂෙල්මි... ෂෙල්මි..." යන වචනයම පමණි. එහෙත් ෂෙල්මිට පණිවුඩය ලැබී රෝහල වෙත යන විට බාලා මෙලොවින් සමු ගෙන තිබිණි.

බාලාගේ මරණයෙන් පසු ෂෙල්මි තනි වූවාය. එය ෂෙල්මිගේ මෑණියන්ටද මහත් බරක් විය. තරුණ දියණියගේ ආරක්ෂාව හා පැවැත්ම සඳහා ස්වාමි පුරුෂයෙකුගේ අත්‍යවශ්‍යතාව මෑණියෝ නිතර මෙනෙහි කළාය. අවධාරණය කළාය. බාලාගේ මරණයෙන් වසරකට පමණ පසු ෂෙල්මි සිංහල තරුණයකු සමඟ නැවත විවාහ වූවාය. ඒ විවාහයෙන් මාස කීපයකට පමණ පසු දිනක් ෂෙල්මි කුස්සියේ ඉවුම් පිහුම් කරමින් සිටියදී පැමිණි ගැරඬියෙක් ජනේලයේ මැද පොල්ලේ වෙලී ෂෙල්මි දෙස බලා සිටියේය. බියපත් වූ ෂෙල්මි කුස්සියේ වැඩ අත් හිටුවා සාලයට පැමිණ මෑණියන්ට ඒ බව කීවාය.

දියණියත් මවත් කුස්සියට ගොස් නැවත බලද්දී ගැරඬියා ඉවතට ඇදී යමින් සිටියේය. ඉන් පසු සමහර දිනවල ෂෙල්මිගේ ඇඳුම් රාක්කයේ සිටද තවත් දිනවල පිඟන් රාක්කයේ සිටද ෂෙල්මි දෙස බලා සිටියේය. ගැරඬියාගේ හිරිකිත ස්වභාවය නිසා ෂෙල්මිට ඇඳුම් රාක්කයේ ඇති ඇඳුම්, පිඟන් රාක්කයේ ඇති පිඟන් කෝප්ප පවා පිළිකුල් විය. මේ ගැන නිතර නිතර කතා කිරීම නිසා ඇයට මානසික රෝගයක් ඇතැයි සිතූ ඇගේ සැමියා ඇය මනෝ වෛද්‍යවරයකු වෙත ගෙන ගියාය. මේ හිරිකිත සතාගේ පිළිකුල් බව නිසා ෂෙල්මි නිතර නිතර දෑත් සේදීමටත්, ශරීරය පිරිසුදු කිරීමටත් ඉබේම හුරු වූවාය.

මේ මානසිකත්වය මත ඇය එකම කාර්යය නිතර නිතර සිදු කරන්නට හුරු වීම නිසා ඇයට ඕ.සී.ඩී. නමැති මානසික රෝගය ඇතැයි මනෝ වෛද්‍යවරයා නිගමනය කළේය. මේ වන විට ඇය පස් හැවිරිදි දියණියකගේ මවකි. මේ ගැරඬි කරදරයෙන් මිදීම සඳහා හෝමාගම, බණ්ඩාරවෙල ආදි ප්‍රදේශවල ගෙවල් මාරු කරමින් පදිංචිය වෙනස් කළත් ගැරඬියා ඇය සොයා ආවේය.

මෙය තමන්ට මහත් හිරිහැරයක් යැයි කියූ ඇගේ සැමියා දියණියද රැගෙන ඇය අත්හැර ඔහුගේ නිවසේ පදිංචියට ගියේය. එහෙත් සමහර අවස්ථාවල ෂෙල්මිට උදව් උපකාරද කළේය.

හෝමාගම සිට බණ්ඩාරවෙල පදිංචියට ගිය විට ගැරඬියා එහිද ගියේ ය. බණ්ඩාරවෙලද ස්ථාන කීපයකටම පදිංචිය මාරු කළත් මේ ගැරඬි කරදරය අවසන් නොවීය. අන්තිමේ ෂෙල්මි බණ්ඩාරවෙල අතහැර ගම්පහ පදිංචියට ආවාය. මහල් නිවාසවල පදිංචි වුවද මාස කීපයක් ගත වන විට ගැරඬියා ඇය සොයා ආවේය. ගම්පහද අතහැර ගිය ඇය දැන් පදිංචිව සිටින්නේ එකොළොස් වැනි නිවසේය.

ෂෙල්මි ක්‍රිස්තු ධර්මය අදහන්නියකි. මියගිය බාලා හින්දු ධර්මය ඇදහූවෙකි. මේ කාලය තුළ ෂෙල්මි මන්ත්‍ර ගුරුකම් සඳහා විය පැහැදම් කොට ආර්ථික වශයෙන් නැත්තටම නැති වී සිටින්නීය. ක්‍රිස්තියානි ආගමික පිළිවෙත්, හින්දු හා දෙමළ පිළිවෙත් හා බෞද්ධ පිළිවෙත් ආදි හැම එකක්ම සිදු කළත් සහනයක් නොලද බව ෂෙල්මි කියන්නීය.

මේ සිද්ධිය පිළිබඳ ගවේෂණාත්මකව සලකා බලන විට ඇගේ පළමු සැමියා ගැරඬියෙකු වී ඉපිද ඇය කෙරෙහි බැඳුණු ඇල්ම නිසා ඇගේ පසු පසින් ගමන් කරනවා යැයි කෙනෙකුට සිතෙන්නට පුළුවන. එහෙත් සාමාන්‍ය ගැරඬියෙකුට හෝමාගම සිට බණ්ඩාරවෙල දක්වා නිරුපද්‍රිතව යා හැකිද? බණ්ඩාරවෙල සිට ගම්පහට පැමිණිය හැකිද? එසේ ඇය සොයා යෑමට මෙවැනි තිරිසන් සතෙකුට ඇති සුවිශේෂ දැනුම හා ශක්තිය කුමක්ද? මේ එකම ගැරඬියාද? කිහිප දෙනෙක්ද?

නීච සතෙකු ලෙස සලකන ගැරඬියා සිරුරට ආවිෂ්ට වන පහත් මට්ටමේ භූතාත්මයක්ද? ගැරඬියකු වාහනය කර ගත් එවැනි භූතාත්මයක්ද? යන ප්‍රශ්න පැන නගී. එසේත් නැතිව මේ මිය ගිය පළමු ස්වාමිපුරුෂයා යැයි අනුමාන කිරීම හෝ නිගමනය කිරීම කොයි තරම් දුරට නිවැරදිද? සාධාරණද? නොඑසේ නම් මේ කාරණා සියල්ලටම පරිබාහිර වෙනත් හේතුවක්දැයි ෂෙල්මි නොදනී. අපටද තවම නිගමනය කළ නොහැකිය.

මහින්ද විජේතිලක

Air Condition

# Air Care Plus Ltd.

Sales, Service, Repair & Installation

Heating



Proudly Serving The Greater Toronto Area

- Furnace
- Gas Piping
- Hot Water Tank
- Tankless Water Heater
- Humidifier
- Air Cleaner
- Air Conditioning
- Dishwasher, Fridge Water Line Installation
- Gas Stove and Gas Dryer Installation

**FREE HUMIDIFIER**

With the purchase of a new Furnace or Air Conditioner

Limit one per customer. Not valid with any other offer. Please present this coupon during estimate. All installations subject to applicable taxes. Some conditions may apply. Expires on August 31/2013.



**Ashok**

Licensed H.V.A.C technician

**Line: 416.605.8300**

Email: ashokdon@live.ca

CanLanka Business Association

10 YEARS

100% Satisfaction Guaranteed · Money Back Guarantee

MORTGAGE ALLIANCE
R&R MORTGAGES

**Specialize in**

1. First Mortgages
2. Private Mortgages
3. New Immigrant Mortgages
4. Self Employed clients
5. Low income
6. Debt Consolidation
7. Multiple Investment Property Financing

**We Work With over 30 Lenders**



**Manzeel Patel,** AMP
Mortgage Agent

**Mobile: 647 272 8355**

Tel: 416 321 0011 Ext 204 Fax: 416 850 5153
Email: info@everythingmortgages.ca Web: www.everythingmortgages.ca
1801 Harwood Ave N., Unit 5 Ajax ON L1T 0K8
LIC#M11002628 / BROKERAGE LIC# 12122

OVER 9 YEARS OF UNDERWRITING EXPERIENCE WITH MAJOR LENDERS


A VOICE OF LANKA PRESENTATION
නොවැම්බර් 9 වෙනි සෙනසුරාදා
ලතා වල්පොල සහ
අමිත් වල්පොල ගී ප්‍රසංගය
සෞම්‍යරාත්‍රී
at Don Bosco Auditorium
Featuring Sarath De Alwis
ඔබ රස ගන්වන ගීත එකතුව
ගායන ශිල්පිනී ලතා වල්පොල
ශ්‍රීනි විභූෂිත
හීන හතක් මැද
සඳ කොමලී
පුන්සඳ එළියයි
සිහිනෙකි බාල කාලේ
රැජිණ මමයි
රන්වන් දුල් කරලින්
සුකොමල බඳ
නමෝ මරියනී
රෑන ගිරා
අම්මලා දුක් ගන්නේ
රොන් සොයා
ගායන ශිල්පී අමිත් වල්පොල
උත්තම මුණි දළදා
සැමදා ඔබ මගේ
සිරිනි සරුසර වී
ජීවිතේ ප්‍රීති සංචාරෙකි
මේ සෞම්‍ය රාත්‍රිය
උපත ලබා මේ ලෝකේ
සුරතලී
සාධු ශ්‍රී
හනික යමං
මග බල බලා
මං මුලා වෙලා
යුග ගායනා
ජීවන ගංගා
හොඳ හොඳම වේය ලොව
ඔය බැල්ම
දෑතට දෑත තියාලා
වාසනාවන්ත කල
පෙම් රැල්ල
ලංකාරෙන්
අහසේ සඳ සේ
ආනන්ද ශ්‍රීය
මෝරලා ප්‍රේම ගීතේ
පෙම් මාලා
පෙම් රාජ්‍යයේ
චන්ද්‍රා මේ රෑ
TICKETS
$20.00
Toronto Maha Vihara 416-208-9276, Brisk Cargo 416-321-0400
Westend Temple 905-891-8412, Promoters Auto 416-285-8608
M & S Convenience 416-444-8202

දසත ළමා පිටුව

# අහසින් ගිය ඉබ්බා

පුංචි දූල පුතාලට අද අපි කියා දෙන්නේ අපූරු උපමාවකුත් එක්ක ජාතක පොතෙහි සඳහන් වන කතාවක්. කච්ඡප ජාතකය නම් මේ කතා පුවත බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර තියෙන්නේ කෝකාලික නම් භික්ෂූන් වහන්සේටයි. පසු කලෙක 'ඉබ්බා අහසින් ගියා වගේ', 'හොඳට නරකට දෙකට කටමය', 'ඉබ්බා නැහුණොත් කට හින්දාලුනේ' යන ප්‍රස්තාව පිරුළු නිර්මාණය වී ඇත්තේද මේ ජාතක කතාවම පදනම් කොට ගෙනයි. හොඳයි දුවේ පුතේ එහෙනම් දැන් ඒ කතාව අපි කියවමු.

ඔන්න එකෝමත් එක කාලෙක බරණැස් නුවර ආසන්නයේ පිහිටි එක්තරා විලක ඉබ්බෙක් වාසය කළා. මේ ඉබ්බට කෑමෙන් බීමෙන් වගේම මිත්‍ර සම්පත්තියෙනුත් අගහිඟයක් තිබුණේ නෑ. විල වෙත එන සෑම සත්වයෙක්ම, පක්ෂියෙක්ම මේ ඉබ්බාගේ හිතවතුන් බවට පත්කර ගැනීමට ඉබ්බා සමත් වුණා. මේ මිත්‍රයන් අතරින් ඉබ්බා වඩාත් ප්‍රිය කළේ කොහේදෝ සිට සැමදා උදෑසන පියඹා විත් ඉබ්බාගේ සැපදුක් විචාරන කොක්කු දෙන්නාටයි.

බලන්න ලස්සන රූප සෝභාවකින් යුත් කොක්කු ජෝඩුව කොහේ සිට පැමිණෙන්නේදැයි දැන ගැනීමේ කුතුහලයෙන් ඉබ්බා පෙළෙමින් සිටියා. එහෙත් යහළුවන්ගෙන් ඕපාදූප ඇසීම එතරම් සුදුසු නොවන්නක් නිසා ඒ ගැන විමසීමට ඉබ්බාට සිත් දුන්නේ නෑ. කොහොම වුණත් එක් දිනක් ඉබ්බට තම සිතේ ඇති ගැටලුව කොක්කුන්ගෙන් නොඅසා සිටීමට බැරි වුණා.

"යාළුවනේ ඔයාල හැමදාම උදේම ඇවිත් දහවල් වෙනකොට පියඹා යනවා. ඒකෙන් හැඟෙන්නේ ඔයාලා මේ විලේ පදිංචි නැති බවයි. කොහෙද ඔයාලා ඉන්නේ"

ඉබ්බාගෙන් මේ ප්‍රශ්නය බලාපොරොත්තුවෙන් සිටි කොක්කු දෙදෙනා එකවරම ඊට පිළිතුරු දීමට ඉදිරිපත් වුණා.

"අපි ඉන්නේ හිමාලය වනයේ තිබෙන ලස්සන විලක් සහිත රන් ගුහාවකයි. ඒ පරිසරය හරිම සුන්දරයි. අපි මේ විදියට හැමදාම බරණැස් නුවරට එන්නේ අපේ මිත්‍රයා වන ඔබ බලා යාමටයි"

"යාළුවනේ ඔබ ඉන්න තැන ගැන කරන මේ වර්ණනාව අහල මටත් එතන බලන්න යන්න හරිම ආසයි. ඒත් හිමින් ගමන් කරන මම කොහොමද ඔපමණ දුරක් යන්නේ"

"අපි ඔබව රැගෙන යන්නම්"

"අනේ ඒ කොහොමද? මට පියාඹන්න බෑනේ..."

"නෑ... නෑ... ඔබ පියාඹන්න ඕනෑ නෑ. අපි ඔබව ඔසවන් යන්නම්" කියූ කොක්කු දෙදෙනා එතැනින් පියඹා ගියා.

ඉබ්බාට හරිම සතුටුයි. ඒ වගේම හරිම පුදුමයි. 'කොහොමද මාව මෙයාලා ඔසවන් යන්නේ?'යි කියා සිතමින් සිටින විට

"යාළුවේ අපි ආවා..." යි කියමින් කොකුන් දෙදෙනා පැමිණියේ සවි ශක්තිය ඇති ලී දණ්ඩක්ද හොටෙන් එල්ලා ගනිමින්.



"යාළුවේ දැන් අපි මේ ලී දණ්ඩ දෙපසින් හොටින් අල්ලා ගත් පසු ඔයා මේ දණ්ඩෙ මැද තදින් දත්වලින් අල්ලා ගන්න. හැබැයි හොඳට මතක තියාගන්න. කිසිම හේතුවක් නිසා කට නම් අරින්න එපා"

මෙම ගමන සිදුවන ආකාරය ගැන කෙටි හැඳින්වීමක් වගේම අවවාදයක් කිරීමටත් කොක්කු දෙන්නා අමතක කළේ නෑ.

"හා... හා... යාළුවනේ මම කෝටුව දත්වලින් අල්ලගන්නම්. අපෝ මම කට අරින්නේ නෑ" යි ඉබ්බා වහා පිළිතුරු දුන්නේ හිමාලය වනයේ නිල් දිය පිරි රන් ගුහාව සිතින් මවා ගනිමිනුයි.

ඉතිං ඔන්න දැන් කොක්කු දෙන්නා ඉබ්බාවත් එල්ලාගෙන ඈත අහසේ පියඹා යනවා. ගම් නියම්ගම් පසුකරමින්, ඇළදොළ ගංගා පසුකරමින්, කඳු හෙල් තැනිතලා පසුකරමින් ඉබ්බව එල්ලා ගත් කොක්කු දෙන්නා අහසේ පියාඹනවා. අසරණ ඉබ්බාට දැන් හරිම සතුටුයි. ඒ වගේම අහසින් යාමට ලැබුණු අවස්ථාව ගැන කොහේදෝ නැති ආඩම්බර කමකුත් හිතට ඇවිත්. 'මම තමයි මේ ලෝකේ ඉන්න වාසනාවන්තම සතා. මේ වගේ අහසින් යන්න වෙන කාටද හැකි වුණේ' කියන උඩඟු කමින් යුතුව වැරෙන් තදින් කෝටුව සිය දත්වලින් සපාගෙන සිටියා.

ඔහොම යද්දි ගමනාන්තයට ආසන්න වෙද්දි එක්තරා වෙල් යායක කොලු රංචුවක් සෙල්ලම් කරමින් සිටියා. ඒ රැලේ සිටි එක් කොලුවෙකුට හදිසියේම අහසේ පියාඹන අමුතු සත්වයා දිස් වුණා. මඳ වේලාවක් ඒ දෙස බලා සිටි ඔහුට ඒ කණ්ඩායමේ සිටිනවුන් පැහැදිලිව හඳුනාගත හැකි වුණා. දෙපැත්තේ කොක්කු දෙදෙනෙක් සහ මැද ලී දණ්ඩක එල්ලුණු ඉබ්බෙක් ඉන්න බව කොලුවා දුටුවා. 'මේක හරිම පුදුමයක්නෙ. හරිම අපූරු වැඩක්. ඉබ්බෙක් අහසින් යනවා අදමයි මා දුටුවේ' යි සිතූ කොලුවා තම යහළුවන් වෙත දිව ගොස් මෙය පෙන්වා සිටියා.

අහසින් යන ඉබ්බා දැක්ක කොල්ලන්ට කට වහගෙන සිටීම ඉතාමත් අපහසු වුණා. "ඉබ්බෙක් අහසින් යනවෝ.... මෙන්න බලන්නෝ.... ඉබ්බෙක් අහසින් යනවෝ" යයි කියමින් උන් අත්පුඩි ගසමින් බෙරිහන් දීමට පටන් ගත්තා.

මේ හඬ අහසේ සිටින ඉබ්බාටත් ඇසුණා. නෙත් කොණින් පහළ බැලූ ඉබ්බාට තමාට විහිළු කරන කොලු ගැටවුන් ගැන ඇති වුණේ මහත් කෝපයක්. අහසින් යෑමේ අවස්ථාව ලද තමා වැනි උසස් අයෙකුට මේ ආකාරයෙන් නිග්‍රහ කිරීම ගැන ඇතිවූ කෝපය නිසාම ඉබ්බාට උන්හිටි තැන්ද අමතක වුණා. 'බලාපල්ලකෝ වැදගතෙකුට සලකන්නවත් මූල නොදන්න හැටි. පෙන්නන්නම්කො මුන්දැලට මගේ තරම' යැයි සිතූ ඉබ්බා කොල්ලන්ට බනින්නට කට ඇරියා.

ඉතින් දුවේ පුතේ හිතාගන්න පුළුවන් නේද ඉබ්බාට සිදුවුණ දේ. අනුවණ කමින්, නොඉවසිලිමත් කමින්, ඉක්මන් කෝපයෙන් හා උඩඟු කමින් ඉබ්බා විසින්ම තමා වෙත විනාශය ළඟා කර ගත්තා.

## ළමා ගී

### හඳපානේ රෑ යාමේ

දිය ගොඩ හැම තැන කිරි ඉතිරේ
ගස් වැල් කිරි මුහුදේ කිමිදේ
මඳ මුදු සුළඟෙන් අප නැළැවෙන්නේ
බැබැළෙන හඳපානේ

හඳපානේ හඳපානේ
හඳපානේ රෑ යාමේ

මගෙ පොඩි නංගී කිරි ඉල්ලා
දෝත නගා මහ ඉහළ බලා
අම්බිලියෝ කියමින් නැළැවෙන්නේ
බැබැළෙන හඳපානේ

හඳපානේ හඳපානේ
හඳපානේ රෑ යාමේ

දිය මතු පිට කිරි රැල්ල නැගේ
ඔරුවක් තනි වී ඈත පෙනේ
හෝ ගා මුහුදේ රැල්ල බිඳෙන්නේ
බැබැළෙන හඳපානේ

හඳපානේ හඳපානේ
හඳපානේ රෑ යාමේ

වවුලන්ගේ බකමූණන්ගේ
නාදේ ඉඳහිට මටද ඇසේ
කිරි වෙනුවට ගොම සොයමින් යන්නා
බැබැළෙන හඳපානේ

හඳපානේ හඳපානේ
හඳපානේ රෑ යාමේ

ගී පබැඳුම : හියුබත් දිසානායක
සංගීතය සහ ගායනය : සුනිල් ශාන්ත

## ළමා නිර්මාණ

African Lion Safari ගිය අක්ක නගෝ



දුනුරා ඉන්දුජා ඈපාසිංහ
Golf Road Junior Public School - Gr 2



දුලංශා ඉෂිනි ඈපාසිංහ
Golf Road Junior Public School - 5K




# ඔබේ සිහින නිවහන හිමිකර ගන්න !

නිවාස ණය ගෙවන ඔබේ
සෑම සතයකම
වටිනාකම අපි දනිමු.
තරඟකාරී පොලී අනුපාත සහ
පුළුල් නම්‍යශීලී
නිෂ්පාදන පෙළක් තුළින්
වටිනා කාර්යක්ෂම සේවයක්
ලබා දීම අපගේ අරමුණයි !!
ඒ සඳහා අප ඇප කැප වී සිටිමු.

Call me for a confidential
In-home pre-approval or
Consultation
with an appointment
that suits YOUR schedule !!
I will assure you
a pleasant mortgage
experience with
personal service,
flexible options and
great rates
that suits YOUR needs !!

**Specialised advice and genuine service on,**

- Home equity Line of Credit
- Variable Interest Rate Mortgage
- Open Mortgage
- Fixed-Term Mortgage
- First Time Home Buyer Programs
- No down Payment Mortgage
- New Immigrant Mortgage



Scotiabank

**Sam Premaratne**
Home Financing Advisor
Fax : 905 814 7213
Tel : 647 833 5783
sam.prema@scotiabank.com
samthemortgageman.com

නිවාස සිහිනයට අත්වැලක්



# හිතට බරක් නොමැති ප්‍රියමනාප නිවසක්

ශ්‍රී ලංකාවේදී අධ්‍යාපනය හමාර කළ සැණෙන් රැකියාවන්ට පිවිසි ඔබගේ ඊළඟ සිහිනය වූයේ තමන්ටම කියා නිවසක් ගොඩ නගා ගැනීමයි. කැනඩාවට පැමිණ සිටින බොහෝ දෙනෙක් ඒ සොඳුරු සිහිනය සැබෑ කරගනිමින් මවුරටේදී තමන්ගේම කියා සෙවණක සුවපහසු ජීවිත ගත කළ අය වෙති. එහෙත් කැනඩාවට සංක්‍රමණය වීමෙන් පසු ක්‍රම ක්‍රමයෙන් නැවතත් ඔබගේ ජීවිතය අලුතින්ම ගොඩ නගා ගැනීමේ අභියෝගයට මුහුණ දීමට ඔබට සිදුවී ඇත. ඔබ ලද අධ්‍යාපනයට සරිලන රැකියාවක්, වාහනයක්, නිවසක් ආදි සියල්ල මුල සිටම සපයා ගැනීමට ඔබට සිදුවී ඇත. මේ අතර දරුවන්ගේ කටයුතු, නිවසෙහි කුදුමහත් සියලු කටයුතු ආදි සියල්ල තනිව කර ගැනීමේ බාරදූර වගකීමද ඔබ මත පැටවී ඇත.

මවිසින් මෙහිදී ඔබ වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ කැනඩාවට සංක්‍රමණය වූ ඔබගේ අනිවාර්යය සිහිනයක් වන තමන්ගේම කියා නිවසක පදිංචි වීමේදී මුහුණ දෙන ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමයි.

කැනඩාවට පැමිණ රැකියාවක් සොයාගැනීමෙන් පසු කුලී නිවසක ජීවත් වෙමින් යම් කිසි මුදලක් ඉතිරි කරගන්නවා යැයි සිතීම එක්තරා අන්දමකින් මුලාවකි. මන්ද යත්, මෙහි කුලී නිවසකට වුව ගෙවිය යුතු මුදල අඩුවක් නොමැති හෙයිනි. ඇතැම් අවස්ථාවල බේස්මන්ට් වැනි නිවාස කොටස් අඩු මිලකට කුලියට ගත හැකි වුවත් අවම පහසුකම් සහිත එවැනි ස්ථානයන්හි ජීවිතය ඉතාමත් නීරස වූවක් විය හැකියි. එපමණක් නොව, කුලී නිවසක් සඳහා ඔබ විසින් මාස් පතා ගෙවනු ලබන මුදල කිසිදු ලෙසකින් නැවතත් ඔබ වෙත ලැබෙන්නක් නොවෙයි. එනිසා මේ සියලු කරුණු සැලකිල්ලට ගැනීමේදී සුදුසුම ක්‍රියාව වන්නේ හැකි ප්‍රථම අවස්ථාවේදීම තමන්ගේම කියා නිවසකට ගෙවදීමයි. කැනඩාව වැනි රටක නිවසක් මිල දී ගැනීම ඔබ සිතන තරම් අරුම කටයුත්තක් හෝ අපහසු කටයුත්තක් නොවෙයි. ඒ සඳහා අවශ්‍ය වන්නේ නිවසක් මිලදී ගැනීමේ මූලික ක්‍රියා පටිපාටිය ක්‍රමවත් ලෙස සිදුකරග ැනීම පමණි.

ඒ සඳහා ඔබ විසින් අනුගමනය කළ යුතු පියවර 6 ක් පිළිබඳව මෙතැන් සිට අපි අවධානය යොමු කරමු.

1. ණයවර(Credit) පහසුකම් සාදා ගැනීම
2. නිවාස ණය(Home loan) පහසුකම් සකසා ගැනීම
3. සුදුසු නිවාස වෙළඳ නියෝජිතයකුගේ සේවය ලබා ගැනීම.
4. ඔබට සුදුසු වටාපිටාවක් පිළිබඳ අධ්‍යයනය
5. අදාළ ලියකියවිලි සහ ඔබගේ සුරක්ෂිතභාවය පිළිබඳ සොයා බැලීම
6. තෝරාගත් නිවස ඔබට ගැළපීම සහ ඒ පිළිබඳ සෑහීමකට පත් වීම

1. **ණයවර**(credit) **පහසුකම් සාදා ගැනීම**

නිවසක් මිල දී ගැනීමට තීරණය කළ ඔබ ප්‍රථමයෙන් කළ යුතු කාර්යය වන්නේ නිවාස ණය මුදලක් අනුමත කර ගැනීමයි. නිවාස ණයක් අයදුම් කිරීමට පෙර ඔබ වෙත ණයවර (credit) පහසුකම් ඇත්දැයි අවධානය යොමු කළ යුතු වෙයි.

Credit **පහසුකම් යනු කුමක්ද?**

කැනඩාවට පැමිණි ඔබ මේ ණයවර පිළිබඳව දැනුවත් වී සිටීම අත්‍යවශ්‍ය වන්නක් වෙයි. ඒ අනුව ණයවර පහසුකම් සකසා ගැනීමට ණයවර කාඩ් පතක් ලබා ගත යුතු වෙයි. 'අපෝ ණය වෙන එක හරිම භයානකයි... අපි ණය වෙන්න කැමති නැති නිසා අපිට ඔය බැංකු ණය කාඩ් ඕනත් නෑ...' මේ ඇතැම් අය සිතන ආකාරය විය හැකි වුවත් කැනඩාවේදී නම් ඔබ කැමති වුවත් අකමැති වුවත් ක්‍රෙඩිට් කාඩ් පතක් භාවිත කළ යුතුම වෙයි. මන්ද යත්, ඔබගේ ණයවර යටගියාව (Credit History) ගොඩනගා ගැනීම අවශ්‍ය නම් ක්‍රෙඩිට් කාඩ් පතකින් සිදුකරන ගනුදෙනුද කළ යුතු වන හෙයිනි.

මෙය අපහසු කටයුත්තක් නොවෙයි. ඔබ කළ යුත්තේ ආසන්නයේම ඇති බැංකුව වෙත ගොස් ක්‍රෙඩිට් කාඩ් පතක් අයදුම් කිරීම පමණි. ඇතැම් අවස්ථාවල නවක සංක්‍රමණිකයන් හට ක්‍රෙඩිට් කාඩ් පත් සැපයීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් බැංකුවෙන් බැංකුවට වෙනස් වෙයි. නමුත් බොහෝ අවස්ථාවලදී ආරක්ෂිත ක්‍රෙඩිට් කාඩ් පතක් (Secured credit card) ඔබට ලබාගත හැකිවෙයි. එහිදී කළ යුත්තේ ඩොලර් 500 ක් වැනි මුදලක් තැන්පත් කොට අදාළ ක්‍රෙඩිට් පත ලබා ගැනීමයි. එතැන් සිට ඔබ නමට ක්‍රෙඩිට් වාර්තා ලිපි ගොණුවක් ක්‍රෙඩිට් කාර්යාංශය තුළ ගොඩ නැගෙන අතර එම වාර්තාව ශක්තිමත් කිරීම සඳහා එම ණයවර කාඩ්පත භාවිතය සහ එම ගත් ණය මුදල අදාළ කාලයට අනුව පියවීම සිදු කළ යුතු වෙයි. ක්‍රෙඩිට් කාඩ් පතක් ලබා ගෙන මේ ආකාරයෙන් ණයවර වාර්තාවක් සහිත අතීතයක් තබා ගැනීම තුළින් ඔබට නොයෙක් අන්දමේ ණය ඉල්ලුම් කළ හැකි අතර නිවාස, වාහන, අධ්‍යාපන ආදි ඕනෑම කටයුත්තක් සඳහා ණය අනුමත කර ගැනීම පහසු වෙයි.

නිවාස ණයක් ලබාගැනීමේදී ඔබ වෙත විශාල මූලික ගෙවීම් මුදලක් (Down payment) නොමැති නම් මෙම ණයවර අතීතය මාස 06 කට වඩා පැරණි විය යුතු වෙයි. ඇතැම් විට 20% ක් වැනි විශාල ප්‍රතිශතයක මුල් ගෙවීමක් සහිතව නිවෙස් මිල දී ගන්නා පුද්ගලයන්ගේ ක්‍රෙඩිට් අතීතය එතරම් පැරණි විය යුතු නොවෙයි. කිසිදු ක්‍රෙඩිට් අතීතයක් නොමැති අයෙකු නිවෙසක් මිල දී ගන්නේ නම් 35% ත් 50% අතර ප්‍රමාණයකින් යුත් මුල් ගෙවුම් මුදලක් ඔවුන් විසින් යෙදවිය යුතු වෙයි. නමුත් ඉහත මුල් ගෙවීම් ප්‍රතිශත බැංකුවෙන් බැංකුවට මෙන්ම පෞද්ගලික ණය සපයන්නන් විසින් අනුගමනය කරන ක්‍රමවේදයන් අනුව වෙනස් විය හැකියි. ඔබගේ ක්‍රෙඩිට් අතීතය පිරික්සුම තුළින් ඔවුන් ඔබ පිළිබඳ යම් විශ්වාසයක් ගොඩ නගා ගන්නා අතර ඒ අනුව ඔබගේ ණය මුදල අනුමත කර ගැනීම පහසු වෙයි.

ක්‍රෙඩිට් කාඩ් පතක් සමග ගනුදෙනු කිරීම ඇරඹූ දින සිට ඔබගේ ක්‍රෙඩිට් ලකුණු ගණනය වීම ඇරඹෙයි. ඒ අනුව ක්‍රෙඩිට් රපෝර්තු ඒජන්සි (Credit-reporting agencies) මගින් ඔබගේ ක්‍රෙඩිට් ලකුණු (Credit-Score) අංකනය කරනු ලබයි. කැනඩාවෙහි ක්‍රෙඩිට් රපෝර්තු ඒජන්සි ලෙස පිළිගත් ආයතන වනුයේ Equifax සහ TransUnion යන ආයතන ද්විත්වයයි. මෙම ආයතන මගින් 300 සිට 900 දක්වා අගයයන් තුළ ඔබගේ ක්‍රෙඩිට් තත්ත්වයට ලකුණු දෙනු ලබයි. තමාගේ ක්‍රෙඩිට් ස්කෝරය කොතැනක ඇත්දැයි පිරික්සුම තමාටම සිදුකර ගත හැකි කාර්යයකි. TransUnion Canada: 1-866-525-0262 - www.transunion.ca හෝ Equifax Canada: 1-800-465-7166 - www.equifax.ca වෙත පිවිස අදාළ ෆෝරම පුරවා එම කාර්යය ඉතා පහසුවෙන් නිවසේ සිටම ඔබට සිදුකර ගත හැකි වෙයි. ක්‍රෙඩිට් වාර්තාවේ යම් කිසි දෝෂ සහිත ස්ථානයක් ඇතොත් (උදාහරණ ලෙස, ඔබගේ නම ලියා ඇති ආකාරය ආදිය) එයද නිවැරදි කර ගැනීමේ අවස්ථාව ඔබට මෙහිදී හිමි වෙයි. එමෙන්ම ක්‍රෙඩිට් ස්කෝරයෙහි අගය අඩු නම් එය සිදුවූයේ කුමන හේතුවක් නිසාද යන්නද මෙහි පැහැදිලිව දක්වා ඇත.

**ක්‍රෙඩිට් ස්කෝර් අගය**

නිවාස ණයක් ලබාගැනීම යනු ඉතා විශාල මුදල් ගනුදෙනුවකි. මෙහිදී ඔබ නිවස මිල දී ගැනීම සඳහා යොදවනු ලබන මූලික මුදල 5%, 10%, 15% හෝ 20% විය හැකියි. ඉතුරු සියලුම බරපැන දරනු ලබන්නේ ණය මුදල ලබා දෙන බැංකුව හෝ පෞද්ගලික ආයතනය මගිනි. එහිදී ඔවුන් ඔබගේ නිවස උගස්කරයකට යටත් කොට මෙම ණය මුදල ලබාදෙනු ලබයි. ඒ සඳහා මාසිකව යම් පොලී අනුපාතයක්ද අයකරනු ලබන අතර මෙම ණය මුදල සැපයීමේදී ඔවුන් ඔබගේ ක්‍රෙඩිට් ස්කෝර් අගයයන් පිළිබඳව දැඩි අවධානයක් යොමු කරනු ලබයි. යම් ආකාරයකින් ඔබගේ ක්‍රෙඩිට් අගය සෑහීමකට පත් නොවන ආකාරයේ වේ නම් ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

සාමාන්‍යයෙන් ක්‍රෙඩිට් ස්කෝර් අගය 660 න් ඉහළ තබා ගැනීමට ඔබ සෑම විටම උත්සාහ කළ යුතු වෙයි. එවිට ඔබ යහපත් ක්‍රෙඩිට් (Good credit) හිමියකු ලෙස බැංකුව හා ණය දෙන ආයතන විසින් සලකනු ලබයි.

640- 659 දක්වා අගයක් ක්‍රෙඩිට් ස්කෝරයේ දැක්වේ නම් නිවාස ණයක් ලබා ගැනීම සඳහා මූලිකව ගෙවිය යුතු මුදල (Down payment) 5% ට වඩා යෙදවීමට ඔබට සිදුවිය හැකිය. ඊට අමතරව ආදායම් තත්ත්වය පිළිබඳ සාධනය කළ හැකි විස්තර ඉදිරිපත් කළ යුතු වෙයි. 640- 659 ස්කෝර් අගය සීමාස්ථ රේඛාව (Borderline) ලෙස හඳුන්වනු ලබයි.

යම් ආකාරයකින් ඔබගේ ස්කෝර් අගය 620 න් පහළ අගයක් ගන්නේ නම් ඔබ වහාම ඔබගේ ක්‍රෙඩිට් තත්ත්වය ඉහළ නංවා ගැනීම සඳහා කටයුතු කළ යුතු වෙයි. ඔබ විසින් ලබාගන්නා ලද ක්‍රෙඩිට් වාර්තාව සීරුවෙන් කියවා එහි නිවැරදි විය යුතු ස්ථාන පිළිබඳ ඔබගේ අවධානය ඉක්මනින්ම යොමු කිරීම කළ යුතු වෙයි. මෙය නොසලකා හැරියහොත් තත්ත්වය වඩාත් අවදානම් විය හැකි බවද ඔබ සිහි තබාගත යුතු වෙයි.

මෙහිදී ඔබගේ ක්‍රෙඩිට් ස්කෝර් අගය ඉහළ නංවා ගත හැකි ආකාරයන් කීපයක් මෙසේ දැක්විය හැකිය.

- වසරකට දෙවතාවක් පමණ ඔබගේ ක්‍රෙඩිට් වාර්තාව පරීක්ෂාවට ලක් කරන්න. මෙහිදී ඔබ විසින්ම ක්‍රෙඩිට් වාර්තාව ලබා ගතහොත් එය ඔබගේ ස්කෝර් අගයට බලපෑමක් එල්ල නොකරයි. එහෙත් බැංකුවක්, වෙළඳ ආයතනයක් හෝ වෙනත් පුද්ගලයකු මගින් එය පරීක්ෂා කිරීමේදී ඔබගේ ක්‍රෙඩිට් ස්කෝරයට බලපෑම් එල්ල විය හැකිය.
- ටෙලිෆෝන්, ගෙවල් කුලී, ජල, විදුලි බිල් ආදියෙහි ගෙවීම් කටයුතු නොපමාව සිදු කිරීම කළ යුතු වෙයි. ඇතැම් විට ඩොලර් 10, 20 වැනි සුළු මුදල් ගෙවීම් අතපසු කිරීම නිසා තම ක්‍රෙඩිට් ස්කෝරයෙහි අගය අඩු වූ අය කොතෙකුත් අපට හමු වී ඇත. මෙහිදී ඔබ ගෙවීමට ඇති මුදල ඉහළ අගයක්ද පහළ අගයක්ද යන්න පිළිබඳ ඔවුහු සැලකිල්ල යොමු නොකරති.
- මේ වන විටත් ඔබට අතපසු වූ බිලක් ඇත්නම් එය වහාම ගෙවා අවසන් කරන්න. ඔබගේ පමාව නිසා මෙම බිල්පත් collections ආයතන වෙත යොමු කර අයකිරීම්වලින් ඉවත් කර (charge-offs) ඇත්නම් එය සෘජුවම ඔබගේ ක්‍රෙඩිට් සඳහා බලපෑම් එල්ල කරන්නක් වෙයි.
- ණය ලබාගෙන ඇත්නම් ඒවා පියවා දැමීම. (loans, credit cards, lines of credit, etc)
- සෑම විටම ක්‍රෙඩිට් පතෙහි කැපී පෙනෙන ශේෂයක් තබා ගැනීම සුදුසු වේ. මෙහිදී ක්‍රෙඩිට් පතෙහි ණය සීමාව හා හිඟ ශේෂය පිළිබඳ අවධානය යොමු කළ යුතු වෙයි. අවම වශයෙන් ක්‍රෙඩිට් කාඩ් පතෙහි ණය සීමා අගයෙන් 10% ක් හෝ කාඩ්පතෙහි ඉතිරිව තිබීම යෝග්‍ය වේ. කිසිදු විටෙක ණය සීමා අගයට වැඩියෙන් කාඩ්පත භාවිත කිරීමෙන් වළකින්න.
- ඔබ කෙටි ක්‍රෙඩිට් අතීතයක් (Short credit history) සහිත අයෙක් නම් එකවර ගිණුම් කීපයක් ඇරඹීම සුදුසු නොවේ. එලෙස අනවශ්‍ය ලෙස ක්‍රෙඩිට් කාඩ් ගිණුම් ඇරඹීම ක්‍රෙඩිට් ස්කෝරයට බලපෑම් එල්ල කරන්නක් වෙයි. විශේෂයෙන්ම වෙළඳ ආයතන මගින් නිකුත් කරන ක්‍රෙඩිට් කාඩ්වලදී ඔබ මේ පිළබඳව අවධානයෙන් සිටීම සුදුසු වේ. ඔබ ක්‍රෙඩිට් කාඩ් පතක් අයදුම් කරන සෑම අවස්ථාවකදීම ඔබගේ ක්‍රෙඩිට් අතීතය පිළිබඳ වාර්තාවක් බැංකු හෝ වෙනත් ආයතන මගින් ලබා ගනියි. එහිදී මෙම සෑම සෝදිසියක්(inquiry) සඳහාම ඔබගේ ක්‍රෙඩිට් ස්කෝරයෙහි අගය අඩු වෙයි.
- නිවසක් මිල දී ගැනීමට අදහස් කරන ඔබ විශාල ණය මුදල් අයදුම් කිරීමෙන් වැළකී සිටීම සුදුසු වෙයි.
- සෑම විටම වගකීමකින් යුක්තව ක්‍රෙඩිට් කාඩ් පත භාවිත කිරීම සුදුසු වෙයි.

නිවසක් මිල දී ගැනීමට අදහස් කරන ඔබ ඊට සූදානම් විය යුතු ආකාරය පිළිබඳ අනෙකුත් කරුණු පිළිබඳව අපි ඉදිරි කලාප තුළින් සාකච්ඡා කරමු.

**ගාමිණී අබේසිංහ CNE.ABR**
**ඔන්ටේරියෝ නිවාස හා දේපොළ වෙළඳාම් සංගමයෙහි බලයලත් දේපල හා නිවාස වෙළඳාම් අලෙවි නියෝජිත**

# සුබවාදී අදහස් ඇත්නම් ආතතියෙන් මිදිය හැකියි

**මානසික ආතතිය ඇති වන්නේ ඇයි?**

මානසික ආතතියට හේතු වන සාධක අප ආතතිකාරක නමින් හඳුන්වනු ලබනවා. මෙම ආතතිකාරක පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ විය හැකියි. වයස, කාලය, පෞරුෂය, අත්දැකීම් ආදියද මානසික ආතතිය ඇතිවීම කෙරෙහි බලපාන්න පුළුවන්. උදාහරණයකින් මෙය දැක්වුවහොත් විභාග ශාලාවකට යන සිසුවෙකුට බස්රථය ප්‍රමාද වුවහොත් ඔහු තුළ දැඩි ආතති තත්ත්වයක් ඇතිවෙන්න පුළුවන්. එහෙත් බස්රියක් පැමිණීමෙන් පසුව ඔහුගේ ආතතිය නිම වෙනවා.

මෙවැනි අවස්ථාවකදී ඇතිවන්නේ කෙටි කාලීන ආතති තත්ත්වයක්.

එහෙත් වසර ගණනාවක් මුළුල්ලේ සිය ආබාධිත දරුවා වෙනුවෙන් ජීවිතය කැප කළ මවකට ආතතිය ඇති විය හැක්කේ මීට වඩා වෙනස් ආකාරයකින් ආබාධිත දරුවා වෙනුවෙන්ම ජීවිතය කැපකළ නිසා ඇයට බාහිර පරිසරය හා ගැටීමට කටයුතු කිරීමට ලැබෙන්නේ නැහැ.

ඒකාකාරී ජීවන රටාව නිසා එවැනි කාන්තාවන් තුළ දිගු කාලීනව බලපෑම් කළ හැකි ආතතියක් හට ගත හැකියි.

එහෙත් තම බිරිඳ, සැමියා, දරුවන් මිය යාම වැනි ප්‍රබල සංසිද්ධීන් ඊට මුහුණපානු ලබන සැම දෙනාම අතර එකසේ ආතතියක් ඇති කිරීමට සමත් වෙනවා.

මෙම තත්ත්වය සංස්කෘතිය අනුවද වෙනස් වන අවස්ථා තිබෙනවා. උදාහරණ ලෙස බටහිර රටක කාන්තාවකට දික්කසාදය ඇතැම් විට ආතතිකාරකයක් නොවිය හැක. නමුත් ලාංකීය කාන්තාවකට එය ඉතා ප්‍රබල ආතතිකාරකයක් විය හැකියි.

එකම කඩයිම් පරීක්ෂණයකට මුහුණ දී අසමත් වූ සිසුන් දෙදෙනකු අතරින් එක් අයෙක් කම්පනයට පත්ව ආතතියට මුහුණ දීමත් අනෙක් සිසුවා එය නොසලකා හැර පෙර සිටි ලෙස ප්‍රීතිමත්ව ජීවිතයට මුහුණ දීමත් එකම සිදුවීමකට දක්වන වෙනස් ප්‍රතිචාර ලෙස දක්වන්න පුළුවන්.

කෙසේ වුවද පුද්ගලයා තම ගැටලුවට මුහුණ දෙන ආකාරය, ඔහුගේ පෞරුෂය, ප්‍රජානන හැකියාවන්, ඔහුගේ ආකල්ප, තීරණ ගැනීමේ හැකියාවන් ආදිය ආතතිය ඇතිවීම කෙරේ සෘජුවම බලපෑම් ඇති කරන්නට සමත් වෙනවා.

ප්‍රධාන වශයෙන්ම අවස්ථා තුනකදී මානසික ආතතිය ඇතිවිය හැකියි.

1. ව්‍යවසනයන් (Catastrophic events)
2. ප්‍රධාන ජීවන වෙනස්වීම් (Major life changing)
3. දෛනික ජීවිතයේ ගැටුම් (Daily hassles)

බොහෝ සරල යැයි සිතිය හැකි ඇතැම් ගැටුම් පවා දිගු කාලීනව පවතිද්දී පුද්ගලයින් තුළ ආතතිය ඇතිවන්න පුළුවන්. උදාහරණ ලෙස අසල්වැසියාගේ කරදර, අධික තදබදය තුළ සිටීම, නිරන්තර අධික ශබ්දය ඇසීම, තමන් අප්‍රිය පුද්ගලයන් සමඟ කටයුතු කිරීමට සිදුවීම.

**ආතතිය නිසා රෝගී වීම**

ආතතියට ගොදුරු වූ පුද්ගලයාට මතකය සහ මනස සමබරව තබා ගැනීමට අපහසුයි. දෑත් දෙපා වෙව්ලීම, සීතලවීම, තොලකට වේලීම, අධික හෘදස්පන්දනය, හිසරදය, නින්ද ආශ්‍රිත ගැටලු, බඩපුරවා දැමීම, ආහාර අරුචිය මෙන්ම මානසික වශයෙන් කාංසා සහගත සිතිවිලි සතුට නැතිකම ආදි ලක්ෂණ ඔවුන් තුළ පොදුවේ දකින්න පුළුවන්.

එමෙන්ම දිගු කාලයක ආතතියට මුහුණ දීම නිසා විවිධ සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදුවෙනවා.

අධි රුධිර පීඩනය, හෘදයාබාධ, ගැස්ට්‍රයිටිස්, ආමාෂික වණ, දිගුකල් පවතින සුව නොවන කායික වේදනා සහ බොහෝ සෞඛ්‍ය ගැටලු ආතතිය නිසා හටගන්නවා.

දරුණු ලෙස ආතතියට ගොදුරු වූ ඇතැම් පුද්ගලයන්ට පිළිකා ඇතිවීමේ අවදානම් තත්ත්වයක් පවතිනවා.


ආතතිය නිසා මිනිසාගේ ප්‍රතිශක්ති පද්ධතිය දුර්වල වී ඔහු පහසුවෙන් ලෙඩරෝගවලට ගොදුරු වීම කෙරේ බලපානු ලබනවා. එමෙන්ම ආතතිය දිගුකල් පැවැතීම නිසා පුද්ගලයා විශාදය වැනි මානසික රෝගවලට ගොදුරු වීමටත් පුළුවන්. ආතතිය නිසා ඇතැමුන් මත්පැන්, මත්ද්‍රව්‍ය ආදියට ගොදුරුවීමේ ප්‍රවණතාවක්ද පවතිනවා. එනිසා ආතතිය, එය ඇතිවූ පුද්ගලයාට පමණක් නොව ඔහු අවට සිටින්නවුන් කෙරේද ඇති කරනු ලබන්නේ අහිතකර බලපෑමක්. සමස්තයක් ලෙස ගතහොත් එය මුළු සමාජ සංවර්ධන ක්‍රියාවලියටම ඇති කරනු ලබන්නේ අහිතකර බලපෑමක්. එබැවින් ආතතිය කුමක්දැයි හඳුනාග ැනීමත් ඊට මුහුණ දෙන්නේ කෙබඳු අයුරකින්ද, එය පිටුදකින්නේ කෙලෙසින්ද යන්න දැනගැනීම සෑම දෙනෙකුටම පාහේ ඉතා වැදගත්ය.

**ආතතියෙන් මිදීම සඳහා කළ යුත්තේ කුමක්ද?**

කුමන හෝ අසහනකාරී, පීඩාකාරී තත්ත්වයක් ඔබට ඇති වුවහොත් සිය විශ්වාසදායක ප්‍රඥාවන්ත හිතමිතුරෙකු, ඥාතියෙකු හෝ යම් විශේෂිත පුද්ගලයකු සමඟ පැවැසීම මඟින් ඔබේ හිතේ බර මඳකට හෝ සැහැල්ලු කර ගැනීමට පුළුවන්. එහෙත් ඔබේ ගැටලුව පවසනු ලබන පුද්ගලයා කෙබඳු කෙනෙක්ද යන්න මෙහිදී ඉතා වැදගත්.

ආතතිය ඇතිවීම කෙරේ පුද්ගල ආකල්පද ඉතා ප්‍රබල ස්ථානයක් ගන්නවා. බොහෝ විට සෘණාත්මක ආකල්ප ඇති පුද්ගලයාට ආතතිය ඇතිවීමේ වැඩි ප්‍රවණතාවක් ගන්නවා. සුබවාදී සහ ධනාත්මක ආකල්ප ඇති පුද්ගලයා බොහෝ විට සිය ගැටලුව තුළ පීඩා විඳිමින් ජීවත්වීමට උත්සාහ දරන්නේ නැහැ. සිය ගැටලුවලට හේතු සොයා බලා ඒවා නිවැරැදි කර ගැනීමට උත්සාහ ගන්නා අතර නිතරම ධනාත්මක චිත්ත වේග ඇති කරගනු ලබනවා.

තමන්ට පහසුවෙන් ළඟා විය හැකි ඉලක්ක තබා ගැනීම සහ ඉටුකර ගත නොහැකි ආශාවන්ගේ ඈත් වී සිටීමට හුරු පුරුදු වීම පුද්ගලයාට මානසික ආතතියෙන් මිදීමට ඉතා හොඳ උපකාරයක් ලබා දෙනවා.



වත්මන් සමාජයේ මිනිසා ආගම දහමින් බොහෝ දුරස්ව හිඳින බවක් දක්නට ලැබෙනවා.

සෑම ආගමක් තුළින්ම මිනිසාගේ දිවි පැවැත්ම යහමගට ගැනීමට උත්සාහ දරන අතර ආගමානුකූල දිවි පැවැත්මකට නැඹුරුවීම ආතතියෙන් මිදීමට හොඳ මාර්ගයක් වෙනවා.

ආතතියෙන් තොර සුවදායී ජීවිතයක් සඳහා ශක්තිමත් පවුලක් තිබීම අනිවාර්ය දෙයක්. එහිදී එකිනෙකාට ඇතිවන ගැටලු, ප්‍රශ්න සහ පීඩාකාරී දෑ පිළිබඳ එකිනෙකාට නිවැරැදි අයුරින් සන්නිවේදනය කිරීමට හැකිවන බැවින්, එවැනි පවුල්වල පුද්ගලයන්ට ආතතිය අවම කරගැනීමට ඉතා හොඳ ඉඩකඩක් තියෙනවා.

ආතතියෙන් මිදීමට සංගීතය ඉතා හොඳ ඔසුවක් බව මනෝ විද්‍යාඥයන් සොයාගෙන තිබෙනවා. කර්ණ කඨෝර සංගීතය නොව රාගධාරී සම්භාව්‍ය සංගීතය (Baroque music) මිනිසාගේ ආතතිය අවම කරන අතර හෘද රෝග පවා සුව කිරීමට එය ඉවහල් වනවා. එනිසා දිනකට මඳ වෙලාවක් හෝ සංගීත ඛණ්ඩයක් රස විඳීමට අවස්ථාව සලසා ගැනීම ඉතා වැදගත්.

ස්වාය ව්‍යායාම, යෝග සහ භාවනා මෙන්ම ලිහිල් අභ්‍යාස ආදියෙහි නිරත වීමද ආතතියෙන් මිදීමට ඉතා හොඳ ක්‍රමවේදයක්. කොතරම් කාර්යබහුල වුවද තම ජීවිතය සුවදායක තත්ත්වයකට ගෙන ඒම සඳහා පුද්ගලයා යම් කැප වීමක් කළ යුතු වෙනවා. එහිදී ආතතිය අවම කරගැනීමට පහත සඳහන් ක්‍රම උපයෝගී කරගැනීමට කවරෙකුට වුවද ඉතා පහසුයි.

- විනෝද ගමන්බිමන්වල යෙදීම
- යහපත් මිත්‍ර සබඳතා ඇතිකර ගැනීම, ඔවුන් හා සංවාදයේ යෙදීම.
- ප්‍රමාණවත් නින්දක් ලැබීම.
- තමන් ප්‍රියකරන විනෝදාංශයක නියැලීම.
- වැඩියෙන් සිනාසීම.
- උද්‍යානයක, මුහුදු වෙරළක කාලය ගත කිරීම.
- තමන් කැමැතිනම් සුරතල් සතෙකු ඇති කිරීම.
- පරිසරයේ සුන්දරත්වය (මල්, ගස්වැල්, පළතුරු) විඳීම.
- යහපත් ලිංගික සබඳතා, ආදර කථා කියවීම, හාස්‍ය ජනක කථා, චිත්‍රපට නැරැඹීම.
- වැඩිපුර පළා, පළතුරු හා නැවුම් එළවළු ආහාරයට ගැනීම.

ආතතියෙන් මිදීමට ඉහත ක්‍රම ඉතා වැදගත් වුවද පුද්ගලයාට ආතතිය රෝගයක් ලෙස ඉස්මතු වූ පසු ඉහත ක්‍රම ඉන් මිදීමට ප්‍රමාණවත් වන්නේ නැහැ. එහිදී ආතතියට ලක්වූ පුද්ගලයා උපදේශනයකට යොමුවීම අනිවාර්ය කාරණයක්. එහිදී උපදේශකවරයා ඔහුගේ ආතති ස්වභාවය අවබෝධ කරගන්නා අතර ඔහුට අවශ්‍ය උපදේශනය සහ මනෝ ප්‍රතිකාර ආරම්භ කරනු ලබනවා.

ගාමිණී සුසන්ත


CEYLON TEA
SYMBOL OF QUALITY
Tea 4u.
What's your flavour today?
Experience Nature's Most Exclusive Teas
2g X 25tb Individually Foil wrapped Black Tea
available in following flavours 100% Natural
Black Current , Cinnamon
Romance , Forest Fruits
Peach , Lime
Mixed Fruits ,Lemon
Raspberry , Vanilla
Strawberry , Earl Gray
Cardamom
Lemon
Forest Fruits
Mixed Fruit
Cinnamon
100g Loose Tea Infused with real fruits & flowers
Mint GREEN TEA
Ginger GREEN TEA
Spice GREEN TEA
Ginger , Mint , Jasmine , Dragon fruit , Spice Tea
Lotus , Cherry , Strawberry , Blueberry
Wild Berries , Passion Fruit
$6.99 each or 3 for $19.99
NO ARTIFICIAL INGREDIENTS
100% NATURAL
2g X 25tb Individually
Foil wrapped Green Tea
Lime , Earl Gray
Jasmine , Peach
Strawberry
$3.99 each or
3 for $9.99
Jasmine Green Tea
Sour Sop Green Tea
Green Tea
Tea 4u.
SELECTIONS
AITH International (pvt) Ltd Tel: 416 525 1252



# රුහුණේ ශාන්ති කර්ම

**මෙම ලිපියෙහි පළමු කොටස පසුගිය කලාපයේ පළ විය.**

## යකුන් තොවිල්

යකුන්ගෙන් සිදුවන්නා වූ දෝෂාන්ධකාරයන් මඟ හරවා ගැනීම උදෙසා පවත්වනු ලබන යකුන් තොවිල්වල පැතිරී යාම රුහුණේ තරමට අන්කිසිම ප්‍රදේශයක නොවීම එම ප්‍රදේශයට සුවිශේෂ වූවකි. අද දක්වා ප්‍රධාන යකුන් තොවිල් හතරක් හෝ භාවිතයේ පැවතීම ජාතියේ වාසනාවකි. සූනියම, සන්නි යකුම, මහසෝන් සමයම හා රිද්දි යාගය යන ප්‍රධාන යකුන් තොවිල් හතරේදී ප්‍රධානත්වයට ගන්නා යක්ෂ කොට්ඨාස හතරකට වෙන් වී ඇත. ඒ ඒ යකාගේ ප්‍රධානත්වය ලැබීම හේතු කොට ගෙන අදාළ ශාන්තිකර්මය එකී යකාගේ නමින් හැඳින්වීමට පටන් ගත් බැව් පෙනේ.

## සන්නි යකුම

සන්නි යකාගෙන් සිදුවන්නා වූ දෝෂයන් ලෙස ගැනෙන සන්නි රෝග දුරු කරනු වස් සන්නි යකුට ප්‍රධානත්වය ලැබෙන්නේ සන්නි යකුමේදීය. සන්නි යකුන් 18 දෙනෙකු පිළිබඳව කියවෙන බැවින් ඇතැම් විට මෙම ශාන්තිකර්මය දහඅට සන්නිය යන නමින්ද හඳුන්වනු ලැබේ. මෙම ශාන්තිකර්මය හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, කොළඹ, ගම්පහ යන දිස්ත්‍රික්කයන් පුරාම පැතිරී යාමක් ඇතත් ගාලු-මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවලදී දැකිය හැකි වූ ප්‍රාදේශීය විශේෂතා රැසකි.

සන්නි යකාගේ උත්පත්තිය සම්බන්ධයෙන් ප්‍රධාන උපත් කතා දෙකක් හමුවේ. ඉන් එකක් දං උදි කතාන්තරය වන අතර අනෙක වන්නේ සංඛපාල කතාන්තරයයි. අතිශයින් ප්‍රචලිත කතාන්තරය වන්නේ සංඛපාල කතාන්තරයයි.

ලිච්ඡවි රාජ පරම්පරාවට අයත් රජ කෙනෙක් වූ සංඛපාල රජුගේ අග මෙහෙසිය වූ ආයුපාලා බිසවගේ කුසයෙන් සන්නි යකා උපන් බැව් කියවේ. රජුන් කුරු රට යුද්ධයට ගොස් සිටියදී මහ ඇමති සමග අනිසි සම්බන්ධතාවක් බිසවුන් තුළ පැවති බවට ගොතන ලද බොරුවක් දාසිය විසින් පැවසීමෙන් කෝප වූ රජ, බිසව එල්ලා මැරීමට නියම කළේය. එකී අවස්ථාව වන විට රජුට දාව බිසවගේ කුස පිළිසිඳ ඇති කුමරා ඇගේ මෘතදේහයෙන් ඉපදී සිය පියාගෙන් පළිගැනීමට විශාල මහනුවරට යකුන් දහඅට දෙනෙකු සමග ගිය බැව් අදාළ කතා ප්‍රවෘත්තියෙන් කියවේ.

**මර හඬ තලා පැනලා විසල් පුරයට**
**මරූ යකු විලස් පා වැද රජ විමානෙට**
**බොරූ බස් අසා මගෙ මව් මැරූ පළියට**
**මරූ පස්සේ අරිම් නුඹෙ සෙනඟ අද සිට**

## මහසෝන් සමයම

මහසෝනාගෙන් සිදුවන්නා වූ දෝෂාන්ධකාරයන් මඟහරවා ගනු වස් මහසෝනාට ප්‍රධානත්වය ලැබී ඇති ශාන්තිකර්මය මහසෝන් සමයමයි. හම්බන්තොට හා මාතර දිස්ත්‍රික්ක මෙකී ශාන්තිකර්මය සඳහා සුවිශේෂ වෙයි. පහතරට නර්තනය භාවිතයේ එන්නා වූ අනෙකුත් ප්‍රදේශයන්හි මහසෝන් සමයමෙහි භාවිතයක් නොමැත. අතිශයින් ප්‍රබල ශාන්තිකර්මයක් වූ මහසෝන් සමයම සුව කළ නොහැකි තත්ත්වයේ පසුවන්නා වූ රෝගාතුරයින් උදෙසා පැවැත්වීම සාමාන්‍ය සිරිතයි.

මහසෝනා ලෙඩ කරනු ලබන්නේ පහර දීමෙනි. එසේ පහර දීමෙන් පසු පිට පෙදෙස නිල් පැහැ ගැන්වී අතේ ඇඟිලි සළකුණු පවා පිහිටන බැව් විශ්වාස කරති. පිස්සු විකාරයෙන් නන් දෙඩවීම, ඔල්මාදයෙන් දුව පැන ඇවිදීම, කක්කල් කැස්ස, දිය පිපාසය, කෑම අරුචිය, උදර රෝග ඇති වීම හා ඉදිමීම මහසෝනා විසින් ඇති කරනු ලබන රෝග බව යකැදුරෝ විශ්වාස කරති.

මහසෝනාගේ උත්පත්තිය පිළිබඳව කියවෙන කතා කිහිපයකි. ඉන් එක් කතාවකට අනුව ගජ කුම්භකාරියගේ කුසයෙන් සෝවැලි ගජන්තයාට ජාතකව මහසෝනා උපනි. පෙර ඇතිකර ගන්නා ලද වෛරයන් හේතු කොට ගෙන කුම්භකාර ගෝත්‍රයක උපන් මහසෝනාට කුරිරු වෙස් මැවුනි.

**නමින් පෙර සිරිපා**
**කුම්භකාරිගෙ උපතා**
**එතැන් සිට පැවතා**
**කියන් මහසෝනගේ උපතා**
**පෙර වෛරයකිනා**
**කුම්භකාරියගේ කුසිනා**
**පිරී දස මසිනා**
**අඳේ නැකතින් බිහිව එදිනා**
(මහසෝන් කවි)

තවත් තැනක කියැවෙන්නේ බස්මා අසුරයා දවා පිළිස්සූ සොහොන් අඟුරෙන් මහසෝනා උපන් බවයි. දුටුගැමුණු රජුගේ දසමහා යෝධයින් වූ ගෝඨයිම්බර හා මහසෝනා යන දෙදෙනා මරණින් මතු රකුසු වෙස් මැවී උපන් බව කියවෙන කතා ප්‍රවෘත්තියක්ද ඇත. හැන්දෑවේ 6.00 ට ආරම්භ වන 'මහසෝන් සමයම' නම් ශාන්තිකර්මය පසුදා පහන් වනතුරු පැවැත්වෙන තුන් සමයම් තොවිලයකි.

## රිද්දි යාගය

රුහුණේ ප්‍රචලිත ශාන්තිකර්ම අතර යකුන් වෙනුවෙන් කාන්තාවන් උදෙසා පමණක් පවත්වනු ලබන එකම ශාන්තිකර්මය රිද්දියාගය හෙවත් රට යකුමයි. වඳ ස්ත්‍රීන් උදෙසා දරුවන් ලබාගැනීමේ අපේක්ෂාවෙනුත් පිළිසිඳුනු ගැබෙහි ආරක්ෂාව පතා යහතින් දරු උපත සිදුවීමත් යන කරුණු අරභයා රිද්දි යාගයක් පැවැත්වීම සාමාන්‍ය සිරිතයි.

කළු කුමාරයාගේ බලපෑමෙන් වඳ බවට පත් රිද්දි බිසෝ සත්දෙනා මෙම යාගයේදී ප්‍රධාන වශයෙන් ඇදහුම් ලබන්නේය. භාවාත්මක නිරූපණ රැසක් අන්තර්ගත ශාන්ති කර්මයක් වන රිද්දි යාගය රුහුණේ ආරම්භ වූවක් බවට හේතු සාධක රැසක් ලැබෙයි. රිද්දි බිසවුන්ගේ උත්පත්තියට සම්බන්ධ කම් කියැවෙන උයන්ගොඩ, හුංග මට ආසන්නයේ පිහිටි වෙරලාසන්න ගම්මානයකි. වලවේ ගඟේ අතු ගංඟාවක පිහිටියා වූ ආභරණඇල්ල රිද්දි උපතට බෙහෙවින් බලපායි.

**කොයිබ සිට එන්නේ ඇල්ලි මැල්ලියේ**
**රුහුණු සිටයි එන්නේ ඇල්ලි මැල්ලියේ**
**අතේ පයේ ගිගිරිද සෙල්ලි සෙල්ලියේ**
**රොඩී සැමට නායක රතන වල්ලියේ**

හම්බන්තොට, මාතර, ගාල්ල යන දිස්ත්‍රික්කවල විශේෂ පැතිරී යාමක් ඇති රිද්දි යාගය රුහුණේදී සැකසුන ශාන්ති කර්මයකි. වැදි ජනයා අතර ප්‍රචලිතව පැවති කිරි අම්මා ඇදහීමේ චාරිත්‍රය ඇසුරින් රිද්දි යාගය සිංහල යාගයක් ලෙස විකාශනයට පත්ව ඇති බැව් කිරි අම්මා උපතත් රිද්දි බිසවුන්ගේ උපතත් සංසන්දනාත්මකව බැලීමේදී පෙනේ. රිද්දි යාගය භරත මුනිවරයා විසින් නාට්‍ය ශාස්ත්‍රයෙහි පෙන්නුම් කරන නෘත්‍ය ලක්ෂණයන් අන්තර්ගත එකම සිංහල ශාන්තිකර්මය වීම සුවිශේෂ බවක් ගනී.

## සූනියම

සූනියම යනු කොඩිවිනයයි. කොඩිවින කැපීම හෙවත් සූනියම් කැපීමේ ශාන්තිකර්මය සූනියම් කැපිල්ල හෙවත් සූනියම් ශාන්තිකර්මය යනුවෙන් හඳුන්වනු ලැබේ. ඔඩ්ඩිස යාගය, කැපුම් ශාන්තිය, මැණික්පාල ශාන්තිය යන නම්ද මීට පර්යාය වෙති. ඊර්ෂයා සහගත සිතින් හෝ පළිගැනීමේ අදහසින් කෙනෙක් විසින් තවත් කෙනෙකුට, පවුලකට, ගම්බිම්වලට, යානවාහනවලට කරනු ලබන විනදොස් හෝ නිසි අයුරින් ගෙවල් දොරවල් නොතැනීම, ලිං නොකැපීම, විහාර දේවාල ආදිය සැකසීමේ සදොස් බව, ප්‍රතිමා මූර්ති ආදියට නිසි වතාවත්වලින් තොරව නේත්‍ර තැබීම ආදි කරුණුවලින් ඇතිවන්නා වූ වස්දොස් හේතුකොට ගෙන හටගන්නා වින දොස් දුරු කිරීම උදෙසා සූනියම් ශාන්තිකර්මය පවැත්වීම සාමාන්‍ය සිරිතයි.

විෂ්ණු දෙවියන්ගේ නැගණිය වූ මැණික්පාල බිසව වසවතු සමග විවාහ වන බවට දී ඇති විවාහ පොරොන්දුවක් කඩකිරීම හේතුවෙන් මහා සම්මත රජු සමග විවාහ වූ මැණික්පාල බිසවට වසවතු වින දොස් ඇති කළ බැව් අදාළ උත්පත්ති කතාවෙන් කියැවේ. මෙම වින දෝෂය දුරු කිරීම සඳහා අජාකූටයෙන් ඔඩ්ඩිස ඍෂි ඇතුළු ඍෂිවරයන් නව දෙනෙකු කැඳවා කරන ලද යාගය ඔඩ්ඩිස යාගය හෙවත් මැණික්පාල ශාන්තිය වන බවත් එකී ශාන්තිකර්මයේ පැවති පුද පෙත් අනුකරණය කොට ඒ ආනුභාවයෙන් සෙත් පැතීම සූනියම් යාගයේ ප්‍රධාන ලක්ෂණය බවත් පෙනේ.

හත් අඩි, වැල්වලලු, අන්නාසි , හොඬල අල, තැඹිලි, අටමගල, පුසුල් යනුවෙන් තීන්දු හතක් කැපීම මෙහි අන්තර්ගත ප්‍රධාන ශාන්ති විධීන්ට අයත්ය. යාගයේ පුද ලබන ප්‍රධානියා වන්නේ සූනියම් දෙවිඳු හෙවත් සූනියම් යකාය. මොහු යක් බවෙහි පුද ලබන්නේ සූනියම් යකා හෙවත් ඔඩ්ඩි යකා නමිනි. ලක්දිව පවත්නා ශාන්තිකර්ම සැරසිලි අතර ඉතාමත් දර්ශණීය නිමාවකින් හෙබි සැරසිල්ල අයත් වන්නේ අටමගල වීදි සැරසිල්ලටයි. පැරණි සිංහල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත මල්කම්, ලියකම් ඇතුළත් හබරල කොළයෙන් හා ගොක් කොළයෙන් නිම කරන ලද සියුම් කැටයම් රාශියක් මෙයට අන්තර්ගතය.

## දේව තොවිල්

දෙවියන් හමුවේ පුද පූජා පවත්වා දෙවියන්ගේ පිහිට ආරක්ෂාව අපේක්ෂාවෙන් පවත්වනු ලබන ශාන්තිකර්ම දේව යාග හෙවත් දේව තොවිල් ලෙස හඳුන්වනු ලැබේ. මෙකී ශාන්තිකර්ම පොදුවේ මඩු ශාන්ති කර්ම ලෙසද ව්‍යවහාරිකය. රුහුණේ ව්‍යාප්තව පවත්නා දේව යාග අතර ප්‍රධානත්වයක් හිමිවන්නේ ගම් මඩුවටයි.

අස්වනු කපා ගෙට ගන්නා ගොවි ජනතාව ඉන් පළමු කොටස වෙන් කර තබන්නේ දෙවියන් උදෙසාය. දෙවියන්ට පළමු කොට වෙන් නොකොට පරිභෝජනයට ගැනීම දෙවි දොස් ඇති වේය යන විශ්වාසය මත පිහිටා එකී පුරුද්දට ගැමියෝ හුරු වී සිටිති. එබැවින් ගමක ජීවත් වන සියලුදෙනාගේ දායකත්වය හා සහභාගිත්වය ඇතිව ගම් මඩුවක් පවත්වා දේව දානය දී දෙවියන්ට පින් දීම කරනු ලැබේ. මින් අපේක්ෂා කරන ලද්දේ පසුගි ව වසර ඇතුළත සිය ගොවිතැන් බත සරුකර දීම සඳහා දෙවියන්ගෙන් ලද ආශිර්වාදය හා පිහිටාරක්ෂාවට තුති පුද කිරීමත් ඊළඟ වසරෙහි සරුසාර අස්වැන්නක් ලබාදීම සඳහා දේව බැල්ම ලබාගැනීමත්ය.

38 වන පිටුව බලන්න

ශ්‍රී ලංකා සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ
උපකුලපති
ජයසේන කෝට්ටගොඩ

# පොදු රාජ්‍ය...

6 වන පිටුවෙන්

යන්න ගැනයි. මෙම සමුළුවට සහභාගි වීමට පොදු රාජ්‍ය මණ්ඩල රටවල් 54 ක් නියෝජනය කරමින් රාජ්‍ය නායකයන්, විදේශ ඇමැතිවරුන්, ව්‍යාපාරිකයන්, ආයෝජකයන් සහ මාධ්‍යවේදීන්ද විශාල පිරිසක් පැමිණෙන නිසා අපේ රට පිළිබඳ ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයක අවධානය එකවර යොමු වෙයි.

මේ සමුළුව වාර්තා කිරීම සඳහා විදෙස් මාධ්‍යවේදීන් 500 ක් පමණ පැමිණෙනු ඇතැයිද අපේක්ෂා කෙරේ. ඔවුන් සමුළුව පිළිබඳ තම රටවල මාධ්‍ය ආයතනවලට සපයන මාධ්‍ය වාර්තා හරහා ඒ රටවල ජනතාවගේ පුළුල් අවධානයක්ද සමුළුව පවත්වන ශ්‍රී ලංකාව දෙසට යොමු වෙයි. මේ තුළ අපේ රටේ සංචාරක ආකර්ෂණය පිළිබඳ ලෝකයට පණිවුඩයක් දීමටද අපට ලැබෙන්නේ මහඟු අවස්ථාවකි. ඉන් ප්‍රයෝජන ගැනීම සඳහාද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා සංචරණය විසින් ආකර්ෂණීය වැඩපිළිවෙළක් දියත් කිරීමට අපේක්ෂිතය. මේ ගැන ඇමැති බැසිල් රාජපක්ෂ මේ ලියුම්කරුට පැවසුවේ මෙවන් අදහසකි.

'පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව පැවැත්වෙන කාලය තුළත් ඉන් පසුවත් අප රටට එන අයට රට තුළ නොයෙකුත් සංචාර සූදානම් කර තිබෙනවා. ඒ සංචාරවලින් සමුළුවට එන නියෝජිතයන්ට වගේම ඔවුන්ගේ පවුල්වල අයටත් අපේ ආකර්ෂණීය සංචාරක ස්ථානවලට නොමිලේම යන්න පුළුවන්. එසේම මේ කාලය තුළ අපේ රට ගැන, සංචාරක ආකර්ෂණ ස්ථාන ගැන දැනුවත් වෙන්නත් ඉඩ සලසනවා. එම නොමිලේ ලබාදෙන සංචාර හා දැනුවත් කිරීම් තුළ ඒ අයගේ රටවල වෙනත් අයටත් අප රට පිළිබඳ ලොකු පණිවුඩයක් යනවා. අපේ රටේ පවතින පිරිසිදු බව, ආගන්තුක සත්කාරය, සුහද සිනහව සහ අපේ ආහාර වර්ග යනාදිය ගැන දැනටමත් හොඳ ප්‍රතිරූපයක් සමුළුවට එන විදෙස් නියෝජිතයන් තුළ ගොඩනැගී තිබෙනවා. ඉතින් ඒ අය අපේ රටට ආවහම ඇත්තටම අපි ඒක තහවුරු කරන්න ඕන. ඒ නිසා මේ සමුළුව සාර්ථක කරගන්න එහි උපරිම ප්‍රතිලාභ රටට ලබාගන්න අපේ මුළු මහත් ජනතාවම සහභාගි වෙන්න ඕන'

ශ්‍රී ලංකාවේ මෙම රාජ්‍ය නායක සමුළුව පැවැත්වීමට ලද අවස්ථාව ගැන රජය සතුටට පත්ව සිටියත්, මේ සමුළුව අප රටේ පැවැත්වීමට එරෙහි නොයෙකුත් බලවේගද මේ මොහොතේ ක්‍රියාත්මකව සිටින බව අප අමතක නොකළ යුතුය. බටහිර රටවල සිටින කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාව මේ අතරින් ප්‍රධානය. ඔවුන් අප රටේ පවත්වන සමුළුවට සහභාගි නොවන්නැයි ඒ රටවල රාජ්‍ය නායකයන්ට නොයෙකුත් බලපෑම් කරමින් සිටී.

මෙහිදී අපේ අසල්වැසි ඉන්දියාවේ මධ්‍යම රජයටද, තමිල්නාඩුවේ දේශපාලන බලපෑම්වලට මුහුණ දීමට සිදුවනු ඇත. අප රටේ පවත්වන සමුළුවට ඉන්දියාවේ සහභාගිත්වය අපට ඉතා වැදගත්ය. තමිල්නාඩු දේශපාලන බලපෑම් හමුවේ ඉන්දියාවේ රාජ්‍ය නායකයා මේ සමුළුවට සහභාගි නොවුවහොත් එය ශ්‍රී ලංකාව දැඩි අපහසුවට පත් කරන්නකි. එසේම මේ සමුළුව අපේ රටේ පැවැත්වීම වෙනුවෙන් අපට අති විශාල මුදල් සම්භාරයක් වියදම් කිරීමටද සිදුවේ. දැනටමත් රජයට විශාල මුදල් ප්‍රශ්නයක්ද තිබේ. රජයේ බදු ආදායමද හොඳටම පහත වැටී ඇත. ඒ නිසා මේ සමුළුවට යන වියදම, රාජ්‍ය මූල්‍ය තත්ත්වය මත විශාල පීඩනයක්ද එල්ල කරනු ඇත. එහෙත් සමුළුවෙන් රටට ලැබෙන කීර්තිය, රටේ ප්‍රතිරූපය ඉහළ නංවා ගැනීමට ලැබෙන අවස්ථාව මුදලින් මැනිය නොහැකි එකකි. එහෙත් එම අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගෙන රටට උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට අප සමත් වන්නේද යන කරුණ මත මේ සමුළුවට අප කරන වියදම කෙතරම් රටේ හෙට දවසට ආයෝජනයක් වන්නේද යන්න තීරණය වනු ඇති බව මෙහිදී අවසාන වශයෙන් සටහන් කළ යුතුය.

(මෙම ලිපිය දිවයින පුවත්පතේ පළවූවක් බව කරුණාවෙන් සලකන්න)

# ඈන් ෆ්‍රෑන්ක්...

8 වන පිටුවෙන්

ඈන් දෙදෙනාම ටෛෆස් උණෙන් මිය ගියහ. ඈන් මිය ගොස් තිබුණේ බ්‍රිතාන්‍ය හමුදාවන් මගින් සිරකරුවන් ගලවාගන්නට දින කිහිපයකට පෙරාතුවය.

1945 අප්‍රේල් මාසයේදී බ්‍රිතාන්‍ය හමුදාව සිර කඳවුරුවල දුක් විඳින ජනතාව ගලවා ගන්නා විට නෙදර්ලන්තයෙන් ගෙන ආ අයගෙන් ඉතිරිව සිටියේ 5,000 ක් පමණි. ගෙන ආ මුළු සිරකරුවන් සංඛ්‍යාව 107,000 ක් විය. එහෙත් පන්දහසක් වූ ගැලවුම් ලැබුවන් අතර ඔටෝ ෆ්‍රෑන්ක්ද සිටියේය.

රහස් නිවහනේදී ෆ්‍රෑන්ක් පවුල රැක බලාගත් අයෙකු වූ 'ගී'(Gie) නමැති මහත්මියක් ඈන් ලියූ සියලු දෑ ඇගේ දින පොතද සමගින් ඉතා සුරක්ෂිත ලෙස තබා තිබුණේ නැවත ආපසු ආ දිනෙක ඇය වෙත දෙන බලාපොරොත්තුවෙනි. ඔටෝ ෆ්‍රෑන්ක් මහතා තම බාල දියණිය පිළිබඳව බොහෝ දෑ දැනගත්තේ ඇගේ දිනපොත සහ අනෙකුත් සටහන් කියවීමෙන් අනතුරුවය.

ලේඛිකාවක් වන්නට ඇය තුළ තිබූ අභිමතාර්ථය අවබෝධ කොටගත් ඔහු ඈන්ගේ දින පොත මුද්‍රණය කිරීම සඳහා කටයුතු යෙදුවේය. එය සිදු කෙරුණේ පියාට අවැසි පරිදි සංශෝධනය කිරීමෙන් අනතුරුවය. ලන්දේසි භාෂාවෙන් ලියැවුණු එහි පළමු මුද්‍රණය නිකුත් වූයේ 1947 දීය.

ලොව පුරා මහත් ආන්දෝලනයක් ඇති කළ ඈන් ෆ්‍රෑන්ක් දිනපොත ජපානයේ පළමු මුද්‍රණයෙහි පමණක් පිටපත් ලක්ෂයක් අලෙවි විය. ඈන් ෆ්‍රෑන්ක් දිනපොත කිහිප වතාවක්ම උසාවියටද ගියේය. 'ඈන් ෆ්‍රෑන්ක්' නම් දැරිය අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරියාද අත්අඩංගුවට ගත යුතු යැයි පොත කියවූ බොහෝ අය බලපෑම් කළහ. අවසානයේදී ඔහු සිර භාරයට ගෙන ප්‍රශ්න කෙරිණි. මෙවැන්නක් වයස 13ක 14ක දැරියකට ලිවිය නොහැකි යැයි ප්‍රසිද්ධියේ පැවසූ ගුරුවරයකුට විරුද්ධව තවත් වරෙක ඈන්ගේ පියා නඩු පැවරුවේය.

1980 වර්ෂයේදී ඔටෝ ෆ්‍රෑන්ක් මිය යන්නට ආසන්න දිනයකදී ප්‍රසිද්ධ නොකළ ඇයගේ දින සටහන් ඔහු විසින් 'ඈන් ෆ්‍රෑන්ක්' පදනමෙහි හිටපු අධ්‍යක්ෂ වූ සුජික්(Sujik) නමැත්තෙකුට පවරනු ලැබිණි. 2000 වසරේදී ලන්දේසි අධ්‍යාපනික, සංස්කෘතික අමාත්‍යාංශය මගින් එකී පිටු පහ මිල දී ගනු ලැබුවේ පදනම වෙත ඇමරිකානු ඩොලර් 300,000 ක් ගෙවීමෙනි.

ඈන් සැඟවී සිටිමින් දිනපොත ලියූ ඇම්ස්ටර්ඩෑම්හි 'ඈන් ෆ්‍රෑන්ක්' නිවෙස දකින්නට දෙස් විදෙස් ජනතාව දිනපතා දහස් ගණනින් ඇදී එති. ඇය වෙනුවෙන් කඳුලක් සුසුමක් හෙළන්නට ඒ කිසිවෙකුත් අමතක නොකරති. ඈන් ප්‍රාර්ථනා කළ පරිදිම ඇය මරණයෙන් මතු සදාකාලිකවම ජීවත් වේ.

(අන්තර්ජාලය ඇසුරෙනි)




ඔබගේ ණය බර 80% දක්වා අඩු කර දීමට අපි සූදානම්

We will Reduce your Debts up to 80%

(Visa, MasteCard,AMEX, Personal loans, Line of Credit, Income Tax, HST,GST,Owing, Car or House Repossessed, Student Loan Outstanding for 7 years)

අප වෙතින් ඔබට ලබාගත හැකි සේවාවන්

- ඔබගේ ණය සඳහා අයවන පොලිය නවතා දීම
  We will stop all interest on your debts immediately
- ණය එකතු කරන ආයතනයන් වෙතින් ඔබට ලැබෙන දුරකථන ඇමතුම්, නීතිමය ගැටලු, වැටුපෙන් අයකර ගැනීම් වහාම නවතා දීම
  We will stop collection calls, Court action & wage garnishments immediately
- ඔබගේ සියලු වත්කම් සහ දේපළ සඳහා ආරක්ෂාව සැපයීම
  We will protect all your assets (House, Car, RRSP, TFSA, GIC, Life Insurance, Stocks, Bonds & Shares)
- මාසිකව ගෙවීම් රැසක් වෙනුවට තනි මාසික ගෙවීමක් සකසා දීම
  We will make one monthly payment to all your creditors
- බංකොළොත්භාවයට පත් නොවීමට අවශ්‍ය උපදෙස්
  No need to file for bankruptcy

නව ජීවිතයක් ... නැවුම් ආරම්භයක් ...

NEW LIFE... FRESH START...



CREDIT RECOVERY CANADA
55 Town Centre Court, Suite 700
Scarborough, ON.
M1P 4X4

Tel: 416 264 1272
Fax: 416 332 0914
Web: www.creditrecoverycanada.com


LESSON 8

Hope you had fun learning all the interesting words that we presented on the vocabulary column! Could you use them in basic conversations? That is a good way to memorize new words. You could use the words learnt so far among a group of people who study French. Did name tagging the things around you work as a good method of learning? As we always say, practice and dedication is the most important factor in learning a foreign language.

This month's Dasatha issue consists of a vocabulary section and a grammar section. Vocabulary section brings to you an important lesson about numbers in French. Conversation section will continue again in future issues after presenting you with these important vocabulary lists. The grammar lesson continues as usual to improve your grammar knowledge and help you converse and write correctly in French. Enjoy learning! Thank you!




## Le Vocabulaire (ලවොකැබියුලෑර්) - Vocabulary



The vocabulary section of this months's Dasatha issue consists of the French numbers. Learning how to count in a foreign language makes learning interesting and it gives you a sense of achievement. You can read them aloud in order to memorize and once you remember everything write them down to practice the spellings.

Les Nombres (ලෙ නෝම්බ්‍ර) – The numbers

| | | |
|---|---|---|
| 0 | Zéro | (සේzරො) |
| 1 | Un | (අං) |
| 2 | Deux | (ද) |
| 3 | Trois | (තෟවා) |
| 4 | Quatre | (කැත්‍ර) |
| 5 | Cinq | (සැන්ක්) |
| 6 | Six | (සීස්) |
| 7 | Sept | (සෙත්) |
| 8 | Huit | (විත්) |
| 9 | Neuf | (නෆ්) |
| 10 | Dix | (දිස්) |

| | | |
|---|---|---|
| 11 | Onze | (ඕන්ස්) |
| 12 | Douze | (දූස්) |
| 13 | Treize | (ත්‍රෙයිස්) |
| 14 | Quatorze | (කැතෝස්) |
| 15 | Quinze | (කැන්ස්) |
| 16 | Seize | (සෙයිස්) |
| 17 | Dix-sept | (දිස්සෙත්) |
| 18 | Dix-huit | (දිස්විත්) |
| 19 | Dix-neuf | (දිස්නෆ්) |
| 20 | Vingt | (වැංග්) |
| 21 | Vingt et un | (වැංග්තෙඅං) |
| 22 | Vingt-deux | (වැංග්ද) |
| 23 | Vingt-trois | (වැංග්තෟවා) |
| 24 | Vingt-quatre | (වැංග්කැත්‍ර) |
| 25 | Vingt-cinq | (වැංග්සැන්ක්) |
| 26 | Vingt-six | (වැංග්සීස්) |
| 27 | Vingt-sept | (වැංග්සෙත්) |
| 28 | Vingt-huit | (වැංග්විත්) |
| 29 | Vingt-neuf | (වැංග්නෆ්) |
| 30 | Trente | (ත්‍රොන්ත්) |

| | | |
|---|---|---|
| 31 | Trente et un | (ත්‍රොන්තෙඅං) |
| 32 | Trente-deux | (ත්‍රොන්ත්ද) |
| 33 | Trente-trois | (ත්‍රොන්ත්තෟවා) |
| 34 | Trente-quatre | (ත්‍රොන්ත්කැත්‍ර) |
| 35 | Trente-cinq | (ත්‍රොන්ත්සැන්ක්) |
| 36 | Trente-six | (ත්‍රොන්ත්සීස්) |
| 37 | Trente-sept | (ත්‍රොන්ත්සෙත්) |
| 38 | Trente-huit | (ත්‍රොන්ත්විත්) |
| 39 | Trente-neuf | (ත්‍රොන්ත්නෆ්) |
| 40 | Quarante | (කැරොන්ත්) |
| 41 | Quarante et un | (කැරොන්තෙඅං) |
| 42 | Quarante-deux | (කැරොන්ත්ද) |
| 43 | Quarante-trois | (කැරොන්ත්තෟවා) |
| 44 | Quarante-quatre | (කැරොන්ත්කැත්‍ර) |
| 45 | Quarante-cinq | (කැරොන්ත්සැන්ක්) |
| 46 | Quarante-six | (කැරොන්ත්සීස්) |
| 47 | Quarante-sept | (කැරොන්ත්සෙත්) |
| 48 | Quarante-huit | (කැරොන්ත්විත්) |
| 49 | Quarante-neuf | (කැරොන්ත්නෆ්) |
| 50 | Cinquante | (සැංකොංත්) |

## Grammaire (ග්‍රාමෑර්) Grammar



Hope you studied the irregular verbs in the –er verb group! In order to improve your writing and speaking skills in French, it is important to memorize and review all the verbs in a daily manner. If not you will have a hard time improving. As you already know, French language has no set rule when it comes to conjugating irregular verbs. Try constructing small sentences on your own using all the verbs you learnt so far to improve your writing skills. Last Dasatha issue's French lesson provided you with the conjugations of the irregular verbs in the –er verb group. This month's lesson will provide you with most the irregulars or the often used irregulars of the –ir verb group.

### The first set of irregualr verbs :

| Appeler (අපලෙ) - to call | |
|---|---|
| je pars (ජපාර්) | nous partons (නු පර්තොං) |
| tu pars (තියුපාර්) | vous partez (වු පර්තෙ) |
| il/elle/on part (ඉල්/එල්/ඔන් පාර්) | ils/elles partent (ඉල්/එල් පර්ත්) |

For verbs like partir - to leave and all their derivatives (repartir, resortir), drop the last letter of the stem –part [except in the first and second person plural (nous and vous)] and add –s, -s, -t, -ons, -ez, -ent respectively to form the present tense.

Verbs conjugated like partir:

Dormir (දොර්මීර්) – to sleep
Mentir (මොන්තීර්) – to lie
Sentir (සොන්තීර්) – to feel
Servir (සැර්වීර්) – to serve
Sortir (සොර්තීර්) – to go out

### The second set of irregular verbs:

| Ouvrir (ඌව්රීර්) - to open | |
|---|---|
| j'ouvre (ජුව්ර්) | nous ouvrons (නුස්'ඌව්රොං) |
| tu ouvres (තියුඌව්ර්) | vous ouvrez (වුස්'ඌව්රෙ) |
| il/elle/on ouvre (ඉල්/එල්/ඔන් ඌව්ර්) | ils/elles ouvrent (ඉල්ස්/එල්ස්ඌව්ර්) |

For verbs like ouvrir - to open and all their derivatives (recouvrir, recueillir), you have to add the endings of regular –er verb conjugations to the stem in order to form the present tense.

Verbs conjugated like Ouvrir include:

Couvrir (කුව්රීර්) - to cover
Découvrir (දෙකුව්රීර්) - to discover
Offrir (ඔෆ්රීර්) - to offer
Souffrir (සුෆ්රීර්) - to suffer
Cueillir (කයියීර්) – to plant

### The third set of irregular verbs:

The other irregular verbs in –ir verbs group do not follow a pattern. The conjugations are different from one another. Therefore, you have to study and memorize the conjugations of all these bellow given verbs separately.

| Asseoir (අසව්වාර්) - to sit | |
|---|---|
| J'assieds (ජසියෙ) | nous asseyons (නුස්'අසියියොං) |
| tu assieds (තියුඅසියෙ) | vous asseyez (වුස්'අසියියෙ) |
| il/elle/on assied (ඉල්/එල්/ඔන් අසියෙ) | ils/elles asseyent (ඉල්ස්/එල්ස් අසෙයි) |

| Courir (කුරීර්) - to run | |
|---|---|
| je cours (ජකූර්) | nous courons (නු කූරොං) |
| tu cours (තියුකූර්) | vous courez (වු කූරෙ) |
| il/elle/on court (ඉල්/එල්/ඔන් කූර්) | ils/elles courent (ඉල්/එල් කූර්) |

| Devoir (දව්වාර්) – must / to have to | |
|---|---|
| je dois (ජදුආ) | nous devons (නුදවොං) |
| tu dois (තියුදුආ) | vous devez (වුදවෙ) |
| il/elle/on doit (ඉල්/එල්/ඔන් දුආ) | ils/elles doivent (ඉල්/එල් දුවාව්) |

| **Falloir (*¨wd¾) – to be necessary** |
|---|
| il/elle/on faut (ඉල්/එල්/ඔන් ෆො) |

*The verb falloir takes only one subject pronoun.*

**Kumudu Abeywardena**
Pre-Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com

www. Susanthatutor.com

# TUTORING

(HIGH SCHOOL AND UNIVERSITY STUDENTS)

SCARBOROUGH, MARKHAM, MAPLE, BRAMTON, MISSISSAUGA, OAKVILLE, PICKERING AND AJAX AREA

MATHEMATICS (GRADE 9 ,10,11)
SCIENCE (GRADE 9 ,10 )
ADVANCED FUNTIONS (GRADE 12)
CALCULUS AND VECTORS(GRADE 12)
PHYSICS (GRADE 11 &12)
CHEMISTRY (GRADE 11 & 12)
DATA MANAGEMENT (GRADE 12)
UNIVERSITY PHYSICS, MATHEMATICS & STATISTICS

**100% Results oriented**
**INDIVIDUAL & SMALL GROUP CLASSES**



**(25 YEARS TEACHING EXPERIENCE IN CANADA, SRILANKA , REPUBLIC OF SEYCHELLES AND REPUBLIC OF MALDIVES)**

## TUTORING

(FOR ELEMENTARY SCHOOL STUDENTS)
MATH (FROM GRADE 2 TO 8)
SCIENCE (FROM GRADE 2 TO 8)
ENGLISH (FROM GRADE 2 TO 8)

HOME WORK HELP
PRINTED NOTES & WORK SHEETS
EQAO PREPARATION (GRADE 3,6, 9)
HOME VISITS,

## SUSANTHA GUNASEKARA

(B.Sc , M.Sc ,CEI (LONDON)

**Call 647 859 4301**



# BRISK INTERNATIONAL CARGO INC

**Worldwide Movers**

**Moving personal Effects & Commercial Cargo**
**Door to Door Service all part of Sri Lanka**




We ship Vehicle , personal or commerical cargo to, all destination Across canada- Calgary,Edmonton,Vancouver,Manitoba,Newfoundland and Labrador,

Call A.R.Nathan/L.A.Wasanthi -416-321-0400 / 416-877-2195

★ Packing
★ Shipping

Montreal : 1-514-383-6840 - Ottawa : 1-613-899-5660
919 Ellesmere Road Suite # 306 M1P 2W7 Toronto
Email:info@briskcargo.com Web: www.briskcargo.com

## සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යය

# සද්ධර්ම රත්නාවලිය

**2 වන කොටස**



### බස් වහර

ධර්මසේන මාහිමියන්ගේ කතා කීමේ ජනප්‍රියත්වයට බෙහෙවින්ම බලපෑ සාධකය වූයේ උන්වහන්සේ විසින් භාවිත කළ සිංහල සාහිත්‍යයේ උන්වහන්සේටම සුවිශේෂ වූ බස් වහරයි. කථා කීම සඳහා සුදුසු භාෂා විලාශයක් පිළිබඳව ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් තරඟකාරී අත්හදා බැලීම්වල යෙදුණු අයුරු අපි දුටුවෙමු. එහෙත් ඉන් ජය ලද එකම වූත් ප්‍රථම වූත් කතුවරයා ධර්මසේන මා හිමියෝය. ගැමි ජන බසට අනුගුණ වූත් පඬිජනයා විසින් බැහැර කළ නොහැකි වූත් බස්වහරක් වීම එහි ඇති සුවිශේෂ ලක්ෂණය විය. ගැමි ජනයා විසින් සද්ධර්මරත්නාවලිය වැළඳ ගත්තාක් මෙන්ම විද්වත් ජනයාගේ සම්භාවනාවට එය පාත්‍ර වූයේත් එහි පැවති මේ ලක්ෂණය නිසාමය.


ධර්මසේන හිමියන්ගේ බස්වහර අතිශයින්ම සරල එකක් විය. එමෙන්ම එක දිගට ගලා යන දිය දහරක් මෙන් භාවවාහී ගුණයෙන් යුක්ත වූවක් විය.

'සැවැත් නුවර සතළිස් කෙළක් විවර වස්තු ඇති සිටාණ කෙනෙකුන්ගේ දුවණි කෙනෙක් ඇත. මනහර වූ රූ ධරති. උන් සොළොස් හැවිරිදි වයසේදී මිථ්‍යාචාරයෙන් නවතනු නිසා සත්මාල්පායේ උඩු මාලේ ශ්‍රී යහන් ගබඩාවෙක ලා රකිති. එසේ වුවත් ඌ තුමූ තමන්ගේම ගෙයි කොල්ලකු හා බැඳී වෙසෙති. උන්ගේ දෙමව්පියෝ ජාතීනුත් සම්පත්තීනුත් සම කර වූ සිටු පුත්‍රයාණ කෙනෙකුන්ට සරණ දෙන්ට නියමව දවස් නියම කළහ. නකත් දවස් උදා වූ කලට සිටු දුවණියෝ බැඳී වසන කොල්ලාට කියන්නෝ 'මා අසවල් දවස් අසවල් සිටු පුත්‍රයාණන්ට සරණ දෙති. මා උන් කරා සරණ ගිය කල පඬුරක් හැරගෙන ගිය නමුත් ඔබිනුත් වෙනම රකවල් මෙයින් දක්නා පමණකටවත් නොලබව. ඉදින් මා කෙරෙහි ප්‍රේමයක් ඇත්නම් ඔබ නොයන තෙක් දැන්ම මා කැඳවා ගෙන කැමති තැනකට යව' යි කිවූය. උයිත් යහපතැයි ගිවිස එසේ වී නම් මම සෙට දවස් නුවර වාසල කෙරේ අසවල් තැන සිටිමි. මුඹත් එක් උපදෙසකින් කාටත් නොහැඟෙන ලෙස එතැනට අව මැනවැයි කියාලා දෙවන දවස් කියාලූ තැනම සිටියහ. සිටු දුවණියෝද දෙවන දවස් කිලුටු අදහස් සේම කිලුටු කඩ රෙද්දක් කොයින්දෝ සොයා හැඳ ගෙන මිඩියන්ගේ ලෙසට ලිහිල් කොට හිසකේ බැඳ ගෙන රෑ දෙවරු වී පැහැරියා සේ ඇඟ මුළුල්ලෙහි ධූලි ගාගෙන කළයක් හැර ගෙන පැනට යන කෙල්ලක් මෙන් කෙල්ලන් හා එක්ව ගෙන් පිටත්ව මිඩිවෙස්ගත් ලෙසට කොල්ලා සිටි තැනට ගියහ. ඒ කොලුද ක්‍රියාවෙන් කුම් වුවත් ජාතීන් හා සම්පත්තීන් උතුම් තරම් ඇති සිටු දුවණියන් රෙදි කඩකින් වසාලූ මැණිකක් පරිද්දෙන් කැඳවාගෙන දුරට ගොසින් එක් ගමෙක රඳාහිඳ අයට අඬයට සීසාගෙන වප් වපුට ගෙන දර පළා ගෙනවුත් ජීවත් වෙති. සිටුදුවණියෝද කුස රජුව උපන් බෝසතුන් ප්‍රභාවතීන් නිසා නිකෘෂ්ට ලෙසින් හැසුරුණු නියාවට හුදෙක් පිරිමිහුම ගෑනුන් නිසා නිකෘෂ්ට ලෙස ඇවිදිනෝ නොවෙති. ගෑනුත් පිරිමින් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරෙතී යන්න හඟවන්නාක් මෙන් කළයෙන් පැන් ගෙන වුත් තබමින් සිය අතින්ම පරමන් පිසමන් ආදිය කෙරෙමින් තමන් යට කළ අකුශලයෙහි අනිෂ්ට විපාකය වී බත් කමින් සිට හමු බතකුත් කන්නා සේ අනුභව කරන්නට පටන් ගත්හ'

ඉහත දැක්වූයේ පටාචාරා වස්තුවේ ආරම්භයයි. මෙහි කථාව වැකියෙන් වැකිය ගලා ගිය ආකාරය කොතරම් නම් නිරවුල්ද? පාඨක සිතට වැකියක් පාසා කුතුහලය පිවිසවන ආකාරය කොතරම් නම් කථා කලානුකූලවේද? ඒ හැරත් 'ඌ තමුන්ගේම ගෙයි කොල්ලකු හා බැඳී වෙසෙති. සිටු දුවණියෝද දෙවන දවස් කිලුටු අදහස් සේම කිලුටු කඩ රෙද්දක් කොයින්දෝ සොයා හැඳගෙන' 'ක්‍රියාවෙන් කුම් වුවත් ජාතීන් හා සම්පත්තීන් උතුම් තරම් ඇති සිටු දුවණියන් රෙදි කඩකින් වසාලූ මැණිකක් පරිද්දෙන් කැඳවාගෙන' ආදි වාක්‍යයන් කෙතරම් නම් ප්‍රබල අරුත් කථාවට සපයන්නේද?

ඇතැම් තැනෙක ඉතා දිගු වැකි දක්නට ලැබෙයි. එහෙත් වැකියෙහි දිගු බව අර්ථ ව්‍යාකූලත්වයකට තුඩු දී නැත. එයට හේතුව ධර්මසේන හිමියන්ගේ බසෙහි වන ප්‍රබල සන්නිවේදන ගුණයයි. මේ එබඳු දිගු වැකියකි.

'සාය අවධියෙහිදී හූරු වෙළඳාම් හැඟෙන නියාව දැන වී සාල් හැරගෙන පිටිසරට ගොසින් නැළිය දෙනැළිය දීලා ගම් හූරු පැටවුන් හැරගෙන වී ගෙනගිය ගැල පුරා ගෙනවුත් ගෙපිටිපස්සෙහි හූරුගාලක් ගසාලා ගාල ඇතුළතම උන්ගේ අනුභවයට නිස්සත් ඇති කොට ඒ හැම කා වැඩුණු අවස්ථාවෙහි තෙමේත් පව් කොට වැඩුණේ යම් යම් හූරකු මරා කනු කැමැත්තේ වී නම් ඒ හූරා තර කණුවෙක නොසැලෙනා ලෙස බැඳ සිටුවාලා මස් බොල්වනු නිසාත් පව් බොල්වනු නිසාත් සිවුරැස් මුඟුරකින් තළා මස් බොල්වූ නියාව මුත් පව් බොල්වූ නියාව නොදැන තමාගේ චිත්ත ශුද්ධියක් නැතත් ඌගේ ශරීරශුද්ධිය නිසාත් ඌගේ පුරාකෘත අකුශල කර්මයෙන්



භාගයක් වුවත් සෝධන්ට අවීචියෙහිදී තමාගේ කටත් දල්වන ලෙසට ඌගේ කටත් දල්වා කට නොපියන ලෙසට දඬු කඩක් ගන්වාලා ලෝසාළුවෙන් තමා කට ලෝදිය වත් කරන ලෙසට ඌගේ කටටත් යසැන්දකින් තරව කකියාගිය හුණු පැන් වත් කෙරෙයි'

පූර්ව ක්‍රියා 11 ක් මගින් එකිනෙකට සම්බන්ධ කළ කරුණු රැසක් එකම වැකියක බහා චිත්තරූප දැනවෙන ආකාරයෙන් හූරු වැද්දාගේ ක්‍රියා කලාපය විවරණය කෙරෙන අන්දම බාහිරව පමණක් නොව, ආධ්‍යාත්මිකවත් හූරුවැද්දා හඳුන්වා දීමක් නොවන්නේද?

ධර්මසේන හිමියෝ තවත් තැනෙක අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීම සඳහා කෙටි වැකි උපයෝගී කොට ගනිති. 'සමහර දෙනෙක් දන්දෙන කල සිතිවිල්ලෙන් අමුත්තක් සිතාගෙන තමන් සන්තකය දන් දෙති. දෙන දන එක්ව දෙන්ට අනුන් සමාදන් නොකරවති. ඌ උපනුපන් තෙන තමන් සන්තකයම දීගිය හෙයින් භෝග සම්පත් ලැබෙති. කුශලයෙහි සමාදන් කරවීම නුවූහෙයින් උන්ට පරිවාර සම්පත් නැත'

ගැඹුරු දහමක් පාඨකයාට අවබෝධය ලැබෙන පරිදි කීමට කතුවරයාගේ බස්වහර කොයිතරම් නම් සමත් වීද?

### උපමා

ධර්මසේන මා හිමියන්ගේ බස්වහර වඩාත් ඔපවත් වී ඇත්තේ එහි එන උපමාවන් නිසාය. උපමා යෙදීමෙහි ලා උන්වහන්සේ කොතරම් සූර වූද යත් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි උන්වහන්සේ හා උපමා යොදන්නට වෙනත් සමතෙක් එදා මෙදා තුර නොවූ බවට මතයක් පවා ගොඩ නැගිණි. මෙතෙක් සාහිත්‍යකරුවන් පාලි සංස්කෘතයෙන් ගෙන යෙදූ උපමා වෙනුවට තමන් වෙසෙන සමාජයෙන් උපමා සපයා ගැනීමේ නව ප්‍රවේශයක් උන්වහන්සේ සිංහල සාහිත්‍යයෙහි ඇති කළහ. උපමා යොදනුයේ පාඨකයාට යම් කිසිවක් වඩාත් හොඳින් තේරුම් කර දීම සඳහා නම් ධර්මසේන හිමියන්ගේ උපමා තුළින් සාර්ථකව එම කාර්යය ඉටු විය.

ඇතැම් විටෙක එකම කරුණක් සඳහා උපමා රැසක් එක පෙළට ඉදිරිපත් කිරීම උන්වහන්සේගේ උපමා සම්ප්‍රදායෙහි එන ලක්ෂණයකි.

නාගසේන තෙරුන් දුටු මිළිඳු රජු තුළ හටගත් බියෙහි ස්වභාවය දක්වනු වස් උපමා එකොළොසක් ඉදිරිපත් කළහ.

'සිංහයකුට ළංවූ ඇතක්හු මෙන්ද ගුරුළකුට ළංවූ නයකු මෙන්ද පිඹුරකුට ළංවූ සිවලකු මෙන්ද නයකුට ළංවූ මඬුවකු මෙන්ද දිවියකුට ළංවූ මුවකු මෙන්ද බළලකුට ළංවූ මීයකු මෙන්ද යකදුරන්ට ළංවූ පිසාචයකු මෙන්ද රාහු අසුරිඳුට ළංවූ සඳ මෙන්ද මැදිරියකට අසුවූ පක්ෂියකු මෙන්ද දැලකට අසුවූ කුඩමස්සකු මෙන්ද මීයන්ට ආසන්නව සිටි දෙව් පුතක්හු මෙන්ද බාගොසින්'

එක් එක් කරුණට එක් එක් උපමාව දක්වමින් එකම දීර්ඝ වාක්‍යයක් තුළ උපමා විශාල ප්‍රමාණයක් ගොණු කළ මෙබඳු වැකිද සද්ධර්මරත්නාවලියෙහි දක්නට ලැබේ.

'එසේ හෙයින් නුවණැත්තවුන් විසින් කෙතෙක් ධන ධාන්‍ය සම්පත් වුවත් උපද්‍රවයක් විනා නිරුපද්‍රවතාවක් ඉන් සම්භ නොවන හෙයින් එහි ඇලුම් හැර යම්සේ වේයෝ ගොදුරු සොයා යන කල තමන් වසා වේපස් බැඳීමෙන් සැඟවී ගෙන යෙද්ද? එමෙන්ම දානශීලාදී සුචරිතයෙන් අකුසල් වසා තවද යම් සේ බළල්ලු කොතෙනකට ගියත් මීයන්ම සොයද්ද උන්ට සිතිවිලි නම් ඒ ම ද එපරිද්දෙන් කවර කොතනකදීත් කුසල් අදහස් ඇතිව තවද යම් සේ ගෝනුස්සෝ තමන්ගේ නගුටම ආයුධ කොට තකද්ද එමෙන්ම නුවණම අත ආයුධයක් සේ සිතා ගෙන තවද යම් සේ මුගටියෝ නයින් කරා වදනා කල බෙහෙත් ගස්වල ගෑවී පියා යෙද්ද එමෙන්ම ක්‍රෝධ නමැති සර්පයන්ට මෛත්‍රී නමැති බෙහෙත් ඇතිව තවද යම්සේ කැනහිල්ලු කුමන අපවිත්‍රයක් ලදත් පිළිකුල් නැත්තෝද එමෙන්ම... තෘෂ්ණාව නුපුරා තවද යම් සේ දිවිමකුළුවෝ මඟ අවුරා දැල් බැඳලා මැසිමදුරු ආදීන් ඊ බැඳුණාවුන්ම කත්ද එමෙන් චක්ෂුරාදී වූ සදොර සිහිවටන් නමැති දැල බැඳලා කෙලෙස් නමැති මැසි බූවණු ආදීහු බැඳුණාවූ නම් භාවනා මුඛයෙන් සපා කා නිමවා කෙළවර නිවස් රස අනුභව කටයුතු'

මෙහි උපමා යෙදුණු සැටියෙන් වක්කඩ කැඩූ සැණකින් දියබස්නා සේ ධර්මසේන හිමියන් සිතට ස්ථානෝචිතව හා නිරායාසීව උපමා ගලා ආ ආකාරය පිළිබඳව මවිතයක් ඇති නොවන්නේද? එදා මෙදා තුර මෙබඳු උපමා භාවිතයක් අන් කිසිදු සිංහල ලේඛකයකුගෙන් සිදු වී නොමැත්තේය.


මේ හැරුණු විට සද්ධර්මරත්නාවලිය පුරා පලින් පල බණ්ඩ ලෙස යෙදුණු උපමා සංඛ්‍යාව අති විශාලය. මේ උපමා සියල්ලක්ම වාගේ ගස් කොළන්, සතා සතුන්, ගංගා ඇළදොළ ආදි පරිසරය හා බැඳුණු ඒවා වීම විශේෂ ලක්ෂණයක් වේ. ඉහත නිදසුන් දැක්වූ උපමා දෙස බැලීමේදී ඒ බව සිතාගත හැකි වෙයි. මේ උපමාවන්ගෙන් විශාල ප්‍රමාණයක් ඩී.බී. ජයතිලක සූරීන් විසින් එක්තැන් කොට ඇත.

මෙම ලිපියෙහි ඉතිරි කොටස ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.

**සිරිසේන විතානගේ විසිනි**


Only exceptional skill can craft extraordinary beauty
Let me represent you and use my extensive real estate knowledge to ensure that you find your dream home.
I understand the value in focusing on little details. That's why I take extra time and care to make sure my clients get the best possible results.
Free home evaluations
RIGHT AT HOME REALTY INC. BROKERAGE
Office: 905-565-9200
Fax: 905-565-6677
ravidesilva.realtor@gmail.com
Monte Carlo Corporate Centre
7045 Edwards Blvd. Suite 401
Mississauga ON L5S 1X2
Ravindra De Silva BSc
Sales Representative
Direct: 647-890-1581
Going the extra mile to please my clients
www. ravidesilva.com
REALTOR MLS MULTIPLE LISTING SERVICE
Member of theToronto Real Estate Board


1st & 2nd Mortgage
CENTUM
Optima Mortgages Inc.
Brokerage License # 10894
Each brokerage is independently owned and operated
# 9 - 1345 Morningside Ave, Toronto, ON, M1B 5K3
Telephone: 416-759-1818
Fax : 416 759 6005
Toll Free: 1-888-380-3007
Residential & Commercial Mortgages
Mortgage Refinancing & Switch
1st 2nd Mortgages
Home Equity Loan
0% Down Payment Residential Mortgage
Free Mortgage & Debt Consultation
Self Employed
Pre -approval & Quick Closing
Speak to me for
* Expert Advice * Fast Service * Save Money
& to make sense !
Gini Annarasa
Mortgage Broker (License # M08008550)
Cell : 416.830.3241
Email: gannarasa@gmail.com




# You Could Win up to $100,000*

**MORTGAGE ALLIANCE**

Nexgen Mortgage & Loans Inc.

## When you Minimize Your Mortgage with the RIGHTBROKER

*win the value of your mortgage up to $100,000
See complete sontest rules for details at www.rightmortgage.com/minimizeyourmortgage

**Choice**...of over 40 lenders, from major banks to private sources
**Convenience**...with one place to compare lenders and get the Right Mortgage for your needs
**Counsel**...from an independent professional who works for you



**Mohan Verdi**
(Mortgage Broker FSCO Lic. 12002)

**Tel: 905-790-1000**
**Cell: 416-399-9864**
**Nexgen Mortgage & Loans**

## Quick Approval $ 5-50,000
## 2nd Mortgage Up to 85% LTV

(No income or credit check*) Some conditions may apply

## Residential, Commerical Mortgage

First , Second Mortgage • Refinancing • Renewal Mortgage • First Time Home Buyer
Self Employed Mortgage • Equity Visa Credit Line

217-9886 Torbram Road, Brampton ON L6S 3L9
www.mortgagealliance.com/nexgenmortgage • Email: info@nexgenmortgageloans.ca
Hiring new mortgage agents full training and support

EQUITABLE TRUST · CAAMP ACCHA · FIRST NATIONAL FINANCIAL LP · MCAP · right MORTGAGE · NATIONAL BANK FINANCIAL GROUP · TD Canada Trust · Scotiabank™



• විජය නන්දසිරි • රොෂාන් පිලපිටිය • කුමාර තිරිමාදුර
• ගිහාන් ප්‍රනාන්දු • ෆර්නි රඟන..
බල්ලොත් එක්ක බෑ
Comedy of Errors and Disguise
රවීන්ද්‍ර ආරියරත්න නාට්‍ය නිර්මාණ
2013 ඔක්තෝම්බර් 06 සවස 6.00 ට
DON BOSCO AUDITORIUM
(Islington and Highway 401)
Ticket $ 30 & $ 20
Contact for Tickets
Missisauga Temple - 905-891-8412 , Brampton Temple - 905-454-6649,
Wanni Danawardana - 416-287-1903, Nilanthi Hettige - 416-499-2284, Manju - 647-405-0420,
Ranjith Perera - 416-436-1401, M & S - 416-444-8202, Chamila - 416-705-8983,
Palitha Hagoda - 647-831-1915, Voice of Lanka - 416-444-7548, Rasanthi - 416-432-1532

# ANOMA PERERA

**Barrister, Solicitor & Notary Public**
**(Attorney-at-Law, Sri Lanka)**



- **REAL ESTATE - Residential & Commercial**
- **WILLS & POWERS OF ATTORNEY**

**EVENING & WEEK END CONSULTATIONS**
**AVAILABLE BY APPOINTMENT**

## ANOMA PERERA LAW OFFICE

**2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4**
**Telephone: (905) 673-5665** **Fax: (905) 673-1682**
**e-mail : anomaperera01@gmail.com**

# Meet your local Mortgage Specialist



Peter (Sharmal) Jesudhason
Mortgage Development Manager

As a Scotiabank Mortgage Specialist, I am committed to providing you with fast service,competitive rates, and innovative mortgage solutions that are right for you. And, for your added convinience, I can arrange your financing in the comfort of your own home or office. Are you thinking of.....

* Buying or building a home?
* Refinancing your existing mortgage?
* Renovating your home?
* Consolidating existing debts?

I'll help you find the mortgage suited to your individual needs. Call me today and let's get started.



416 804 2810
peter.jesudhason@scotiabank.com

Scotiabank

TM Trademarks of The Bank of Nova Scotia.


නිව් වන්නි මාර්කට් ඉන්ක්.
NEW VANNI MARKET INC.
960 Dundas Street East,
Mississauga, Ontario, L4Y 2B8
New Vanni Market
புதிய வன்னி சந்தை
POINTS CARD
NVM GROUP CANADA
BECOME A MEMBER AT NEW VANNI MARKET
AND RECEIVE POINTS FOR EVERY PURCHASE
AND REDEEM THEM FOR FREE ITEMS.
We Sell Elephant Brand, Munchi & Maliban Products
සම්බා 8lb... $5.99
බාස්මතී (Meera)...... $4.99
Goudas Rice...... $7.99
S.M.B Red Row Rice.... $ 5.99
Red Rice Flour 8LB....... $ 5.99
Steam Flour 8lb...... $ 5.99
Neera Curry Powder $ 3.99
$ 2.99 Now available Preserver and Syrups
Maggi coconut powder $ 2.99
Red Label Orange Pekoe Tea 216 bags $ 5.99
Now available
Unico Vegetable Oil (3L) $ 5.99
Fish & Meat Market
Sardin 1lb $ 1.99
Crab Box 9/12 $ 4.99
Red Snapper 1lb $5.99
Shrimp 1lb 4.99
Squid 1lb $2.99
අලුත් ටූනා 1lb $5.99
තලපත්
අලුත් එළුමස්
Nestomalt $4.99
Lakspray $5.99
Marie $1.99
වියළි හාල්මැස්සන් 200g $ 2.49
වියළි හාල්මැස්සන් 1lb $3.99
සියලුම කරවල වර්ග
උම්බලකඩ
මේස ලුණු(Table Salt) (Goudas) .69/C
පොල්, රතුළූණු, කෙසෙල් කොළ, බුලත්
පපඩම්(joy) 2 packets for $1
Steam Fried Chile 2 for $1
ගොටුකොළ, මුකුණුවැන්න, කතුරුමුරුංගා
අලුත් එළවළු සහ පළතුරු වර්ග රැසක්
Mysore Dhal 8LB $3.99
Grace Tin Fish $1.99
Frozen Grated Coconut $1.99
Bulk Food Corner
Urie Dhal -උඳු පරිප්පු
Masoor Dhal- මයිසූර් පරිප්පු
Mung Dhal- මුං පරිප්පු
Toor Dhal-තෝර පරිප්පු
Cumin Seeds-සුදුරු
Coriander-කොත්තමල්ලි
Fennel-මාදුරු
Mustard-අබ
Fenugreek-උළුහාල්
Pepper -ගම්මිරිස්
chick-pea -කඩල
ශ්‍රී ලංකාවේ නිශ්පාදිත ජෑම්, කෝඩියල්, ටින් කෑම වර්ග
MD ITEMS ARE ALSO AVAILABLE
SEND MONEY TO SRI LANKA, INDIA OR OTHER COUNTRIES AND GET A FREE DVD.
ඔබට අවශ්‍ය සියලුම පූජා භාණ්ඩ අප වෙතින් ලබා ගත හැක
* all prices are subject to change without prior notice
Tel:905 566 5550 Fax: 905 566 5590
ගෙදර යන ගමන් අතේ ඇති මුදලට හිතේ හැටියට ඔබට අවශ්‍ය සියලුම ශ්‍රී ලාංකේය නිෂ්පාදන එකම තැනකින් ලබාගන්න
NEW VANNI MARKET INC.
වෙත පැමිණෙන්න

## ඔබට අවශ්‍ය නීති උපදෙස් සඳහා අමතන්න -

# නීතීඥ පූර්ණා ජයසේන



| | |
|---|---|
| දේපළ මිලදී ගැනීම්, විකිණීම් හා උකස් කිරීම් | Real Estate |
| ආගමන නීතිය | Immigration Law |
| අන්තිම කැමති පත්‍ර | Last Wills |
| ඇට(ර්)නි බලපත්‍ර | Power of Attorney |
| දිවුරුම් පත්‍ර | Affidavits |
| දික්කසාද හා පවුල් නීතිය | Family Law |

# Poorna Jayasena Law Office

Brampton Location
(Bovaird & Hurontario)
10 Gillingham Drive,Unit 203
Brampton ON L6X 5A5
Tel:905 595 1181

Caledon Location
(Mayfield & Hurontario)
75 Pinebrook Circle
Caledon ON L7C 1C3

Fax: 905 595 1182; Email: poornajayasena@gmail.com

# IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage, Refinancing, Second Mortgage, First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

## Abby Sri Haran

**Senior Mortgage Specialist**

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

# ප්‍රවේශමෙන්....

# ඔබේ රහස්‍ය තොරතුරු එළි වේවි... !

ඉස්සර වගේ නොවෙයි. දැන් අපි හැමදේකටම දුවගෙන එන්නෙ පරිගණකය ළඟටයි. දුකක් හෝ සතුටක් ඇති වුණාම දුවගෙන ඇවිත් ඒ දුකට සතුටට හේතු වුණු දේ ලියන්නෙත්, කවියක්, කතාවක් හෝ දිනසටහන් ලියන මාධ්‍යයක් ලෙස භාවිත කරන්නෙත් පරිගණකයයි. එපමණක් නොවේ ජීවිතයේ නොයෙකුත් අවස්ථාවල ගත්ත ඡායාරූප හා අතිශය පෞද්ගලික තොරතුරු සියල්ල ගබඩා කර තබන්නෙත් පරිගණකයේමයි. මේ තොරතුරු අතර සමීපම අය පමණක් දැකිය යුතු අන්දමේ ඡායාරූප, බැංකු ගිණුම්, ක්‍රෙඩිට්, ඩෙබිඩ් ණයපත් අංක, විද්‍යුත් ලිපින හා මුරපද ආදි මෙකී නොකී බොහෝ දේ තිබිය හැකියි.

ඔබ මේ සියලු තොරතුරු ගබඩා කිරීමට වෙන වෙනම නම් කරන ලද ලිපි ගොණු (Folder) විවෘත කර ඇතිවාට සැකයක් නැත. මීට අමතරව ඒවා අන් අයගේ ඇස ගැටීම වැළැක්වීම සඳහා මෘදුකාංග-යක් උපයෝගී කොට ගෙන ගොණු අගුල්ද (Folder locks) දමා ඇතිවා විය හැකිය. ‘ඔක්කොම හරි... දැන් කාටවත් මේව හොයාගන්න බෑ’ යැයි ඔබ සිතුවද එය හරියට පැස්බරා වැල්ලේ ඔළුව සඟවා ගෙන ‘මාව කාටවත් පේන්නේ නෑ’ යැයි සිතූ සිතිවිල්ලට සමාන වේ.

ඔබ විසින් පරිගණකයට ඇතුළත් කරනු ලබන මේ සියලුම දත්තයන් සැබවින්ම ගබඩා වී ඇත්තේ ඔබේ පරිගණකයේ ඇති හාඩ් ඩිස්කය(Hard disk) තුළයි. හාඩ් ඩිස්කය ඔබ සතුව පවතින තාක් කල් ඔබගේ රහස්‍ය තොරතුරු සුරක්ෂිත වුවත් කිසියම් අලුත්වැඩියාවකට පරිගණකය වෙනත් අයෙකු වෙත දීමෙන් හෝ විකිණීමෙන් පසු ඔබගේ රහස් තොරතුරු සියල්ලද අන් සතු විය හැකියි. බාහිරව පේන්නට ඇති ලිපි ගොණු සියල්ල මකා (delete) දමා ‘මම ඒ ෆයිල් ඔක්කොම ඩිලීට් කළා’ යැයි ඔබ සිතූවද හාඩ් ඩිස්කයේ ඔබගේ මතකයන් රැඳී සිටීමට ඇති ඉඩකඩ ඉතාමත් වැඩි බව ඔබ දැනගත යුතු වෙයි.

ඇතැම් විට ඔබ පරිගණකය විකිණීමට පෙර හාඩ් ඩිස්කය පවා ෆෝමැට් කිරීමකට ලක් කර සියලු මතකයන් මකා දැමූවද Recovery මෘදුකාංගයක් මගින් නැවතත් හාඩ් ඩිස්කයේ පැරණි මතකයන් අලුත් කර ගැනීමේ හැකියාව ඇත. නවීන ලෝකයේ තාක්ෂණික සොයා ගැනීම් එතරම්ම ප්‍රබල වන අතර හොඳට මෙන්ම නරකටද එය භාවිත කිරීමේ ඉඩකඩ බහුල වේ. ශිෂ්ට සම්පන්න සමාජයක ජීවත් වන පුද්ගලයින් ලෙස අන් අයගේ පෞද්ගලිකත්වයට හානි කිරීම අතිශය බරපතල කරුණක් වුවත් මේ සමාජ සම්මතයන් බිඳ වැටුණු බොහෝ අවස්ථා ලෝකයේ නොයෙක් දෙසින් අසන්නට ලැබෙයි.

පෞද්ගලිකත්වය ලොවට හෙළිදරව් වීම තුළින් මරණය පවා ළඟා කරගත් පුද්ගලයන් පිළිබඳව වාර්තා, පුවත් නිතර අප නෙත ගැටෙයි. ඇතැම් අශිෂ්ට පුද්ගලයින් විසින් මෙසේ අයථා ලෙස මතුකරගත් තොරතුරු අන්තර්ජාලය හරහා ලොව පුරා ප්‍රචාරය කළ අවස්ථාද දක්නට ලැබේ. මෙම තොරතුරු ලබාගැනීමෙන් බියගැන්වීම්, තර්ජනය කිරීම් ආදියට ලක් වෙමින් අපරාධකරුවන් හට අයුතු ලාභ ප්‍රයෝජන ලබා දෙමින් ජීවිත කාලය පුරා වද වේදනා විඳින්නෝද බොහෝය. මේ සියලු දුක් වේදනාවන්ට මූලික වන්නේ ඔබගේ නොදැනුවත්කම විය හැකි වුවත් නොසැලකිලිමත් කමත් 50% ක පමණ දායකත්වයක් ඊට සපයයි. විශේෂයෙන්ම කාන්තාවන් විසින් මේ පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර ලෝකයේ පරිගණක අපරාධකරුවන්ගේ ඉලක්කයන් අතර කාම අපරාධයන්ට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි.

මෙහෙම ගියොත් පරිගණකයක් හදන්න දෙන්නම බෑනේ... !

මෙම ලිපිය කියවීමේදී ඉහත ගැටලුව ඔබට මතු වීම සාධාරණ වේ. ඇත්තෙන්ම එයට දිය හැකි සරලම පිළිතුරත් ‘ඔව්... රහස් දේ ඇතොත් අන් අයෙක් අතට පරිගණකය දීම භයානකයි’ යන්නයි. එහෙත් මෙය ප්‍රායෝගික නොමැත. කිසිදා ලෙඩක් නොදෙන, නොකැඩෙන පරිගණක ලෝකයේ මෙතෙක් බිහිව නැත. එසේම කැඩෙන හැම විටම පරිගණකය විසිකිරීමට තරම් වත්කමක්ද අපට නැත. ඒ නිසා පරිගණක අලුත්වැඩියා කරන්නන් සොයා යෑමට සිදුවීම අනිවාර්ය වෙයි. ඒ වගේම ලෙඩ දෙන විට පරිගණකයට ගොඩ වෙදකමක් කොට කාට හෝ විකුණා දමා ‘යන්තම් ඒකෙන් ගැලවුණා’ යැයි සිතීමද සාමාන්‍ය සිරිත වේ. මේ කුමන අකාරයෙන් වුවත් සිදුවන්නේ පරිගණකය වෙනත් දෑතකට හිමි වීමයි.

ඔබගේ පරිගණකය එකවර නිහඬ වී අකර්මණ්‍ය වුවහොත් කිසිදු ආරක්ෂිත ක්‍රමවේදයක් යෙදීමේ අවස්ථාව ඔබට අහිමි වෙයි. එහිදී පරිගණක අලුත්වැඩියා කරන්නා වෙත රැගෙන යාම මිස වෙනත් විකල්ප විසඳුමක්ද ඔබට නොමැත. එහෙත් සෑම පරිගණක අලුත්වැඩියා කරන්නෙක්ම මෙම නිර්ලජ්ජිත ක්‍රියාවන්හි නිරත වන බවද අපි නොකියමු. එනිසා එලෙස අකර්මණ්‍ය වූ පරිගණකයෙහි ඔබ පිළිබඳ ඉතාමත් රහස්‍ය තොරතුරු අඩංගුව ඇත්නම් වඩාත් විශ්වාසදායක පුද්ගලයෙකු ලවා එම පරිගණකය අලුත්වැඩියා කර ගැනීම සඳහා යොමු වීම සුදුසු වේ. එසේ නොමැති නම් හාඩ් ඩිස්කය ඉවත් කර ගත හැකි වුවත් පරිගණකයක් අකර්මණ්‍ය වූ විට එය කිරීම එතරම් සුදුසු නොවෙයි. මන්ද යත් පරිගණකයෙහි රෝග නිධානය සොයාගැනීමට එය බාධාවක් විය හැකි බැවිනි.

යම් විදියකින් පරිගණකය මුළුමනින් අකර්මණ්‍ය නොවී ලෙඩ දෙන විට එය අලුත්වැඩියා කරන්නකු වෙත ගෙන යාමට සිදු වුවහොත් බාහිරව ඇති සියලුම ෆෝල්ඩර, ෆයිල් ආදිය මකා දමා මෘදුකාංගයක් මගින් හාඩ් ඩිස්කයේ මතක මකා දැමීම සිදු කළ හැකියි. නමුත් මේ සඳහා තරමක හෝ පරිගණක දැනුමක් ඔබ සතු විය යුතුයි.

ඔබේ පරිගණකය විකිණීමක් සිදුකරන්නේ නම් එතුළ ඇති පැරණි හාඩ් ඩිස්කය ගලවා අලුත් හාඩ් ඩිස්කයක් සවිකර දීම වඩාත්ම සුදුසු වෙයි. එසේ නොමැති නම් ෆෝමැට් කිරීමක් සමග විශ්වසනීය මෘදුකාංගයක් මගින් පරිගණක මතකයන් මකා දැමීම සිදු කළ හැකියි. මෙහිදී නැවතත් Recovery මෘදුකාංග යක් දුවවා පරිගණකයෙහි දත්ත තව දුරටත් රැඳී ඇත්දැයි සොයා බැලීම සුදුසු වේ.

මේ සියල්ලටම වඩා භයානක දේ වන්නේ ඔබගේ පැරණි පරිගණක ඉවත දැමීමේ ක්‍රියා පටිපාටියයි. මෙහිදී කිසිදු වගවිභාගයකින් තොරව කැළිකසල ගෙන යාමට එන දිනය බලා පාර අයිනේ පැරණි පරිගණකය තබා කසළ ලොරිය පැමිණ එය ගෙන යාමෙන් පසු එයින් මිදුණා යැයි සිතීම මුලාවකි. මෙහිදී ඔබ පිළිබඳ රහස්‍ය තොරතුරු ආදිය එම පරිගණකයේ සටහන්ව ඇතොත් ඔබ වඩාත් ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතු වෙයි. ඉවත දමන පරිගණකයේ ඇති හාඩ් ඩිස්කය ඉවත් කර එය මුළුමනින්ම විනාශ කර දැමීම කළ යුතු සුදුසුම දෙය වෙයි. මෙහිදී එතුළ ඇති ප්ලැටර්ස් හා චුම්භක රික්තකයන්ට හානි වන ලෙස සිදුරු කිරීම කළ යුතු වෙයි.

මේ සියලු කරුණු විමසා බැලීමේදී පරිගණකයෙහි තැන්පත් කර ඇති සියලුම වැදගත් තොරතුරු ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය නම් හාඩ් ඩිස්කය රැක ගැනීම සිදුකළ යුතු බව පෙනී යයි. තවද නව තාක්ෂණය භාවිතය පහසු වුවත් එය සෑම විටම ප්‍රායෝගි ක නොවන බවද මතක තබා ගැනීම සුදුසු වෙයි.

චමරි අබේසිංහ

# නවතම ඇපල් iPhone කට්ටලය



ඇපල් සමාගම විසින් සිය නවතම iPhone ස්මාට් ෆෝන් සාමාජිකයින් දෙදෙනා ලොවට හඳුන්වා දීම සැප්තැම්බර් 10 වන දින Calif හි ඇපල් සමාගමේ මූලස්ථානයේ සිදුකරනු ලැබුණි.

Apple iPhone 5c සහ Apple iPhone 5s ලෙසින් නම් කර ඇති මෙම නවතම අයිෆෝන දෙක, සෙලියුලර් දුරකතන ලොවෙහි නව පෙරළියක් ඇති කරනු ඇති බවට බොහෝ දෙනා විශ්වාසය පළ කරති.

මින් පෙර ඇපල් සමාගම මගින් නව අයිෆෝනයක් වෙළඳපොළට නිකුත් කරන විට එතෙක් වෙළඳපොළේ පැවති පැරණි අයිෆෝනයේ මිල අඩුකිරීම සිදු කළත් මෙවර එම සම්ප්‍රදායය වෙනස් කරමින් මිලෙන් අඩු නව අයිෆෝනයක්ද හඳුන්වා දීමටද ඔවුන් විසින් කටයුතු යොදා ඇත. ඒ අනුව මෙම මිල අඩු නව අයිෆෝනය iPhone 5c ලෙසින් වෙළඳපොළ වෙත ඉදිරිපත් කිරීමට නියමිත වේ.

Corning Gorilla Glass ආවරණය වෙනුවට ප්ලාස්ටික් ආවරණයක් සහිතව මෙම නව ‘5 සී’ අයිෆෝනය නිපදවා ඇති අතර 16GB '5c' ෆෝනයක් ඇමරිකන් ඩොලර් 99 ක් ලෙසද 32GB '5c' ෆෝනයක් ඇමරිකන් ඩොලර් 199 ක් ලෙසද මිල නියම කර ඇත. ඇපල් මෙවර හඳුන්වා දුන් ‘5 සී’ මාදිලිය ඔවුන් පෙර හඳුන්වා දුන් iPhone 5 මාදිලියට බොහෝ සෙයින් සමාන වන නමුත් නව වෙනස්කම් කීපයක්ද එයට එක් කර ඇත. කොළ, සුදු, නිල්, රෝස සහ කහ පැහැගත් ප්ලාස්ටික් ආවරණ සහිතව නිකුත් වන ‘5 සී’ සඳහා, බැටරි ආයුකාලය දීර්ඝව පැවතීම, LTE තාක්ෂණය සඳහා වැඩි ඉඩකඩ, උසස් තත්ත්වයේ කැමරා ආදි නව උපාංග කීපයක්ද එක් කර ඇත.

ඇපල් සමාගමේ නවතම පෙරළිය ලෙස කලඑළි දුටු Apple iPhone 5s සඳහා නවීනතම තාක්ෂණ අංග රාශියක් යොදා ගැනීමට ඇපල් කටයුතු කොට ඇත. මෙම ‘5 එස්’ මාදිලියේ දුරකථනයක් 16GB ඇමරිකන් ඩොලර් 199 කටද 32GB ඇමරිකන් ඩොලර් 299 කටද 64GB ඇමරිකන් ඩොලර් 399 කටද මිල ගණන් නියම වී ඇත.

‘5 එස්’ හි අභ්‍යන්තර නිමාව මෙතෙක් පැවති සියලුම අයිෆෝන් දුරකතනයටන් වඩා වෙනස් ආකාරයක් ගනු ලබයි. විශේෂයෙන්ම මෙහි කාර්යක්ෂමතාව අයිෆෝන් 5 දුරකතනය මෙන් 40 ගුණයකින් වැඩි කර ඇත. ලෝකයේ පළමු වතාවට 64bit ප්‍රොසෙසරයක් සහිතව එළි දුටු ‘5 එස්’ ස්මාට් ෆෝනය A7 සැකසුම් යන්ත්‍රයක් (processor) මගින් බලගැන්වෙනු ලබයි. ඒ 7 ලෙස නම් කරන ලද සංඥා උත්තේජක මානයද (motion sensor) මෙහි ඇති නව උපාංග යකි. වැඩිදියුණු කරන ලද මෙගාපික්සල්(MP) 8 ක කැමරාවද අඩු ආලෝක තත්ත්වයක් මත වුවත් ඡායාරූප ගත හැකි ආලෝක ක්‍රම දහසක් පමණ මිශ්‍ර කළ හැකි Tone- dual LED ෆ්ලෑෂරයද මගින් පැහැදිලි වර්ණවත් ඡායාරූප ගැනීමේ හැකියාවද මෙම ෆෝනය මගින ලබා ගත හැකිය. මෙම දුරකතනයේ දක්නට ඇති නවතම විශේෂාංගය වන්නේ Touch ID නමැති ඇඟිලි සලකුණු සංවේදකයයි (Fingerprint Sensor). මෙය අයිෆෝනයේ Home Button යෙහි ස්ථාපනය කොට ඇත. දැනට ලැප්ටොප් පරිගණකයන්හි ඇති ඇඟිලි සලකුණු සංවේදකවලට වඩා ඉහළ තාක්ෂණයකින් සහ නිරවද්‍යතාවකින් යුතුව ඉදිරිපත් කර ඇති මෙමගි න් ඔබගේ ජංගම දුරකතනයට බාහිර පුද්ගලයින්ගේ පැමිණීම වළක්වා ගත හැකි වෙයි. මෙම සෙන්සරය මගින් ලබාගන්නා දත්ත අයිෆෝනයේ ප්‍රෙසෙසරයේ පමණක් ගබඩා වන අතර ඒවා ඇපල් මෘදුකාංග ප්‍රවර්ධකයන්ට පවා ලබාගත නොහැකි ලෙස රහස්‍ය ලෙස පවතී.

‘5 එස්’ ස්මාට් දුරකතන Gold Silver සහ Space Gray යන වර්ණයන්ගෙන් යුක්ත වන අතර මෙම නවතම ඇපල් අයිෆෝනයන් සැප්තැම්බර් 20 වනදා සිට වෙළඳපොළේ නිකුත් කිරීමට නියමිතව ඇත.


Reach your dreams with an exceptional Realtor
not just support An ally in your corner
HOMELIFE
HIGHER STANDARDS
Higher Standards Agents...Higher Results
Victor Gamage
Sales Representative
Direct : (647) 780-2853
Bus:(905) 201-9977
HomeLife/Future Realty Inc.,Brokerage
Independently owned and operated.REALTOR®
205-7 Eastvale Dr. Markham ON L3S 4N8
Fax:(905) 201-9229
email:dreamhome@victorgamage.com
www.victorgamage.com


Shiv Shakti Jyotishalaya
THE MOST POWERFUL SPIRITUALIST FROM INDIA
Pandit:
RAMJI
Specialist in All kinds of Astrology
If you are dissappointed with other Astrologers, Meet the GOD GIFTED PANDIT RAMJI & Get the Permanent Solutions for all your Problems
SOLUTIONS & SUGGESTIONS ON:
Finance * Work * Love * Husband-Wife
Education * Health * Depression * Enemy
Spousal Conflicts * Children Problems Etc
100% REMOVAL OF BLACK MAGIC & EVIL SPIRITS OF ALL RELIGIONS & COMMUNITIES BY PERFORMING SPECIAL POOJAS , MANTRA'S KAALI POOJA'S AND PRAYERS
647-962-7346, 647-852-2996
679 Markham Road, Scarborough, On, M1H 2A4
(Cedar Heights Plaza), Markham & Lawrence

10 කොටස

# සූකර වස්තුව



ඈ ගෙට ගොඩවන විටම කරුණා දරුවා ඔසවාගෙන ආලින්දයට පැමිණියාය. නියම මව් සෙනෙහසින් කුසුමලතා දරුවා ඔසවා ගත්තාය. දරුවා කෑගසමින් අඬන්නට විය. කිරි පොවන්නට උත්සාහ කළ නමුත් එයද ව්‍යර්ථ විය.

"දැන් පුතා මටයි පුරුදු. මල්ලි අතටවත් යන්නෙ නෑ..."

කරුණා කීවේ දරුවා යළිත් තමන් අතට ගනිමිනි.

"ටිකක් වෙලා යනකොට පුරුදු වේවි. කොහොමත් දරුවෙකුට කිරි සුවඳ දැනෙනවා"

සීලවතී හාමිනේ කීවේ ගෙතුළට යමිනි. ආලින්දයේ රැඳුණු කරුණා හා කුසුමලතා ආපසු මිදුලට පැමිණියහ.

"මං නම් හරිම කැමතියි නංගි ආපහු ආවාට. අපේ මේ ප්‍රශ්න දුරදිග යන්නෙ මොකටද? මම නම් අපේ මල්ලි සුද්ද කරන්න යන්නෙ නෑ. ඒත් අපි මොකටද රට්ටු හිනස්සන්නෙ. මිල්ටන් ගෑනි එළවලා දැන් වෙන ගෑනියෙක් තියාගෙන. ඒ වගේ කතාවක් හැදුනොත් ඉඳල මොකටද නංගියේ. හොඳයි නංගි වෙන කවුරු හරි එක්ක යාළු වුණා. ඒත් එච්චරනෙ. මෙච්චර වයසට ගිහිල්ලත් මාත් කවුරු හරි එක්ක නොගිහින් ඉන්නෙ පවුලෙ නම්බුව රකින්න ඕන හින්ද නංගියෙ...."

කරුණා කතා කරන්නේ වේදනාවෙන් යැයි කුසුමලතාට සිතිණ. නොසිතාම දරුවා කුසුමලතා අතට පැන්නේ ඒ මොහොතේය. කුසුමලතාට සියල්ල අමතක විය. ළැම කිරි බරින් පිරෙන බව ඇයට දැනිණ. හය මසක් ගත වීත් දරුවා තනපුඩුවට කට කිට්ටු කළාය. දරුවා නොනැවතී කිරි උරන්නට විය.

මොහොතකින් කුස ඔත් දරුවා ගැන කුසුමලතාට සිහිපත් විය. දරුවකු පිළිසිඳ ගත් පසු කිරි සිඳී යන බවට ඇති මතය කුසුමලතා අසා තිබුණාය. එහෙත් අද තමාගේ තත්ත්වය එයට වෙනස්ව ඇත.

දරුවා කිරි උරන අන්දම බලා සිටි කරුණාගේ සිත ඈත අතීතයට ගමන් කළාය. කරුණා බලාපොරොත්තු වූ තරුණයා පාසල් ගුරුවරයෙකි. ඔහු පිටගම් කාරයෙකි. පහත් කුලයකට අයත් බව පසුව දැනගන්නට ලැබිණ. හඳපානේ පැනයන්නට ඔහු කරුණාට කිහිපවරක්ම ආරාධනා කළාය. එසේ නොහැකි වූ විට කරුණා සමග කොතැනකදී හෝ එක්වන්නට ඔහුට උවමනා විය. එවැන්නක් සිදුවුවහොත් කරුණා ඔහුටම දීග දෙන බව ඔහුගේ විශ්වාසය විය. ගෙදර තිබූ දැඩි රැකවරණය මධ්‍යයේ වුවද කරුණා කෙසේ හෝ එවැනි අවස්ථාවක් උදා කරගත්තාය. එහෙත් අවස්ථාවෙන් මල්එල නොනැගිණි.

සියලු බලාපොරොත්තු ඉහිරී ගියේ කාගේ හෝ බලපෑමක් නිසා ගුරුවරයා ඈත පාසලකට මාරු කරනු ලැබීමෙනි. ඔහුගෙන් දරුවෙකු හෝ ලබාග ැනීමට කරුණා තුළ දැඩි ආශාවක් තිබිණ. කරුණා අදත් තනිකඩය. එහෙත් දරුවකු ලබාගැනීමේ ආශාව කරුණා වෙතින් අදත් ඉවත්ව ගොස් නැත.

"අනේ නංගියේ මටත් දරුවෙක් උන්න නම් කියා හිතෙනවා"

කරුණා නොසිතා කී වචනවලින් කුසුමලතා තිගැස්සුණාය. දරුවාගේ කිරි ඉරීම නැවතී තිබිණ.

"ඉතිං ඇයි අක්ක බැන්දෙ නැත්තෙ...?"

තමන් ඇසුවේ මෝඩ ප්‍රශ්නයක් බව කුසුමලතාට පසුව වැටහිණ. නිරුත්තරව බොහෝ වේලාවක් සිටි කරුණා දරුවා ඔසවා ගත්තාය.

"ඒකත් ඇත්ත. බඳින්නෙ නැතුව ළමයි හදාගන්නෙ කොහොමද? බැඳපු ගෑනියෙකුට ඕන තරම් ළමයි හදාග න්න බැරියැ. මොකෝ කාගෙන් තහනමක්ද? නේද නංගියේ"

දරුවා උඩ දමමින් කරුණා කීවේ සැහැල්ලු සිතිනි. එහෙත් එය තමන්ට එල්ල කළ පහරක් සේ කුසුමලතාට දැනිණ.

කුසුමලතාගේ කුස ඔත් දරුවා තමන්ගේ නොවන බව දැනගැනීමට මිල්ටන්ට වැඩි දවසක් ගත නොවීය. කුසුමලතා ආපසු කැන්දන් ආ දිනයේම ඇගේ ලොකු වෙනසක් ඔහුට පෙනිණ. ඒ ඈ දිගින් දිගටම ඔක්කාර කිරීමට පටන් ගත් බැවිනි. ගමන් මහන්සියට ඇති වූ එකක් යැයි මුලින් සිතුවද ඔක්කාරය දිගින් දිගටම පැවතීම නිසා ඔහුගේ ඒ සැකය වැඩි විය.

"ඇයි ගෑනියේ ඔය ටික මට කලින් නොකිව්වේ. එහෙමනං මං උඹට උගත් එක්කම යන්න අරිනවනෙ..."

එක් උදෑසනක කඩයට යන්නට ලෑස්ති වී මිල්ටන් ඇසුවේ කුසුමලතාට පමණක් නොව මවටද ඇසෙන පරිද්දෙනි.

බයෙන් බිරාන්ත වූ කුසුමලතා බිම බලා ගත්තාය. මිල්ටන් දැන් දැන් තමාට පහර දෙතැයි ඇයට සිතිණ. දරුවා කරුණා අතට දුන් ඈ ටිකෙන් ටික පස්සට ඇදුණාය.

"ඒකි ඉන්න තමයි හැදුවේ. උඹයි මමයි ගිහින්නෙ එක්ක ආවෙ. නැතුව ඒකි බලෙන් ආව ගමනක්යැ"

සීලවතී හාමිනේ කුසුමලතා මුවා කරමින් ඉදිරියට පැන්නේ එසේ කියමිනි.

"අනේ මගේ කට. කාගෙද බඩේ ඉන්න එකා කියපං. මං ගිහින් දෙකක් කතා කරන්න"

"ඕන නෑ මං ආපහු ගෙදර යන්නං"

කුසුමලතා සීලවතී හාමිනේ පිටුපසට වී ඉකිබිඳින්නට වූවාය.

"උඹ මොන දීපංකරේක යන්නද? ආව තැන දීග ආව මිනිහා එක්ක ඉන්නව මිසක්. බඩේ ඉන්න එකා කාගේ වුණත් කමක් නෑ. උඹ මෙතනින් හෙල්ලෙන්නෙ නෑ"

සීලවතී හාමිනේ ඒ වචන කුසුමලතාට කීවේ මිල්ටන්ට ඊදෙන්නටය.

"අනික මිල්ටන් පුතේ සේරටම වැරදිකාරයා උඹ. උඹ හරියට හිටියනං මේ කෙලී යන්නෙ නෑ. මෙහෙම දෙයක්



වෙන්නෙත් නෑ. අනික උඹේ කැරැට්ටුව දිග ඇරුණොත් මේ කෙලී විනාඩියක් ඉන්නෙ නෑ. දැන් කට පියාගෙන හිටපල්ලා. උඹල දෙන්නට එක වහළ යට ඉන්න ඕන නං...."

සීලවතී හාමිනේ කීවේ තරවටුවක් විලසිනි. එහෙත් එයට මිල්ටන් අවනත වූ බවක් නොපෙනිණ.

"කාගෙවත් දරුවො කිරිත්තං කරන්න මට බැහැ..."

මිල්ටන් කීවේ හති අරිමිනි.

"ඒ වුණාට උඹට තව ගෑනුන්ගෙ දරුවො කිරිත්තං කරන්න වේවි"

සීලවතී හාමිනේගේ ඒ වචන තම කම්මුලට ගැසූ පහරක් මෙන් මිල්ටන්ට දැනිණ. අම්මා සියලු දේ දැනගෙන සිටී. දැන් කොතනින් හෝ ගැලවීමක් නැත. මිල්ටන් නිහඬ වූයේ ලැජ්ජාවක් පසුතැවිල්ලක් වැනි හැඟීමක්ද ඉස්මතු වූ බැවිනි. යන්නට ලෑස්ති වූ ගමන නවතා දමා ඔහු ආලින්දයේ වූ පුටුවක ඉඳ ගත්තේය.

"පුතේ මේ අහපං. මේවට කලබල වෙලා බෑ. කෙලීගේ කැමැත්තට සිද්දවෙච්ච දෙයක් නෙවෙයි මේක. ඒකිට බලහත්කාරකමක් සිද්ද කරල. ගමේ කවුරුත් මේක දන්නෙ නෑ. ඉතින් එහෙව් එකේ කෙලී ගෙදර ඇරලා රටේ ලෝකෙ එවුන්ට කතන්දර හදන්න ඉඩ දුන්නොත් හොඳට තියෙයි. අනික උඹත් දැන් ඔය අනම් මනම් ගමන් නවත්තලා තමන්ගෙ ගෑනිත් එක්ක පවුල් කන්න බලපං. දරුවා උඹේ නමට කිරිත්තං කරන්න වෙනවා. ආයේ ඒකෙ දෙකක් නෑ. උඹේ ගෑනිට වෙන මිනිහෙකුගෙන් දරුවෙක් කිව්වොත් අපේ පවුලේ නම්බුවට මොකද වෙන්නෙ. උඹට මොකද වෙන්නෙ. දැන් නිශ්ශබ්ද වෙලා හිටපං එච්චරයි..."

මිල්ටන් බොහෝ වේලාවක් කරබාගෙන කල්පනා කළේය. අම්මා කියන දෙයෙහි සත්‍යයක් නැත්තේද නොවේ. මේ සිද්ධිය නිසා තමාට ඕනෑ තරම් නිදහසේ ජීවත් විය හැක. දැන් කුසුමලතා ගිරයට අසු වූ පුවක් ගෙඩියකි. කැඳත් රැවුලත් දෙකම බේරා ගැනීමට දැන් ඈ වෙහෙසෙනු ඇත.

එදින සවස මිල්ටන් ගෙදර නොපැමිණියේය. ඔහු කඩේම නවතින්නට ඇතැයි සීලවතී කීවේ කුසුමලතාටත් ඇසෙන්නටය.

"ඉඳල හිටල දවසක් කඩේ බුදියනවා. තමන් රෑට කඩේ ඉන්නවය කියන එක අහළ පහළ උන්ට දැනගන්න ඕන නිසා..."

එසේ කියූ සීලවතී හාමිනේට කඩ කාමරයේ ඇඳ මත තිබූ චීත්ත රෙද්ද සිහිපත් විය. එය දුටුවේ තමන් පමණකි. කුසුමලතාට එය ඇස නොගැසුණේය.

"උඹ ඕව ගණන් ගන්න එපා කුසුමො. අද ටිකක් හිතේ අමාරුවක් ඇතිනේ. හෙට අනිද්ද දිහාවට ඕව හරි යාවි"

සීලවතී හාමිනේ කීවේ කුසුමලතා සනසන අටියෙනි. එහෙත් මිල්ටන්ගේ පැමිණීමක් ඇයට අවශ්‍ය නොවීය. ඇයට අවශ්‍යව ඇත්තේ මිල්ටන්ගෙන් බේරීමටය. නැන්දනියගේ ආධිපත්‍යය යටතේ තමාට ලැබුණු ආරක්ෂාව ගැන ඈ බෙහෙවින් සතුටට පත්ව සිටියාය.

පසුදින හොඳටම රෑ බෝවී මිල්ටන් ගෙදර පැමිණියේය. කුසුමලතා හා කථා නොකළ ඔහු අරක්කු භාගයක් හිස් කොට නින්දට වැටුණේය.

දින කිහිපයක්ම මෙය මෙසේ සිදු විය. කුසුමලතාටද මෙහි අමුත්තක් නොදැනිණ.

"යකෝ ඔය බඩේ ඉන්න එකා එළියට ආවට පස්සෙ තමයි මං ආයෙ උඹට සලකන්නෙ..."

වෛරී මරගාතේ සමහර දිනක මිල්ටන් බෙරිහන් දුන්නේය. දරුවා ලැබෙන තුරු එය එසේම සිදු විය.

කුසුමලතාට දරුවා ලැබුණේ ගම්පහ රෝහලේදීය. දරුවාගේ හැඩරුව ගැන සිතද්දී කුසුමලතාගේ සිත නොසන්සුන් විය. ලාල්සිරිගේ හැඩරුව එහෙම පිටින්ම මුහුණේ රැඳී තිබිණ. එහෙත් ඒ බව දැන සිටියේ කුසුමලතා හැරුණු විට සොමිනෝනා පමණි. ඒ ලාල්සිරි වෙනත් කිසිවකු විසින් දැක නොතිබුණු බැවිනි. ගැහැනු දරුවකු බැවින් ලොකු මහත් වන විට මේ හැඩරුව වෙනස්ව යා හැකි යයි කියමින් සොමිනෝනා තම දුව සැනසුවාය.

32 වන පිටුව බලන්න



අනුල ද සිල්වා

# සූකර වස්තුව...

31 වන පිටුවෙන්

මිල්ටන් රෝහල වෙත පැමිණියද දරුවා දෙස නොබැලුවේය. දරුවාගේ හැඩරුව බැලීමට අවශ්‍යව තිබුණද මේ එයට වේලාව නොවේ යැයි ඔහුට සිතිණ.

"කන්න මොකවත් ගෙනල්ල ඕනැද?" ඔහු යුතුකමක් ඉටු කරන්නට මෙන් ඇසුවේය.

"එපා අම්මා බත් ගෙනාවා"

"වෙන කවුරුත් ආවේ නැද්ද බලන්න"

"වෙන කවුරු එන්නද?"

"ඇයි අරෑ..."

කුසුමලතාගේ දෑසට කඳුළු ඉනුවේය.

"සේරම නට්ටාලි නටලා දැන් කිඹුල් කඳුළු හෙලනවා"

කුසුමලතාට ඉකිගැසිණ. කම්මුල් දිගේ රෑරා ආ කඳුළු කැට කිරි උරමින් උන් දැරියගේ කොපුල් තල මත වැටිණ. මවගේ සියලු වේදනා ඒ මොහොතේ සිටම කිරි හා කඳුළු සමගින් දැරියගේ ජීවිතයට උරුම වන්නට විය.

කුසුමලතා වටපිට බැලුවේ තම ඉකිබිඳුම කාට හෝ ඇසේදැයි සිතමිනි. එහෙත් කිසිවකු ඈ දෙස බලා සිටින බවක් නොපෙනිණ. ලෙඩුන් බලන්නට එන වේලාව වූ බැවින් වාට්ටු තුළින් මතු වූ ඝෝෂාවෙන් සියල්ල වැසී ගියේය.

* * * *

"ලෝකෙටම ඇහෙන්න තමයි මං කෑගහන්නෙ. ලෝකෙටම පේන්න තියෙන දේ මං කෑගහල කිව්වම මොකද?"

ගැහැනියකගේ කටහඬ ඇසුණු බැවින් කඩේ වැඩ කරන සිරිපාල මඳක් එබිකම් කළේය. ඒලෝකෙටම පේන්න තියෙන දේ දැක ගැනීමටය. යසවතී ටිකක් මහත් වී ඇතැයි සිරිපාලට සිතිණ. ඒ හැර පෙනෙන්නට වෙනත් දෙයක් නොවීය. මිල්ටන් සිරිපාල දෙස බැලුවේ පිහිටක් පතන්නකු විලසිනි. සිරිපාල කිසිවක් නොදත්තකු සේ අහක බලාගෙන සිටියේය.

"මට පොරොන්දු වුණු විදියට සල්ලිවලින් රුපියල් පන්දාහක් දෙනවා.



ඒ ඇති. ආයෙ අපේ ගෙවල් පැත්තේ නාවට කමක් නෑ"

පිටස්තරයකු සිටින බව දුටු නිසාදෝ ඉන්පසු යසවතී තරමක් හඬ බාල කරමින් කතා කරන්නට වූවාය.

"ඇයි යසවතී ඔය කුසේ ඉන්න දරුවා මගේ නෙවෙයිනේ"

මිල්ටන් කීවේ යසවතීට පමණක් ඇසෙන්නටය.

"මොකද නැත්තේ. කුසෙන් හැල්ලු උනහම මං ඒක පෙන්නන්නම්"

"ඔය දරුව කාලෙක හිටන් එහෙ ආව ගිය ගුණපාලගෙ නෙවෙයිද?"

"ගුණපාලගෙද මිල්ටන් මහත්තයගෙද කියල මං දින ගණන් ගැනල බැලුවෙ නෑ. මහත්තයට යුතුකමක් තියෙනවා මට ඔය සල්ලි ටික දීල දාන්න.

ගුණපාල ළඟ සල්ලි නෑ. ඌ දරුවගේ තාත්තා වුණත් මට උගෙන් සල්ලි ඉල්ලන්න බැහැ"

"එතකොට මට සල්ලි තියෙන එකද වැරැද්ද?"

"සල්ලි තියෙන එක නෙවෙයි මහත්තයෝ සල්ලි තියෙන මුදලාලි මහත්තුරු වල් කම් කරන එකයි වැරැද්ද"

මිල්ටන්ට පොළව පළාගෙන යන්නට තරම් ලැජ්ජා සිතිණ. කුසුමලතා තමන්ට කිසිම දිනක මෙසේ රළු පරළු වී නැත. පිටස්තර ගැහැනියකගේ බැණුම් අසන්නට තරම් තමා මෙසේ පහත් තත්ත්වයකට පත් වූයේ තමාගේම වරදිනි. මිල්ටන් මුදල් ලාච්චුව ඇර බැලුවේය. එහි රුපියල් දාහකට වඩා තිබුණද මිල්ටන් රුපියල් දාහක් අතට ගත්තේය.

"දැන් සල්ලි තියෙන්නෙ ඔච්චරයි"

ඔහු රුපියල් දාහ යසවතී අත තැබුවේ එසේ කියමිනි.

"ඕකෙන් බේරෙන්න බැහැ. මං තව දවස් දෙක තුනකින් ආයෙත් එනවා"

රුපියල් දාහ ඉනේ ගසාගත් යසවතී පිටත්ව ගියේ එසේ කියමිනි. මිල්ටන් කඩයේ ඉතිරි දොර පලු දෙකත් වසා දැම්මේය. කිසිවකුට මුහුණ දිය නොහැකි බව ඔහුට දැනිණ. පිටුපස කෑල්ලට ගිය ඔහු තිබූ ඇඳ මත වාඩි වූයේ කුමක් කළ යුතුදැයි සිතමිනි. තමන්ගේ ජීවිතයේ බොහෝ සිදුවීම්වලට මේ ඇඳද සාක්කිය. අතීතය එහෙ මෙහෙ පැටලුණු මකුළු දැලක් මෙනි. තමා කිසිසේත් නිර්දෝෂී නොවේ. යසවතී බනින්නෙ තමා වරදක් කර ඇති බැවිනි. දරුවාගේ පියා තමා නොවන බව සත්‍යයකි. එහෙත් එය ඔප්පු කළ නොහැක. යසවතීටද කසාද පුරුෂයෙක් සිටී. අන්තිමට දරුවා ඔහුගේ නමට කිරිත්තන් වෙයි. යසවතී හා සසඳන කල කුසුමලතා කොතරම් අහිංසකදැයි ඔහු සිතන්නට විය.

තවත් රසබර කොටසක් ලබන කලාපයෙන්









# 2013 සැප්තැම්බර් 1 දින සිට සැප්තැම්බර් 30 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)




## මේෂ ලග්නය

ඔබගේ ලග්නාධිපති සතර වැන්නේ සිටීම ශුභයි. ශනි 7 වැන්නේ උච්චව සිටීමත් සිකුරු ස්වක්ෂේත්‍රව 7 වැන්නේ සිටීමත් ශුභයි. රවි සහ බුධත් බලවත්ව සිටීම ශුභයි. තම වැඩකටයුතු නිසි ලෙස කර ගැනීමේ භාග්‍යය ඇත.



## වෘෂභ ලග්නය

මෙම ලග්න හිමියන්ගේ ලග්නාධිපති ස්වක්ෂේත්‍රව සිටීම ශුභයි. සතුරු කරදර බිඳ බාධක බිඳ ඉදිරියට යාමේ හැකියාව ඇත. උසස් අධ්‍යාපනය හදාරන සැමට ශුභයි. රැකියා උසස් වීමට, ආදායම් සරුවීමට භාග්‍යය ඇත. සැම දශාවක්ම ගත කරන අයට ශුභයි.



## මිථුන ලග්නය

ලග්නාධිපති 4 වැන්නේ සිටීම ශුභයි. ඉඩකඩම් ලබාගැනීමේ භාග්‍යය ඇත. කෙසේ හෝ මුදල් ඉපයීමට උත්සාහ දරන කාලයකි. වියදමද පෙන්වයි. උසස් ඉගෙනුමට හොඳයි. රැකියා දියුණුව සැලසේ. ක්‍රීඩා තරඟවලින් ජය ලැබිය හැකිය. කොන්ත්‍රාත් ව්‍යාපාරවලින් ලාභ ලැබිය හැකිය.

## කටක ලග්නය



ග්‍රහචාරය අනුව ඔබට මේ කාලය ශුභ ඵල ගෙන දේ. අධ්‍යාපනය හදාරන දරුවනට, උසස් අධ්‍යාපනය හදාරන අයට ශුභයි. රැකිරක්ෂා දියුණුවට, උසස්වීම් ලැබීමට හොඳයි. ආදායම් මාර්ග සරු වීමට, ගෙවල් දොරවල් ගැනීමට භාග්‍යය ඇත. හදිසි ධන ලාභ ලැබීමට වාසනාව ඇත.



## සිංහ ලග්නය

ඔබගේ ලග්නාධිපති ස්වක්ෂේත්‍රව මූලත්‍රිකෝණව සිටීම ශුභයි. එකොළොස් වැන්නාධිපති දෙවැන්නාධිපති බලවත්ව දෙවැන්නේ සිටීමත් ශුභයි. තෙවැන්නේ ශනි-සිකුරු බලවත්ව සිටීමත් ශුභයි. තමන්ගේ සැම කාර්යයක්ම ශුභ ලෙස කරගෙන යාමට හැකිය. බාධක බිඳ දමා එඩිතරව තම වැඩකටයුතු කර ගැනීමට හැකිය. ආදායම් මාර්ග සරු වීමේ භාග්‍යය ඇත. ධන ලාභ ඇත.



## කන්‍යා ලග්නය

ඔබගේ ලග්නාධිපති බලවත්ව ලග්නයේ සිටීම ශුභයි. දෙවැන්නේ සිකුරු-ශනි බලවත්ව සිටීමත් ශුභයි. අධ්‍යාපනය හදාරන සිසුන්ට ශුභ ඵල ලැබෙන අතර උසස්වීම් ලැබීමටත්, රැකිරක්ෂා අපේක්ෂිත අයට රැකියා ලැබීමටත් හේතුයි. දේපළ, ධනය, වස්තුව ලැබීමේ භාග්‍යය ඇත.



## තුලා ලග්නය

ඔබගේ ලග්නයේ ශනි-රාහු ගෝචරව ගමන් කරයි. උච්චව සිටින ශනි සමග ස්වක්ෂේත්‍රව සිටින සිකුරු යෝගවී සිටීම ශුභයි. එකොළොස් වැන්නේ රවි බලවත්ව සිටීමත් ඉතා ශුභයි. රැකියා, ව්‍යාපාර දියුණු වීමට, උසස්වීම් ලැබීමට, දේපළ වස්තුව ලැබීමට ශුභයි. බාධක අවහිර ඇතත් ඒවා මර්දනය කර ඉදිරියට යාමේ හැකියාව ඇත.



## වෘශ්චික ලග්නය

ලග්නාධිපති නව වැන්නේ සිටීම ශුභයි. ශනි-රාහු 12 වැන්නේ ගමන් කිරීම ශුභ නැත. එහෙත් දසවැන්නාධිපති එකොළොස්වැන්නාධිපති දෙදෙනා බලවත් වීම ශුභයි. අධ්‍යාපනය හදාරණ අයට ශුභයි. රැකීරක්ෂා දියුණුවට, උසස්වීම් ලැබීමට ශුභයි. ධන ලාභ ලැබීමට හේතුයි.



## ධනු ලග්නය

ඔබගේ ලග්නාධිපති හත්වැන්නේ ගමන් කිරීමත් දෙවැන්නාධිපති 11 වැන්නේ ගමන් කිරීමත් ශුභයි. සිකුරුත් තුලාවේ සිටීම ශුභයි. ධනය ලැබීමට, රැකියා දියුණුවට ශුභයි. අධ්‍යාපනය හදාරන සැමට ශුභයි.



## මකර ලග්නය

ලග්නය සහ දෙවැන්න අධිපති ශනි උච්ච බලයෙන් යුක්තව 10 වැන්නේ රාහු සමග යෝග වී ඇත. මෙසේ ලග්නාධිපති බලවත්ව සිටීම රැකියා දියුණුවට හේතුයි. අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගැනීමට හැකිය. සතුරු කරදර නොමැත. බොහෝ දුරට මිශ්‍ර ඵල ගෙන දෙන මාසයකි.



## කුම්භ ලග්නය


ඔබගේ ලග්නාධිපති ශනි 9 වැන්නේ රාහු-සිකුරු සමග සංයෝගව සිටීම ශුභයි. සතුරු කරදර අඩුවේ. කෙසේ හෝ තම වැඩකටයුතු කරගැනීමට උත්සාහ කරන කාලයකි. දරුවන්ට ශුභ වේ. අධ්‍යාපන කටයුතුවලට, ව්‍යාපාරවලට ශුභ වන අතර පිනට දහමට යොමුවන කාලයකි.



## මීන ලග්නය

ඔබගේ ලග්නාධිපති 4 වැන්නේ ගමන් කිරීම ශුභ නැත. ශනි-රාහු අටවැන්නේ ගමන් කිරීමත් ශුභ නැත. මානසික අසහනය, ලෙඩ රෝග අනතුරු ඇතිවිය හැකිය. ඉක්මන් තීරණ ගැනීමෙන් වැළකී ඉවසීමෙන් කටයුතු කිරීම ශුභයි. පුණ්‍ය කටයුතුවල යෙදීමෙන් සහන ලැබේ.

**එම්. වයි. ධර්මවිජය**
ජ්‍යොතිෂ ඩිප්ලෝමා,
උසස් ඩිප්ලෝමා, ජ්‍යොතිෂ
ශිරෝමණි(රන්පදක්කම් ලාභී)
01-905 990 2311



# කාල හෝරා

මින් පෙර කලාප තුනෙන් කාල හෝරාව සාදාග න්නා ආකාරය සවිස්තරාත්මකව පෙන්වා දුනිමි. එහිදී කාලහෝරා, පංචම කාලහෝරා, සූක්ෂ්ම පංචම කාලහෝරා ආදිය බෙදී යන අයුරු විස්තර කළෙමි.

මෙතැන් සිට කාලහෝරාවක් සහ පංචම කාලයක් තුළ එම හෝරාවන් සුදුසු කුමටද? එයින් ගත හැකි ප්‍රයෝජන මොනවාද? යන්න පිළිබඳ විස්තර කරමි.

## 1. රවි හෝරාව

මේෂ, සිංහ යන රාශි දෙකේ රවි ග්‍රහයා ගමන් කරන කාලවලදී කැති, උත්‍රපල, උත්‍රසල යන නැකැත් තුන උදා වී ඇති ඉරිදා දිනයක රවි හෝරාව ඉතාමත් බලවත් වේ. එමෙන්ම රවි පාප ග්‍රහයකු නිසා ශුභ වැඩකට යොදාගන්නේ නැත. එනමුත් පහත සඳහන් වැඩවලට ශුභයි.

i. සැත්කමකට භාජනය වීමට
ii. බෙහෙත් ගැනීමට
iii. දේශපාලන වැඩවලට, දේශපාලනඥයින් හමුවීමට
iv. නඩු බාරදීමට, පොලිසියෙහි පැමිණිලි දැමීමට
v. ජනාධිපති, ආණ්ඩුකාරවරු, නගරාධිපති, වෛද්‍යවරු යන අයගෙන් උදව් ඉල්ලීමට
vi. භාවනා කිරීමට

එමෙන්ම රවි සංක්‍රාන්තිය සහිත රවි දිනක රවි හෝරාවෙන් ගත් ණයක් කිසිමදාක ගෙවා අවසන් කළ නොහැක.

### රවි පංචම කාල හෝරාව තුළ සුදුසු නුසුදුසු ක්‍රියා

රවි හෝරාවේ යෙදෙන පංචම කාල හෝරා 5 ක් ඇත. එනම්,

i. රවිගෙන් රවි පංචමය - උසස් නිලධාරීන් හමුවට
ii. රවිගෙන් චන්ද්‍ර පංචමය - ව්‍යාපාර ආරම්භයට
iii. රවිගෙන් කුජ පංචමය - කිසිම ශුභ කටයුත්තකට හොඳ නැත.
iv. රවිගෙන් බුධ පංචමය - අයහපත්ය.
v. රවිගෙන් ගුරු පංචමය - විෂ බැවින් අශුභය.

## 2. චන්ද්‍ර හෝරාව

චන්ද්‍රයා උච්ච සහ ස්වක්ෂේත්‍ර රාශිවල ගමන් කරන කාලයේදී එමෙන්ම රෙහෙණ, හත, සුවණ නැකතක් උදා වී පවතින දිනයක පුර පක්ෂයේ සඳු දිනයක සඳු හෝරාව යෙදෙන කාලය ඉතා බලවත් වේ. එබැවින් සඳු හෝරාවක් තුළදී යොදාගැනීමට සුදුසු කටයුතු,

i. ප්‍රේම බන්ධනවලට
ii. විදේශ ගතවීම, විදේශ ගමන් සම්බන්ධ කටයුතුවලට
iii. දැඩි සිත් ඇති අය හමුවීම
iv. පැල සිටුවීම
v. ළිං කැපීම
vi. දෙගිඩියාවෙන් සිටින කරුණකදී කල්පනා කිරීමෙන් සුදුසු තීරණයකට එළඹීම

### සඳු පංචම කාල හෝරාව තුළ ශුභ අශුභ තත්ත්ව

i. සඳුගෙන් සඳු පංචමය - විෂ නගී. ශුභ නැත.
ii. සඳුගෙන් කුජ පංචමය - අයහපත්
iii. සඳුගෙන් බුධ පංචමය - ඉගෙනීමට ශුභයි. තරඟ විභාගවලින් ජය ලබයි. බලාපොරොත්තු සඵල වේ.
iv. සඳුගෙන් බුධ පංචමය - දැනුම බුද්ධිය වර්ධනය සඳහා අරඹන වැඩ සාර්ථක කර ගැනීමට ශුභයි.
v. සඳුගෙන් සිකුරු පංචමය - විනෝදයට, සැපතට, අලංකාරයට, විවාහ ආදියට

## 3. කුජ හෝරාව

මේෂ, වෘෂ්චික, මකර රාශිවල කුජ නොහොත් අඟහරු ග්‍රහයා ගමන් කරන කාලවලදී මුවසිරස, සිත, දෙනට යන නැකැත්වලින් එකක් උදා වී පවතින අඟහරුවාදා දිනයක අඟහරු හෝරාව ඉතා බලවත් වේ. කුජ ග්‍රහයා පාපයකු බැවින් ශුභ වැඩ සඳහා මෙම හෝරාව නොගැනේ. එනමුත් මෙම හෝරාව යොදා ගැනීමට සුදුසු කාර්යයන්

i. අධිකරණ කටයුතු
ii. රාජකාරි භාරගැනීමට
iii. සටනට, වර්ජනයට, වස්කවි රචනයට, වස්කවි කීමට
iv. ඉඩම් මිලට ගැනීමට, මැණික් ගැරීමට, ගඩොල් තැනීමට, පොළොව ආශ්‍රිත කටයුතුවලට, සපත්තු, යකඩ ආදි කර්මාන්ත ආරම්භයට
v. වෙළඳ ව්‍යාපාර ආරම්භයට, ඉඩම් මිල දී ගැනීමට

### කුජ පංචම කාලහෝරාව තුළ ශුභ අශුභ තත්ත්ව

i. කුජගෙන් කුජ පංචමය - ඉතා අශුභයි.
ii. කුජගෙන් බුධ පංචමය - උනන්දුව, උත්සාහය, ආත්මශක්තිය, ධෛර්යය ලබයි.
iii. කුජගෙන් ගුරු පංචමය - අයහපත් වේ.
iv. කුජගෙන් සිකුරු පංචමය - අලංකාරය, විනෝදය, රසාස්වාදය ලැබීමට හැකිය. අඹුසැමි එක්වීමට හොඳයි.
v. කුජගෙන් ශනි පංචමය - විෂයි. සෑම කටයුත්තකටම අයහපත් වේ.

# කොමඩු ඇටය





## කෙටි කතාව

"අම්මේ"

දස වසක් නොපිරූ කුඩා කටවල් තුනකින් එසේ බෙරිහන් දෙන කල විපතක් වත්දැයි මම තිගැස්සෙමි. අත වූ හැන්ද පිඟාන හෝ කෝප්පය ගිලිහී බිම පතිත වන තරමට මම කැළඹෙමි.

මන්ද යත් දවස මුළුල්ලේ මා බියෙන් සහ සැකයෙන් පසුවන බැවිනි. මගේ ඇබිත්තං මිනිසුන් හට කරදරයක් සිදුවනු ඇත්දැයි මම කොතෙකුත් ගැහෙන හදින් සැක සංකා පහළ කරමි.

මේ ලෝකයේ සියලු අණ වින අපල උපද්‍රව ඔවුන්ගේ කුඩා හිස් මත පතිත වනු ඇතැයි බියපත් වීම අනුවණකමක් විය හැකිය.

එහෙත් ගස් බඩ ගාන, කැබිනට්ටුවේ ඉහළට නැඟ සක්මන් කරන, ජනෙල් පඩියේ නැඟී බිමට පනින පඩි පෙළක් බඳු කොල්ලන් හතර පස් දෙනකුන් සිටින මවකට හැර අන් කිසිවකුට මේ බිය හෝ සැක සංකාව තේරුම් ගත නොහැකිය.

එකිනෙකා හඹා ගොස් එක පොදියට බිම පෙරළී පොර බදන දරුවන් අබියස මගේ හුස්ම හිරවෙයි. ඉතින් ඒ නිසාම අඳුර වැටෙන කල සැනසුමක සිහින් සේයා මට දිස් වෙයි.

රාත්‍රී ආහාරය ඉතා කැමැත්තෙන්ද, අතුරුපස ඊටත් වඩා කැමැත්තෙන්ද භුක්ති විඳින කොලු රැළ දවසේ අවසන් කර්තව්‍යය ඉටු කරන්නේ මගේ බලකිරීම නිසා මිස කිසිදු කැමැත්තකින් නොවේ.

"නිදාගන්න කලිං දත් මැද්දෙ නැත්තං මොකද වෙන්නෙ?"

"දත් දොස්තර ළඟට යන්න වෙනව"

මද්දුමයා උත්තර දෙන්නෙ මුහුණ හකුලා ගනිමිනි.

"ඊට පස්සෙ මොකද වෙන්නේ?"

"ඊට පත්තෙ අම්මෙ දත් දොත්තර දත් හාරනව අර මැසිමෙං" නිවුන්නු එක්වනම හඬ ගාති.

"ආන්න ඒක නිසා තමා හැමදාම රෑට දත් මදින්න ඕන තේරුණාද?"

"ඉතිං අම්මේ එක දවසක් එකම එක දවසක් දත් මදින්නෙ නැතුව නිදා ගන්න බැරිද ?"

පොඩ්ඩා නහයෙන් හඬයි.

"බෑ..." මම දැඩිව පවසමි.

"අම්ම නිකං හවසට පොලිස්කාරයෙක් වගේනෙ. හරි සැරයි....." ලොක්කා මැසිවිලි නඟයි.

සිනාව මැඩ ගන්නා මම දත් බුරුසු පහ බෙදා දෙමි. ඉතින් ඔවුන්ගේ ඒ අප්‍රියජනක මොහොතින් පසු එකිනෙකා ඇඳන්වල හොවා මදුරු දැල් දැමීමෙන් මගේ මහා සංග්‍රාමය නිමා වෙයි.

ලේ වැගිරෙන තුවාලයක් සිදු නොවී නිරුපද්‍රිතව නින්දට යන මගේ දරුවන් නරඹමින් මම සැනසුම් සුසුමක් හෙළමි.

හෙට දවස කෙබඳු එකක් විය හැකිද? වේගයෙන් බයිසිකල් පදින පොඩ්ඩාට අන්තරායයක් සිදුවීම වළක්වා ගත හැක්කේ කෙසේද? නිවුන්නුන් හට පණු බෙහෙත් ලබා දිය යුතු දවස ළං වීද ? මධ්‍යම රාත්‍රියේ පවා මම මේ හැඩකාර දඟකාර කොල්ලන් ගැනම සිතන්නෙමි.

ඉනික්බිති නිද්‍රාවේ ගැඹුරු පත්ලට ඇද වැටෙන මා දකින සිහිනයක පවා ඔවුහු දුව පනිති. නටති. තුවාල සිදුකර ගනිති.

කුස්සියෙන් නික්ම ගිය මා දුටුවේ අනූවෙ ගෙදර ධර්මෙ මාමාගේ සිනාමුසු මුහුණයි. අමුත්තකු පැමිණෙන හැම වරකම මගේ දරුවන් මෙලෙස බෙරිහන් දෙන බව මට මතක් වූයේ එවිටය.

"මාමේ ...."

ඔහු නිහඬවම දෑත දිගු කෙළේ ය. මටත් කලින් කොමඩු ගෙඩි දෙක දුටු දරුවෝ ප්‍රීතියෙන් හඬ නැගුවෝය.

"කො.....ම .....ඩු ......" ධර්මෙ මාමා හිස සැලුවේය.

"මේ පාර වැඩක් නෑ දුවේ. සේරම කොමඩු ඇට මීයො කෑවා. මේ අහම්බෙන් ඉතිරි වෙලා ඔය ගෙඩි කීපයක් පල ගත්තා..."

"මීයෝ ....?" දරුවෝ විස්මයෙන් කෑ ගසති.

"දැං ඕගොල්ලො ගිහිං සෙල්ලං කරන්න"

මේ කාරුණික වැඩිහිටියාගේ හිත නරක් වනු ඇතැයි බියපත් මම මහ හයියෙන් බෙරිහන් දෙන කොල්ලන් දෙස රවා බැලුවෙමි.

"මට වෙලට යන්ඩ පරක්කු වෙනව. ඕක ළමයින්ට කපල දෙන්න කන්න...ඉදිල තියෙන්නෙ"

කොමඩු ගෙඩි දෙක කපා බෙදා දුන් මම, ඉමිහිරි පළතුරක රස විඳින්නට ඔවුන් හට ඉඩ ලැබීම පිළිබඳව ධර්මෙ මාමාටද කොමඩු ඇට කීපයක් හෝ නොකා ඉතිරි කළ මීයන්ටද ස්තුතිවන්ත වීමි.

මගේ සතුටත් සැනසීමත් මොහොතකට සීමා කරමින් මද්දුමයා බෙරිහන් දුන්නේය. දරුවන්ගේ පියා ඇතැම් විට ඔවුන් සිප වැළඳගෙන සුරතල් කරයි. එකල්හිද මෙලෙස බෙරිහන් දීම ඔවුන්ගේ සිරිතයි. ඒ නිසාම මම ඒ හඬ නොතකා ළිප ගින්දරේ දැවෙන්නට වීමි.

අම්මේ..මද්දුවගෙ නාහයට ගියා කොමඩු ඇටයක්..."

මා වෙත දිව ආ නිවුන්නු එසේ කී කල්හි මම තැති ගතිමි.

"ඔය ඇත්තමද?"

"ඇත්තමයි අම්මේ... මද්දුවට කැත්තක් ආවා"

"නෑ කිඹුමක්..."

"එතකොටම කොම_ ඇටේ නායට ගියා...."

"කැත්තක් ආවෙ"

"නෑ කිඹුමක්..."

නිවුන්නු වාද කරන්නට වන් කල මම කෝපයෙන් කෑ ගැසුවෙමි.

"ඕක නවත්තන්න"

අවුරුදු පහක දරුවන් දෙදෙනකු හට මගේ ස්වරයද බැල්මද අතිශයින් රළු පරළු විය. ඔවුන් එකිනෙකා දෙස බලමින් තමන් කළ වරද කුමක් දැයි වටහා ගන්නට තැත් දරන බව පෙනී ගියේය. මගේ හද රිදුම් දුන්නේය.

දරුවන් සමග ඉතා ඉවසීමෙන් සහ පරිස්සමින් කටයුතු කළ යුතු බව මම නැවත නැවතත් මෙනෙහි කෙළෙමි. මට තරවටු කරගනිමින් මම දණ නමා ඔවුන් තුරුළු කරගතිමි. සමාව අයැදින්නට පවා මට සිත් විය.

"බලන්නකො අම්මේ මද්දුවා නහයෙනුත් කොමඩු කාලා"

පොඩ්ඩා සරදම් සරින් කීය.

"මද්දු..... මොකද වුණේ?"

"අනේ අම්මේ ඉන්න බෑ... නහයට කොමඩු ඇටයක් ගියා...."

මද්දුමයාගේ කඳුළු පිරි දෑස සහ හැඬුම්බර හඬ අබියස මම අසරණ වීමි.

"දැං මොකද කරන්නෙ?"

"කොමඩු ඇටේ මද්දුවගෙ නහයෙ ඇතුළෙ පැළ වෙයිද අම්මා? "

"ඕගොල්ල එක විනාඩියක් සද්ද නොකර ඉන්නවද? මට පොඩ්ඩක් හිතන්න දීල දැං මොකක්ද කරන්නෙ කියල"

ගලිවරයා අබියස අඟුටුමිට්ටන් වැනි වූ නිවුන්නු හිස් ඉහළ නඟා දෑස් අයා මා දෙස බලන්නේ මා කෝපයට පත් වී දැයි සැක හැර දැන ගන්නටය. ඒ නිසාම වඩාත් ප්‍රසන්නව හැසිරෙන්නට මම වග බලා ගතිමි.

"අනේ අම්මා ඉන්න බෑ... මොකක් හරි කරන්නකො..."

මද්දුමයාගේ බැගෑබර හඬ මා කළඹාලයි.

"තාත්තට කියන්න වෙනව" ලොක්කාගේත් පොඩ්ඩාගේත් මුහුණු අඳුරු වූයේ සැණෙකිනි.

"අයියෝ.... කනක් ඇහිල ඉන්න හම්බවෙන්නෙ නෑ බනින්න පටන් ගත්තම....."

ලොක්කා එක එල්ලේ අප්‍රසාදය පළ කළේය.

"ඔව් අම්මේ තාත්තා බනී..." පොඩ්ඩාද මා වලක්වාලන්නට තැත් කෙළේය.

"ඒ වුණාට තාත්තට නොකිය බෑනෙ"

"බැරිද අම්ම මද්දුවගෙ නහයට පොල්කූරක් දාල ඔය කොමඩු ඇටේ එළියට ගන්න?"

වැඩිමලාගේ වචන මද්දුමයා බියට පත්කරවයි.

"අනේ එපා අම්මා" ඔහු මගේ ඇගේ එල්ලුණේය.

"නෑ නෑ නහයට පොල්කූරු දාන්නෙ නෑ..."

මම දරුවන්ගේ පියා වෙත ගොස් මද්දුමයා මුහුණ දුන් අකරතැබ්බය හෙළි කෙළෙමි.

අවිවේකයෙන් පසුවන මිනිසා මෙබඳු විටෙක මහත් සේ කැළැඹෙන බැව් මම දනිමි.

"ඒ මොකක්ද කර ගත්තෙ?" ඔහු කෝපයෙන් ප්‍රශ්න කෙළේය.

"එහෙම තමා ඉතිං හිතල කරගත්තෙ නෑ... ඕනම වෙලාවක ඕනම කෙනෙකුට ඕනම දෙයක් වෙන්න පුළුවන්"

"බම්බුව" යි මදෙස රවා බැලූ ඔහු මද්දුමයා වෙත ගියේය.

අපි සියලු දෙනම ඔහු මද්දුමයා පරීක්ෂා කරන ආකාරය බලා සිටියෙමු. මට වඩාත් වුවමනා වූයේ ඔහුගේ මුවින් ගිලිහෙන වදන් ශ්‍රවණය කරන්නටයි.

"ආ... මේක එච්චර දෙයක් නෙමේ..."

"නහයට කොමඩු ඇටයක් ගිය එක එච්චර දෙයක් නෙමේ ?" යි මම පුදුමයෙන් ප්‍රශ්න කෙළෙමි.

"මේක හරියයි..."

"හරියන්නෙ කොහොමද? ළමයව ඉස්පිරිතාලෙ ගෙනියන්න ඕන"

"හැම එකටම ඉස්පිරිතාලෙ උස්සගෙන දුවන්න ඕන නෑ අවන්ති මේක මේ පොඩි දෙයක්"

"බෑ බෑ ළමයව ඉස්පිරිතාලෙ ගෙනියන්න ඕන. දොස්තර කෙනෙකුට පෙන්නන්න ඕන"

මගේ උච්ච ස්වරයත් දැඩි බැල්මත් ඔහු දුර්මුඛ කෙළේය.

"එහෙනං ඉතිං ළමයව ලෑස්ති කරවල දෙනව"

මම විගස ඒ අණ පිළිපැද්දෙමි.

"දැං ඉතිං මේ වැඩ සේරම දාල, පලයල්ලකො ඉස්පිරිතාල ගානෙ... ෂික්..."

ලොක්කා සහ පොඩ්ඩා හෙමින් සීරුවේ ඉවතට ඇදුණෝය. සෙමින් වුව නිශ්චිතව ඇවිළෙන්නට පටන් ගත් ගිනිමැලය තව මොහොතකින් බුර බුරා ඇවිලෙන බව ඔවුහු දනිති.

"දන්නෙ නැද්ද ඇට අයින් කරල දෙන්න... කොහෙද ළමයෙකුට දෙයක් කන්න දෙන හැටිවත් දන්නවයැ...."

දුනුවායා දුනු ඊතල ගෙන මානන්නේ කෙබඳු ඉලක්කයක් වෙත දැයි දැන් මම දනිමි. මගේ හද ගැහෙයි. ඉලක්කයද ගොදුරද දඩයමද මා මිස අන් කිසිවෙක් නොවේ.

"අපෙ අම්මල නං දන්නව ළමයෙකුට දෙයක් කන්න දෙන හැටි. ළමයි ඉපදුණාට වැඩක් නෑ... හදන්න දැනග න්න ඕන"

මා මද්දුමයාගේ ඇඟ සෝදා අලුත් ඇඳුම් ඇන්දෙව්වේ ගොළුව බිහිරිව ගියාක් මෙනි. අඳව ගොළුව බිහිරිව යෑම ව්‍යාධියක් බව සැබැවි. එහෙත් මේ ත්‍රිවිධ ව්‍යාධියම මට බොහෝ විට පිහිට වෙයි.

"එක පාරම ඉස්පිරිතාලෙ ගෙනියන්න ඕන නෑ... අපි පොඩි කෙමක් අත්බේතක් කරල ඉමු..."

සැමියාගේ මිතුරන් කීප දෙනෙක් මද්දුමයා සහ කොමඩු ඇටය පිළිබඳව සැලව පැමිණියේ උපදෙස් සහ අවවාද ගොන්නක්ද සහිතවය.

"ඒකනෙ මාත් කියන්නෙ. කොහෙද ඉතිං දැං ඉන්න ගෑනු හදන්නෙ කිඹුහුමක් ගියත් ළමයව චැනල් කරල විශේෂඥයෙකුට පෙන්නන්න... මෝස්තරේ..."

සමන්ත නැවතත් මට ඇනුම්පදයකින් සංග්‍රහ කෙළේය.

"අහසයි පොළවයි වගේ බැණුම් අහන්නෙ නෑ දුවේ වෙන කිසි කෙනෙක්වත් කිසිදෙයක්වත් මේ ලෝකේ. ඒත් බලන්නකො කොච්චර බැණුම් ඇහුවත් ඉන්න ලස්සන. එක ඩිංගක් ගණන් ගන්නවද ? නෑ..."

කිරිඅම්මා අපෙ අම්මාට එසේ පැවසුවේලු . ඒ වචනම අපෙ අම්මා මගේ කනට කොඳුළාය. එහෙත් භාග්‍යයකට හෝ අභාග්‍යයකට මට එසේ පවසන්නට දුවක් නොවෙයි.

"නැති එකමයි හොඳ කාලකණ්ණි කෙල්ලො..." යි මම කෝපයෙන්ද ශෝකයෙන්ද මිමිණුවෙමි.

සමන්ත සහ මිතුරෝ මද්දුමයා පුටුවක හිඳුවා ප්‍රතිකාරය අරඹති. පළමුව දරුවාගේ නාස් පුඩු තුළට පොල් කෙඳි යවා කිවිසුම් මඟින් කොමඩු ඇටය පිටතට ගන්නට වෑයම් කරන ආකාරය මා බලා සිටියේ රිදුම් දෙන හදවතිනි.

නැහැය වැනි සියුම් සංවේදී අවයවයක් සමග මොවුන් මෙසේ ක්‍රියා කිරීම පිළිබඳව මගේ කිසිදු කැමැත්තක් නැත. එහෙත් විරුද්ධත්වය පාන්නට තබා මඳක් ළං වන්නටවත් මට අවසරයක් නැත. සැමියාගේ ගිනිගෙන දැවෙන දෑස මහා ප්‍රාකාරයක්ව මගේ දෙපය අඩපණ කරවයි.

"එතකොට මමද වැරදිකාරයා...? මමද මද්දුගෙ නහයට කොමඩු ඇටේ දැම්මෙ ?" හඬ නගා අසන්නට තරම් වන උද්වේගකර බවකින් පෙළෙමින් මම ඈතට වී බලා සිටියෙමි. ලොක්කා පොඩ්ඩා සහ නිවුන්නු ඇසිපිය නොහෙළා මද්දුමයා දෙස බලා සිටිති.

"දැං කිඹුහුම් කීයක් ගියා ද? කෝ මේ කොමඩු ඇටේ එළියට ආවෙ නෑනෙ"

"මේ හරියන්නෑ... අපි මෙයාගෙ කට වහමු...."

සමන්ත සහ මිතුරෝ කරන කියන දෑ බලා ඉන්නට බැරි තරමේ අපහසුවක් මට දැනෙයි.

"ඔය ළමය මාස නවයක්ම හිටියෙ මගෙ බඩේ... බිව්වෙ මගෙ කිරි... මමයි කැත කුණු අත ගගා ඔච්චර ලොකු කරගත්තෙ... ඉතිං ඇයි මං කියන දේ අහන්න බැරි....? අනේ ළමයව ඉස්පිරිතාලෙකට ගෙනියන්න මම වැදල කියන්නම්... ළමයව ඉස්පිරිතාලෙකට ගෙනියන්න... මම ඕගොල්ලො ඔක්කොටම දණ ගහල වඳින්නං..."

කෑ ගසන්නට හඬා වැළපෙන්නට මට උවමනා විය.

සිය බිරියගේ ළය කැකෑරෙන හැඟීම් පිළිබඳව නොදත් සමන්ත මිතුරාගේ උපදෙස් අනුව කටයුතු කරයි. ඔහු පොල් කෙන්ද මද්දුමයාගේ නැහැ පුඩුව තුළට යැව්වේ මිතුරාගේ සුරතින් මද්දුමයාගේ මුව වසාගත් පසුවය.

හඬ නඟා කිවිසුමක් පිට කළ දරුවා පියාගේ

**ශාන්ති දිසානායක**

**43 වන පිටුව බලන්න**

# 'පුංචි පත්තිනි හාමුදුරුවෝ' අමුඩෙ ගහගෙන බයිසිකලයෙන් නගරෙටත් ආවා

සසඳ සසඳ
දිය පල්ලේ
තිබෙයි අල

සසඳ සසඳ දිය
මතුපිට
තිබෙයි කොළ

වැස්සට පිනි
බබා මෝරන
කැකුළු මල

මස්තකයින්ට
මුතු කුඩයකි
නෙළුම් මල

නිර්ව්‍යාජ ගැමි කවියකුගේ හෘද ස්පන්දනය කැටපත් කළ මේ ජනගායනාව ඔබට මතකද? මෙවන් සුවහසක් ජන ගී රාව නැගූ ඒ රසවත් ගැමියා සොයා මම ඉකුත්දා හොරණ පුරවරයෙන් එපිට උඩුව ගමට ගියෙමි. ඇත්තටම ඔහුගේ ඇතැම් ගීයක එන 'පාළුසොහොන් පිටි, කඳුවැටි, ඕවිටි, රබර් වතු' පසුකර උඩුවට ගිය මේ ගමන කොන්ක්‍රීට් වනාන්තරයෙන් එපිට ගහකොළින් පිරි, ඇළ දොළ කුඹුරු ආදියෙන් පෝෂිත සුන්දර ගමක ආස්වාදය අපට ළං කරවන්නක්ම වීය.

වවුලගල කඳු යාය පිස හමන සුළඟ සුවදායකය. ගමට ඇතුළු වූ වහාම බටහිර පැත්තට වන්නට රූස්ස වන ගහනයෙන් පිරි මඩකඩ කන්ද ගම රකිනා මහා අදෘශ්‍ය දේවතාවකු මෙන් මට පෙනෙයි. නැගෙනහිර දෙසින් දිස්වන සුන්දර නාගල කන්දත් පන්සල් කන්දත් ඒ දේවතාවාගේ පරිවාර යෝධයන් වැන්න. රයිගම් කෝරලයේ කුඹුකේ පත්තුව නමින් නම්වරලත් මේ උඩුව, උඩවැව යන්නෙන් බිඳී ආවකි. ගම මැදට වන්නට පිහිටි උඩවැව අද නිල්වන් කෙත්යායකි. කලකට පෙරාතුව බිඳී ගිය උඩවැව වෑකන්ද දෙස මම බලා සිටියෙමි.

මේ ජනශ්‍රැති පර්යේෂකයා, සෞන්දර්යවේදියා, මහා ගැමියා, ගුරුවරයා රයිගම් පුරවරයේ සේසතයි. ඒ රෝහණ බැද්දගේය. සැබැවින්ම ඔහුගේ පෞරුෂ්‍යය නිර්මාණය කළේ පන්සල හා කුඹුරයි. ලෝකයේ මහා ශ්‍රේෂ්ඨයන් බිහිකරනුයේ හිරුගේ රැස් හා මවගේ කිරිවලින් බව අසා ඇති මට පරිපූර්ණ ගැමියකු බිහිකිරීමට පන්සල හා කුඹුර බලපෑ හැටි හොඳින්ම මෙහිදී ප්‍රත්‍යක්ෂ වෙයි.

මම මීට අවුරුදු 70 කට පමණ පෙර අතීතයට එබී මෙගමේ මිනුවන්වෙල කුඹුරු තීරයේ ගොයම් කයියකට සහභාගී වෙමි.

ඉනිවේල්ල දිගේ සරොම් කොටයක් ඇඳගත් උඩුකය හෙළුවෙන් තබාගෙන ගමන් කරන පුංචි කොලු ගැටයෙකි. ඔහු අත සුරුවම් පිහි පොඩියකි. ගොයම් කවියේ පදයට ඔහුගේ දෙතොළඟද මිමිණෙයි. අනතුරුව සරොම් පොඩිය කැහැපට ගසාගත් කොලු ගැටයා ගොයම් කැපූ කුඹුරේ ඉපනැලි අතරට පා පොඩි ඔබයි.

ඔහුගේ ඇස් දීප්තිමත්ය. හාත්පස සිසාරා ගිය ඒ ඇස් සරුවට පිපුණු ඉපනැල්ලක් තෝරා ගනී. ගතවූයේ නිමේෂයකි. එයින් පොඩි එකා නළාවක් සාදාගෙන පිඹී.

එක සීරුවට ගොයම් කයියෙන් නැගෙන තාල අනුරූ තබා ඉපනැල්ලෙන් සැදූ නළා පොඩියෙන් රිද්මයක් නගන මේ පැටියා දැක ගොවි මහතෙක් "කාගෙද බං මේ පොඩ්ඩා" යි ළඟ සිටියකුගෙන් අසයි.

"මේ අපේ නෝමිස් මාමාගේ පුතා රෝහණ නේ" ඔහු කියයි.

රෝහණ කොලුවා නිර්මාණශීලීය. තනියම සිතන්නට හැකි පොඩ්ඩෙකි. ඊළඟට ඔහු තරමක් උස්ව වැඩෙන විට බට පඳුරකට ළංවී එහි පුරුකක් පිහියකින් අතුල්ලා බිඳ ගනියි. බට පුරුක පිහියෙන්ම පෙරන් ගා කුරුට්ට ඉවත් කරයි. යකඩ කූරක් ලිපට ඔබා රත්කරගෙන බට නළාවකට සුදුසු අන්දමට හිල් විදගනී. විදින විදින හිලක් පාසා ඔහු නළාව පිඹියි. සම වයසේ කොල්ලෝ රෝහණ ළඟ තප්පලම් ගසා ඔහු කරන දෑ බලා සිටිති.

පන්සලේ සිහින් පිරිත් හඬද, දොළේ ජලදහර ගලන මියුරු හඬද සිහින් මඳනල වෙල්යාය සිසාරා නගන කෙඳිරියද අසා සිටින කොලු පොඩ්ඩා ඒවා වස්දඬු රාවයට නගන්නට උත්සාහ ගනී. ඒත් සොබාදහමේ නාදය ඔහුට අල්ලා ගත නොහැක. එය හරිහැටි කරන්නට මහා සංගීතඥයකුට මිස වෙනත් කවරකුටවත් බැරි බව තේරුම් ගනී. එහෙත් ඒ ඇළ දොළේ කමතේ, වෙල් එළියේ කතාබහ ඒ හඬ පෞරුෂය තියුණු කරයි. මම කවදා හෝ ජන ගී නාදය හා මුසු සොබාව ධර්මය ගයමි. එසේම සංගීතයට මුසු කරමි යැයි හේ තරයේම සිතයි.

මා එසේ කීවේ මීට අවුරුදු 60-70 කට පෙර ගමේ රෝහණ කොලු පොඩ්ඩා සිතූ හැටිය. දැන් ඔහු වියපත් මිනිසෙකි. මම රෝහණයන් විමසමි.

"අපි බැද්දගේ පරම්පරාවේ ඇයො. අද මේ ගමේ බොහෝ වැඩිහිටි වියතුන් නැති තරම්. අපේ පරම්පරාවේ සියල්ලෝම විවිධ දස්කම් දක්වන ලද අය වුණත් ඔක්කොම ගොවියො. උඩුව ශ්‍රී නාරායන ගලපිටඋඩ පත්තිනි දේවාලෙ කපු පරම්පරාවට මාත් අයිතියි. පීතර කපු මහත්මයාගෙන් අපේ කපු පරම්පරාව ආරම්භ වන්නේ"

"ඔබ කපු පරම්පරාවෙ ඇත්තෙක් වුණාට ජන සංගීතය පැත්තටයි වැඩි කැමැත්ත" මම අසමි.

"ගුරුවරයෙක් ලෙස රක්ෂාව කරන්ට ගත්තාම මා ඒවායින් ඉවත් වුණා. නැත්නම් පිරිතක්, පින්කම් පොළක්, තොයිලයක්, නැටුමක්, අඬහැරයක් මා අත්හැරියේ නෑ. ඒ තමයි මගේ හුස්ම පොද"

"ජන සංගීතයට මගේ මූලික අධ්‍යාපනය සකස් කළේ මා උපන් මේ උඩුව ගම්මානයයි. හැම අවුරුද්දෙම ගමේ දේවාල භූමියේ තිබෙන 'ගම් මඩුව' කුඩා කාලේ පටන්ම මගේ ජීවිතය හා බැඳුණු කලා සංදර්ශනයක්. එහිදී බෙර වාදන ශිල්පය හා ගායනාක්‍රම ගැන මා තුළ කුහුලක් හා ප්‍රතිභාවක් ඇති වුණා. පහතරට අත්රබන් වාදන ශිල්පයත් මහා රබන් වාදනයත් මා ඉගෙන ගත්තේ අපේ ගේ ඉදිරිපස හවසට රැස්වූ වැඩිහිටි කණ්ඩායමට එක්වීමෙන්. ගමේ කෝලම් කුට්ටමක් තිබුණා. ඒ කණ්ඩායමටත් කවි නාඩගමටත් මං පුංචි කාලේ ඉඳන්ම රංගනයෙන්ද එක්වුණා"

"අපේ අත්තා පීතර කපු මහත්තයා මහා විශ්වකර්ම වැඩ කරලා තියෙනවා. ලෙඩෙක් ආවාම එයා අත ගාලා තෙල් සාත්තුවක් කළත් ඇති. දැඩි මුණ්ඩ දෙවියන් වෙනුවෙන් කරන වාහල නැටුමට පාන්දර ජාමේ ආතා නටන හැටි මං බලා හිටියා. දවසක් ගිනි පාගන වෙලාවක අභියෝගයකට අත දරුවෙක් වඩාගෙන ගිනි පාගලත් තියෙනවා. මේවා හා බස්තියන් මාමාගේ අවුරුදු කතුරු ඔන්චිල්ලා මගේ රස මනස වැඩුවා කියන්ට පුළුවන්"

උඩුව යන නම සැදුණේ උඩවැව යන අරුතින් බව මම පෙරදී ලියුවෙමි. ගම්මන්පිල වැව, රෙමුණ වැව, උයන්වත්ත වැව වැනි මේ රයිගම් කෝරලය හැඩකරන තවත් වැව් කීපයකි. මේ වැව් පිටිවල සුන්දරත්වයද ඔහුගේ රස කුහුල තියුණු කරයි.

රයිගම් බණ්ඩාරයන්ගේ කුමාරියක් දරුණු කුෂ්ඨ රෝගයක් හේතුවෙන් සඟවාගෙන බෙහෙත් කළේ මේ ගමේ ඉහත්තාවේ ඇති වනහාමිගෙ කන්ද උඩදීය. ඒ ස්ථානය 'වනහාමිගෙ ගල' යනුවෙන්ද ගැමියෝ වහරති. මෙයින් ගව් කීපයක් දුරින් 'කුමරුන් පැන්න ගල' නම් තවත් ස්ථානයක්ද තිබේ.

**උපාලි සමරසිංහ**

අපේ ජන කතා ජන ගැමි වහර එක් එක් කෝරලයේ එක් එක් ආකාරයට විග්‍රහ වී තිබුණත් මේ කතාවල ප්‍රධාන අර්ථය කුළුගන්වන්නේ එකක්මය. යුදය පැරැදී එන බැව් සිතා සුදු කොඩිය ළෙලවමින් පැමිණි පිරිස් දැක කුමරුන් ගලෙන් පැන්නා යැයි කියැවෙන ජන කතාව මේ ගමේද ප්‍රකටය.

"ඉස්සර අපේ ගමේ අත්රබන්කාරයො හා මහ රබන්කාරයො හිටියා. අද මේ පරපුරුවල ඒ නිර්මාණ දන්නා අය නෑ. පහතරට නැටුමට දක්ෂ අය හිටියා. රබන් කරකවා උඩ දමා වේවැලට අල්ලන රබන්කාරයො හිටියෙ මෙහෙ" බැද්දගේ මගේ කුහුල වඩවා කියයි.

"එදා මනාලියො පිටගමකින් මෙගමට කැන්දාගෙන ආවෙ රබන් කණ්ඩායම් පෙරටුව ගිහින්. අත්රබානෙ වෙනම ශිල්ප තියෙනවා. මහරබාන අවුරුද්දටත් මංගල්ල අවස්ථාවටත් තමයි එළියට ගන්නේ. අත්මාරු පද ගහමින් මේ අය කියන පද හරිම මිහිරියි. මගෙ බිරින්දෑවත් කැස්බෑවෙන් එක්ක ආවෙ රබන් කණ්ඩායම් පෙරටුකරගෙන"

"අත්මාරු පදයක් කියමුද?" ඔහු අසයි. මමද හිස වනමි. තුනුරුවනින් වරම්ගෙන ඔවුන් බොහෝ විට අත් මාරු පදවලට ගයන්නේ ජාතක කතා හෝ වෙනත් බණ කතා ආශ්‍රිත කවි පදය. රෝහණයන් ගැයූ මේ පදවැලේ තිබුණේ ගුත්තිල-මූසිල කතාවයි.


උඩුව ගමේ මිනිස්සු වැඩට රුසියෝ වෙති. වඩු බාස්ද කම්මල්කරුවාද, පෙදරේරුවාද වෙනස් ඕනෑම වෘත්තියක යෙදෙන්නන්ද අවසානයේ ගොවියෝම වෙති. කුඹුර, බැත, කෙත, නියර ඔවුන්ට හොඳින් හුරුය. පුරුදුය. මේ ගමේ එදා ජීවන රටා හඳුනා ගැනීමට මා රෝහණයන්ගේ හඬ නැවත අවදි කරමි.

"අපේ අම්මත් අවුරුදු 99 ක් ජීවත් වුණා. අම්මා එලිසාහාමි. අවුරුදු 90 වෙලත් උදැල්ලෙන් පොළව කෙටූ ගැහැනියක්. බටුමිරිස් හා තවත් නොයෙක් ගොවිකම් කළා. ඒ කාලෙ සල්ලි ප්‍රධාන නෑ. ගම පුරාම තිබුණෙ බඩු හුවමාරු ක්‍රමය. අවුරුද්ද ළඟ එනකොට ගමට පිටින් එන ප්‍රධාන අමුත්තා තමයි වළං කත්කාරයා. කත් ලීය කරේ තියන් සිනහ මුසුව එන ඒ මනුස්සයා නැවුම් වළං ගමේ ගෙවල්වලට දීගෙන යනවා. ඊළඟට එයා එන්නෙ කිරි වැදුණ ගොයම කැපෙන කාලෙට මලු දෙකක් අරගෙන. මිනිස්සු වළං හිලව්වටත් එක්ක වී ටිකක් දෙනවා.

ඊළඟට රෙදි නැන්දා එනවා. එයත් ගන්නේ වී විතරයි. ඊළඟට මනිබඩු වෙළෙන්දා. ගමේ ගැහැනු නොයෙක් වළලු, ආයිත්තම් ආදිය ගන්න පන්සලේ වස් පින්කම් කාලෙට බලාන ඉන්නවා. වස් පින්කම් කාලෙට අමතරව මනිබඩු වෙළෙන්දා ගමට එන්නෙ අවුරුද්දට විතරයි. "රෙදීයප්" කියාගෙන කෑ ගහන චීනෙක් එනවා රෙදි වෙළෙඳාමට. එයාටත් ලැබෙන්නේ සල්ලිවලට වඩා වී. දුම්කොළ මිටියක් බයිසිකලයේ බැඳගෙන එන වෙළෙන්දන් එනවා.

මට මතකයි මං කුඹුරේ වැඩ කරමින් ඉන්නකොට දුම්කොළ නැතිවුණාම බයිසිකලෙන් හොරණ ටවුමට යනවා. හැතැප්ම පහක් මං මේ විදියට යන්නේ අමුඩය පිටින්මයි. ටවුමෙ දුම්කොළ කඩයට මේ විදියට ආවත් එදා ඒක ප්‍රශ්නයක් නෑ. ඊළඟට විරිදුකාරයා ගමට එනවා. ඊළඟට රොඩී මිනිහා. මේ විදියට අපේ ගමට අලුත් අවුරුද්දට එන චරිත තියෙනවා. මේ අය අතර මට වැඩියෙන්ම හිතට ඇල්ලුවෙ බටගොඩපිස්සා. බටගොඩ කියන ගමේ මහණ වෙලා කලින් හිටපු කෙනෙක්. රාහුල හාමුදුරුවන්ගෙ සැලළිහිණියේ කවි මිනිහට කට පාඩම්. එයා කපු පරම්පරාවෙ

43 වන පිටුව බලන්න



මිනිසාට සදෘශ්‍යතයා



# අලි සමාජය

17 කොටස

අලින්ගේ ලිංගික සදාචාරය, ලිංගික ක්‍රියාවලිය සහ ඒ සම්බන්ධ විවිධ හැසිරීම් රටාද, මද ග්‍රන්ථිය, මද කිපීම මෙන්ම මද කිපීම සහ ලිංගිකත්වය අතර සම්බන්ධතාව ආදිය පිළිබඳව පසුගිය ලිපිවලින් ඔබ දැනුවත් වන්නට ඇත.

අලියෙක් සමග තම මධුසමය ගත කරන ඇතින්නියගේ ඩිම්භයක් අලියාගේ ශුක්‍රාණුවක් සමග සංසේචනය වීමෙන් හට ගන්නා යුක්තාණුව ඇතින්නගේ ගර්භාෂයේ තැන්පත් වීමෙන් ඇතින්න ගැබ් ගනී. මෙලෙස ගැබ් ගන්නා ඇතින්නිය ජීවත් වන්නේ තම රැළේම වන අතර නැවත තමා ගැබ් ගැන්වූ අලියා සමග හෝ වෙනත් අලියෙක් සමග ඇයි හොඳයියක් ඇති කර නොගන්නට ඇය වග බලා ගනී. ගර්භිණීභාවට පත් වීම නිසා ඇතින්නගේ මද චක්‍රය කාන්තාවක් ගැබ් ගත් කළෙක ඔසප් චක්‍රය නතර වන්නාක් මෙන් තාවකාලික විරාමයකට එළැඹෙන බැවින් ගර්භිණී කාළය තුළ ඇයගේ ලිංගික හැකියාව අකර්මන්‍ය වීම එයට හේතුවයි. එසේම තමන් සමග මධුසමය ගත කළ ඇතින්න තමන් නිසා ගැබ් ගත්තේද නැද්ද යන වග බැලීමටවත් එසේ වී ඇත්නම් ඇතින්නගේ ගර්භිණී කාලය තුල ඇතින්නගේ දුකසැප සොයා බලා ඇයගේ අවශ්‍යතාවන් ඉෂ්ඨ සිද්ධ කිරීමටවත් ඇගේ දොළදුක් සංසිඳ වීමටවත් ඇයව ගැබ් ගැන්වූ අලියා නම් කිසිම දිනක ඇය සොයා නොපැමිණෙයි.

**ගර්භිණී ඇතින්නියගේ සුවපහසුව**

ඇතින්නකගේ ගර්භිණී කාළය මාස 22 ක් පමණ වන අතර එය මාස 20 සිට 23 දක්වා වෙනස් වීමට ඉඩ තිබේ. ගැහැනු අලි පැටවෙක් සාමාන්‍යයෙන් මාස 20 කින් පමණ ඇතින්නගේ කුසින් එළියට පැමිණෙන අතර, පිරිමි අලි පැටවෙක් මාස 21 ක් හෝ 22 ක් මවගේ කුස තුළ වැඩෙයි. අප්‍රිකානු අලි පැටවෙක් සාමාන්‍යයෙන් ආසියානු අලි පැටවෙකුට වඩා මඳක් වැඩි කාළයක් මව් ඇතින්නගේ ගර්භාෂය තුළ වැඩෙන නමුදු එයද මාස 23කට වඩා වැඩි නොවේ. දළ දරන අලි පැටවුන්ද අනෙක් අලි පැටවුන්ට වඩා තවත් මසක පමණ කාළයක් ඇතින්නගේ කුස තුළ වැඩෙයි.

අලි පැටවෙක් ඇතින්නකගේ කුස තුළ වැඩෙන බව පැහැදිලිව දැකිය හැක්කේ කළලයට මාස 17ක් පමණ වූ පසුය. එතෙක් කල් ඇය සුපුරුදු ලෙස අපහසුවකින් තොරව තම දෛනික ක්‍රියාකාරකම්වල යෙදෙන අතර අවසන් මාස තුන හෝ හතර තුළ පමණක් ඇගේ උදාසීන ගතියක් හෝ මන්දගාමී ස්වභාවයක් පෙන්නුම් කරයි. එහෙත් ඇය ගැබ් ගෙන ඇති බව අනිත් වැඩිහිටි ඇතින්නියන්ට ඉතා ඉක්මනින් සහ පහසුවෙන් වටහා ගත හැකි වන අතර එතැන් සිට ඇය රංචුවේ සිටින සියලුම සාමාජිකයන්ගේ නොමඳ ආදර සමාදරයට භාජනය වෙයි. සියලුම වැඩිහිටි ඇතින්නියන් ඇය ගැන වඩා වැඩි සැලකිල්ලක් දක්වන අතර නිතර ඇය ගැන සොයා බලමින් ඇයගේ ආරක්ෂාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනු ලබයි.

අවසන් මාස තුන හතරේදී ඇය දක්වන උදාසීන ස්වභාවය නිසා ඇයගේ ගමන් වේගය මඳක් බාල වන අතර රංචුවේ සියලුම සාමාජිකයන් ඇයගේ ගමන් වේගයට අනුගත වෙයි. කිසි විටෙක ඇයට පසු වන්නට හැර ඉදිරියට යාමක් මෙන්ම ඇයව තල්ලු කරගෙන යාමක් හෝ ඇදගෙන යාමක් නොකරයි. එහෙත් ගැබ් ගත් ඇතින්න රංචුවේ අනිත් සතුන් මෙන්ම දෛනික ක්‍රියාකාරකම්වල යෙදෙන අතර දවසින් වැඩි කාලයක් විවේක සුවයෙන් ගත කිරීමට ඇයට අවකාශයක් නැත. අලින්ගේ දිනචරියාවේ වැඩි කාලයක් ගත වන්නේ ආහාර සොයා යාම සඳහා නිසාත් පැටවෙකු දරා සිටින බැවින් පැටවාටද ප්‍රමාණවත් තරම් වෙනදාට වඩා වැඩි ආහාර ප්‍රමාණයක් අවශ්‍ය නිසාත් ඇයට දවසෙන් වැඩි කොටසක් ඇවිදින්නට සිදු වේ. ප්‍රසූතිය ආසන්න වන තෙක්ම, එනම් ප්‍රසව වේදනා දැනෙන්නට පටන් ගන්නා තෙක්ම මන්දගාමීව වුවද තම රංචුව සමග ගමනේ යෙදෙයි.

කෙසේ වුවද පැටවා ලැබීමට ආසන්න වන විට ගැබ්බර ඇතින්න අයත් අලි රංචුව වැඩි පුරම ගැවසෙන්නේ ජලාශ්‍රිත ප්‍රදේශයකය. අලින්ගේ දින චරියාවේ ප්‍රධාන තැනක් ගන්නා ජල පානය සහ ස්නානය සඳහා අවශ්‍ය ජලාශයක්, වැවක් හෝ ගංගාවක් අසල මෙම දින වලදී බහුලවම සැරි සරන්නේ ගැබ්බර ඇතින්න සමග ජලය සඳහා බොහෝ දුරක් ගමන් කිරීම අවදානම් නිසාය. වැසි කාලයේ හෝ වැසි කාලයෙන් පසු ආසන්න කාලයේදී නම් වනයේ සෑම තැනම පාහේ කුඩා ජලාශ, ඇළ මාර්ග, දිය කඳුරු, ආරවල් බහුල නිසා අවදානමකින් තොරව සෑම අතකම සැරිසරන්නට හැකි වුවද පායන කාලයේ ගැබ්බර ඇතින්නට සහ මුළු අලි රංචුවටම ප්‍රමාණවත් තරම් ආහාරද ජලයද සහිත තම ගමන් මාර්ගය තෝරා බේරා ගැනීම වැඩිහිටි අලි අම්මලාට සහ අත්තම්මලාට මුහුණ පාන්නට වන ප්‍රබලම අභියෝගයයි.



**අලින්ගේ දරු ප්‍රසූතිය**

ප්‍රසූතිය බොහෝ විට සිදුවන්නේ රාත්‍රී කාලයේදීය. එහෙත් දවල් කාලයේදී ප්‍රසූතියක් සිදු නොවන්නේමය කියා නියමයක් නැත. කලාතුරකින් දහවල් කාලයේද ප්‍රසූති සිදුවිය හැක. සඳ ඇති රාත්‍රී දිනවලදී පැටවුන් බිහිවීම අනිත් දිනවලදීට වඩා සාපේක්ෂව ඉහළ අගයක් ගනී. සාමාන්‍යයෙන් මිනිස් දරුවෙකු පිළිසිඳ ගැනීමේදී මෙන්ම ප්‍රසූතියේදීද සඳ කිරණින් ඇතිවන බලපෑම හෙවත් 'ලුනාර් බලපෑම' (Lunar effect) අලි පැටවෙකු බිහිවීමේදීද එකසේ බලපාන බව විශ්වාස කෙරේ.

ඇතින්න දරු ගැබෙන් නිදහස් වීමට ආසන්න වීමේදී එනම් ප්‍රසව වේදනාව ඇතිවීමට පටන් ගන්නා අවස්ථාව වන විට අනිත් සියලුම ඇතින්නියන්ද ඒ සඳහා වහාම ලක ලෑස්ති වෙයි. ඒ ආසන්නයේම ඇති වඩාම සුදුසු ස්ථානය තෝරා ගෙන ඇතින්න එතැනට කැඳවාගෙන යනු ලැබෙයි. මෙම ස්ථානය මඳක් ඉඩ කඩ ඇති තරමක එළිමහන් ප්‍රදේශයක් හෝ විශාල ගස් වලින් ගහන ඝන කැළෑවක වුවද කුඩා තැනිතලා ප්‍රදේශයක්ම තෝරා ගැනෙයි. ඉන් පසු සියලුම වැඩිහිටි ඇතින්නියන් විසින් එම තෝරා ගත් ස්ථානය පයින් පාගා, කුඩා ගස් වැල් පඳුරු ආදිය තලා පොළොව සමතලා කර තාවකාලික මෙට්ටයක් තනාගනු ලබන්නේ මව් කුසෙන් එළියට එන පැටවා බිමට වැටීමේදී කෝටු කැබලි ආදිය ඇනීමෙන් පැටවාට සිදුවන අපහසුතාවය මග හරවා ගැනීමටය.

ඉන්පසු ගැබ්බර ඇතින්නිය මැදි කරගෙන අනිත් සියලුම ඇතින්නියන් වළල්ලක් සේ වටේට සිට ගනියි. එම ඇත් පවුර බිඳගෙන හෝ පෙරළාගෙන ඇතුළට එන්නට කිසිවෙකුටත් ඉඩ නොලැබෙයි. කුඩා පැටවුන් සිටිය යුත්තේ එම වළල්ලෙන් එපිට කළාපයේය. එම නීතිය පිළි නොගන්නා දඩබ්බර අලි පැටවෙක් සිදුවන්නට යන දේ පිළිබඳ කුතුහලයෙන් මඩනා ලදුව මහ අලින්ගේ කකුල් අතරින් රිංගා ඇතුලට එන්නට දරන උත්සාහයන් අලි අම්මලාගේ තරවටුවෙන් ව්‍යර්ථ කෙරෙයි. රංචුවේ සිටින කුඩා අලි පැටවුන් සංඛ්‍යාව සාපේක්ෂව වැඩි නම් ඔවුන්ව එම පරිසරයෙන් ඈත් කර තැබීම සඳහා තරුණ ඇතින්නියන් පත් කරනු ලබයි.

මෙම අවස්ථාව අලි සමාජයේ තරමක් බැරෑරුම් අවස්ථාවකි. සමහර ඇතින්නියන් තම හොඬවැලෙන් ගැබ්බර ඇතින්නියගේ පිට පිරිමදින්නේ තමන්ද එවැනි තත්වයකට මුහුණ දී සිටි අවස්ථාවේ තමන්ට ඇති වූ වේදනාව මනසින් සිහිපත් වූ නිසා වන්නට ඇත. තවත් එකියක් තම හොඬවැලෙන් ගැබ්බර ඇතින්නියගේ හිස, ගෙල, මුහුණ ආදිය පිරිමදින්නේ 'තව ටික වෙලාවයි... ඉවසල ඉඳින්' කියා කණට කොඳුරමින් වන්නට ඇත. ප්‍රසව වේදනාවෙන් මඩනා ලද ඇතින්න වේදනාව ක්‍රමයෙන් වැඩි වෙද්දී සමහර අවස්ථාවලදී අසල සිටින ඇතින්නියකගේ හොඬවැල හෝ කකුලක් තම හොඬවැලෙන් තදින් වෙලා ගන්නා අතර වේදනාවේ ප්‍රමාණය අනුව වෙලා ගත් බැම්මේ දැඩි බව අඩු වැඩි වන බව මෙවැනි ප්‍රසූති බොහෝ ගණනක් හොඳින් නිරීක්ෂණය කරන්නට ලැබුණු සත්වවේදියෙක් පවසා තිබේ. කෙසේ වුවද වේදනාව ඉවසා දරා ගනු නොහී ගැබ්බර ඇතින්නිය කෑ ගසන්නට පටන් ගත් විගස අනිත් සියලුම ඇතින්නියන්ද ඒ අනුව මහ හඬින් කෑ ගසන්නට පටන් ගන්නේ ලොව අන් කිසිම සත්වයෙක් පැටවෙක් බිහි කරන අවස්ථාවේ නොකරන ආකාරයටය. ගැබ්බර ඇතින්නියගේ වේදනාත්මක විලාපයද අනිත් සතුන්ගේ කෑගැසීමද එකතු වූ විට විශ්වාස කිරීමට පවා අපහසු අන්දමේ අතිවිශාල ගිගුම් දීමකින් මුලුමහත් ප්‍රදේශයම වෙළා ගනු ලබයි. එම ශබ්දය අහස සිසාරා දෝංකාර නගමින් ඈතින් ඈතට ඇදී යන්නේ එය කණ වැකුණු සියලුම සතුන් භීතියෙන් භීතියට පත් කරවමිනි. අවස්ථාව කුමක්දැයි නොදැන අනපේක්ෂිත අවස්ථාවක එම ගෙරවුම් හඬ එකවරම කණ වැකුණහොත් ඕනෑම නිර්භීත මිනිසෙක් තුළ වුවද තිගැස්මක් ඇති කිරීමට පමණක් නොව මොහොතකට හෘදය ස්පන්ධනය පවා නතර කරන්නට තරම් දරුණු භයංකාර ශබ්දයක් ඉන් ජනිත වෙයි. මෙම විකාර කෑ ගැසීමේ තේරුම කුමක්ද? එසේ කරන්නේ කුමන අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහාද? යි යමෙකුට සිතෙන්නට පුළුවන. ඇත්තෙන්ම එය තේරුමක් නැති ක්‍රියාවක් නොවේ. අලි රංචුවේ අනිත් සාමාජිකයන් සියළුදෙනාම එක හඬින් මෙසේ ශබ්ද නගන්නේ කාරණා දෙකක් සඳහාය. එකක්, පැටවා බිහිකිරීම සඳහා වෙර දරන ගැබ්බර ඇතින්නියගේ වේදනාව සුළු වශයෙන් හෝ අඩු කිරීමේ අරමුණෙනි. තමන් තනිවම මුහුණ දෙන මෙම වේදනාත්මක මොහොතේ තමන්ව තනි වන්නට ඉඩ නොදී තම රංචුවේ සිටින අනිත් සියලුම අම්මලා, අත්තම්මලා, නැන්දලා, අක්කලා, නංගිලා පමණක් නොව කුඩා මල්ලිලා පවා තමන් සමග මෙම මොහොතේ එකට එකතු වී සිටින බව දකින ඇහෙන ගැබ්බර ඇතින්නියගේ සිතට නැගෙන සතුට මෙන්ම චිත්ත ශක්තියද හේතුවෙන් ඇගේ ශාරීරික වේදනාව මඳකින් හෝ අඩු නොවෙතැයි කාට නම් කිව හැකිද?

එහෙත් ඇතින්න සමග පෙමින් බැඳී සිට ඇතින්න ගැබ් ගැන්වූ අලියා නම් මෙම මොහොතේ ඇගේ අතින් අල්ලාගෙන සිටින්නටවත් හිස පිරිමදින්නටවත් ඇය අසල නොවෙයි. එය අලින්ගේ ස්වභාවයයි. ඒ ගැන බලාපොරොත්තුවක්වත් තැකීමක්වත් ඇතින්නට නැත.

දෙවන හේතුව නම් අලුත උපදින අලි පැටවා ඉතා පහසු ගොදුරක් බව දන්නා අනෙකුත් විලෝපීය සතුන්ගෙන් අලි පැටවා ආරක්ෂා කර ගැනීම සඳහාය. අප්‍රිකානු වනාන්තරවල සිටින සිංහයන්, කොටියන් වැනි සතුන්ටද, ඉන්දියාවේ සිටින ව්‍යාඝ්‍රයින් වැනි සතුන්ටද අලුතින් ලොවට පය තබන මෙම අලි පැටවා ඉතා පහසු දඩයමකි. ලංකාවේ නම් සිංහයින්, ව්‍යාඝ්‍රයින් වැනි සතුන් නොසිටියද කැනහිළුන්, ඌරන් වැනි සතුන් ප්‍රසූතියේදී ගලා යන ලේ, වැදෑමහ ආදියෙන් නගින කුණු ගඳ සහ පිළී ගඳට ලොබින් එතැනට ඇදෙන අවස්ථා එමටය. මෙම සියලුම සතුන් බය ගන්වා උන් එම ස්ථානයෙන් ඈත් කර තැබීම මෙම කෑ ගැසීමේ දෙවන අරමුණයි.

අලින්ගේ දරු ප්‍රසූතිය සම්බන්ධ තවත් විස්තර ළබන කලාපයෙන්

**නොයෙල් ගුණරත්න**

## කියාදීපන් නංගියේ



යන එන විටදි
නුඹ මා දෙස බලන්නේ
සිනාසෙන දෑසින්දෝ
හඬන දෑසින්දෝ
කියා දීපන් නංගියේ

ජීවිතය කියා දෙන නුඹ
දුක් කරදර දරාගෙන
ජීවිතය ජයගන්න
මාවතද ඔය දෑසින්
කියාදෙන්නේ නංගියේ

මා දෙස බලන
නුඹ ජීවිතය
කොතරම් සුන්දරද
කඳුළු කොතරම් මිහිරිද
විඳිමින් විඳවමින් යන
මේ ජීවිතයේ පාඩමද
ඔය කියාදෙන්නේ
කියාදීපන්
මොනාලීසා නංගියේ

එම්.සිල්වියා ද සිල්වා

## අම්මාවරුනේ

කුසින් දරාගෙන දරුවන් බරක් නැති
රුවන් කරඬු ලෙස උසුලන අයෙක් ඇති
එවන් මහ ගුණැති මව පසැස් සැති
බුදුන්ගෙනුත් බුහුමන් ලද කෙනෙක් වෙති

ලෙඩට දුකට හදවත ගිනි ඇවිලෙනවා
දුවට පුතුට එක ලෙස ලේ කිරි වෙනවා
හඬට හඬන ළඟටම දුවගෙන එනවා
මවට නොසැලකුවොත් මතු පල දෙනවා

නිතර නිතර දුටුවත් දැක මනාපය
හතර දිසාවට එළිවෙන නිසාමය
සසර වසන තුරු ඇය චුවමනාමය
ගෙදර පාළු අම්මා නැති වුණාමය

නෙතට සුවය දෙන අපහට වන පිහිට
හිතට දුකය අම්මා නොදුටුව දාට
හිසට කිරුළු පැලඳුවත් මොනවාට
දනෙයි අඩුව අම්මා නැති වුණ දාට

කොස්ගොඩ සිරිසුධම්ම හිමි

## නොහිමි ආදරය....

අචින්ත්‍ය ආදරය
අනාත්මයි ආදරය
වියෝවන තුරු නොදැනුණු ආදරය
ළං කර ගන්නද දුරස් වන ආදරය

බිඳ වැටෙන හදවත
සනසාලනු මැන
මා වෙතට ළංව
තුරුල් කර ගන්නට
වරම් නොළඳ මා
සිරකරනු හදවතෙහි
ගිලිහී යන්නට නොදී
ඔබෙන් ලද ආදරය
මහමෙරකි සබඳ...



කුමුදු රත්නවීර




## යාචකයා

අප හැම ඉපදුණේ යම් මොහොතකදි ලොවේ
අබමල් රේණුවක වෙනසක් ඇතුව නොවේ
කෙනෙකුට හිමි වෙද්දි ඉහළම සතුට සුවේ
තවකෙකු මාවතේ ලැග අසරණව තැවේ

සැපයට හෝ දුකට වෙන වෙන උරුම කියා
පැරදුණු කෙනෙකු නැත බැලුවොත් කරුණු සොයා
අනුවණ කමින් මේ මගෙ ඉරණමය කියා
මිනිසුන් දුක් විඳී සීයේ විලස ඔයා

කිසිවෙකු දෙන දෙයක් ලැබ දිවි රැකෙන විට
ඔබ හට ලොකු උදව්වක් කළ නොහැක මට
මේ සුළු උදව්වෙන් තව එක දවස කට
ඔබෙ දිවි රැකේ නම් ඒ සැනසුමකි මට

ඩබ්ලිව්. ඉෂාරා ලක්මාලි





## ඇස් දෙක

ඉස්සර නවි යකඩ යකා
වතුර බිබී අඟුරු කකා
කොළඹ දිව්ව මෙහෙව් එකා
අද යන්නේ අඟුරු නොකා

වේකා අලි මෝඩ යකෙක්
ඇත්තේ නැත මොළය ටිකක්
අඳුර මකා එකම ඇසක්
තිබුණත් නැත පෙනෙන එකක්

අත්වැල අල්ලා යන්නේ
රියදුරෙක්ය මග දන්නේ
ඔහුටය අවනත වන්නේ
යන මග පෙන්නා දෙන්නේ

රියදුරාට ඇස් ඇත්තේ
ගමන කෙලෙස යා යුත්තේ
නිල් රතු සන් කණු මත්තේ
බල බල අණ කළ යුත්තේ

දැන් දැන් මේ රියදුරැලා
හැල්මේ යති නිදි කිරලා
අනතුරු මග දිග හැපිලා
අලි වඳ වෙති මග මැරිලා

අලි මංපෙත පනිනවාලු
යකා අණක් නගනවාලු
ඇස් ඇරගෙන සිටිනවාලු
මළ පසු බස් දොඩනවාලු

රියදුරන්ට දුන් ඇස් දෙක
යකඩ යකාගේ අඳ එක
වෙනස් කළොත් දෙයියන් දැක
අලි සවිපත රැකගත හැක

කැන්ද ලියද්දපාළුවේ
අල්බට් ඇම්. ලියනගේ

## බිත්ති චිත්‍රය

දෙදරා
ඉරිතලා
ගරා වැටෙන්න තතනන
බිත්තිය
රජ සමයේ පැරැණි සිතුවම
දහස් ගණනක් ඇස්වල
වැදී කිලිටිව දිගු කලක් තුළ

බැල්ම මෙපමණ දිනකට
ඉවසනු බැරිව වෙව්ලන
පැරැණි රජ මහ වෙහෙර භූමිය
සූපතල බිත්ති චිත්‍රය

වසර සියවස් ගණන් දුරකට
අප රැගෙන යන උරුමය
මම තව වරක් තරඹමි
ඉපැරැණි බිත්ති චිත්‍රය

කේ. පී. ඩබ්ලිව්. ප්‍රියන්ත ජයලත්

## කවියකුගේ මරණය

උපමා රූපක වැළපේ සරසවියේ මිදුලේ
දිග එළිවැට කළාලයක් විලසින් බිම අතුලේ
ජන කවියේ වදන් පේළි සුදු කොඩියේ ඉගිලේ
මුතු කැට මුදු අකුරු කඳුළු හැම නෙතකම උතුලේ

කුමරතුඟු විකුම් සේකර ඇත මහ පොත් ගොන්නේ
ගුරුළුගෝමි විදුසක්විති නිහඬව වැළපෙන්නේ
පායා ආ සඳ පලුවත් අඳුරේ සිර වෙන්නේ
තරු කැට අහසින් වැටිලා පොළවත් හින ගන්නේ

ලෝකඩ සිංහයා ඉඳී තපසට ඉඩ දීලා
රජත මයුරයාගේ පිල් කළඹද ගැලවීලා
සම්මානේ අකුරු පේළි කාවුන් හිල දාලා
සරසවි උරමත හිරවගෙ නෙත් දෙක පියැවීලා



දඹේගොඩ ජිනදාස

# PROTOCOLS OF THE LEARNED ELDERS OF ZION

## දෙවන ලෝක යුද්ධය ඇවිලවූ ලෝකයේ භයානකම පොත

**මෙය මේ ලෝකයේ එතෙක් මෙතෙක් බිහි වූ නරකම නපුරුම සහ අඳුරුතම පොත පිළිබඳ කතාවයි. ලෝකයේ දියුණු රටවල් වැඩි හරියක ප්‍රධාන පොත් සාප්පුවලින් මේ පොත මිලට ගත හැකිය. මෙය මිල දී ගැනීමට තරම් වත්කමක් ඔබට නැති බව හැඟුණොත් නොමිලයේ වුව ලබා දීමට සූදානම් රහස් කණ්ඩායම් මෙයට ශත වර්ෂයකට පෙරත් සිටියහ. අදත් සිටිති. දෙවන ලෝක යුද සමයේදී යුදෙව්වන් දශලක්ෂ ගණනක් ගෑස් කාමරවලට යැවීම සඳහා අත්පොත වශයෙන් හිට්ලර් විසින් මේ පොත යොදා ගන්නා ලදී. Protocols of the learned Elders of Zion (යුදෙව් විද්වතුන්ගේ චර්යා ධර්ම) නමැති මේ පොත ඕනෑම මොහොතක යුදෙව් විරෝධී ලෝක යුද්ධයක් අරඹනු පිණිස හොල්මනක් මෙන් ලොව පුරා සැරිසරන්නේය.**

* * *

රුසියාවේ සාර් රජ පරම්පරාවේ අන්තිම කාලයේදී Znamya නමැති ප්‍රසිද්ධ පුවත්පතක් තිබිණි. 1903 අගෝස්තු 26 සහ සැප්තැම්බර් 07 අතර කාලය තුළ මේ පුවත්පතේ 'විශේෂ' ලිපි පෙළක් පළවිය. එහි අඩංගු කාරණා ඉතා බියජනක විය. ලෝකයේ බලය අත්පත් කර ගැනීම සඳහා යුදෙව්වන් විසින් කරගෙන යනු ලබන කුමන්ත්‍රණයක් ගැන මේ පොත හෙළි කළේය. 1897 දී ස්විස්ටර්ලන්තයේ බැසල් නගරයේදී පවත්වන ලද යුදෙව් සමුළුවකදී රහසිගත යුදෙව් ලෝක රාජ්‍යයක් සඳහා සාකච්ඡා පැවැති හැටිත් මෙය වාර්තා කිරීමට ගිය පුවත්පත් කලාවේදීන් අල්ලස් දී නිහඬ කළ හැටිත් එම ලිපි පෙළ මගින් හෙළිදරව් කෙරිණ. එය වූ කලී ක්‍රිස්තුස්වහන්සේ රෝම අධිරාජ්‍යයට පාවාදීමෙන් පසු ලොව පුරා සීසීකඩ විසිර සිටි යුදෙව්වන් තම තමන් ජීවත්වූ රටවල සාමූහික ප්‍රජාවන් බවට එකමුතුව සාර්ථක ලෙස හිස ඔසවමින් සිටි කාලයයි. ඒ වන විට නූතන ඊශ්‍රායලය බිහිව තිබුණේ නැත. යුදෙව් ආගම හෙවත් බයිබලයේ පැරණි ගිවිසුම හා අනුබද්ධ දෙවියන් වහන්සේ මූලික කරගත් ආගම අදහන ලද්දේ එක් එක් රටවල සිටි යුදෙව් කණ්ඩායම් විසින් පමණි. මතු අනාගතයේදී ලෝකය තනිකරම යුදෙව් රාජ්‍යයක් වන බවත්, යුදෙව් නොවන වෙනත් ජාතීන්ට අයත් තරුණ පරම්පරාව වැරදි අධ්‍යාපනය වැඩිහිටියන්ගේ අනුග්‍රහය ලබන බේබදුකම සහ ගණිකා වෘත්තිය මගින් විනාශ කිරීම සඳහා යුදෙව් ප්‍රජාව ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න ගැනත් පෙර කී ග්‍රන්ථයේ උපුටනයක් ලෙස Znamya පුවත්පතේ පළ විය. මේ සියල්ලටම අමතරව යුදෙව් ආගම හැර සෙසු සියලු ආගම් විනාශ කිරීමටත් ලෝකයේ ප්‍රධාන නගර සියල්ල පුපුරුවා හැර ඒවා යුදෙව් නගර ලෙස යළි ගොඩනගන බවටත් ස්විස් අගනුවර පැවැති යුදෙව් සම්මේලනයේදී ගන්නා ලද තීන්දුවක් ගැන Znamya පුවත්පත හෙළි කළේය.

මේ ලිපි පෙළ කියවූ යුදෙව් නොවන රුසියානුවන්ගේ මෙන්ම යුදෙව්වන්ගේද ඇඟේ මවිල් කෙළින් විය. යුදෙව් නොවන රුසියානුවෝ ළඟ එන යුදෙව් යුද්ධයට බිය වූහ. යුදෙව්වෝ යුදෙව් නොවන්නන්ගේ වෛරයට පාත්‍ර වීමෙන් තමන්ට විය හැකි හානිය සලකා බිය වූහ. ලිපි පෙළ නිම වී පැය 24 කට පසු සාර් රජුගේ දාමරික හමුදාවන් කඩු කිනිසි සහ තුවක්කු අතට ගෙන රුසියන් අගනුවර ලෙස පැවැති පිටර්ස්බර්ග් නගරයේ සිටි යුදෙව්වන් සංහාරය කරමින් ඔවුන්ගේ වටිනා බඩු කොල්ල කා වාසස්ථානවලට ගිනි තබන්නට පටන් ගත්හ. ක්‍රමයෙන් ඇවිල ගිය මේ සංහාරය ඊළඟ ශතවර්ෂයටද පැතිර ගොස් 1918-1921 කාලයේදී මස්තක ප්‍රාප්තව රුසියාවේ යුදෙව්වන් දෙලක්ෂයක් මරුට බිලි කළේය.

### පොතක් කියවා බියපත් වූ ජනයා


1920 වන විට Protocols of the Learnerd Elders of Zion ග්‍රන්ථය ලොව පුරා රටවල බෙදාහරින ලදී. පොත කියවීමෙන් බියපත් වූ බ්‍රිතාන්‍ය පුවත්පතක් කිසිදු යුදෙව්වකුට රජයේ රැකියා නොදිය යුතු බව තරයේ පැවැසීය. මේ වූ කලී මහජන මතය හැසිරවීමේ කටයුත්තට පුවත්පත් එළැඹෙමින් සිටි කාලයයි. පුවත්පත් කියන දේ විශ්වාස කිරීමට මිනිස්සු පුරුදු වෙමින් සිටියහ. Protocol crurh එක්සත් රාජධානිය කළඹමින් සිටි මොහොතක තම හඬ අවදි කළ ලන්ඩන් ටයිම්ස් පත්‍රය මේ පොත සාර් රජු විසින් සාදන ලද අංග සම්පූර්ණ බොරුවක් බව හෙළි කළේය. එය 1864 දී නැපෝලියන් බොනපාට් බලයෙන් අතුගා දැමීම සඳහා අනුගමනය කළ යුතු වැඩ පිළිවෙළක් ගැන රුසියාවේ ලියැවුණු ලේඛන කිහිපයක් වචනයෙන් වචනය කොපි කර නැපෝලියන් හා ප්‍රංශ හමුදා යන තැන්වලට යුදෙව්වන් යන වචන ආදේශ කර නැවත ලියන ලද්දක් බව තවදුරටත් කීමටද ලන්ඩන් ටයිම්ස් පුවත්පතට හැකි විය. ව්‍යාජ පොත ලියා තිබුණේ සාර් රජුගේ රහස් පොලිසියයි. මන්ද යත් යුදෙව්වන් වැඩි හරියක් දෙනා කොමියුනිස්ට් කාරයන් බවට වැරදි ආරංචියක් සාර්ට ලැබී තිබිණ. යුදෙව්වන් කල් තියා මරාදමා විප්ලවයෙන් භාගයක් නැති කරන්නට සාර් ගත් උත්සාහය එයය.

ලන්ඩන් ටයිම්ස් ඔළුවෙන් හිටගෙන ඇත්ත කීවත් එය පිළිගන්නට යුදෙව් විරෝධීන් සූදානම් වූයේ නැත. Protocol ග්‍රන්ථයේ පිටපත් මිලියන ගණනක් භාෂා 17 කින් මුද්‍රණය කර ලොව පුරා බෙදා හරින ලදී. 'යුදෙව්වා' යනු ළඟ එන ව්‍යාපාරික අන්තරායක් බව තේරුම් ගත් ඉකුත් සියවසේ සිටි ඇමරිකානු කෝටිපති හෙන්රි ෆෝඩ් (ඔහු ෆෝර්ඩ් මෝටර් රථ සමාගමේ අයිතිකරුය) ඇමරිකාව තුළ මේ පොත බෙදා හැරීමට තම පෞද්ගලික ධනය යෙදවීය. මේ අනුව යුදෙව්වන් සම්බන්ධයෙන් ලෝක නායකයන් විවිධ න්‍යාය පත්‍ර අනුගමනය කළ බව පැහැදිලිය. සාර්ට තිබුණේ 'දේශපාලන' න්‍යාය පත්‍රයකි. ෆෝර්ඩ්ට තිබුණේ 'ව්‍යාපාරික' න්‍යාය පත්‍රයකි. බයිබලයේ අලුත් ගිවිසුම ඇදහූ අය හෙවත් ක්‍රිස්තියානින්ට තිබුණේ බයිබලයේ පරණ ගිවිසුමට අනුව කටයුතු කළ යුදෙව් ආගමිකයනට එරෙහි 'ආගමික' න්‍යාය පත්‍රයකි.

ඒ අතර යුදෙව්වන්ට එරෙහි ලිපි මාලාවක් සකස් කළ හෙන්රි ෆෝර්ඩ් එයට International Jew (ජාත්‍යන්තර යුදෙව්වා) යන නම තබා පිටපත් පන්ලක්ෂයක් මුද්‍රණය කර බෙදා හැරියේය. මෙහිදී හෙන්රි ෆෝර්ඩ් නොදත් දෙයක් තිබිණ. එනම් ඔහුගේ මෝටර් රථ මිලට ගැනීමට තරම් ආර්ථික ශක්තියක් තිබූ ඇමරිකානුවන් අතුරින් වැඩි දෙනා යුදෙව්වන් බවය. ඔවුහු ඔහුගේ මෝටර් රථ මිලට ගැනීම වර්ජනය කළ අතර හෙන්රි ෆෝර්ඩ් ක්‍රමයෙන් කඩා වැටෙන්නට විය. International Jew පොත යළි කැඳවාගන්නට ඔහුට ඕනෑ වූ නමුත් එය කිසි විටෙකත් කළ නොහැකි විය.

මේ අතර Protocols හෙවත් International Jew ලිපි සමුච්චයටත් ජර්මනිය තුළ විශාල තැනක් තිබිණ. හිට්ලර් ලියූ අර්ධ චරිතාපදානය වූ 'මගේ සටන' පොතේ සඳහන් වූයේ Protocols පොත 100% ක්ම සත්‍ය බවය. ලන්ඩන් ටයිම්ස් පත්‍රය එය බොරුවක් ලෙස පුන පුනා හඳුන්වන්නේ එය සත්‍යයක්ම නිසා බව හිට්ලර් කීවේය. 1932 දී හිට්ලර්ගේ නාසි පක්ෂය ඡන්ද කෝටියක් ලබාගෙන බලයට එන්නේ මේ පොතෙන් ගත් කොටස් වේදිකාව මත කීමෙනි. ඇත්තවශයෙන්ම ගත් කල ඒ වන විට ජර්මන් ආර්ථිකයෙන් සෑහෙන ප්‍රමාණයක කොටසක් තිබුණේ යුදෙව්වන් අතය. 1933 වන විට නාසි පක්ෂය මේ පොත 13 වතාවක් මුද්‍රණය කර ජර්මනිය පුරා බෙදුවේය. දෙවන ලෝක යුද්ධය නමැති ගිනි ජාලාව පත්තු කරන ලද්දේ තනිකරම මේ පොත විසින් නොවූවත් එම ගිනි ජාලාවට අවශ්‍ය තෙල් සෑහෙන තොග යක් සපයන ලද්දේ මේ පොතෙනි.

ඊළඟට මේ පොත යන්නේ යුදෙව්වන්ගේ පරම සතුරන් වූ ඉස්ලාමීයයන් වාසය කරන මැදපෙරදිගටය. 1970 දී Protocols පොත ලෙබනනයේ වඩාත්ම විකිණෙන පොත බවට පත් වෙයි. 1985 දී ඉරාන රජය මේ පොත අරාබි බසට පරිවර්තනය කර වෛරී සහගත පෙරවදනක්ද සමග මුද්‍රා හරී. හමාස් සංවිධානය එය පටන් ගත්දා සිටම මේ පොත ස්වකීය පාඨ ග්‍රන්ථය හා ප්‍රතිපත්ති නිර්ණයට අවශ්‍ය ග්‍රන්ථයක් ලෙස පිළිගනී. Protocols ගමන තවමත් අවසන් නැත.




## රුහුණේ ශාන්ති...

8 වන පිටුවෙන්

බෝවෙන රෝග, දුර්භික්ෂ, අස්වනු පාලුව, තද නියං ඇතිවන්නේ දෙවියන්ගේ පිහිටාරක්ෂාව නිසි අයුරින් නොලැබීම හේතු කොටගෙන බැව් විශ්වාස කරන ගැමියෝ වාර්ෂිකව ගම්මඩුවක් පවත්වා දෙවියන්ගේ ඇල්ම බැල්ම ලබාගැනීමට කටයුතු කරති.

මෙහිදී පුද ලබන ප්‍රධාන දේවතාවිය වන්නේ පත්තිනි දේවතාවියයි. පත්තිනිය සමග එකට පුද ලැබීමට වරම් ලබා ඇති දෙවොල් දෙවියන්, වාහල මංගර, කතරගම, සමන් ආදි පරිවාර සමූහයාද මෙහිදී උපහාර ලබති.

### ගරා මඬු

ධීවර ජනතාව වාරකන් කාලය එළඹෙත්ම සියලු රැකිරක්ෂා නවතා මුහුදු වෙරළෙහි ගරා මඩු නැටීමට පුරුදුව සිටිති. ඇතැම් විට ගරා මඬුව ගම්මඩුවට සම්බන්ධ කොට පැවැත්වේ. පසුගිය කාලසීමාව ඇතුළත වැඩිපුර මසුන් ලැබීම හේතු කොටගෙන ඇතිවන වස් දොස් දුරු කිරීම හා ඊළඟ වසරට මසුන් අඩුපාඩුවක් නොමැතිව ලබාගැනීම සඳහා දේවාශිර්වාදය හා ආරක්ෂාව ලබාගැනීම මින් අපේක්ෂා කෙරේ.

මෙහි ප්‍රධානත්වය හිමිවන්නේ ගරා යකාටය. ගරා යකා ආහාරයට ගිජු කමක් දක්වන්නෙක් බැවින් මුහුදේ මසුන් ගිල දමා ධීවරයන්ගේ අපේක්ෂාවන් අඩාල කළ හැකි යැයි විශ්වාසයක් පවතී. එනිසා ගරා යකාට විශේෂ පුදපූජා දී එකී මත්ස්‍ය සම්පත ආරක්ෂා කරගැනීම පුරුද්දක් ලෙස පවත්වාගෙන එනු ලැබෙයි. ගරා යකුන් දොළොස්දෙනෙක් සහ දොළොස් ගිරිකට්ටුව මෙහිදී පුද පෙත් ලබති.

### බලි තොවිල්

අභ්‍යවකාශයේ පවත්නා ග්‍රහ වස්තූන්ගේ බලපෑමක් මනුෂ්‍යයා වෙත බලපැවැත්වෙන බැව් නොරහසකි. රවී, චන්ද්‍ර, කුජ, බුද, ගුරු, ශුක්‍ර, ශනි, රාහු, කේතු යන නවග්‍රහයින් මූලික කොට සැකසී ඇති නක්ෂත්‍ර වත්පිළිවෙත්වලට අනුව බලි නියම කර ගැනීම සිදු කෙරේ. ග්‍රහ ඝට්ටන, ග්‍රහ මාරු, ග්‍රහ වක්‍ර වීම්, ධූමකේතු ආදියේ බලපෑම අනුව මනුෂ්‍යයාට අහිතකර බලපෑම් ඇතිවන කල්හි ඒ ඒ දේව කොට්ඨාස හමුවේ පුදපූජා පැවැත්වීම බලි යාගයක දක්නට ඇති සාමාන්‍ය ලක්ෂණයයි. මහා දසා බලියක්, අනු දසා බලියක් සහිතව ඒ ඒ රෝග කාරකයන් හා නැකැත් පත්‍රයේ පිහිටීම අනුව බලි නියම කිරීම බලි ඇදුරාගේ කාර්යයයි. බෞද්ධාගමික් මුහුණුවරක් සහිතව බලි යාගය සකසන ලද්දේ රුහුණේ අග්‍රගණ්‍ය පඬිරුවන් සේ සලකන තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් හා වීදාගස හිමියන් විසින් යැයි පිළිගැනේ. බලියාගයන් සඳහා කියැවෙන කියමන් බොහොමයක් මෙකී ස්වාමින්වහන්සේලාගේ ප්‍රබන්ධයන් බැව් සැලකේ.

### සිංහල ශාන්තිකර්ම තුළින් ඇති වන සන්නිවේදනය

සිංහල ශාන්තිකර්ම තුළින් සමාජයට ඉටු වූයේ හුදෙක්ම ශාන්තිමය ගුණය පමණක් නොවේ. සිංහල සමාජය ගුණගරුක බවින් නංවා යහපත් සදාචාරාත්මක වාතාවරණයක් සැකසීම සඳහා අවශ්‍ය කරන්නා වූ සන්නිවේදන ක්‍රමයක් සිංහල ශාන්තිකර්ම තුළ අන්තර්ගතය. ආචාර ධර්ම හා කුල සිරිත් රැක ගැනීමත් ඒවා කඩවීමෙන් ඇති වන්නා වූ අනිසි ප්‍රතිඵල කියාපෑමත් තුළින් පැවසෙන්නේ සමාජ සාධාරණත්වයෙහි මිනිසා ජීවත් කළ යුතු බවකි.

චිත්‍ර කලාව, මූර්ති කලාව, කැටයම්, නක්ෂත්‍රය, නර්තනය, ගායනය හා වාදනය එක්තැන් කරන ලද පරිපූර්ණ කලා ප්‍රසංගයක් බඳු වූ රුහුණු ශාන්තිකර්ම හෙළ කලාකරුවාගේ කලා කෞශල්‍යය ඔපවත් කරන කැඩපතක් බඳුය.

## Gotu Kola and Curry Leaf plants Are Here!

We have Passion Fruit Plant, Lemon Grass (For Curries and Tea), Bloody Dock (Spinach variety ornamental), SunChoke (good for diabetics) and other exotic varieties.

**Seeds Of Asia**
1345 Morningside ave #8
(North of Sheppard)
416 284 4004
seedsofasia.com

## Cake Boxes

### (Favor Boxes) for all occasions

**Weddings, Birthdays, Anniversaries and other celebrations**

- Luxurious and Elegant Designs at easily affordable prices
- Fully Personalised/Customised
- Premium Paper Cardstock available
- We can ship anywhere to Canada/US

**We offer incentives to Cake Decorating Designers**
Please Contact us for your Introductory Package with Samples/Premium Cardstock Options you can show to your customers

**Palm Print**
416 284 9545
palmprint.ca
1345 Morningside ave #8
(North of Sheppard)

## SPARKLING PARADISE LTD

Property Maintenance & Home Improvement Services

1193A Brimley Road, Unit 6A, Scarb., ON M1P 3G5
**Tel: 647 748 5003**
sparlingparadiseltd@gmail.com

- Property Maintenance
- Renovations
- Real Estate Buy and Sell Renovation works
- Custom Modification
- Basement Renovation
- Harwood and Laminate Flooring
- Tile Flooring
- Heating / Cooling
- Plumbing
- Painting
- Windows
- Doors
- Cabinetry

**Call us for Free Quotation**

"Rain or shine, we will sparkle your home"

## Why Pay More ?

Save Thousands on Commission When You sell Your Home

1%

1% Exclusive Listing Commission *

Full Service Home Listing at a Fraction of the Price

| Your House | 1% | Typical Sales Commission 5% | Saving |
|---|---|---|---|
| $200,000 | $2,000 | $10,000 | $8,000 |
| $300,000 | $3,000 | $15,000 | $12,000 |
| $400,000 | $4,000 | $20,000 | $16,000 |
| $500,000 | $5,000 | $25,000 | $20,000 |
| $600,000 | $6,000 | $30,000 | $24,000 |
| $700,000 | $7,000 | $35,000 | $28,000 |

Century 21® Innovative Realty Bro; Inc

2 Offices to Serve You Better: 2250 Markham Road, Unit 3, Toronto ON M1B 2W4 ## Missisauga: 1001 Mayerside Drive, Unit 3 Missisauga, ON L5T1J6

nishan.don@gmail.com *Subject to condition. 1% commission does not include co-operating brokerage commission. Not intended to induce breach of an existing buyer or seller contract.

"Solving the puzzle of selling your home"



**Nishantha Donsiyambalapitiyage**
Sales Representative

Direct: **416.417.0763**

# හඟුරන්කෙත විමලරතන හිමි උපැවිදි වෙයි

**හොඳ වෙලාවට භික්ෂු චරිතයක් ලැබුණේ. මිනීමරුවෙකුගේ චරිතයක් දුන්න නම් අත්දැකීම් ගන්න ඒකත් කරල බලයිනේ.**

**- භික්ෂුහු චෝදනා නගති**



එක් කලෙක රටෙහි ආන්දෝලනාත්මක චරිතයක්ව සිටි සනත් ගුණතිලකයන් පසුගිය කාලයේ මඳක් නිහඬව සිටි අතර හිටි හැටියේම නැවතත් ඔහු පිළිබඳ කතාබහ මතු වීමට පටන් ගෙන ඇත. ඒ පසුගියදා සිදුකරගන්නා ලද ඔහුගේ තාවකාලික පැවිද්ද හේතුවෙනි.


බෙන්තර සපුගොඩ විහාරස්ථානයකදී සතියක කාලයක් සඳහා හඟුරන්කෙත විමලරතන නමින් පැවිදි දිවියට පත් වූ සනත් ගුණතිලකයන් මේ වන විට නැවතත් ගිහි වෙස් ගෙන ඇත. අනාගතයේදී රඟපෑමට නියමිත චිත්‍රපටයක භික්ෂු චරිතයක් වෙනුවෙන් අත්දැකීම් ලබාගැනීම සඳහා තමා මෙසේ තාවකාලිකව පැවිදි දිවියට පත් වූ බව ඒ පිළිබඳ අදහස් දක්වමින් සනත් ගුණතිලක පවසයි. එහෙත් ඔහුගේ මේ ක්‍රියාව ශ්‍රී ලාංකේය භික්ෂු සමාජය විසින් නොයෙක් අයුරින් අර්ථකථනය කළ අතර ඒ පිළිබඳ පළවූ අදහස් කීපයක් අපි මෙසේ පළ කරමු.



### 'රාවණා බලය' සංවිධානයේ කැඳවුම්කරු ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමි

සම්ප්‍රදායට අනුව මහණ වීමෙන් පසු චිත්‍රපටයක පෙරහුරුවක් සඳහා මහණ වුවා යැයි පැවැසීම තුළ තමන් හට මහණ දිවියට ඇතුළත් වීමට මග පෙන්වූ හිමියන්ද රවටා ඇති බව පෙනේ. ශාසනය යනු පෙරහුරු කරන තැනක් නොවන නිසා මේ බව පළමුව කිව්වා නම් සනත් ගුණතිලක මහතා පැවිදි දිවියට ඇතුළත් කළ ඉත්තෑපානේ ධම්මාලංකාර හිමියන් මෙම මහණ කිරීමේ පිංකම නොකරනු ඇත. ශාසනයට ඇතුළු වීමෙන් අනතුරුව ශාසනික සම්ප්‍රදායට ගරු කළ යුතු අතර ඉන් අනතුරුව හිතුමනාපේ කටයුතු නොකළ යුතුයි. මේ විදියට අත්දැකීම් ගන්නේ නම් සනත් ගුණතිලක මහතාට වැරදීමකින් හෝ මිනීමරුවකුගේ චරිතයක් සඳහා ඇරයුම් නොකිරීමට වගබලා ගත යුතුයි.

### ආචාර්ය ඕමල්පේ සෝභිත හිමි



සනත් ගුණතිලක මහත්තයා හෝ වේවා මොන කවුරු හෝ වේවා තමන්ගේ රස්සාව වන රඟපෑම සඳහා සුදුසුකම් ලබා ගැනීමට ශාසනයට ඇතුළත්වන්න පැවිදි වූවා නම් එය ශාසනයේ ගෞරවය කෙලසීමක්. පැවිදි වීමේදි ආරාමික ශාසනික සම්ප්‍රදාය අනුගමනය කිරීමක් සිදුවෙලා නැහැ. පැවිදි දිවියට ඇතුළත් වෙද්දි පැවිද්ද ඉල්ලන්නේ 'සබ්බ දුක්ඛ, නිස්සරණ' කියා පවසන වාක්‍යයෙන්. ඒ කියන්නේ සසර දුකින් අත්මිදීම පිණිස මාව පැවිදි කරන්න කියා තමයි ඉල්ලන්නේ. එහෙත් සනත් කියන්න ඇත්තේ මගේ රඟපෑමේ වැඩිදියුණුව ඉටුවීම පිණිස, ජනප්‍රියවීම පිණිස මාව පැවිදි කරන්න කියලයි. 'අගාරස්මා අනගාරියං පබ්බජි' කියන්නේ ගිහිගෙයින් නික්මී පැවිදිකමට එනවා කියලා. සියලු වත් පිළිවෙත්වලට මේ දේ සිදු වුණා නම් එහෙම දෙයක් වෙනවාද මෙතැන. පැවිදි විය යුත්තේ ගිහි ජීවිතෙන් ඉවත් වෙලා සියලු සම්බන්ධකම්වලින් නිදහස් වෙලා, පවුල් ජීවිතයෙන් ඉවත්වෙලා, අපි කියන්නේ සිවුර නළුකම පුහුණු කරගැනීමට යොදා ගැනීම ශාසනික ගෞරවය විනාශ කිරීමක්. මෙහිදි වංක අදහසක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. මේ පිළිබඳ මාධ්‍යවලට කියලා මාධ්‍ය මගින් ප්‍රචාරය කරල තමයි මේ පැවිදිවීම කරලා තිබෙන්නේ. මේ කරලා තිබෙන්නේ බරපතළ වැරැද්දක්. ශාසනික සදාචාරය විහිළුවට ලක් කිරීමක්. භික්ෂුත්වය හෑල්ලු කිරීමක්. මෙය කිසිදු බෞද්ධ භික්ෂුවක් අනුමත කරන ක්‍රියාවක් නොවේ. කිසිම බෞද්ධයෙක්ද අනුමත කරන ක්‍රියාවක් නොවේ.



### බොදු බල සේනා සංවිධානයේ මහ ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර හිමි

සමහරු විවිධ නාට්‍ය චිත්‍රපට සඳහා භික්ෂු චරිතයකට පණ පොවන්න එම චරිතයට සාධාරණත්වයක් ලබා දිමට මෙමගින් උත්සාහයක් ගන්නවා. මෙම පැවිදිවීම ගැටලුවක් නැහැ. ඒ සඳහා තමයි තාවකාලිකව පැවිදි වෙන්නේ. මේ ආකාරයට සාමණේර අයුරින් පැවිදි වුණා කියලා භික්ෂුවකගේ ගණයට වැටෙන්නේ නැහැ. ශාසනය රැකෙන්නේ උපසම්පදා භික්ෂුවත් සමගයි. සාමණේරයන් ලක්ෂයක් හිටියත් වැඩක් නැහැ උපසම්පදා භික්ෂුවක් නැතිව. උපසම්පදාවට පත්වුවහොත් පමණයි භික්ෂුවක් විදියට පිළිගන්නේ. තමන්ට දවස් 10ක් සාමණේර අයුරින් ඉන්න අවශ්‍යනම් පන්සිල් සමාදන් වෙලා සාමණේර විදියට ඉන්න පුළුවන්. මේ සිද්ධිය ශාසනික විරෝධී ක්‍රියාවක්වත් සම්ප්‍රදාය විරෝධී කතන්දරයක්වත් නොවේ. ශාසනය රැකෙන්නේ උපසම්පදා භික්ෂුවත් සමගයි.

### තිනියාවල පාලිත හිමි



සනත් ගුණතිලක මහතා පැවිදි දම් පිරූ කාලය තුළ පන්සලේ ධර්මානුකූලව ජීවත් වූ අතර සිවුරට කිසිදු අගෞරවයක් සිදු නොකළේය. එසේම චාරිත්‍රානුකූලව වත්පිළිවෙත් පුරා පැවිදි දිවියට පත් හඟුරන්කෙත විමලරතන හිමියන් චාරිත්‍රානුකූල ලෙසම සිවුරෙන් ඉවත් වී උපැවිදි විය. මෙවැනි තාවකාලික පැවිදි වීම් බෞද්ධ ආගමික පසුබිමක් ඇති බොහෝ රටවල සිදුකෙරෙන අතර මෙම ක්‍රියාමාර්ගය සමච්චලයට ලක් කිරීම අසාධාරණයක්.



## ප්‍රසන්නට තවත් සම්මානයක්....

අගෝස්තු 23 වනදා සිට 26 වනදා දක්වා රුසියාවේ පැවති Sakhalin International Film Festival හිදී හොඳම චිත්‍රපටයට හිමි සම්මානය ප්‍රසන්න විතානගේ විසින් අධ්‍යක්ෂණය කරන ලද 'ඔබ නැතුව ඔබ එක්ක' චිත්‍රපටයට හිමි විය. තුන්වෙනි වරට පවත්වනු ලැබූ Sakhalin අන්තර්ජාතික සිනමා උළෙල සඳහා රුසියාව, ජපානය, කොරියාව, තායිලන්තය, පිලිපීනය, චෙක් ජනරජය, කසකස්තානය, ජර්මනිය හා ප්‍රංසය යන රටවල්වලින් චිත්‍රපට රැසක් ඉදිරිපත්ව තිබූ අතර තරඟකාරී අංශය නියෝජනය කරමින් චිත්‍රපට නවයක් තේරී තිබුණි.

මෙවර ලැබූ සම්මානයත් සමග මේ වන විට 'ඔබ නැතුව ඔබ එක්ක' විසින් හිමිකරගෙන ඇති අන්තර්ජාතික සම්මාන සංඛ්‍යාව පහකි. 43 වෙනි ඉන්දීය අන්තර්ජාතික සම්මාන උළෙලේදී හොඳම නිළිය ලෙස මෙම චිත්‍රපටයේ ප්‍රධාන නිළි චරිතය රඟපෑ අංජලී පටෙල් දිනාගත් සම්මානයද, ප්‍රංශයේ වෙසුල් අන්තර්ජාතික උළෙලේදී තරඟකාරී අංශය නියෝජනය කරමින් හොඳම චිත්‍රපටය ලෙස Cyclo d'Or සම්මානය සහ හොඳම ආසියාතික චිත්‍රපටයට හිමිවන නෙට්පැක් සම්මානයද , ඉතාලියේ මිලානෝ නුවර පැවති අප්‍රිකා, ආසියා, ලතින් අමෙරිකා අන්තර්ජාතික සිනමා උළෙලේදී සිග්නීස් සම්මානයද දිනාග ැනීම සෙසු අවස්ථා අතර වෙයි. මීට අමතරව ලෝකයේ සිනමා උළෙලවල් රැසක් නියෝජනය කිරීමේ අවස්ථාවද 'ඔබ නැතුව ඔබ එක්ක' චිත්‍රපටයට හිමිව තිබීම විශේෂත්වයක් වේ.

## කරුණාරත්න අබේසේකර හා මොහිදින් බෙග් ගුණ සැමරෙයි

කලාශූරී මොහිදින් බෙග් සහ කරුණාරත්න අබේසේකර යන කලාකරුවන්ගේ ගුණ සැමරීමේ උළෙලක් පසුගියදා කොළඹ 07 සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ ජාතික හා බෞද්ධ කටයුතු පිළිබඳ විමර්ශන මණ්ඩලය විසින් පවත්වනු ලැබුණි.

අඩසිය වසකට වැඩි කලක් බොදු ගීතය වෙනුවෙන් කලාශූරී මොහිදින් බෙග් මහතා විසින් ඉටු කළ කාර්යභාරය හා සිංහල ගීත කලාවට, සාහිත්‍යයට, සිංහල ගුවන් විදුලියට කරුණාරත්න අබේසේකරයන් විසින් ඉටුකළ කාර්යභාරය ඇගයූ මෙම උළෙලේදී ඔවුන් වෙනුවෙන් සමරු තිලිණ ප්‍රධානයක්ද සිදුකරනු ලැබුණි. මෙම උත්සවය වර්ණවත් කරමින් දේශාභිමානී උපහාර ගී ප්‍රසංගයක්ද පැවැත්වූ අතර මෙම උළෙල සඳහා මොහිදින් බෙග් මහතාගේ පවුලේ සාමාජිකයින් සහ කරුණාරත්න අබේසේකර මහතාගේ පවුලේ සාමාජිකයින් ඇතුළු ආරාධිතයින් රැසක් සහභාගි වී සිටිනු දක්නට ලැබුණි.

## දේශීය සිනමාවේ ප්‍රගතියට ඩිජිටල් තාක්ෂණය

දේශීය සිනමාව රැක ගැනීම උදෙසා සිනමා කර්මාන්තය ඩිජිටල් තාක්ෂණයට පරිවර්තනය කිරීමේ ප්‍රතිපත්තිය ළඟදීම ගෙන එන බව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා පවසා සිටියි. ඒ මහතා මේ අදහස් පළ කළේ මේ පිළිබඳව වූ සාකච්ඡාවක් අතරතුරදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රඹුක්වැල්ල මහතා, නවීන තාක්ෂණ දියුණුවත් සමග චිත්‍රපට සේයා පටල නිෂ්පාදනය කරන ලෝකයේ බොහෝ සමාගම් සේයාපටල නිෂ්පාදනයෙන් බැහැර වන හෙයින් දේශීය සිනමාකරුවන් හට අනාගතයේදී ගැටලුවලට මුහුණ පෑමට සිදුවන බව පෙනී යන බවත් සිනමා කර්මාන්තය රැක ගැනීමට නම් නවීන ඩිජිටල් පහසුකම් සඳහා යොමු විය යුතු බවත් පෙන්වා දුනි.

ලෝක සිනමාව නවීන ඩිජිටල්කරණයට යොමුව ඇති මේ යුගයෙහි දේශීය සිනමාව ඊට පිවිසීම මෙතරම් ප්‍රමාද වීම අඩුපාඩුවක් බව මේ සාකච්ඡාවට එක් වූ ප්‍රවීණ ශිල්පීන් විසින්ද පවසා ඇත. ඒ අනුව මේ සඳහා අවශ්‍ය කටයුතු නුදුරු අනාගතයේදීම සූදානම් කිරීමට සියලු කටයුතු යොදන බව අමාත්‍යවරයා පැවසීය.

## ස්වර්ණ පුස්තක සම්මානය 'කාල සර්ප' නවකතාවට

ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය මගින් පවත්වනු ලබන ස්වර්ණ පුස්තක සම්මාන උළෙලෙහි 2012 වසරේ ප්‍රකාශිත හොඳම නවකතාවට පිරිනැමෙන ස්වර්ණ පුස්තක සම්මානය කීර්ති වැලිසරගේ මහතා විසින් රචනා කරන ලද 'කාල සර්ප' නවකතාවට හිමිව ඇත. සුමිත්‍රා රාහුබද්ධගේ 'අත අත නෑර', කපිල කුමාර කාලිංගගේ 'කන්දේ වීදිය', මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ 'සෙංකොට්ටං', සමරවීර විජයසිංහගේ 'තැප්පා සේම ගිනි' මෙහිදී හොඳම කෘති පහ ලෙස ඇගයුමට ලක් විය.

2012 වසරේදී පොත් ප්‍රකාශකයින්ගේ සංගමය වෙත ලැබුණු කෘති 116 ක් අතරින් මෙම තෝරාගැනීම සිදුකර ඇත. මෙවර ස්වර්ණ පුස්තක සම්මාන විනිශ්චය මණ්ඩලයේ සභාපතිත්වය ආරියවංශ රණවීරයන් දැරූ අතර මහාචාර්ය අනුර වික්‍රමසිංහ, ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන, ආචාර්ය හර්ෂන රඹුක්වැල්ල හා ගාමිණී වියන්ගොඩ යන මහත්වරු සෙසු විනිසුරුවන් ලෙස කටයුතු කළහ. මෙවර ස්වර්ණ පුස්තක සම්මානය දිනාගත් කීර්ති වැලිසරගේ මහතා ප්‍රවීණ කෙටිකතා හා නවකතා කරුවෙකු ලෙස ශ්‍රී ලංකාවේ නමක් දිනා සිටින්නෙකි.

# 38 වන වරටත් පැවැත්වෙන ටොරොන්ටෝ අන්තර්ජාතික සිනමා උළෙල

ලෝකය පුරා චිත්‍රපට උළෙල රැසක් තිබුණද ඒ අතරින් මූලිකත්වය ගෙන ඇත්තේ කීපයක් පමණි. එයිනිදු ටොරොන්ටෝ අන්තර්ජාතික සිනමා සම්මාන උළෙලට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ලෝක සිනමා සම්මාන උළෙල ප්‍රමුඛතා නාමාවලියෙහි තෙවන ස්ථානය හිමිවීමෙන්ම මෙහි ඇති අගය ප්‍රකට වෙයි. මෙම ලැයිස්තුවෙහි පළමු ස්ථානය ප්‍රංශයේ කෑන්ස් සිනමා උළෙලටද, දෙවන ස්ථානය ඇමරිකාවේ සන්ඩාන්ස් සිනමා උළෙලටද හිමි වෙයි.

සෑම වසරකම සැප්තැම්බර් මාසයේදී පවත්වනු ලබන ටොරොන්ටෝ අන්තර්ජාතික සිනමා උළෙල 38 වන වරට මෙවර සැප්තැම්බර් 05 දා සිට 15 වනදා දක්වා පවත්වනු ලැබේ. මෙවර රටවල් 70 කින් තෝරාගන්නා ලද චිත්‍රපට 366 කට අධික සංඛ්‍යාවක් මේ සිනමා උළෙලට සමගාමීව ප්‍රදර්ශනය කෙරෙයි. සෑම වසරකම 400,000 ට අධික ප්‍රේක්ෂක සංඛ්‍යාවක් මෙම උළෙලට සහභාගි වීමද විශේෂත්වයකි.

1976 වසරේ The Festival of Festivals නමින් ඇරඹි මෙම උළෙලේදී එකල ප්‍රදර්ශනය වූයේ ලෝකයේ හොඳම චිත්‍රපට කීපයක් පමණි. පළමු චිත්‍රපට උළෙල සඳහා 35,000 කට අධික ජනතා සහභාගිත්වයක් පැවති අතර මුල් කාලයේදී තම චිත්‍රපට උළෙලහි ප්‍රදර්ශනයට ඉදිරිපත් කර ගැනීම සඳහා නිෂ්පාදකයින් හට මහත් පරිශ්‍රමයක් දැරීමටද සිදුව ඇත. නමුත් වසර කීපයක් ඉක්ම යත්ම එම තත්ත්වය වෙනස් වීමට පටන් ගති. ටොරොන්ටෝව වැනි අති ග්‍රාම්‍ය ප්‍රේක්ෂක පිරිසක් වෙත උසස් ගණයේ චිත්‍රපට ප්‍රදර්ශනයෙන් පළක් නොවෙතැයි අදහස් පළ කළ හොලිවුඩ් සිනමාකරුවන් මෙම උළෙලින් තම චිත්‍රපට ඉවත් කර ගැනීමට පෙළඹුණි. එහෙත් ඉදිරියට තැබූ පය පසුපසට නොගෙන ධෛර්යවත්ව ක්‍රියා කළ ටොරොන්ටෝ අන්තර්ජාතික සිනමා උළෙලෙහි සංවිධායකවරුන්, ගැලවී ගිය හොලිවුඩ් චිත්‍රපට වෙනුවට ලෝකයේ වෙනත් රටවල අග්‍රගණ්‍ය සිනමා පට තම උළෙල වෙනුවෙන් ගෙන්වා ගැනීමට කටයුතු සකස් කෙරුණි. අවසන සියලු මතභේද පසෙක ලා හොලිවුඩ් චිත්‍රපටද උළෙලෙහි ප්‍රදර්ශනය වීම ඇරඹි අතර මේ වන විට හොලිවුඩ්හි අලෙවිකරණ යන්ත්‍රය(marketing machine) බවට ටොරොන්ටෝ සිනමා උළෙල පත්ව සිටී.

තරඟකාරී හා තරඟකාරී නොවන අංශවලින් පැවැත්වෙන මෙම සිනමා උළෙල සඳහා හොලිවුඩ්, බොලිවුඩ් මෙන්ම ලෝකයේ සෙසු සෑම රටකින්ම චිත්‍රපට ඉදිරිපත් වේ. පසුගිය වසර කීපයේදී ශ්‍රී ලාංකේය සිනමා පට කීපයක්ම මෙම උළෙල සඳහා ඉදිරිපත් වුවත් මෙවර කිසිදු ශ්‍රී ලාංකේය චිත්‍රපටයක් මෙම උළෙල නියෝජනය නොකිරීම මහත් අඩුවක් ලෙස අපි දකිමු.

# MTV සම්මාන උළෙලේදී වසරේ හොඳම සංගීත වීඩියෝවට හිමි සම්මානය Justin Timberlake ගේ "Mirrors" දිනයි



බටහිර සංගීත ලෝකයේ සුපිරි තාරකාවන් පිරිවරා ගනිමින් වාර්ෂිකව පැවැත්වෙන MTV Video Music Awards සම්මාන උළෙල පසුගියදා නිව්යෝර්ක්හිදී පැවැත්වුණි. අගෝස්තු 25 දින පැවැත්වුණු මෙම උළෙලේදී සංගීත ලෝකයේ ජයකෙහෙළි නගමින් ලොව පුරා ප්‍රචාරය වන සංගීත රූප රචනා බොහොමයක් ඇගයුමට ලක් විය.

මෙහිදී වඩාත්ම කතාබහට ලක් වූ සංගීත ශිල්පියා ජස්ටින් ටිම්බර්ලේක් වූ අතර ඔහු විසින් ඉදිරිපත් කරන ලද "Mirrors" ගීතය අඩංගු රූප රචනාව වසරේ හොඳම රූප රචනාව බවට පත් විය. මීට අමතරව ඔහු විසින් තවත් සම්මාන හතරක්ද හිමි කර ගැනීමට සමත් විය. පසුගි ය පෙබරවාරි මස 11 වන දින Grammy Awards හිදී එළි දුටු 'මිරර්ස්' ගීතය ලෝකයේ බොහෝ රටවල්වල ගුවන් විදුලි නාලිකාවල ප්‍රචාරය වීමට පටන් ගැනීමත් සමග ඉමහත් ජනප්‍රියත්වයක් හිමි කර ගත්තේය. ඇමරිකාවේ Billboard Hot 100 වෙත මෙම ගීතය එළිදැක්වීමත් සමග පළමු සතිය තුළදී ගීතය අඩංගු සී. ඩී. තැටියෙහි අලෙවිය 163,000 ඉක්මවා තිබූ අතර මේ වන විට මිරර්ස් ලෝකයේ බොහෝ ගීත දර්ශකයන්හි අංක එකේ ගීතය බවට පත්ව ඇත.

ඇමරිකානු ජාතිකයකු වන ජස්ටින් ටිම්බර්ලේක් ව්‍යාපාරික ලෝකයේ ඉහළින්ම වැජඹෙන්නෙකු වන අතර සිනමා නළුවෙක්ද වෙයි.

# ඩොලර් 40,000 වටිනා බීබර්ගේ මාලය



පසුගි ය කාලය පුරා පුවත් මවන්නකු ලෙස ජස්ටින් බීබර්ට හිමිවූයේ ප්‍රමුඛ ස්ථානයකි. මත්ද්‍රව්‍ය භාවිතය, නොහොබිනා ඇසුරුකම් නිසා ඔහු පිළිබඳ පැතිර ඇති ඕපාදූප කතා නිමක් නැත. තවමත් 19 හැවිරිදි වියේ පසුවන මෙම දඩබ්බර ගායකයා වරෙක ඇමරිකාවේ ඔහායෝහි සමාජ ශාලාවක් තුළදී ඩී.ජේ සංගීතකරුවකුගේ මුහුණට කෙළ ගසා පරුෂ වචනයෙන් බැණ වැදීම නිසා එම පුද්ගලයා විසින් බීබර්ට විරුද්ධව නීතිය මගින් කටයුතු කිරීමට පවා සූදානම් විය.


සමාජ ශාලා ඇසුර ප්‍රිය කරන බීබර් පසුගි

යදා ටොරොන්ටෝ සමාජශාලාවකදී මුහුණ පෑවේ නොසිතූ විරූ අකරතැබ්බයකටයි. ඒ ඔහුගේ කර පැළඳ සිටි ඩොලර් 40,000ක් වටිනා රන් මාලය අතුරුදන් වී තිබීමයි. කම්කරු දිනය යෙදී තිබූ සති අන්තයේදී පාන්දර 3.00ට පමණ තම මාලය කරෙහි නැති බව බීබර් දැනගත්තද එය නැතිවූ වේලාව පිළිබඳ පැහැදිලි අදහසක් ඔහු තුළ නොමැත.

බීබර් වෙත මෙවැනි පාඩු සිදුවූ ප්‍රථම අවස්ථාව මෙය නොවෙයි. පසුගිය අප්‍රේල් මාසයේදී ජර්මනියේ සංගීත ප්‍රසංගයකට සහභාගි වීමට යන විට රැගෙන ගිය බීබර්ගේ සුරතල් වඳුරු පැටවා නිසා බීබර්ට ගෙවීමට වූ රේගු දඩය ඩොලර් 16,000 ක් බව පැවසේ. සුරතල් සතෙකු ජර්මනියට රැගෙන ඒමේදී කළ යුතු නීත්‍යනුකූල තත්ත්වයන් කිසිවක් බීබර් විසින් සිදුකොට නොමැති වීම නිසා මෙම දඩයට යටත් වීමට ඔහුට සිදුවිය.

කෙසේ වෙතත් වසරකට ඩොලර් මිලියන 58 ක ආදායමක් ලබමින් ලෝකයේ ප්‍රසිද්ධ පුද්ගලයින් ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවෙහි 9 වන ස්ථානයෙහි පසුවන ජස්ටින් බීබර් වැන්නෙකුට මෙවැනි පාඩු හා දඩ එතරම් ගණනක් නොවෙනු ඇත.

# 'LONG WALK TO FREEDOM'








මෙවර ටෙරොන්ටෝ අන්තර්ජාතික සිනමා උළෙලේදී ලෝකයේ ශ්‍රේෂ්ඨ නායකයකුගේ කතා පුවත ඇතුළත් චිත්‍රපටයක දොරට වැඩීම සිදුවිය. නොවැම්බරයේ සිට ලොව පුරා සිනමාහල් වෙත මුදා හැරීමට නියමිත මෙම චිත්‍රපටය 'Long Walk to Freedom' වේ.

දකුණු අප්‍රිකාවේ අසහාය නායක නෙල්සන් මැන්ඩෙලා විසින් තම චරිතාපදානය ඇතුළත් කොට ලියූ 'Long Walk to Freedom' (නිදහස සොයා දිගු ගමනක්) පොත ඇසුරෙන් නිර්මාණය කොට ඇති මෙම චිත්‍රපටය නිෂ්පාදනය කොට ඇත්තේ දකුණු අප්‍රිකානු නිෂ්පාදකයකු වන Anant Singh විසිනි. ගෝල්ඩන් ග්ලෝබ් සම්මානලාභී සිනමා නළුවකු වන Idris Elba මෙහි මැන්ඩෙලාගේ චරිතය නිරූපණය කරයි.

මින් වසර 15 කට පමණ පෙර අනන්ට් විසින් 'Long Walk to Freedom' කෘතියෙහි හිමිකාරත්වය ලබාගෙන ඇති අතර ඒ සඳහා බොහෝ වෙහෙසක් දැරීමට ඔහුට සිදුවී ඇත. පොතේ අයිතිය ලබාගැනීම වෙනුවෙන් සටන් කළ බොහෝ දෙනා අතරින් මැන්ඩෙලාගේ කැමැත්ත අනුව පොත ලබාදීමට නියමිත වූ තැනැත්තා අනන්ට් විය. පොත චිත්‍රපටයක් බවට පත්වීමේදී එයට මැන්ඩෙලා පදනමේ පූර්ණ සහයෝගය ලැබී ඇති අතර රූගත කිරීම් 2012 වසරේදී ආරම්භ වී ඇත.

'Long Walk to Freedom' කෘතිය කාණ්ඩ 2 න් සමන්විත වන අතර මෙහි සිංහල පරිවර්තනයක්ද ඇත.

# ආවර්ජනා

## ගී දැහැන



















පසුගියදා පවත්වන ලද ආවර්ජනා ගී දැහැන 3 වන පියවරෙහි අවස්ථා...

**ආවර්ජනා ගී දැහැන සංගීතවේදී සුනිල් ජයසිරිගේ ඉදිරිපත් කිරීමකි**















සේයා රූ සටහන රන්සිරිමල් ප්‍රනාන්දු

# 'පුංචි පත්තිනි...

35 වන පිටුවෙන්

කෙනෙක් නිසා මට කතා කළේ 'පුංචි පත්තිනි හාමුදුරුවො' කියලයි. මිනිහගෙ කවිවල සමුද්‍ර ඝෝෂ විරිත හරියටම තිබුණා. එහෙම ගැමියෙක් මට හමු වී නෑ"

"කොලුවො, උඹ ඇලපිලි පාපිලි කිසිවක්ම නැති කවියක් දන්නවාද?" තමා අසලම දැවටෙන ඒ රසාලිප්ත වදනින් වශීව සිටි පුංචි රෝහණ කොලුවාගෙන් බටගොඩපිස්සා අසයි.

**කර්දර් කලට ගල යට ඉඳගන කවට**
**නර්වර් බසට පණ යනවට කවට මට**
**හර්කට තණ කවන කටවට බලන විට**
**පර් පණ යන කලට බණ පද අසන වට**

බැලු බැල්මට මෙහි කිසිදු තේරුමක් නැති බවක් පෙනුණත් මෙහි ඇලපිලි පාපිලි නම් කිසිත් නැත. එහෙත් ගමේ කාගේත් අවධානය දිනාගත් බටගොඩ පිස්සාගේ සැලළිහිණියේ, ලෝකෝපකාරයේ, කවි ගායනාව අපූරුය.

රබන් උඩ දමා ඇල්ලීම හා පහතරට නැටුම් ශිල්පය මේ ගමට ආවේ කෙසෙල්හේනාව පැත්තට පදිංචියට පැමිණි විජේමාන්න පරම්පරාවෙනි. එම පවුල එගමේ පදිංචියට පැමිණ ඇත්තේ දෙයියන්දර ප්‍රදේශයෙන් බව බැද්දගේ කියයි.

ඒ කාලයේ මේ ගමේ තොවිල් බෙරයක් නෑසුණු සතියක් ගෙවී ගියේ නැත. දින තුන හතරකට වරක්වත් ඇඩ්වින් කට්ටඩියාට ගමේ තොවිල් නැටැවීමක් තිබිණ. සන්නි යකුන් කැඳවා පිස්සන් හා මායම් වූවන් මෝහනය කැර රාත්‍රිය මුළුල්ලේ නැටවීමට ඔහු තරම් දක්ෂයෙක් මේ ගම් තුලාන හතක් පීරුවත් සොයා ගත නොහැකි තරම් විය. පෙරේත ගොටු දීමටත්, මහසෝන් සමයමට විලක්කු බැඳීමටත් ඊගහ පසුපස යකුන් පැන්නීමටත් මේ ගුරුන්නාන්සේ දක්ෂයෙකි.

පරිසරයේ ඇති ගූඪභාවය හා කුප්පි ලාම්පු දුබල එළියෙන් පමණක් ගෙවන රාත්‍රිය රෝහණයන් තුළ දැනවූයේ බියකි. භයානක රසයකි. ඒ රසය පරදවා හිටිඅඩියේ ගමේ පැල් රකින්නකුගේ හේනකින් රසවත් සීපදයක් ඇසෙයි.

*කලාමැදිරියා යන කලට කරුවලේ*
*නිලා එළිය වැටුණායි උගෙ පියාසරේ*
*ළමා කටහඬක් ඇසුණායි ඒ අතරේ*
*තමා මන්ද ඔය හැටි කල්පනා කළේ*

රාත්‍රිය පුරා පන්වලින් විසිතුරු රටා පැදුරු වියන්නෝද, වට්ටි පෙට්ටි වියන්නෝද, වෙනත් විසිතුරු කර්මාන්තවලට එක්වූවෝද රාත්‍රිය පුරා හුවමාරු සීපද කියති. ඒවාද පුංචි කොලුවාගේ රස කුහුල පාදන අවස්ථාවක්ම වීය.

ගමේ පන්සලේ මල්මුරේ පින්කම් කාලෙට විශේෂයෙන් වස් තුන්මාසේ ගමේ කොලු රෑන වැඩිමනත් සිටින්නේ පන්සලේමය. ඒ කාලය නොයෙක් සල්පිල් පන්සල ඉදිරිපිට ඉදිවෙයි. මෙහිදී ගමේ ළමා ළපැටින්ට මෙන්ම වැඩිහිටියන්ටද ඉතාම පුණ්‍යවන්ත කාර්යයක් කිරීමට සිදුවන අතර ප්‍රීතිමත්ම කාලයක් ලෙසද පිළිගැනෙයි.

"බස්තියන් මහප්පා කතුරු ඔන්චිල්ලාව බඳින්න පටන් ගන්නේ අලුත් අවුරුද්දට. තනිකර හොර ලීයෙන් තමයි ඔන්චිල්ලාව සකසන්නේ. මඩේ දාලා කාලයක් තිබිලා පදම් වන මේ ලී හරිම ශක්තිමත්. මේ ලී වරපට ලෙස ගන්නේ කැළේ ගස්වල පට්ටා. ඒවා ලුණුවලට වඩා සවිමත්" රෝහණයෝ කියති.

එක් එක් ගමට අනන්‍ය වූ විවිධාකාර දේ තිබේ. හතරකෝරළයේ කොටහලු ගෙදරක කොටහලු කවි ගැයුණු අතර එසේ ගැයූ කොල්ලාට කොටහලු කොල්ලා යැයි නම් වහරක්ද තිබිණි. එසේම මේ ගමේ කතුරු ඔන්චිල්ලා කවිපද මෙගම් තුලානට පමණක් සුවිශේෂ වූවකි. "කතුරු ඔන්චිල්ලා කවියක් මතකයට නගමුද?" මම බැද්දගේට ඇරයුම් කරමි.

"ඔව්, මට මතකයි මහප්පා ඒවා ගයන හැටි. රළු ගොරෝසු සාගර ජල තරංග පරයන හඬින් ඒවා ගම් පියසේ පා වෙලා ගියා. ඒත් ඒ ගායනා විලාස හරියටම ඒ අවස්ථාවට ගැළපුණා. මම දන්නා විදියට කියන්නම්"

**අහසත් පොළොවත් ඉරසඳ සමඟින්**
**වලාකුළෙන් වට කර බැන්දෙන්**
**දහසක් සක්වල වට කර බැන්දෙන්**
**මිතුරේ රබනුන් සිතට ගනින්**
**මහසත් විමනේ ගවිතිස් ගණනින්**
**නාදය හිරකර වට බැන්දෙන්**
**මහතත් දුර දිග බලලා මිතුරේ**
**තහන්දි සවුදම ලෙහෙලා දියන්**

මහ රබානේ පදත් සමඟ පද සමූහයක් යොදා ගනිමින් මේවා ගැයිණ.

ගම් පුරාණය තව තවත් සොයා කිමිද යාමට මට සිතේ. මම ගමේ පැරැණි වැඩිහිටියකු සොයා ගතිමි. කරෝලිස් නමැති අවුරුදු 78 ක් වන මේ වැඩිහිටියා ඉතා ඕනෑකමින් අපට සවන් දුන්නේය. එසේම කරුණු කීවේය.

"අප කවුරුත් ගියේ ගමේ ඉස්කෝලෙට. ඒත් 5න් පස්සෙ අපට ගමෙන් ඈත හඳපාන්ගොඩ වගේ තැන්වලට යන්ඩ සිද්ධ වුණා. අපි ගියේ කඳු ළඳු නැඟගෙන ඇළ දොළ පහුකරන්. දැන් වගෙ පාර තොට නෑනේ. පන්සල් කන්දට එපිටහින් තිබුණු උඩුව රජයේ ආදර්ශ ගොවිපළේ හොරෙන් වෙරළු කඩන්ඩත් අපි ගියා. එදා මේ රෝහණත් අප සමඟ ඇවිත් ගහේ මුදුන් අත්තට නැංගා. ඒකෙන් හදිසියේ මෙයා ලිස්සා වැටුණෙ නැතෑ. විනාඩි ගණනක් හුස්ම අල්ලාගන්ඩ බැරිව බිම වැටිලා හිටියා. එයා කන්දේ ලන්දේ වැනි ගීත ගයන්නේ මේ වගේ ඒවයේ කරක් ගහලා ගත්තු අත්දැකීම් එක්ක"

"මේ ගමේ ඒ කාලෙ දොඩම් වගාව හොඳට තිබුණා. බුලත් වගාව තිබුණා. දැන් ඒවා අඩුයි. රේස් කරත්තවලට හරක් හුරු කරන අවස්ථා බලන්ඩ තමයි අපේ කොලු නඩේ කැමැති. දඟ හරක් වෙට්ටු දාලා පනින හැටි. පුරුදු කරන්නො පසුපස පන්නන හැටි. බලා ඉන්ඩ ආසයි"

"මේ පළාත රයිගම් බණ්ඩාරගෙ. එදා පත්තිනි දේවාලයට අවශ්‍ය බඩු භාණ්ඩත් අරන් පරංගියාවෙල කියලා ටිකක් එහායින් තියෙන වෙල් යාය හරහා කොරතොට පරම්පරාවක කපු මහත්මයෙක් මේ නාරායන දේවාලය පැත්තට එමින් හිටියා. එයා ලංකාවේ සීතාවක අංගම්පොර පරම්පරාවක දක්ෂ සටන් ශිල්පියෙක්. පරංගින් කීප දෙනෙක් මේ කපු මහතා ලුහුබැඳ ඇවිත් නැවතුණා. ඒත් අවසන් පරංගි යා හැරෙන්නෙ නැතුවම කපු මහතා පන්නාගෙන එනකොට වෙල්යායෙදි අංගම්පොර හටන් පෙන්නලා වෙලේ එබුවා. ඒ නිසයි ඔතැන 'පරංගි යාවෙල'නම ලැබුවෙ. නාරායන දේවාලය ළඟදි රයිගම් බණ්ඩාරගෙ ඇමැතියෙක් කපු මහතාට ආරක්ෂාව දුන්නා"

"මෙහි බඩදරු මවුන් රාත්‍රියට ගෙදරින් දොරට බහිද්දි දෑකැත්ත අරන් එළියට එන්නේ ඇයි?" මම මෙගම පිළිබඳ අසා ඇති අභිචාරයන් ගැන කරෝලිස්ගෙන් විමසමි.

"මේවා අදත් තියෙනවා. පැරැන්නො තමයි වැඩියෙන්ම කළේ. අපේ කිරි හරක් පට්ටිවල පැටවු හංගන යකෙක් හිටියා. ඒකට වෙලාවට පුද පූජා නොදුන්නොත් පැටවු හැංගුවා. පූජාව දුන්නු ගමන් පැටවු කැළයෙන් එළියට දානවා. මේවා නැතැයි කීවට ඕනැතරම් තිබුණා. ගැහැනුන් බඩදරු අම්මලා දෑකැත්ත අරන් එළියට ගියේ මහසෝනට බයේ. ඒකෙත් කතාවක් තියෙනවා. මහසෝනා දවසක් කමතක් මැද්දෙන් යනකොට අමතක වී දාලා ආපු දෑකැත්තක් හමුවුණා. ඌ කොහොමත් සෙල්ලක්කාරයා. මේ නැවිලා තිබෙන දෑකැත්තේ යකඩය කෙළින් කරන්ඩ හිතාගෙන වෙර වීරිය අරන් මුවහත් පැත්තෙන් ඇද්දා. අත කැපුණා. ඒ වතාවෙ පයේ විලුඹ තියලා එහෙම කෙළින් කරන්ඩ ඇද්දා. ඒ වතාවෙ විලුඹත් කැපුණා. එදා ඉඳන් මහසෝනා දෑකැත්තට බයයි. ඒ ඇරෙන්ඩ වෙනත් ආයුධයකට එයා බය නෑ"

කරෝලිස් ගමේ කෝලම් කුට්ටම, ගරා යකුම, පත්තිනි දේවියට කරන දාන ගැන කතා කළ ආකාරයෙන් ඔහු අභිචාරයෙන් ඔද වැඩුණු ගැමියකු බව පෙනිණ. ගමේ සමාජ හැසිරීම අධ්‍යයනය කරන්නට මට ඔහු සම්පතකි.

රෝහණයන් සමඟ තවත් ගමේ ප්‍රභූ චරිතයක් සොයා ගැනීම මගේ ඊළඟ අරමුණ විය. හොරණ ප්‍රධාන මංසන්ධියේ ආයුර්වේද ශාලාවක් පවත්වාගෙන යන ආයුර්වේද වෛද්‍ය උදේනිස් අලුත්ගේ මට අමතක කළ නොහැකිය. ඔහු කී කතාවේ සංක්ෂේපයක් සටහන් කරමි.

"එදා මේ ගමේ මහා කෘෂි ආර්ථිකයක් තිබුණා. හැම මිනිහෙක්ම සම්පූර්ණ මිනිහෙක්. ඒ හැම මිනිහටම වතු වැඩ, වඩු වැඩ, මේසන් වැඩ, තොවිල් වැඩ, පන්සල් වැඩ, පින්කම් පොළේ වැඩ, ගෙපළ කපන්ඩ, පස් අදින්ඩ මේ හැමදේම පුරුදුයි. ඒ කෘෂි ආර්ථිකයේ හිටපු ශක්තිමත් සදාචාර මිනිස්සු නිසා ගම රැකුණා. කට්ටඩි වැඩටත් දක්ෂ අය හිටියා. ලේ තාලි තීන්දුව කියන භයානක යාතු කර්මය කරන්ඩ දක්ෂයො හිටියා. හූනියම කපා ඉවර වුණාම පුහුලෙන් ලේ ගලනවා. එදා සිංහල වෙදකමට මිනිස්සු මේකෙ පිරිලා හිටියෙ. මං පයෝධර පිළිකා හොඳ කරලා තියෙනවා. මිනිසුන්ගේ ගඳ ගහන තුවාල සනීප කරලා තියෙනවා. මහත්තයො විශ්වාස කරන්ඩ මං ලියුකේමියාවත් සුව කරලා තියෙනවා. මේ රෝහණ ළමයා අපේ ගමේ සේසත. මේකා හරිම බඩුව" (ඔහු සිනාසී එසේ කියයි) එහි තේරුම ගමේ ඕනෑම වැඩකට, ගොයම් කයියකට, මගුලකට, පිරිතකට, මල්මුර පින්කමකට, නැතුවම බැරි මිනිහෙක් යන්නය.

එහෙත් ඒ සොඳුරු ගම අද වෙනස් වෙමින් තිබේ. ඒ ගැන රෝහණයන්ට ද ඇත්තේ ශෝකාලාපයකි. ඔහු තම ගම ගැන දීර්ඝ කවි පන්තියක් ලියයි. එහි මුල් කොටසේ ගමේ සිරියාව, ලස්සන, පිහිටීම ගැන යමක් කියැවේ. මතු දක්වන්නේ ඉන් සුළු කොටසක් විදාරණය වන හැඟීම්වල ශේෂයකි. මේ බැද්දගේ ලියන අද ගමය.

**ගැමි වහරට අනුව - උඩ වැව ඇසුරු කොට ගෙන**
**ගම හැඳින්වීමේදී - උඩුව යනුවෙන් වෙනස් වී ඇත**
**මෙගම ඉපදුණු මට - බුදු දහම හා ගොවි කම**
**දෙපස සිට එක සේ - සවිය දුනි දිවි මග සැකසුමට**

**එදා සිටි සැදැහැති - ගැමියන් අද ගමේ නැත**
**එදා මට ළෙන්ගතු - වූ දැහැමි පරිසරය අද නැත**
**කමතේ පැලේ සිට - වෙල් යාය පසු කොට ගෙන**
**මුළු ගම සිසාරා - ඇසුණු සීපද රාව අද නැත**

**නිතැතින්ම බිහි වන - සීපද හඬ රටාවන්**
**රැව් දෙවනට තරම් - සමත් ගැමියකු අද ගමේ නැත**
**නෙලුම් ගී සීපද - කමත් කවි මල් වාරම්**
**කතුරු ඔන්චිලි කවි - රබන් කවි ඈ අද කිසිත් නැත**

**මල්, ගිනි, කොට ලෙසින් - තාල කැපුමෙදි කී කවි**
**පෝරුවේ අෂ්ටක - ශ්ලෝ කියනට අද කෙනෙක් නැත**
**වාම් දිවි පෙවෙතෙහි - ගත සිත සැහැල්ලුව සිටි**
**ගැමියන් නැසී ගොස් - උපන් විසිතුරු පරපුරක් ඇත**

**මා හැර දමා ගිය - වැඩිහිටි පරපුරෙන් ලද**
**නිමැවුම් රටට දී - ඔවුන් ගුණ සිහි කරමි, පින් දෙමි**
**ගමේ හෝ ඉන් පිට - කිසිවෙකු කෙරෙහි මා තුළ**
**කිසි ලෙසකින් උපන් - ද්වේශයක් හෝ වෛරයක් නැත**

**මේ ගම හොඳයි මට - ගුණ මකු නොවෙමි කිසි විට**
**හිත හොඳින් ගත කොට**
**මියෙමි දිවි ඇති තෙක්ම මෙහි සිට**

# කොමඩු ඇටය ...

34 වන පිටුවෙන්

මිතුරාගේ සුරත සොටු තලියකින් වසා දැමුවේය. මෙතෙක් වේලා නිහඬව හා නිසලව නරඹමින් හුන් දරුවෝ උස් හඬින් සිනාසෙන්නට වූහ.

පිළිකුලින් මුහුණ හකුලා ගනිමින් නැඟී සිටි මිතුරා "ම... මට පරක්කු වෙනව මං යන්නං" යි කියමින් වතුර සොයා දිව්වේය.

"බලනව කරපු දේ... අර මනුස්සයගෙ අත පුරාම හොටු..."

සමන්ත මද්දුමයා දෙස රවා බැලුවේය. නොකඩවා කිවිසුම් ඇරීමෙන් විඩාපත් දරුවාගේ අසරණ බව දුටු මට වැළපෙන්නට සිත් විය.

"කෝකටත් හොඳයි නේද ඉස්පිරිතාලෙ එක්ක යන එක..." තවත් මිතුරෙක් එසේ පවසමින් පිටව ගියේය.

"සේනපුර ඉස්පිරිතාලෙන් අනුරාධපුර අරිද දන්නෙත් නෑ...."

සමන්ත පරාජිත හඬින් කොඳුළේය.

"යමු... යමු... ලොකු කෙනෙක් වගේ නෙමේ... පොඩි ළමයනෙ...."

තවම පිටව නොගිය අවසන් මිතුරා එසේ කී කල මට මහා සැනසුමක් දැනිණ.

"කොමඩු ඇටේ පැළවෙයිද අම්මා?"

මද්දුමයා යතුරු පැදියට නගින්නට පෙර ඇසුවේය.

"නෑ පුතේ...." මම ඔහු වැළඳ ගතිමි.

"ඉක්මනට නගිනවා ඉඹින්න නං කාට බැරිද? ළමයි වදන එක නෙමේ හපංකම හරියට හදන එක..."

සමන්ත කෝපයෙන් බෙරිහන් දුන්නේ ය. යතුරු පැදියේ හඬද ඒ කෝපාවිෂ්ට හඬද එකට එක්ව මට පහර දුන්නේය.

"මද්දුවා මැරෙයිද අම්මා ?"

නිවුන්නු එක්වන්ව ප්‍රශ්න කළෝය.

"නෑ...." මම බිදුණු හඬින් කීමි.

"තාත්ත මොකටද අම්මට බනින්නෙ? අම්ම මොනා කරන්නද...?"

ලොක්කා සිය කෝපයද අප්‍රසාදයද පළ කෙළේය.

"නෑ පුතේ.... තාත්තට හරියට වැඩනෙ. ඉතිං ඔයාලට මොනාහරි කරදරයක් වුණාම තාත්තට තරහ එනවා. තාත්ත ඔයාලට හුඟක් ආදරෙයිනෙ පුතේ....."

පොඩ්ඩා මා දෙස බලා සිටියේ පුළුල් කරගත් දෑසිනි.


"අම්මද මද්දුවගෙ නායට කොමඩු ඇටේ දැම්මේ...?"

බඩපිස්සා හිස ඇල කරමින් ඇසුවේය. ඕනෑම කෙනකු හට සිපය ගන්නට හිතෙන තරමට ඒ ඉරියව්ව සුරතල් විය.

"ඔව්.... ඒකනෙ තාත්ත අම්මට බැන්නෙ..."

හතරවැනියා හිස වැනුවේ දැන මුත්තකු මෙනි. කුමක් කිව යුතුදැයි සිතාගත නොහැකිව මම වට පිට බැලුවෙමි.

කළු පැහැයට හුරු, මඳක් දිලිසෙන කොමඩු ඇට ඉස්තෝප්පුව පුරා පතිතව තිබිණි. ඒවා සියල්ල තලා දැමීමේ නොඉවසිල්ලෙන් මගේ දෑත නලියන්නට විය.



# කැනඩා රජය මගින් ඔබට ලැබෙන ප්‍රතිලාභ, ඒ සඳහා සුදුසුකම් ලබන අයුරු සහ එම ප්‍රතිලාභ ගණනය කරන ආකාරය

## Benefits from Canadian Government Eligibility Criteria and Calculation

# CANADA TAX

උක්ත මාතෘකාව යටතේ 2013 අගෝස්තු කලාපයෙන් ඔබ දැනුවත් කරනු ලැබූ Canada child tax ප්‍රතිලාභය සම්බන්ධයෙන් වූ ඉතිරි කොටස සහ අනෙකුත් ලැබිය යුතු ප්‍රතිලාභයන් සම්බන්ධව මෙවර කලාපයෙන් අපි දැනුවත් වෙමු.

### 1. Canada child tax benefit(CCTB)

ඔබ කැනඩාවට පැමිණි පළමු වර්ෂයේ Canada child tax benefit ප්‍රතිලාභය ලැබීම සඳහා RC66 ෆෝරම පුරවා ඉදිරිපත් කළ යුතු බව දැන් ඔබ දන්නා කරුණකි. ඉන්පසුව තම පවුල් ඒකකයේ ආදායම මත කොපමණ ප්‍රමාණයක් CCTB ප්‍රතිලාභය ලබන්නේද යන්න තීරණය වන අතර එම ආදායම තම වාර්ෂික බදු වාර්තාව මගින් කැනඩා ආදායම් ඒජන්සිය(CRA) තීරණය කරනු ලබයි.

මෙය මූලික දීමනාව සහ අතිරේක දීමනාවක් එකතු වීමෙන් සැකසෙන අතර පවුල් ඒකකයේ සිටින දරුවන් සංඛ්‍යාව අනුවද වෙනස් වේ.

Canada child tax benefit හි අඩංගු මූලික දීමනාව පවුල් ඒකකයේ ආදායම / 43,561 ට වැඩි වන විට වැඩි වූ ප්‍රමාණයෙන් 2% ක ප්‍රතිශතයකින් අඩු වන අතර අතිරේක දීමනාවට බලපාන අවම ආදායම් සීමාව / 25,356 කි. (2013-14 වර්ෂය සඳහා) මෙම අතිරේක දීමනාව පවුල් ඒකකයේ ආදායම් සීමාව ඉක්මවීමේදී එක් දරුවෙක් සිටින පවුලක් සඳහා 12.2% ක ප්‍රමාණයකින්ද දරුවන් දෙදෙනෙක් සිටින පවුල් ඒකකයකදී 23% කින්ද දරුවන් තිදෙනෙක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරුවන් සිටින පවුල් ඒකකයකදී 33.3% කින්ද අඩු කරනු ලබයි.

යම් කිසි අවාසනාවන්ත සිදුවීමකින් CCTB ප්‍රතිලාභය ලබන්නා(සාමාන්‍යයෙන් පවුල් ඒකකයක මෙම ප්‍රතිලාභය ගෙවනු ලබන්නේ දරුවන්ගේ මව වෙතය) මියගියහොත් ඒ පිළිබඳව වහාම කැනඩා ආදායම් ඒජන්සිය(CRA) දැනුවත් කළ යුතු අතර දරුවන් ඉන්පසුව රැකබලා ගනු ලබන පුද්ගලයා කවුරුන්ද යන්නත් ඔහුට/ඇයට දරුවන්ගේ සම්බන්ධය කුමක්ද යන්නත් දැන්විය යුතුවේ. දරුවන් රැක බලා ගනු ලබන පුද්ගලයා දරුවන්ගේ පියා නොවන අවස්ථාවලදී නව RC 66 ෆෝරමයක් නැවත පුරවා CRA වෙත ඉදිරිපත් කළ යුතු වේ.

අදාළ දරුවන් රැක බලා ගැනීම ඔබගෙන් ඉවත් වන අවස්ථාවන්හිදී ඒ පිළිබඳවද වහාම CRA දැනුවත් කළ යුතු අතර එම ප්‍රතිලාභය ලැබීමට එතැන් සිට ඔබ සුදුසුකම් නොලබයි.

ඔබගේ විවාහක තත්ත්වය වෙනස් වන අවස්ථාවකදී එනම් වෙන් වීමකට තීරණය කළ අවස්ථාවකදී (separation) හෝ දික්කසාදයකදී(divorce) ඒ පිළිබඳව එම වෙනස්වීම සිදුවන දිනට අදාළ මාසයට පසු මාසයේ අවසාන දිනට ප්‍රථම CRA දැනුවත් කළ යුතු අතර මෙය RC 65 ෆෝරමයක් මගින් සිදුකළ හැකිය.

මෙහිදී දරුවන් රැක බලා ගැනීමේ වගකීම කවුරුන් වෙත පැවරී ඇද්ද යන්න CRA විමසා බලනු ඇත.

| CRA-Benefit payment dates - 2013 | | |
|---|---|---|
| Benefit | Last | Next |
| Canada child tax benefit (CCTB) | August 20, 2013 | September 20,2013 |
| GST/HST credit | July 05,2013 | October04,2013 |
| Universal child care benefit | August 20, 2013 | September 20,2013 |
| Working income tax benefit | July 05,2013 | October 04,2013 |
| Ontario Trillium benefit | September 10,2013 | October 10,2013 |

### 2. Shared Custody-Child Tax Benefit

දරුවන් රැක බලාගැනීම දෙදෙනා විසින්ම සිදුකරන අවස්ථාවලදී දෙදෙනා වෙත CCTB බෙදා වෙන්කර දීමටද CRA සාධාරණව 2010 වර්ෂයේ සිට ගණන් බැලීම සිදු කරන ලදී. මෙම තත්ත්වය යටතේ ඒ ඒ පුද්ගලයා දරුවන් රැක බලා ගැනීම සිදුකරන කාල පරිච්ඡේදය අනුව CCTB ඒ ඒ අදාළ පුද්ගලයින්ට ගෙවීම සිදුකරනු ලබයි. මාසික ප්‍රතිලාභය වුවද දෙදෙනා අතර බෙදාගත හැකිවේ.

මේ පිළිබඳව CRA දැනුවත් කිරීම පහත ලේඛන මගින් තහවුරු කළ හැකි වේ.

1. දරුවාගේ පාසලේ හෝ පෙර පාසලින් ලබා ගන්නා ලද සහතික කරන ලද ලිපියක්
2. පවුලේ වෛද්‍යවරයා හෝ නීතිඥවරයෙක් විසින් සහතික කරන ලද ලිපියක්
3. සහතික කරන ලද උසාවි නියෝගයක්
4. දරුවා සහභාගි වන ක්‍රියාකාරකම් සඳහා ගෙවන ලද රිසිට් පතක්

ඔබ සහ ඔබගේ පවුලේ අය කැනඩාවේ ස්ථිර පදිංචියට පැමිණි පසුව කිසියම් හදිසි අවශ්‍යතාවක් මත නැවත තම මවුරටට යෑමට සිදුවුවහොත් සහ නැවත ආපසු පැමිණීමට කාලයක් ගතවුවහොත් කැනඩාවේ නොසිටි කාලය සඳහා දරුවන් CCTB ලැබීමට හිමිකම නොලබන අතර යම් හෙයකින් දිගටම CRA විසින් ගෙවීම් සිදුකරනු ලැබුවේ නම් එම මුදල ආපසු ගෙවීමට සිදුවේ. මෙහිදී CRA වෙත දැනුම් දීමකින් වාර්ෂික වශයෙන් ආපසු ගෙවීමේ පහසුකම්ද සලසා ගත හැකි වන නිසා ඒ පිළිබඳවද එවැනි අවස්ථාවල සැලකිලිමත් විය යුතු වේ.

### 3. Ontario Trillium Benefit

මෙය ඔන්ටාරියෝ ප්‍රාන්තයට පමණක් සීමා වූ ප්‍රතිලාභයක් වන අතර 2010 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබූවකි. ඊට පෙර වර්ෂවල ඔබ වෙත ගෙවූ ප්‍රතිලාභයක් වන විකුණුම් බදු ප්‍රතිලාභය(sales tax credit) සමග ඔන්ටාරියෝ ප්‍රාන්තයට අදාළ විදුලි බලය සහ නිවාස දේපළ වෙනුවෙන් ගෙවන බදු කුලී සඳහාද ප්‍රතිශතයක් එකතු කරමින් ඔබ වෙත වැඩි ප්‍රතිලාභයක් මෙමගින් ලබා දීමට ඔන්ටාරියෝ ප්‍රාන්ත රජය කටයුතු කර ඇත.

2010 වර්ෂයේ සිට මෙය මාසිකව ගෙවූ ප්‍රතිලාභයක් වුවද 2013 වර්ෂයේදී ඔබගේ ආදායම් බදු පිළියෙල කරන අවස්ථාවේ මෙම ප්‍රතිලාභය මාසිකව ලබා ගන්නවාද එක්වර ලබා ගන්නවාද යන්න ඔබට තීරණය කළ හැකි වන අතර එක්වර ලබාගැනීමට තීරණය කරන අවස්ථාවක 2015 ජූනි මසදී එය ඔබ වෙත ලබාදීමට කටයුතු පිළියෙල කරමින් පවතී.

මෙම ඔන්ටාරියෝ ට්‍රිලියම් ප්‍රතිලාභය සඳහා සුදුසුකම් ලැබීමට අවුරුදු 19 ට වැඩි සියලුම ඔන්ටාරියෝ වාසිකයන් සුදුසුකම් ලබන අතර එක් පවුල් ඒකකයක අවුරුදු 19 ට වැඩි දරුවන් සිටී නම් ඔවුන්ට වෙන වෙනම මෙම ප්‍රතිලාභය ලැබෙන අතරම පවුල් ඒකකයකටත් වෙනමම ලබා දෙන්නකි.(එනම් දෙමාපියන් සහ අවුරුදු 18 අඩු දරුවන් වෙනුවෙන් එම පවුල් ඒකකයටම)

**ඔන්ටාරියෝ** Trillium Benefit **ගණනය කරන අයුරු**

මෙම ගණනය සඳහා උපරිම ආදායම් සීමාව ලෙස දරුවන් නොමැති තනි පුද්ගලයෙකු නම් $ 21,411 විවාහක දරුවන් සිටින තනි පුද්ගලයෙකු නම් $ 26,763

A. ඔන්ටාරියෝ විකුණුම් බදු ප්‍රතිලාභය(OSTC)
මූලික දීමනාව $278
සහකරු/සහකාරිය සඳහා ප්‍රතිලාභ $278
දරුවන් සඳහා ප්‍රතිලාභ $ 278 x දරුවන් ගණන XXX

B. ඔන්ටාරියෝ බලශක්ති හා දේපළ බදු ප්‍රතිලාභය (OEPTC)

i. පදිංචිය සඳහා ගෙවූ ප්‍රතිලාභය
එම වසරට ගෙවූ ගෙවල් කුලී x 20% = XXX
එම වසරට ගෙවූ දේපළ බදු(property tax) = XXX
ශිෂ්‍ය නේවාසිකයින් සඳහා දීමනාව = $ 25
පදිංචිය සඳහා වූ පිරිවැය(occupancy cost) XXX

ii. බලශක්ති ප්‍රතිලාභය සඳහා කොටස (Energy Components)
දිගුකාලීන රැක බලාගැනීමේ මධ්‍යස්ථානයකට(Long term care home) ගෙවන මුදලක් වූයේ නම්
XXXX 20% = XX
සහ
පදිංචිය සඳහා ගෙවන ප්‍රතිලාභ = XX
(ඉහතින් ගණනය කළ පරිදි එකතුව)
ඉහත එකතුව හෝ $ 214 න් අඩු අගය XXX

iii. නිවාස දේපළ සඳහා කොටස(Property tax component)

පදිංචිය සඳහා වූ පිරිවැය X 10% = XX
(ඉහතින් ගණනය කළ)
අවුරුදු 65 ට අඩු පුද්ගලයෙකු සඳහා උපරිමය $ 695
අවුරුදු 65 ට වැඩි පුද්ගලයෙකු සඳහා උපරිමය $ 429
අමතර දීමනාව - 65 ට අඩු පුද්ගලයෙක් සඳහා $ 54
65 ට වැඩි පුද්ගලයෙක් සඳහා $ 455
XXX

C. ඔන්ටාරියෝ උතුරු කොටස සඳහා ලබාදෙන ප්‍රතිලාභය (Northern Ontario Energy Credit) NOEC

ඉහත සඳහන් සියලු ප්‍රතිලාභ එකතුව XXX

මෙම එකතුව මාස 12 කට බෙදා දැනට ගෙවනු ලබන අතර 2014-2015 සිට අපගේ කැමැත්ත අනුව එක්වර ගෙවීමටද ඔන්ටාරියෝ ප්‍රාන්තය සැලසුම් කර ඇත. මෙම තෝරා ගැනීම 2013 අපගේ ආදායම් බදු පිළියෙල කිරීමේදී තීරණය කිරීමට ඉඩ දීමට සැලසුම් කර ඇත.

සිරි ගමගේ සහ ශ්‍රියානි ගමගේ
GS Accounting ආයතනය
Office: #210- 1560 Brimley Road,
Scarborough ON M1P 3G9
Tel: 647-352-1560,
Fax: 647-352-1561
Cell: 416-571-4270
Email: gsaccounting@ymail.com
Web: www.gsaccounting.ca
Res: 1274 Warden Avenue,
Scarborough ON M1R 2R6
Tel: 416 -331- 8349

# WANT TO BE A DOCTOR?

*THEN CONSIDER*

## ALL SAINTS UNIVERSITY
SCHOOL OF MEDICINE

**416-839-6461**

LAST 2 YEARS **(CLINICAL ROTATIONS)** OF EDUCATION COMPLETED AT TEACHING HOSPITALS IN **USA & CANADA**

2 CAMPUSES TO CHOOSE: **DOMINICA ST. VINCENT**

PROVISIONAL ADMISSION WITH MIDTERM MARKS












## NOW ENTER DIRECTLY FROM HIGH SCHOOL TO MEDICAL SCHOOL

**MD DEGREE PROGRAMS**

**3** year 4 months for BSc Graduates

**4** year 8 months for High School Graduates (includes Premedical Program)

Apply Online @ www.allsaintsuniversity.org or allsaintsu.org

FOR MORE INFORMATION IN SINHALA & TAMIL CALL:
**416-839-6461**
**416-743-9222**

Attend one of our upcoming information seminars.

*Faculty, Students & Alumni will be present to answer any questions.*

**23** SAT FEB. | '13
RADISSON TORONTO EAST
55 Hallcrown Place
(Victoria Park & 401)
Toronto, ON M2J 4R1

**16** SAT MAR. | '13
QUALITY HOTEL
2180 Islington Ave.
(Islington & 401)
Toronto, ON M9P 3P1

**20** SAT APR. | '13
BEST WESTERN
38 Estate Drive
(Markham & 401)
Toronto, ON M1H 2Z1

**up to 50% scholarship for first 3 years of academic study**

**Enrolment for May & Sept. 2013 are currently in progress**

**Canadian Admissions**
**5145 Steeles Ave. West**
**Entrance C Suite 223**
**Toronto, ON**
**416-743-9222**




## JOB JOB JOB

Are you looking for an opportunity in the financial industry?
Full-time and part-time positions are available. If you are interested please send your resume to
**ashawije18@yahoo.ca**

## New Focuses Tech Solutions

All Your Publishing Needs at One House

**Computor Repairs**
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

**Web Sites**
Web Design, Website Development, Webhosting(Linux & Windows), Shopping Cart Systems.....

**Graphics**
Illustrations, Logos, Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

**ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා**

Tel : 416 201 0628 Email : s@newfocuses.com

## අගනා ඉඩමක් විකිණීමට

කුරුණෑගල-මීගමුව ප්‍රධාන පාරේ කුරුණෑගල නගරයට කි.මී 3 දුරින් නාගරික බස් ප්‍රවාහන සීමාව තුළ මලකඩුවාව සැලවටෝරියන් කොන්වන්ට් පාරේ(ප්‍රධාන පාරට මීටර 200 දුරින්)පදිංචියට ඉතාම සුදුසු නිස්කලංක පරිසරයක පිහිටි පර්චස් 20 ක බිම් කැබැල්ලක්(අනෙක් බිම් කැබලි 11 ම මිල දී ගෙන පදිංචි වී ඇත්තේ උසස් රැකියාවල නියුතු වෘත්තිකයන්ය) වහාම විකිණේ.
විමසීම් - රෝහණ හෝ මාලි 905 790 6949, 647 764 4632, 647 855 0664
හේමතිලක(ශ්‍රී ලංකාව) 011 94 37 2238501

## TUTORING

**Tutoring available for Math**

**From grade 1 to 12**

Including Calculus and Advance functions
Over 12 years of experience as a teacher and University teaching Assistant in Sri Lanka, Republic of Maldives and Canada.
100% result oriented Reasonable Charges

**1 වන ශ්‍රේණියේ සිට 12 වන ශ්‍රේණිය දක්වා සිසුන් වෙනුවෙන්**
**ගණිත විෂයය පිළිබඳ උපකාරක පංති පළපුරුදු ගුරුවරියක විසින් පවත්වනු ලැබේ**
.

**Saumya Wanniarachchi**
**(B.Sc Hons)**
**Tel: 905-956-6877 Cell: 647 881 1418**
**saumya12lk@yahoo.com**

## French Tutoring

Individual and small group classes for French learners. French reading, writing, and conversing. Any grade from grade 1-12, university minors and French Immersion.

**Kumudu Abeywardena,** B.A
(Modern Languages), Dip (AFC)
**T.P - 416 244 5585**

**කාන්තා සහ ළමා ඇඳුම් මැසීම සඳහා ඇණවුම් භාරගනු ලැබේ.**
**ආශා**
**647 537 4364**

## දසත Dasatha වෙළඳ සහ ලුහුඬු දැන්වීම් සඳහා විමසන්න

**Classifieds Ads are $ 10 per 2 Inch Column**

All Ads & Classified Ads are also published in the online edition at
**www.dasatha.com**
For **NO ADDITIONAL CHARGE**

Tell: 416 822 2789
Fax: 416 241 3391
Email:dasathainfo@gmail.com
Mailing Address:
Dasatha Publications,
114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

# GISM Campus

නවසීලන්තයේ හෝ එක්සත් රාජධානියේ පිළිගත් විශ්වවිද්‍යාලවලට අනුබද්ධිත උපාධි පාඨමාලාවක් ආරම්භ කර ලොව පිළිගත් උපාධියක් ලබා ගැනීමට GISM ආයතනයෙන් ඔබට ඇරයුම්

ගුණගරුක මවක හෝ පියෙකු වශයෙන් තම දරුවාට දිය හැකි උතුම්ම දායාදය යහපත් අධ්‍යාපනයක් හා උසස් ශිල්පීය දැනුමක් ලබා දීමයි. ඔබ එම මාවතේ කඩඉම් කිහිපයක්ම පසුකර මේ වන විට දරුවාගේ අනාගතය සැලසීමේ තීරණාත්මක මං සන්ධිය වෙත පැමිණ ඇති අතර උසස් අධ්‍යාපනයේ නිවැරදි මඟ තෝරා ගැනීමට සිහින මවමින් සිටිනවාට සැකයක් නැත.

උසස් පෙළින් පසු අප රටේ දක්ෂ දරුවන්ට පහසු හා සාධාරණ මුදලකින් උසස් තත්ත්වයෙන් හා නව තාක්ෂණ ක්‍රමවලින් සැකසුණු පාඨමාලාවක් හදාරා ලොව පිළිගත් උපාධියක් ලබාගැ නීමට අප විද්‍යා හා තාක්ෂණික උපාධි ආයතනය(GISM Campus) මඟ සලසා ඇති බව සතුටින් දන්වමු. අධ්‍යාපනය මුවාවෙන් අසාධාරණ ලෙස මුදල් උපයන කූඨ ව්‍යාපාරිකයන්ගෙන් ඔබ හා ඔබේ දරුවන් ගලවා ලොවට අවශ්‍ය දක්ෂ හා විනය ගරුක පුරවැසියන් බිහිකරනු වස් දියත්කර ඇති මෙම වැඩපිළිවෙළේ තොරතුරු බිඳක් අපි ඔබට මෙමඟින් ලබාදීමට අපේක්ෂා කරන්නෙමු.

අප ආයතනය ලොව ඉතාම උසස් ජීවන රටාවකින් හෙබි, අතිසුන්දර, නවසීලන්තයේ ප්‍රධාන සරසවියක් වන අධ්‍යාපනයේ ප්‍රමුඛයෙකු වූ මැසේ විශ්ව විද්‍යාලයේ අනුබද්ධ ආයතනය ලෙස ක්‍රියා කරයි. අප විසින් සුදුස්සන් තෝරා එම සිසුන්ට උපාධි පාඨමාලාවල මුල් කොටස(පළමු වසර හෝ ඊට වැඩි කාලයක්) සඳහා වූ අධ්‍යාපනය ශ්‍රී ලංකාවේදී ලබාදී ඉන් සමත් වන සිසුනට උපාධි අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට නවසීලන්තයට යැවීමට කටයුතු සලසා ඇත.

මැසේ සරසවිය ලොවෙහි විශ්ව විද්‍යාල ශ්‍රේණි ගත කිරීම් තුලින් පළමු තුන්සියය තුළ සිටින අතර බටහිර රටවල්වල පිළිගත් විශ්ව විද්‍යාල හා සැසඳුවහොත් අඩුම පාඨමාලා ගාස්තු අය කරනුයේද මෙම සරසවියෙන් බව කිව හැකිය. මෙමඟින් ලැබෙන උපාධි සහතිකය ශ්‍රී ලංකාව ඇතුළුව ලොව ඕනෑම රටක පිළිගන්නා අතර පහසුවෙන් රැකියාවක් ලබා ගැනීමට හෝ වැඩිපුර අධ්‍යාපනය පිණිසද සිසුනට ඉමහත් රුකුලක් සපයනු ඇත.

නවසීලන්තයේ අධ්‍යාපනය ලබන කාලය තුළ හා ඉන්පසුව අර්ධකාලීන හා පූර්ණ කාලීන වශයෙන් රැකියාවක් පහසුවෙන් සොයාගත හැකිවීම මෙම විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබන සිසුනට ලැබී ඇති වරප්‍රසාදයකි. තවද, උපාධියෙන් පසු අවශ්‍යනම් නවසීලන්තයේ රැඳී සිටිමින් රැකියාවන් කිරීමට අවස්ථාවද ඔවුනට ලැබේ. අප විසින් අවශ්‍ය වීසා පහසුකම්, නවාතැන් හා වෙනත් අධ්‍යාපනික අවශ්‍යතාවයන් සලසා දීම සිදුකරන අතර, අප රට තුළ හා විදේශගතව සිටින කාලය තුල ඔබ දරුවා ගැන සොයා බැලීමද GISM ආයතනය විසින් කරනු ලබයි.

එසේම මෙවැනිම තවත් විශ්ව විද්‍යාලයක් වන එක්සත් රාජධානයේ එඩින්බර්ග් නේපියර් විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පාඨමාලා සඳහා සුදුසු සිසුන් බඳවා පළමුවන හා දෙවන වසරවල අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ දී අප ආයතන මඟින් ලබා දී අනතුරුව සිසුන් එක්සත් රාජධානියේ මෙම සරසවියට යවා තුන්වන වසර හෝ අවශ්‍ය නම් ගෞරව උපාධිය සඳහා හතරවන වසර සඳහාද, අධ්‍යාපනය ලබාදී ඔබ දරුවාට ලොව පිළිගත් ඉංජිනේරු හෝ විද්‍යා උපාධියක් ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත. මෙම සරසවියද අති නවීන පහසුකම් වලින් හෙබි ලොව ප්‍රධාන පෙළේ සරසවියක් වන අතර මෑතකදී රාජකීය සම්මානයද හිමිකරගෙන ඇත. අප ආයතනය මෙහිදී ද ශ්‍රී ලාංකික අනුබද්ධිතයෙකු වේ. අප සිසුවන් සාර්ථකව පාඨමාලා නිමකරනු දැකීමට හා ඔවුන්ට ඒ සඳහා නිවැරදි උපදෙස් හා පහසුකම් ලබා දීම අපගේ එකම අභිප්‍රාය වන බැවින්, සුදුසු සිසුන් සීමිත සංඛ්‍යාවක් පමණක් බඳවා ගැනීම සිදු කරයි. සාර්ථක අනාගතයකට මඟ සලසන ඉලෙක්ට්‍රොනික්/ඉලෙක්ට්‍රිකල් ඉංජිනේරු, පරිගණක තාක්‍ෂණය, ව්‍යාපාර කළමනාකරණය, විද්‍යා කලා යන අංශ වලින් පාඨමාලා රැසක් තුළින් ඔබේ දරුවාට සුදුසු අංශයක් තෝරා ගැනීමට හැකියාව ඇත.

අප ආයතනය ප්‍රථම උපාධි පාඨමාලාවට අමතරව පශ්චාත් උපාධි හා පර්යේෂණ උපාධි සඳහාද සේවා සපයනු ලබයි. තවද දක්ෂ වෘතිකයෙකු වීමට හෝ වැඩිදුර අධ්‍යාපනය ලැබීමට හෝ හැකියාව ඇති පහසු හා අඩු වියදම් සහිත ඩිප්ලෝමා පාඨමාලාද කෙටි කාලීන පාඨමාලාද මෙම ආයතනය මඟින් පිරිනමනු ලබයි.

උසස් රැකියාවකට හෝ වැඩිදුර අධ්‍යාපනයට ඉඩකඩ මනා ලෙස සැකසුනු පාඨමාලා හදාරා සාර්ථක උපාධිධාරියෙකු වීමට ඔබේ දරුවාට ලැබෙන මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට අප මෙයින් ඔබට ගෞරවයෙන් ආරාධනය කර සිටිමු.

වසර 30 ට අධික කාලයක් තුල පැවති කුරිරු යුද්ධමය වාතාවරණයෙන් පසුව ශ්‍රී ලංකාව වර්තමානයේ අති වේගවත් සංවර්ධනයක් කරා යොමුවී ඇති මේ අවස්ථාවේදී ඔබ දරුවා පිළිබඳව වූ අපගේ වැඩපිළිවෙල ඔවුනට කදිම අවස්ථාවකි. විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන්ට ද තම දු දරුවනටද අතහිත දීමටද මෙමඟින් දැන් අවස්ථාවක් උදාවී ඇත.

විදේශගතව සිටින ශ්‍රී ලාංකික විද්වතුන් හට අප රටේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්‍ෂ මැතිතුමාගේ විවෘත ආරාධනයෙන් පසුව මහාචාර්ය සේනාරත්න මහතා නැවත මව් රටට පැමිණ රටේ දියුණුවට තම දායකත්වය දීමට ඉදිරිපත් වීම වූ එක් විද්වතෙකි.

මහාචාර්ය සේනාරත්න මහතා ශ්‍රී ලංකාවේ මෑතකදී ආරම්භ කරන ලද උසස් අධ්‍යාපන ආයතනයක් වන Graduate Institute of science and Management (GISM) ආයතනයේ සභාපති ලෙස දැනට කටයුතු කරයි. ඒ මහතා අප රටට පැමිණ අධ්‍යාපන හා පර්යේෂණ ක්‍ෂේත්‍රයේ සංවර්ධනය සඳහා කටයුතු සිදුකිරීමට මෙම ආයතනය ස්ථාපනය කර ඇති අතර එමගින් ඉංජිනේරු හා තොරතුරු තාක්‍ෂණය, ව්‍යාපාර කළමනාකරණය සහ සමාජ සංස්කෘතික ආදි වශයෙන් විවිධ ක්‍ෂේත්‍රවල අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු කිරීමට පහසුකම් සලසා ඇත.

මහාචාර්ය සේනාරත්න මහතා අධ්‍යයන ක්‍ෂේත්‍රයේ මෙන්ම කාර්මික හා ඉංජිනේරු ක්‍ෂේත්‍රයන්හිද තම හැකියාවන් සහ පළපුරුද්ද එක හා සමානව දියුණු කරගෙන ඇති අතර ඒ මහතා නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලයෙන් ක්‍ෂුද්‍ර තරංග සැකසුම් පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ගෙන ඇති අතර ඔහුගේ වර්තමාන අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන ක්‍ෂේත්‍රය වනුයේ පියයුරු පිළිකා මුල් අවධියේ හදුනාගැනිම සඳහා ක්‍ෂුද්‍ර තරංග පදනම් කරගත් රැහැන් රහිත සංනිවේදන ඉංජිනේරු විද්‍යාව වන අතර ක්‍ෂුද්‍ර තරංග යොදාග නිමින් ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් වන කාර්මික ක්‍ෂේත්‍රයේ පර්යේෂණයන්හි ද ඔහු නිරත වේ.

GISM ආයතනය ශ්‍රී ලංකාවේ දියුණුව උදෙසා පර්යේෂණ හා උපදේශන සේවා සැපයීමට බලාපොරොත්තු වේ. මේ සඳහා මෙම ආයතනයේ වෙනමම පර්යේෂණ හා උපදේශක මධ්‍යස්ථානයක් ඇත. මෙම සංසදය දේශීය හා ජාත්‍යන්තර පර්යේෂකයින්, විද්වතුන් සහ අධ්‍යයන ක්‍ෂේත්‍රයේ විශේෂඥයින්ගෙන් සමන්විත වන අතර එමගින් අප රටේ සංවර්ධනය සම්බන්ධව පැන නගින ප්‍රශ්නවලට විසදුම් ලබා දී අප රටේ සංවර්ධනයට සහාය දිමටද හැකියාව ලැබේ.

ශ්‍රී ලංකාවේ සිටින ඉතා දක්ෂ වෘත්තිකයින් ඒකරාශි වී එකම පර්යේෂණ කණ්ඩායමක් වශයෙන් කටයුතු කරමින් ඨෂීඑ ආයතනයේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා සැලසුම් කිරීම එම ආයතනයේ අරමුණයි. කර්මාන්ත ක්‍ෂේත්‍රයේ සහ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි විවිධ ආයතන ඨෂීඑ සමග සාකච්ඡා කිරීම හා පර්යේෂණ කිරීම් තුළින් ගැටලු විසඳා ගැනීම හා එමගින් සඵලදායි ප්‍රතිඵල ලබාගැනිමට හැකිවනු ඇත.

අප කාර්ය මණ්ඩලය ඔබ වෙනුවෙන් සේවය කිරීමට සැදී පැහැදී සිටී. ඔබ දරුවාට සුභ අනාගතයකට ආසිරි පතමු. අප පාඨමාලා පිළිබඳ වැඩි විස්තර සඳහා www.gism.lk වෙබ් අඩවිය වෙත පිවිසීමෙන්ද 203 හයිලෙවල් පාර කිරුළපන යන ස්ථානයේ කාර්යාලය වෙත පැමිණීමෙන්ද 0112 820 810 ඇමතීමෙන්ද තොරතුරු ලබා ගත හැක.

- GISM ආයතනය


WEDDING FLORAL DECOR
(Flowers for all Occasions)
Unique Floral Designs for your Wedding
BRIDEL BOUQUETS, PORUWA,
CHURCH & HALLS,
TABLE & OIL LAMP DE'COR
BRIDEL DRESSING, HAIR-STYLES
AND MAKE-UP
Please call - Yasodara
416 - 889 - 5759



If you are Buying or Selling ....
For a Reliable Inspection ....

Yohan De Mel
Certified Home Inspector
Nirhan Property Inspection Services
TEL - 416 885 4625
Web : WWW.NIRHAN.COM
E-MAIL : YDEMEL@NIRHAN.COM

# වෛද්‍ය උපදෙස් වරදවා වටහා ගැනීම භයානකයි

වෛද්‍යවරයකුගෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණි එක්තරා රෝගියකු තම රෝගය පිළිබඳ තොරතුරුත් ඊට සරිලන වෛද්‍ය උපදෙසුත් වෛද්‍යවරයා හා හුවමාරු කරගනිමින් සිටින අතර තුර සිත තුළ තෙරපුණු තම අවශ්‍යතාවක් පිළිබඳ ගැටලුවද මෙසේ ඉදිරිපත් කරනු ලැබුණි.

"ඩොක්ටර්... මේ අසනීප ගතිය හැදුනත් හරි ගෙදරින් ඩ්‍රින්ක් එකක්වත් ගන්න දෙන්නෙ නෑ. ඇත්තටම මං ඉඳල හිටල පොඩි ඩ්‍රින්ක් එකක් ගත්තට වරදක් නෑ නේද?"

මෙහිදී මඳ සිනා පහළ කළ වෛද්‍යවරයා "ඉඳල හිටල නම් මත්පැන් ස්වල්පයක් ගැනීම වරදක් නැහැ" යි පැවසීය.

වෛද්‍යවරයා ඔහු වෙත එසේ පවසා සිටියේ බොහෝ කලාතුරකින් ස්වල්ප වශයෙන් මත්පැන් පොදක් තොලගානු ඇතැයි සිතා විය හැකියි. එහෙත් සිදුවූයේ වෙනකකි. "ආ... ඩොක්ටර්ත් කිව්ව මේ ලෙඩේට බිව්වට අගුණයක් නෑ කියලා" යැයි පවසමින් රෝගී වීමට පෙර සිටි අයුරින්ම කිසිදු වගවිභාගයකින් තොරව ඔහු මත්පැන් පානයට පෙළඹුණි. පසුව ඔහුට සිදුවූයේ රෝගී තත්ත්වය උත්සන්න වී ජීවිතය දැඩි අවධානමකට ලක්ව රෝහලකට වී දුක් විඳීමටය.

ඉහත දැක්වූයේ සමාජයේ ඉතාමත් බහුල ලෙස දක්නට ලැබෙන වෛද්‍ය උපදෙස් වරදවා වටහා ගැනීමේ අවස්ථාවක් සම්බන්ධ පුවතකි. මේ අන්දමෙන් නොයෙක් අවස්ථාවල නොයෙකුත් අන්දමට ලබාදෙනු ලබන වෛද්‍ය උපදෙස් වරදවා වටහා ගැනීමෙන් හෝ සිතාමතා තම වුවමනා එපාකම් අනුව එම වෛද්‍ය උපදෙස් වෙනස් කරගැනීමෙන් හෝ අමාරුවේ වැටෙන්නේ රෝගියා බව අප කවුරුත් සිහි තබා ගත යුතුය.

සෑම වෛද්‍යවරයෙකුම තමා වෙත පැමිණෙන රෝගියා වෙත ප්‍රතිකාර නියම කිරීමේදී රෝගියා විසින් පිළිපැදිය යුතු උපදෙස් මාලාවක් ඉදිරිපත් කරනු ලබයි. එකම රෝගයක් සඳහා බටහිර, ආයුර්වේද, චීන, හෝමියෝපති ආදි වෙනස් වෛද්‍ය ක්‍රමවලදී ලබා දෙන ප්‍රතිකාර මෙන්ම අනුගමනය කිරීමට ලබාදෙන උපදෙස්ද වෙනස් විය හැකිය. මෙහිදී රෝගියාට ලබාදෙන ඖෂධයන්ට අසාත්මික නොවන අන්දමේ උපදෙස් ප්‍රධානත්වය ගැනේ. එපමණක් නොව, රෝගයෙන් රෝගයටද, රෝගියාගෙන් රෝගියාටද, ස්ත්‍රී පුරුෂ භාවය අනුවද, ළදරු, ළමා, තරුණ, වැඩිහිටි තත්ත්ව අනුවද ප්‍රතිකාර සහ උපදෙස් වෙනස් වෙයි. මේ සියල්ලට අමතරව ඇතැම් රෝග සඳහා ප්‍රතිකාර කිරීමේදී රෝගියාගේ රැකියාවේ ස්වභාවය අනුවද උපදෙස් ලබා දීමට වෛද්‍යවරයාට සිදුවන අවස්ථා දක්නට ලැබේ. ඇතැම් රෝග තත්ත්වයන් සඳහා දීර්ඝ ලෙස අතිශය පෞද්ගලික තොරතුරු පවා සාකච්ඡා කොට ප්‍රතිකාර හා උපදෙස් ලබා දිය යුතු අවස්ථාවන්ද ඇතිවිය හැකි අතර එවන් අවස්ථාවල ලැජ්ජාව හෝ බිය නිසා යම් තොරතුරු සඟවාගන්නේ නම් එය ඔබගේ රෝගය විනිශ්චය කිරීම සඳහාද බාධාවක් විය හැකියි.

ඔබගේ රෝගී තත්ත්වයන් පිළිබඳ සියලුම කරුණු වෛද්‍යවරයා වෙත නිරාවරණය කළ පසු ඔහු විසින් දෙනු ලබන උපදෙස් ආදිය ඉතාමත් හොඳින් ධාරණය කර ගැනීම රෝගියා සතු වගකීමකි. යම්කිසි අපහැදිලි තැනක් හෝ නොතේරුණු අවස්ථාවක් වෙතොත් ඒ පිළිබඳ නැවත නැවතත් ප්‍රශ්න කර එය නිරාකරණය කර ගැනීම රෝගියා සතු අයිතියකි. රෝගියාට වෛද්‍යවරයා හා සාකච්ඡා කිරීමට හෝ ප්‍රශ්න කිරීමට දැනුමක් හෝ සවිශක්තියක් නැතොත් අනිවාර්යෙන්ම වෛද්‍ය උපදෙස් සඳහා යාමේදී තවත් අයෙකු සමග යාම වඩාත් සුදුසු වේ. මේ සියල්ල ඉහළින්ම සිදුවුවත් වඩාත් වැදගත් වන්නේ මේ උපදෙස් නිසි පරිදි පිළිපැදීමයි. එය 100% නිවැරදිව සිදුවුවහොත් ඔබ පෙළෙන රෝගයෙන් ඉක්මනින්ම අත්මිදීමට ඔබට හැකි වෙනු ඇත.

### තම වාසියට හා පහසුවට කරුණු තේරුම් ගැනීම

මෙය බොහෝ විට බොහෝ අවස්ථාවලදී අපි සෑම දෙනෙක් විසින්ම කරනු ලබන දෙයකි. නමුත් ජීවිතයේ වෙනත් කරුණුවලදී මෙන් නොව, රෝගයක් වැළඳුණු විට මේ ආකාරයෙන් කටයුතු කිරීමෙන් භයානක විපත් අප වෙත ළඟා විය හැකිය. ඊට කදිම උදාහරණයකි ඉහත අප පෙන්වා ඇති රෝගියාගේ මත්පැන් බීමේ අවස්ථාව.

වෛද්‍යවරුන් විසින් රෝග නිර්ණය කිරීමෙන් අනතුරුව දෙනු ලබන අවවාදවලින් අපට පහසු දේ පමණක් තෝරා ගැනීමත් අප කැමති දේ පමණක් තෝරා ගැනීමත් සුදුසු නොවේ. එහිදී සිදුවන්නේ අනියම් ආකාරයකින් වෛද්‍ය උපදෙස් නොතකා හැරීමයි. අප අකමැති දේ යනු සෑම විටම අප අතින් කඩ වී යන වෛද්‍ය උපදෙස් වෙයි. උදාහරණයක් ලෙස ඇතැම් රෝගී තත්ත්වයක් නිසා තෙල් සහිත ආහාර ගැනීම නුසුදුසු බව වෛද්‍යවරයා පවසයි. එහෙත් කිසියම් ප්‍රියසම්භාෂණයක් වැන්නකදී "අනේ ඔන්න ඔහේ චුට්ටක් කන්න. අරයටත් ඔය ලෙඩේමයි. ඔය අගේට තෙල් කන්නේ" යැයි වටින් පිටින් ලැබෙන ඇරයුමින් තෙල් සහිත ආහාර ගිජුව ගිල දැමීම ඇරඹෙයි. එතැන් සිට කිසිදු බියකින් තොරව තෙල් කෑම ගැනීම අරඹන ඔබ අවසන නතර වන්නේ හෘද රෝගියකු වීමෙනි.

එමෙන්ම සෑම වෛද්‍යවරයකුම නිරතුරුව පවසන ව්‍යායාම කළ යුතු බවට වන සඳහනද අප විසින් නොතකා හරිනු ලබන, වරදවා වටහා ගනු ලබන උපදෙසකි. "අපි ගෙදර වැඩ කරනවා, වැඩට යනවා... ඔයිට වඩා තව මොන ව්‍යායාමද?" මේ අප සිතන හැටියි. මෙය අතීතයේ නිවෙස්වල ගෘහනියන්ට නම් නිවැරදි විය හැකියි. එහෙත් නවීන උපකරණවලින් ආහාර පිස ගැනීම, රෙදි සේදීම, ගේ දොර ඇමදීම කරන අද ගෘහනියන්ගේ ඇඟපත සෙලවීමක්, දහඩිය දැමීමක් සිදුවේද? එනිසා අපගේ කැමැත්ත අනුව නොව වෛද්‍යවරුන්ගේ උපදෙස් අනුව මෙහිදීද ක්‍රියා කිරීම සුදුසු වේ.

දුම්බීම නිසා ශ්වසන රෝගයනට ගොදුරු වූවන්ට වෛද්‍යවරුන් විසින් දෙන මූලික උපදෙස දුම්බීමෙන් වළකින ලෙසයි. නමුත් ඇතැම් රෝගීන් මෙම තත්ත්වයෙන් මිදී සිටින්නේ සිය රෝග ලක්ෂණ පහව යන තෙක් පමණි. වෛද්‍ය උපදෙස් නොතකා නැවතත් දුම්වැටියට හුරු වීම නිසා ඔවුන් ජීවිතයෙන් වන්දි ගෙවනු ලැබූ අවස්ථා අපට අසන්නට ලැබී ඇත.

### වෙනත් රෝගීන්ට දුන් උපදෙස් තමාටත් හරි යැයි සිතීම

මෙය ඉතාමත් භයානක තත්ත්වයකි. ඇතැම් පුද්ගලයෝ වෛද්‍ය උපදෙස් පිළිපැදීමට අමතරව එම රෝගියාට දුන් ඖෂධ පවා පාවිච්චි කිරීමට පෙළඹෙති. වෛද්‍යවරයකු විසින් රෝගියකු වෙත කිසියම් ප්‍රතිකාරයක් හෝ උපදේසයක් ලබා දෙන්නේ එම රෝගියා පිළිබඳ මනා අධ්‍යයනයක් කිරීමෙන් අනතුරුවය. එකම රෝගය වුවද දෙදෙනෙකුට සෑදුණු විට නොයෙකුත් වෙනස්කම් සහිත විය හැකියි. එහිදී රෝගීන්ගේ වයස, ස්ත්‍රී පුරුෂභාවය, අසාත්මිකතාවන්, පැරණි රෝගී තත්ත්වයන්, දෙදෙනාගේ වටාපිටාව, රැකියාව ආදිය බොහෝ සෙයින් වෙනස් විය හැකියි. උදාහරණයක් ලෙස කිසියම් පුද්ගලයෙකුට රැකියාවේ යෙදීමේදී ඇතිවූ දණහිසේ අමාරුවක් සහ තවත් පුද්ගලයෙකුගේ වෙනත් සිදුවීමක් නිසා ඇතිවූ දණහිසේ අමාරුවක් සහමුලින්ම වෙනස් රෝගී තත්ත්වයන් දෙකක් විය හැකිය. ඇතැම් විට දෙවැන්නාට පහළ වී ඇත්තේ ආතරයිටීස් රෝගී තත්ත්වය විය හැකියි. මෙහිදී මුලින් කී තැනැත්තාට සමාන රෝග ලක්ෂණ ඔහු වෙත පළ වුවද එකම ප්‍රතිකාරය හෝ වෛද්‍ය උපදෙස ඔහුට නොසෑහේ.

එසේම හෘදයාබාධයක් වැනි රෝගී තත්ත්වයක් බරවාහන රියදුරකුට හා ලිපිකරුවකුට වැළඳී සුව වීමෙන් පසු ලබා දෙන වෛද්‍ය උපදෙස් සහමුලින්ම වෙනස් විය හැකියි. රෝගී තත්ත්වය සුව වූ ලිපිකරුවාට සති 2-3 න් නැවතත් රැකියාවට යාමට වෛද්‍යවරුන් අවසර දුන්නද බරවාහන රියදුරාට එවන් උපදෙසක් කිසිදු විටෙක වෛද්‍යවරු ලබා නොදෙයි. එහිදී "අහවලාටත් මට හැදුණු හාට් ලෙඩේමයි. දැන් එයා වැඩට යන්නෙ. දොස්තරල එපා කිව්වට මටත් දැන් වැඩට යන්න පුළුවන්" යැයි තමා විසින්ම වෛද්‍ය උපදෙස් වෙනස් කරගනිමින් බරවාහන රියදුරා වැඩට ගියහොත් එය ඔහුගේ ජීවිතය පමණක් නොව මහමග තවත් ජීවිත රැසක් අනතුරේ හෙළීමක් විය හැකියි.

### වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොසැලකීම

ඇතැම් රෝගී තත්ත්වයන් සඳහා වෛද්‍යවරුන් විසින් නියම කරනු ලබන බෙහෙත් වර්ග සහ මාත්‍රාවන් නොසලකා හැරීම නිසා බොහෝ දෙනෙක් තමා වෙත විපත් ළඟා කර ගනිති. "අපෝ ඒ බේත ගත්තම මගේ මුළු ඇඟම දනවා. මුත්‍රා දැවිල්ලයි. ඇඟ පත වණේ වගේ රිදෙනවා. ඒ නිසා මම ඒක නැවැත්තුවා" මෙවැනි වදන් අපට නිරතුරුව අසන්නට ලැබෙයි. සමහර විට ඔබ ඒ හිතුමතේ නවතා දමා ඇත්තේ ඔබේ රෝගී තත්ත්වය සඳහා ගත යුතුම ඖෂධයක් විය හැකියි. උදාහරණ ලෙස කොලෙස්ටරෝල් සඳහා දෙනු ලබන කිසියම් ඖෂධයක් නිසා ඇඟ පත වේදනාව වැනි රෝගී තත්ත්වයන් ඇති විය හැකියි. මෙහිදී ඔබ කළ යුත්තේ හිතුමතේ බෙහෙත නවතා දැමීම නොව. බෙහෙත ගැනීමෙන් පසු ඔබට ඇතිවූ අපහසුතා ගැන වෛද්‍යවරයා සමග සාකච්ඡා කිරීමයි. එවිට ඔබගේ රෝගයට අනුව ඔබට අපහසුවක් නොමැති ඖෂධයක් වෙත වෛද්‍යවරයා ඔබව යොමුකරනු ලබයි.

බොහෝ විට මානසික රෝගී තත්ත්වයන්, ආතති තත්ත්වයන් සඳහා ප්‍රතිකාර ලබාගන්නවුන් කිසිදු විටෙක හිතුමතේ කටයුතු කිරීම සුදුසු නොවේ. සෑම විටම නිසි වෛද්‍ය උපදෙස් පිළිපැදීමෙන් ඔවුන් පෙළෙන රෝගී තත්ත්වයෙන් ඉතාමත් ඉක්මනින් මිදිය හැකි අතර ඒ බව රෝගියාගේ බාරකරුවන්ද තරයේ සිතා ගත යුතු වෙයි.

ඇතැම් අවස්ථාවල රෝගී තත්ත්වයන්ට වෛද්‍යවරුන් දෙන උපදේසයන්ට අමතරව දන්නා හඳුනන අයගේ උපදෙස්ද ලබා ගැනීමට අපි හුරුවී සිටිමු. කිසිදු වැටහීමකින් තොරව ලබාදෙන මෙවන් ගොඩ වෙදකම් නිසා යහපතට වඩා අයහපත සිදුවිය හැකියි. විශේෂයෙන්ම අපස්මාරය වැනි රෝගී තත්ත්වයකදී බාහිර පුද්ගලයින් විසින් ලබාදෙන උපදෙස් පිළිපැදීමෙන් මොළයේ සෛල පවා විනාශ වී යා හැකියි. මෙය භූත දෝෂයක්, තනිකම් දෝෂයක් යැයි පවසමින් යකඩ කෑලි, හැඳි වැනි දේ කටට එබීම තුළින්, ඇඟට වතුර හැලීම තුළින් රෝගියා නොසිතූ විරූ අනතුරු රැසකට මුහුණ පෑ හැකියි. මෙවැනි රෝගියකු සිටී නම් සුදුසුම දෙය වන්නේ හැකිතාක් දුරට වෛද්‍ය උපදෙස්වලට අනුව ප්‍රථමාධාර ලබා දීමයි.

### අන්තර්ජාලය බලා රෝගය නිර්ණය කිරීම

මෙය නවීන තාක්ෂණයත් සමග අප වෙත ආ භයානක වසංගතයකි. ලෝකයේම ඇති හොඳ නරක සෑම දෙයක්ම අන්තර්ජාලයට රිංගා සොයා ගැනීමේ අවස්ථාව අද අපට හිමි වී ඇත. ඒ අතර අප පෙළෙන රෝගී තත්ත්වයන් පිළිබඳ විස්තර සොයා ගැනීමටද අන්තර්ජාලයේ පිළිසරණ පැතීමට අද බොහෝ දෙනෙක් හුරු වී සිටිති.

මෙය ඉතාමත් අසීරු හා භයානක දෙයකි. අපගේ රෝග ලක්ෂණ සැලකිල්ලට ගෙන කිසිදු වෛද්‍ය වාර්තාවකින් තොරව අප අහවල් රෝගයෙන් පෙළෙනවා යැයි සිතීම පවා මානසික රෝගයක් යැයි මට සිතේ. ඇතැම් අය රෝගය නිර්ණය කිරීමෙන් නොනැවතී අන්තර්ජාලයෙන්ම බෙහෙත් පවා ඇණවුම් කර ගෙන්වාගෙන බොන අවස්ථාද ඇත. තවත් පිරිස් අන්තර්ජාලයේ සැරිසරන හොර වෙදුන්ට හසුවී ලෝක ලෙඩ දාගත් අවස්ථාද දක්නට ලැබේ.

කිසිදු වෛද්‍ය දැනුමකින් තොරව ඒ ආකාරයෙන් ප්‍රතිකාර නිර්ණය කර ගැනීම තමාගේ වල තමාම කපා ගැනීමක් බව නොකියාම බැරිය. මේ නිසා සෑම විටම වෛද්‍යවරයකු මුණ ගැසී තම රෝගය නිර්ණය කර ගන්න. ඔබගේ රෝගය පිළිබඳ පැහැදිලි වාර්තාවක් ලැබුණු පසු ඒ පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීම අවශ්‍ය යැයි හැඟෙතොත් පමණක් අන්තර්ජාලයට යොමුවී ඒ ගැන හදාරන්න. උදාහරණයක් ලෙස පිළිකා රෝගයකින් පෙළෙන තැනැත්තෙකු හට තමාගේ රෝගී තත්ත්වය පිළිබඳ වැඩිදුර දැනගැනීමට අවශ්‍ය නම් අන්තර්ජාලයෙන් එය සොයාගත හැකිය. නමුත් පිළිකා රෝගයෙන් පෙළෙන්නන් අන්තර්ජාලය කියවා බලා තම රෝගී තත්ත්වය පවතින අවධිය නිර්ණය කිරීමෙන් වළකින්න. ඇතැම් විට අන්තර්ජාලයෙහි පවතිනවාට වඩා අවම අවධියක ඔබගේ රෝගී තත්ත්වය තිබිය හැකිය. අන්තර්ජාලය බලා මානසිකව ඇද වැටීමෙන් ඔබ රෝගයෙන් පෙළෙන වේදනාවට වැඩි වේදනාවකින් පීඩාවට පත්විය හැකියි.

එමෙන්ම වෛද්‍යවරයකු විසින් තමාට දුන් ඖෂධයක අතුරු ප්‍රතිඵල ආදියෙහි වාර්තාවක් සොයාගැනීමට අවශ්‍ය නම් එයද අන්තර්ජාලයෙන් ලබාගත හැකිය. එහෙත් මේ කිසිදු විටෙක ඔබට ප්‍රතිකාර කරන වෛද්‍යවරයාගේ අනුදැනුමකින් තොරව ඖෂධ මාරු කිරීම, මාත්‍රාව අඩුවැඩි කිරීම ආදිය කිරීමෙන් වැළකීමට සිහි තබාගන්න.




කන්දේ ලන්දේ ගඟුලැල්ලේ
පේනා තෙක් මානේ
මන බැන්දේ ඉන්දේ
සුව පහසේ වාසේ ගම්මානේ

වෙල් යායේ දොළ පාරේ
නිල්වන් ජලාසේ
ගං තීරේ ගුරු පාරේ
සිරි දෙව් සිනා වේ //

ඒ මව් තුරුල්ලේ
සුරූපී යොවුන් ලාලනී
සංකේත වූ වාසනාවේ
ගම්මානේ

කන්දේ ලන්දේ....

ඇල් හේනේ රුක් සෙවණේ
ගෙපැලේ විහාරේ
පූජාවේ බෙර නාදේ
ගැමි ගීත රාවේ//

මා පුංචි කාලේ ලැබූ ආදරේ
සුන්දරත්වේ
යයිදෝ නවෝදෙන් මැකීලා
ගම්මානේ

කන්දේ ලන්දේ...

මේ ගීතය ඇසෙන වාරයක් පාසා අපේ මවුබිම වෙත සිත දිව යන්නේ නිරායාසයෙනි. එපමණටම අප උපන් දේශයේ අතීත ගැමි දිවියෙහි සුන්දරත්වය මෙයින් මොනවට පැහැදිලි කරයි. මෙම ගීතය දෙස විමසිල්ලෙන් බැලීමේදී පෙනී යන්නේ මෙහි කිසිදු වදනක් අතිශයෝක්තියෙන් ලියවී නැති බවයි. සියල්ල සැබෑ ලෝකයේ සිදු වූ අපූර්වතම අත්දැකීම් ගොන්නකි. කඩිමුඩි, දඩිබිඩි සංස්කෘතියෙන් බැහැර වූ අප කුඩා කල ජීවත් වූ, හැදුණු වැඩුණු ගම පිළිබඳ සැබෑම අර්ථ කථනයක් ගීතය පුරා දී ඇත.

කන්ද, ලන්ද, ගඟ සීමා කරගනිමින් බිහිව තිබූ ගැමි සංස්කෘතියෙහි වාසය එකල මහත් සුව පහසුවක් විය. වෙල් යාය අසබඩින් ගලන දොළ පාර, පටු ගුරු පාර අද්දරින් ගලන ගං තීරය ගැමියාගේ ඒ සුවපහසු දිවිය තව තවත් වර්ධනය කරලමින් ගැමි දිවියට සිරිදෙව් දුව කැඳවීමට සමත් විය.

ඉතාමත් සරල දිවිපෙවතකින් යුත් ගැමියා විසින් හේනේ පැලේ ගයන කවියකින් ගමේ විහාරයේ මුමුණන ගාථාවකින්, වැයෙන බෙර පදයකින් සිය දිවියට එක්කර ගත්තේ අපූර්වතම සෞන්දර්යයකි. ඒ සොඳුරු සෞන්දර්යය හා බැඳුණු චමත්කාරය ගැමියාගේ ජීවිතයටම බද්ධ වී තිබූ අංගයන් විය.

එහෙත් අද ඒ සියල්ල වෙනස් වී ඇත. රට වෙනස් වෙමින්, ගම වෙනස් වෙමින් නැග එන නව තාක්ෂණික අරුමෝසම් දියුණුවෙන් ගමෙහි සාරසිරිත් මහත් විප්ලවයකට මුහුණ පා ඇත. අතීත සශ්‍රීකත්වය, සිරියාව ගමෙන් පැන ගොස් අප පුංචි කාලේ ලද සැනසුම, ආදරය, සුන්දරත්වය මැකී යාමේ තර්ජනයට මුහුණ පෑමට ගමට සිදුවී ඇත. යථාර්ථය මෙය යැයි පසක් කරලමින් අද ගමද නගරය මෙන්ම සංකීර්ණ වෙමින් යන අයුරු දැකගත හැකිය.

විවිධ ජන ගී රටා සොයමින් පර්යේෂණ රැසක නියැළුණු ජනශ්‍රැති පර්යේෂකයකු, සෞන්දර්යවේදියකු, කථිකාචාර්‍යවරයකුද වන රෝහණ බැද්දගේ නම් නිර්ව්‍යාජ ගැමියා විසින් මෙම ගීතයේ පදරචනය, සංගීතය හා ගායනය සිදු කර ඇත.

SATKAR





Bad Credit,
No Credit,
New To Canada
No Problem*

Call: Ravi or Gamini
416 747 1996 , 416 822 2789

ඔබගේ සියළුම වාහන අවශ්‍යතාවන්
සඳහා විමසන්න

AUTO SALES & SERVICE
Complete Mechanical Repairs & Safety Inspection tO
All Makes & Models
66 Milvan Drive. Unit 8 . Weston. Ontario. M9L 1Z5
* Some conditions apply.

# තණ නිල්ල දිගේ ඇදිලා යනවා...











අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රිකට් තරඟාවලියෙහි රස මුසු තැන්...







ජයවර්ධන පුර, මොරටුව (NDT සහ ඉංජිනේරු), පේරාදෙණිය, කැලණිය , කොළඹ යන විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනය ලැබූ විද්‍යාර්ථීන් සහභාගි වූ සුහද ක්‍රිකට් තරඟාවලිය අගෝස්තු 31 වනදා පවත්වන ලදී. මෙහිදී ජයග්‍රහණය පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ක්‍රිකට් කණ්ඩායම විසින් හිමිකරගන්නා ලදී.













සේයා රූ සටහන රන්සිරිමල් ප්‍රනාන්දු

# ඔබ සැමට ආරාධනා...!

## බසක වරුණ
## 2013 සිංහල භාෂා දිනය

සංගීතඥයෙක්, ජනශ්‍රැති පර්යේෂකයෙක්, කථිකාචාර්යවරයෙක්

මෙන්ම සෞන්දර්යවේදියෙක් ලෙස ප්‍රකට

දේශ නේත්‍රා සම්මානලාභී

**රෝහණ බැද්දගේ මහතා**

මෙවර බසක වරුණ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වෙයි.

කැනඩාවේ සිංහල භාෂක සමාජය වෙනුවෙන් පවත්වන
භාෂා සාහිත්‍ය උළෙල සහ සංස්කෘතික සංදර්ශනය

**2013 සැප්තැම්බර් 22 වන ඉරිදා**

**දොන් බොස්කෝ රඟහලේදී**

**සංවිධානය කැනඩා සිංහල සංගමය**

# BEYOND YOUR EXPECTATIONS !

## Residential & Commercial
## Real Estate

Children's Miracle Network®

#1 RE/MAX

හිතට බරක් නැති හිසට සෙවණක්
කුලී නිවසින් තමන්ගේම නිවහනකට....

## Buy Or Sell your Home with me

### For Buyers

**I will pay your 1st month Mortgage***

(*Limited to $300.00 for Each $100,000 Mortgage)

### For Sellers

**Only 1% listing agent commission****

1%

if you sell and buy a property through me**

CNE
Certified Negotiation Expert®

ABR®
Accredited Buyer Representative®

- Free Home Evaluation
- Search the entire MLS
- Critical Sellers Information
- Critical Buyer Tips
- Find Comparable Homes
- Important Market News
- Letter of Opinion



RE/MAX 100 Percent Club
2010 / 11

RE/MAX PLATINUM CLUB
2012

- RE/MAX Platinum Club Award 2012
- RE/MAX 100% Club Awards 2010 / 11
- RE/MAX Diamond President's Award 2010 / 12

RE/MAX Diamond Realty Inc., Brokerage

# Gamini Abeysinghe. ABR, CNE

**Real Estate Sales Representative**

# Mobile : 416 822 2789

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828
1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Visit my website - www.gaminiabeysinghe.com**

- Some conditions apply. Please feel free to contact me for further details **
- Not intended to solicit currently listed properties or buyers under contract